291 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 291 - இல. 5
Volume 291 - No. 5

2022 මැයි 04වන බදාදා
2022 மே 04, புதன்கிழமை
Wednesday, 04th May, 2022

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

**වත්මන් ආර්ථික තත්ත්වය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා:**
මුදල් අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා**

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වූ එකඟතා ගිවිසුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශ නිවේදනය පිළිබඳ සාකච්ඡාව**

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
கைத்தொழிற் பிணக்குகள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்

**தற்போதைய பொருளாதார நிலைமை மற்றும் சர்வதேச நாணய நிதியத்துடனான பேரம்பேசல்:**
நிதி அமைச்சரினது கூற்று

**அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்**

**சர்வதேச நாணய நிதியத்துடனான பேரம்பேசல் குறித்து மாண்புமிகு நிதி அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட கூற்று தொடர்பான கலந்துரையாடல்**

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Industrial Disputes (Special Provisions) Bill: Determination of the Supreme Court
Committee on Parliamentary Business: Nomination of Members

CURRENT ECONOMIC SITUATION AND NEGOTIATIONS WITH INTERNATIONAL MONETARY FUND:
Statement by Minister of Finance

MINISTERIAL CONSULTATIVE COMMITTEES

DISCUSSION ON THE MINISTERIAL STATEMENT OF THE MINISTER OF FINANCE REGARDING NEGOTIATIONS WITH THE INTERNATIONAL MONETARY FUND

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2022 මැයි 04වන බදාදා***
*2022 மே 04, புதன்கிழமை*
*Wednesday, 04th May, 2022*

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப.10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### கைத்தொழிற் பிணக்குகள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### INDUSTRIAL DISPUTES (SPECIAL PROVISIONS) BILL: DETERMINATION OF THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to announce to Parliament that I have received the Determination of the Supreme Court in respect of the Bill titled "Industrial Disputes (Special Provisions)", which was challenged in the Supreme Court in terms of Article 121(1) of the Constitution.

The Supreme Court makes the following Determination in terms of the relevant provisions stipulated in the Constitution:

(i) Clause 2(1) read with Schedule I of the Bill is inconsistent with Article 43(1) of the Constitution and may only be passed by the special majority required by Article 84(2) of the Constitution.

The Hon. Attorney-General has informed that Item 49 will be removed from Schedule I of the Bill by way of a Committee Stage Amendment and Schedule I, as so amended, will not be inconsistent with the Constitution.

(ii) Clause 2(1) of the Bill is inconsistent with Articles 3, 4(c), 111(H)(1)(b) and 111(M)(a) of the Constitution and may only be passed by the special majority required by Article 84(2) and approved by the people at a Referendum by virtue of the power of Article 83 of the Constitution.

The Hon. Attorney-General has informed that the deeming provision will be removed from Clause 2 (1) of the Bill by way of a Committee Stage Amendment.

Clause 2(1), as so amended, will not be inconsistent with the Constitution.

(iii) The Court has also detemined that by moving the Amendments that have been specifically stated in the Determination of the Supreme Court in respect of Clause 2, Clause 3, Schedule I and Long Title of the Bill will make the Bill consistent with the Constitution.

I order that the Determination of the Supreme Court be printed in the Official Report of today's Proceedings.

***ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය:***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

In the matter of an application under and in terms of Article 121(1) of the Constitution read with Article 120 and Rule 63(1) of the Supreme Court Rules of 1978, against the Bill titled "INDUSTRIAL DISPUTES (SPECIAL PROVISIONS)".

A. V. N. Perera,
No 192, Doowa Road,
Baddegana, Pitakotte.

**Petitioner**

**S.C. (S. D.) No: 30 / 2022**

Vs.

Hon. Attorney General,
The Attorney General's Department,
Colombo 12.

**Respondent**

**Before:**

Vijith K. Malalgoda PC - Judge of the Supreme Court
A.H.M.D. Nawaz - Judge of the Supreme Court
Janak De Silva - Judge of the Supreme Court

**Counsel:**

Dharshana Weraduwage with Ms. Dhanushi Kalupahana and Ushani Atapattu for the Petitioner.

Mrs. Suharshi Herath Senior Deputy Solicitor General with Ms. Navodi de Zoysa State Counsel for the Attorney-General.

The Court assembled for the hearing at 10.00 a.m. on 21st and 22nd April, 2022.

A Bill titled "Industrial Disputes (Special Provisions)" was published in the Government Gazette on 25th March, 2022 and was placed on the Order Paper of Parliament on 8th April, 2022. This petition was filed on 18th April, 2022 invoking the jurisdiction of this Court in terms of Article 121 to determine whether the Bill or any provisions of the Bill are inconsistent with the Constitution. On receipt of the petitions, the Attorney General was noticed pursuant to Article 134(1) of the Constitution.

The Court heard the Petitioner and the Attorney General.

The preamble to the Bill reads as follows:

> "An Act to make special provisions to deem the Presidents of the Labour Tribunals as Additional Magistrates to hear, try, determine and dispose of all suits or prosecutions under the provisions of specified enactments and for matters connected therewith or incidental thereto."

Clause 1 of the Bill gives the Minister the power to specify when the Bill comes into force. In terms of Clause 2, every President of the Labour Tribunal established in terms of section 31A of the Industrial Disputes Act (Chapter 131) is deemed to be an Additional Magistrate for the purposes specified therein. Clause 3 makes the provisions of the Code of Criminal Procedure Act, No. 15 of 1979 and Evidence Ordinance applicable to such proceedings. In terms of Clause 4, the Sinhala text is to prevail in case of inconsistency.

During the hearing, the learned counsel for the Petitioner raised objections to several clauses of the Bill relating to its constitutionality.

The learned counsel for the Petitioner submitted in general that the Bill, as a whole or in part, is inconsistent with many entrenched provisions of the Constitution, including Articles 3, 4(b), 4(d), 12(1), 27(2)(a) and (b), 27(6), (9) and (12) and 27(15) and hence require the approval of the people at a Referendum by virtue of Article 83.

In particular, it was submitted that the long title and Clauses 2 and 3 of the Bill collectively attempt to dilute the powers of the Commissioner for Workmen's Compensation and accordingly, those provisions violate Articles 3, 4(b), 4(d), 12(1), 42, 43 and 44 of the Constitution and thus require the approval of the people at a Referendum by virtue of Article 83.

Alternatively, the learned counsel for the Petitioner contended that the long title and Clauses 2 and 3 of the Bill attempts to disregard or deviate from Sri Lanka's International Treaty Obligations and accordingly, those provisions violate Articles 3, 4(b), 4(d), 12(1), 27(2)(a), (b), 27(6), 27(9), 27(12) and 27(15) of the Constitution and hence require the approval of the people at a Referendum by virtue of Article 83.

It was further submitted that Clauses 2(1), 2(2) and 2(3) of the Bill collectively go against the principles and/or the provisions of the Workmen's Compensation Ordinance No 19 of 1934 (as amended) and those provisions violate Articles 3, 4(b), 4(d), 12(1) and thus require the approval of the people at a Referendum by virtue of Article 83.

The learned counsel for the Petitioner next drew our attention to the preamble of the Bill and submitted that although it seeks to confer civil jurisdiction on the Presidents of Labour Tribunals, the provisions of the Bill do not confer such jurisdiction. Accordingly, it was submitted that Clauses 3(1) and 3(2) of the Bill violate Articles 3, 4(b) and 12(1) of the

Constitution and thus require the approval of the people at a Referendum by virtue of Article 83.

Finally, it was submitted that the Bill as a whole weakens the office of the Commissioner of Workmen's Compensation, which seriously violate the fundamental rights of the Petitioner and Citizens of the Republic as a whole and thereby the entirety of the Bill negatively affects the Rule of Law and violates Articles 3, 4(d) and 12(1) of the Constitution and thus require the approval of the people at a Referendum by virtue of Article 83.

The objections of the Petitioner to the Bill are principally twofold: Firstly, the inclusion of the Workmen's Compensation Ordinance (Chapter 139) as item 49 in Schedule I of the Bill and secondly, the failure on the part of the provisions of the Bill to confer civil jurisdiction on the Presidents of Labour Tribunals although the preamble refers to such vesting.

During the hearing the learned Senior Deputy Solicitor General informed, and subsequently confirmed by way of a motion dated 22nd April 2022, that the Attorney-General will advise the Minister of Labour to move the Committee Stage amendments annexed to letter dated 22.04.2022 sent by the Legal Draftsman to the Secretary, Ministry of Labour. Two of the proposed amendments are to remove item 49 from Schedule I and the reference to suits in the preamble.

The learned counsel for the Petitioner indicated to Court that his concerns would be resolved if the proposed amendments were made.

In addition to the matters raised by the Petitioner, the Court noted two significant issues.

Firstly, we observe that the Workmen's Compensation Ordinance (Chapter 139) was not included as item 49 in Schedule I of the draft Bill submitted for Cabinet approval by the Minister of Labour by Cabinet Memorandum dated 10th March 2022 for which Cabinet

approval was obtained. The Court has not been provided with any further Cabinet Memorandum by which Cabinet approval has been sought and obtained to include the Workmen's Compensation Ordinance (Chapter 139) in Schedule I. Nonetheless, it has been included as item 49 in Schedule I of the Bill tabled in Parliament.

In terms of Article 43(1) of the Constitution, the Cabinet of Ministers is charged with the direction and control of the Government of the Republic, which shall be collectively responsible and answerable to Parliament. These provisions encapsulate two important elements of a Cabinet system of government, namely, unanimity of government and its accountability to Parliament. Lord Salisbury expounded the classic expression of collective responsibility of the Cabinet as follows:

> *"For all that passes in Cabinet every member of it who does not resign is absolutely and irretrievably responsible and has no right afterwards to say that he agreed in one case to a compromise, while in another he was persuaded by his colleagues...It is only on the principle that absolute responsibility is undertaken by every member of the Cabinet, who, after a decision is arrived at, remains a member of it, that the joint responsibility of Ministers to Parliament can be upheld and one of the essential principles of parliamentary responsibility established."* [Official Report, HC Cols 833-34. 8 April 1878]

The decision of the Cabinet of Ministers to introduce the "Industrial Disputes (Special Provisions) Bill" is a policy decision which attracts the collective responsibility of the Cabinet in terms of Article 43(1). However, the draft Bill submitted for Cabinet approval differs from the Bill tabled in Parliament in so far as the Workmen's Compensation Ordinance (Chapter 139) is concerned.

Accordingly, Clause 2(1) read with Schedule I of the Bill is inconsistent with Article 43(1) of the Constitution and may only be passed by the special majority required by Article 84(2).

The learned Senior Deputy Solicitor General informed during the hearing, and subsequently confirmed by way of a motion dated 22nd April 2022, that item 49 will be removed from Schedule I of the Bill by way of a Committee Stage amendment.

Schedule I as so amended will not be inconsistent with the Constitution.

Secondly, the Court observed that in terms of Clause 2(1) of the Bill, every President of the Labour Tribunal established under section 31A of the Industrial Disputes Act (Chapter 131) shall *be deemed to be an Additional Magistrate* for the purposes specified therein.

In ***Jinawathie and Others v. Emalin Perera*** **[(1986) 2 Sri.L.R. 121 at 130]** Ranasinghe J. (as he was then) held:

> "In statutes the expression "deemed" is commonly used for the purpose of creating a statutory function so that the meaning of a term is extended to a subject matter which it properly does not designate. Thus, where a person is "deemed to be something" it only means that whereas he is not in reality that something the Act of Parliament requires him to be treated as if he were. When a thing is deemed to be something, it does not mean that it is that which it is deemed to be, but it is rather an admission that it is not what it is deemed to be, and that notwithstanding it is not that particular thing it is nevertheless deemed to be that thing."

By way of Clause 2(1) of the Bill, Parliament seeks to elevate a President of the Labour Tribunal to the status of an Additional Magistrate when in fact he is not.

In terms of Article 111(H)(1)(b) of the Constitution, it is the Judicial Service Commission that is vested with the power to appoint judicial officers. According to Article 111M(a), judicial officer includes a person who holds office as judge of any Court of First Instance. Hence, section 6(1) of the Judicature Act provides for the appointment of Magistrates and Additional Magistrates by the Judicial Service Commission.

In this context, it is pertinent to examine the historical context in which the Judicial Service Commission became part of our constitutional framework in order to appreciate the reasons for its creation.

The Judicial Service Commission was introduced for the first time into our constitutional framework by the Ceylon (Constitution) Order-in-Council 1946. In ***Senadhira et. al. v. The Bribery Commissioner* (63 N.L.R. 313)** it was identified as the fourth pillar in the temple of justice. There was no doubt that under the Ceylon (Constitution) Order-in-Council 1946 the legislature was empowered to validly confer judicial power on institutions created by law. However, the Supreme Court in ***Ranasinghe v. The Bribery Commissioner* (64 N.L.R. 449)** held that judicial power vested in such institutions cannot be exercised by persons who are appointed to the institution by the Governor-General and not by the Judicial Service Commission. This position was confirmed in ***Senadhira et. al. v. The Bribery Commissioner* (Supra.)**, ***Don Anthony v. The Bribery Commissioner* (64 N.L.R. 93)**, ***Piyadasa v. The Bribery Commissioner* (64 N.L.R. 385)** and ***Ceylon Transport Board v. Samastha Lanka Motor Sevaka Samithiya* (65 N.L.R. 185)**. Clearly, judicial power under the Ceylon (Constitution) Order-in-Council 1946 was only exercisable by a judicial officer appointed by the Judicial Service Commission except in the case of the superior courts.

The Privy Council in ***The Bribery Commissioner v. P. Ranasinghe* (66 N.L.R. 73)** while affirming the judgment in ***Ranasinghe v. The Bribery Commissioner* (Supra.)** held that the framers of the Constitution appreciated the importance of securing the independence of judges and of maintaining the dividing line between the judiciary and executive.

Accordingly, it is seen that the Judicial Service Commission was first introduced into our constitutional framework to protect and foster the independence of the judiciary by ensuring that the appointment and disciplinary control of the minor judiciary is vested with it free from any influence from the executive or legislature.

Although the doctrine of separation of powers and the Judicial Service Commission did not find its way into the 1972 Constitution, it was reinstated under the 1978 Constitution. In ***Ratnasiri Perera v. Dissanayake, Assistant Commissioner of Co-operative Development and Others*** **[(1992) 1 Sri.L.R. 286]** Fernando J. held that the relevant provisions of the 1978 Constitution were not enacted in vacuo, but inter alia in the background of the Constitutional provisions and judicial decisions set out above.

Consequently, there can be no doubt that the framers of the 1978 Constitution reintroduced the Judicial Service Commission to free the minor judiciary from any form of executive and legislative influence as part of the overall objective of establishing the independence of the judiciary.

The importance of securing the independence of the judiciary was expounded by Blackstone (Blackstone's Commentaries Vol. 1 at p. 269) as follows:

> *"In this distinct and separate existence of the judicial power in a peculiar body of men, nominated indeed, but not removable at pleasure by the Crown, consists one main preservative of the public liberty which cannot subsist long in any state, unless the administration of common justice be, in some degree, separated both from the legislative and also from the executive power. Were it joined with the legislative, the life, liberty and property of the subject would be in the hands of arbitrary judges, whose decisions would be then regulated only by their opinions, and not by any fundamental principles of law; which though legislators may depart from, yet judges are bound to observe. Were it joined with the executive, this union might soon be an overbalance for the legislative."*

Article 3 of the Constitution states that sovereignty is in the People and is inalienable. This provision seeks to give constitutional recognition to the concept of sovereignty in political theory which was first referred to by Bodin in *The Republic* in 1576. It defines Sovereignty to include the powers of government, fundamental rights and the franchise.

Nonetheless, it seeks to deviate from the traditional meaning attributed to the concept of sovereignty in political theory, which focused only on the power of the State, and extend its meaning to include rights such as fundamental rights and the franchise. It is a non-exhaustive definition as the word used is *inclusive*. Hence there are other rights other than fundamental rights and the franchise that form part of the sovereignty of the people in our constitution.

In terms of Article 3, sovereignty is in the people and according to Article 4, the organs of government exercise the executive, legislative and judicial power of the people. No useful purpose is served by giving constitutional recognition to judicial power if there is no independent judiciary to protect itself from executive and legislative intrusions. Similarly no useful purpose is served by giving constitutional recognition to fundamental rights if there is no independent judiciary to protect them from executive and administrative excesses. Correspondingly, no useful purpose can be achieved if the people are given the power of franchise without the right to an independent judiciary to give practical effect to such right. An independent judiciary is the last bulwark to protect civil liberties against arbitrary action by the executive or the legislature in appropriate proceedings.

In the end, the full implementation of all rights of the people depends upon the proper administration of justice by a competent, independent and impartial judiciary by upholding the rule of law. In this context, it is important to note that the SVASTI of the Constitution assures to all people the independence of the judiciary. Hence sovereignty in Article 3 of the Constitution must be read to include the right to an independent judiciary.

Accordingly, when the sovereign power of the people is to be exercised by organs and institutions of government, it must be understood and interpreted in this context.

In terms of Article 4(c) of the Constitution, the judicial power of the People shall be exercised by Parliament through courts, tribunals and institutions created and established, or recognized, by the Constitution, or created and established by law, except in regard to matters relating to the privileges, immunities and powers of Parliament and of its Members wherein the judicial power of the People may be exercised directly by Parliament according to law. In interpreting this power of the Parliament, it must be read together with the right to an independent judiciary which is part of the sovereignty vested in the people in terms of Article 3.

Therefore, except in regard to matters relating to the privileges, immunities and powers of Parliament and of its Members, Parliament has only the power to provide for the creation of courts, tribunals and institutions for the exercise of the judicial power of the people. This judicial power can only be exercised by a judicial officer duly appointed under the law. Although Parliament has power in terms of Article 105(2) of the Constitution to replace or abolish, or amend the jurisdiction of such courts, tribunals and institutions, it does not have the power to appoint judicial officers directly or indirectly. The Judicial Service Commission and its powers are integral to the protection and promotion of the independence of the judiciary, which forms part of the sovereignty of the people. Consequently, in ***Ratnasiri Perera v. Dissanayake, Assistant Commissioner of Co-operative Development and Others*** **(Supra.)** Fernando J. held that except constitutional jurisdictions, other jurisdictions can be taken away by ordinary law provided that if they are transferred to other bodies, the officers or members thereof must be appointed in terms of Articles 114 and 170.

By Clause 2(1) of the Bill, Parliament is seeking to appoint judicial officers which offends the independence of the judiciary and thereby infringes Articles 3, 4(c), 111(H)(1)(b) and 111 (M) (a) of the Constitution.

We are therefore of the opinion, and determine, that Clause 2(1) of the Bill is inconsistent with Articles 3, 4(c), 111(H)(1)(b) and 111 (M) (a) of the Constitution and may only be passed by the special majority required by Article 84(2) and approved by the people at a Referendum by virtue of the power of Article 83.

The learned Senior Deputy Solicitor General informed during the hearing, and subsequently confirmed by way of motion dated 22nd April 2022, that the deeming provision will be removed from Clause 2(1) of the Bill by way of a Committee Stage amendment.

Clause 2(1) as so amended will not be inconsistent with the Constitution.

The following are the amendments that the Attorney-General will advise the Minister of Labour to move at the Committee Stage:

Page 1, Clause 2 : (1) delete lines 8 to 11 (both inclusive) and substitute the following: -

"2. (1) Every labour tribunal established under section 31A of the Industrial Disputes Act (Chapter 131) shall, in addition to the powers and duties conferred by written law, exercise the powers conferred upon a Magistrate";

(2) delete line 17 and substitute the following :-

"Commissioner or implementation of the provisions incidental hitherto of the";

(3) delete lines 20 and 21 and substitute the following: -

"(2) For the purposes of this Act, the jurisdiction of a labour tribunal as mentioned above shall, subject to the provisions";

Page 2, : (4) delete line 1 and substitute the following: -

"(3) The jurisdiction of a labour tribunal";

(5) delete line 7 and substitute the following: -

"the Magistrate's Court shall continue to exercise such other powers other than the powers under subsection (1) of this section";

Page 2, Clause 3 : (1) delete lines 11 and 12 and substitute the following:-

"3. (1) The President of a labour tribunal specified in Column I of Schedule II shall have the power";

(2) immediately after line 21 insert the following:-

"(2) There shall be a duly appointed Registrar and an incidental staff for the purpose of implementing the functions specified under subsection (1) section 2 of this Act";

Page 5 : delete item 49 of the Schedule I;

Long title : delete the long title and substitute the following: -

"AN ACT TO MAKE SPECIAL PROVISIONS TO EMPOWER THE LABOUR TRIBUNALS TO HEAR, TRY, DETERMINE AND DISPOSE OF ALL ENFORCEMENT PROCEEDINGS AND PROSECUTIONS UNDER THE PROVISIONS OF SPECIFIED ENACTMENTS AND FOR MATTERS CONNECTED THEREWITH OR INCIDENTAL THERETO.".

Upon the Bill tabled in Parliament being amended as undertaken above, it will be consistent with the Constitution. In this regard, we note that it is the constitutional duty of the Hon. Attorney-General in terms of the proviso to Article 77(2) of the Constitution to communicate his opinion of an amendment proposed to a Bill in Parliament to the Speaker at the stage when the Bill is ready to be put to Parliament for its acceptance.

We place on record our deep appreciation of the assistance given by the learned counsel for the Petitioner and by learned Senior Deputy Solicitor General who appeared on behalf of the Hon. Attorney-General.

**Vijith K. Malalgoda, PC**

Judge of the Supreme Court

**A.H.M.D. Nawaz**

Judge of the Supreme Court

**Janak De Silva**

Judge of the Supreme Court

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்

COMMITTEE ON PARLIAMENTARY BUSINESS: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධාන සහ 2022 ජනවාරි 20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (මහජන ආරක්ෂක අමාත්‍ය, සංචාරක අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரும் சுற்றுலா அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Public Security, Minister of Tourism and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to*

2020 අගෝස්තු 05 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව.- [අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கல்வி அமைச்சரும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Education and Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, 2019 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කනක හේරත් මහතා (මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Kanaka Herath - Minister of Highways)

ගරු කථානායකතුමනි, 2019 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 අංක 30 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ 2022.02.24 සිට 2022.03.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සභාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.- [ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

අමාත්‍යාංශ නිවේදන, මුදල් අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා.

## වත්මන් ආර්ථික තත්ත්වය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා: මුදල් අමාත්‍යතුමාගේ ප්‍රකාශය

தற்போதைய பொருளாதார நிலைமை மற்றும் சர்வதேச நாணய நிதியத்துடனான பேரம்பேசல்: நிதி அமைச்சரினது கூற்று

CURRENT ECONOMIC SITUATION AND NEGOTIATIONS WITH INTERNATIONAL MONETARY FUND: STATEMENT BY MINISTER OF FINANCE

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (මුදල් අමාත්‍ය, අධිකරණ අමාත්‍ය සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நிதி அமைச்சரும் நீதி அமைச்சரும் சிறைச்சாலைகள் முகாமைத்துவம் மற்றும் சிறைக் கைதிகள் புனர்வாழ்வளிப்பு இராஜாங்க அமைச்சரும்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Finance, Minister of Justice and State Minister of Prison Management and Prisoners` Rehabilitation)

ගරු කථානායකතුමනි, ඔබතුමා ඇතුළු ගරු සභාවේ සිටින සියලුදෙනාගෙන් අවසරයි.

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

මුලින්ම මම, අප රටේ පවතින වර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳව මේ ගරු සභාවට පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙහිදී මා බලාපොරොත්තු වන්නේ කිසිවෙකුට ඇඟිල්ල දිගු කිරීමට වත්, මේ තත්ත්වය ඇති වීමට වැඩියෙන්ම වග කියන්න ඕනෑ කවුද කියන කාරණා පිළිබඳව වත් සඳහන් කිරීම නොවෙයි. වර්තමාන ආර්ථික තත්ත්වයත්, මේ තත්ත්වයෙන් රට මුදා ගත හැකි වැඩ පිළිවෙළක් සහ ඒ සඳහා අපට ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද කියන කාරණා පිළිබඳව සලකා බැලීමයි දැන් අප කළ යුත්තේ.

Sir, I have also made arrangements for a summary of my speech today in all three languages together with the Fiscal Report and the progress made with the IMF to be circulated among all Members of Parliament. I think that would be available in about half an hour's time.

ගරු කථානායකතුමනි, මම හිතන ආකාරයට නිදහසින් පසුව ලංකාව මුහුණ දෙන බරපතළම ආර්ථික අර්බුදයට අපි අද මුහුණ දෙමින් සිටිනවා. මා දන්නේ නැහැ, මේ සභාවේ සිටින සියලුදෙනාට සහ එළියේ ඉන්න අයට මේ අර්බුදයේ බරපතළකම, එහි දිග පළල පිළිබඳව නිවැරැදි අවබෝධයක් තිබෙනවාද කියලා. ගරු කථානායකතුමනි, අපි අද කථා කරනවා ගෑස් හිඟයක් පිළිබඳව; අපි අද කථා කරනවා බෙහෙත් හිඟයක් පිළිබඳව; අපි අද කථා කරනවා පැය 3ක්, පැය 4ක් විදුලිය කැපීම පිළිබඳව. මේ හැම දෙයක්ම නිසි පරිදි කළමනාකරණය කර ගන්න ඕනෑ. මක් නිසාද, මේ භාණ්ඩ හා සේවා සම්පූර්ණයෙන්ම නැති වන භයානක තත්ත්වයක් ආසන්නයේයි අප සිටින්නේ. මේ පිළිබඳව එකිනෙකා විවිධ අයට ඇඟිල්ල දිගු කරමින් සිටිනවා. ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී අපි දැන ගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මේ උවදුරෙන් මිදීම සඳහා කටයුතු කිරීම අපේ ජාතික වග කීමක්. පක්ෂ, පාට ලෙස බෙදී සටන් කරනවාට වඩා, කඩා වැටෙමින් තිබෙන මේ ආර්ථිකය යම් ප්‍රමාණයකින් හෝ නඟා සිටුවා යළි එය ප්‍රකෘති කර ගැනීම සඳහා අපට ජාතික වග කීමක් තිබෙනවා. ප්‍රධාන වශයෙන් කියනවා නම්, දකුණු කොරියාව වාගේ, එහෙම නැත්නම් 1990-1991 වර්ෂවල ඉන්දියාව කළා වාගේ අපි මේ ආර්ථික අර්බුදය ආශීර්වාදයක් කර ගන්නවාද, එහෙම නැත්නම් මේ ආර්ථිකය වැරැදි මඟකට යොමු කරලා වෙනිසියුලාව වාගේ, ලෙබනනය වාගේ මීට වඩා බරපතළ තත්ත්වයකට රට ගෙන යනවාද කියන ප්‍රශ්නය අද අප ඉදිරියේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මුලින්ම මම පෙන්වා දෙනවා, 2021 වර්ෂයේ අපට ලැබුණු සම්පූර්ණ ආදායම පිළිබඳ විස්තර. 2021 වර්ෂයේ රජයේ සමස්ත ආදායම රුපියල් ට්‍රිලියන එකයි, බිලියන 464යි. ඒ කියන්නේ, රුපියල් බිලියන 1,500ක් පමණ. එ්, grants හැටියට සහ tax හැටියට ලැබුණු ආදායම. ගරු කථානායකතුමනි, අපේ වියදම රුපියල් බිලියන 3,522යි. ඒ කියන්නේ, ආදායම වාගේ දෙකහමාර ගුණයක් වියදම් කරන්න අපට සිදු වෙලා තිබෙනවා. ඒ වියදමෙන් රුපියල් බිලියන 2,748ක් -දෙගුණයක් පමණ- පුනරාවර්තන වියදම් සඳහා විතරක් වැය කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ හැරුණු විට පසු ගිය අවුරුද්දේ තිබුණු තත්ත්වය අනුව අපට තවත් රුපියල් ට්‍රිලියනයක් ගෙවන්න සිදු වෙලා තිබුණා, interest හැටියට. මේ ගැන සරල උදාහරණයක් කියනවා නම්, ගෙදර මාසික ආදායම රුපියල් ලක්ෂයක් නම්, රුපියල් දෙලක්ෂ හතළිස්දහසක් වියදම් කරලා තිබෙනවා. ඒක අතිවිශාලයි. ඒකේ බරපතළකම තේරෙන්න ඕනෑ. ඒකෙන් මිදෙන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. මේක අවුරුද්දක්-දෙකක් ඇතුළත කරපු දෙයක් නොවෙයි, කාලයක් තිස්සේ කරපු දෙයක අවසන් ප්‍රතිඵලය. ඒක තේරුම් ගන්න එක ඉතාම වැදගත්. ඒ නිසා, මේ බදු ප්‍රතිපත්තියට තවදුරටත් ඉදිරියට යන්න පුළුවන්ද කියන විශාල අභියෝගය අප ඉදිරියේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, 1959 වර්ෂයේ සිට 2021 දක්වා කාලය තුළ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ලංකාවේ බදු ආදායම ශීඝ්‍ර ලෙස පහත වැටී තිබෙන ආකාරය දැක්වෙන ප්‍රස්තාරය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

1981, 1982, 1983 වර්ෂ වනවිට දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 25ක්, සියයට 24ක්, 23ක් පමණ මේ රටේ බදු ආදායම තිබුණා. කාලයක් තිස්සේ මේ සියලු ආණ්ඩු අතරේ ඒක පල්ලෙහාට පල්ලෙහාට, පල්ලෙහාට ගිහිල්ලා, -සියයට 17ට, සියයට 14ට, සියයට13ට, සියයට 11ට ගිහිල්ලා- අද වනකොට ඒ ප්‍රමාණය සියයට 8.7ක් දක්වා අඩු වෙලා තිබෙනවා. කිසිම රටක ආර්ථිකයකට, -සවුදි අරාබිය වැනි රටකට හැර, තෙල් නැත්නම්,- අවම වශයෙන් සමස්ත GDP එකෙන් සියයට 14ක, 15ක බදු ආදායමක් නැත්නම් පවතින්නට බැහැ. ඒක මොන ආණ්ඩුව ආවත්, මොන පක්ෂය ආවත් හඳුනා ගතයුතු සත්‍යයක්. මම හිතනවා, විපක්ෂයේ සිටින ආර්ථිකය පිළිබඳ උනන්දුවක් දක්වන, ඒ පිළිබඳ දැනුමක් තිබෙන අය මාත් එක්ක එකඟ වෙයි කියලා. දැනට අපට තිබෙන්නේ සියයට 8.1ක, 8.6ක පමණ බදු ආදායමක්. එම දත්ත දැක්වෙන ප්‍රස්තාරය මම සභාගත කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

පුනරාවර්තන වියදම් දිහා බැලුවාම, 2021 වර්ෂයේදී වැටුප්වලට විතරක් අපි රුපියල් බිලියන 845ක් වියදම් කර තිබෙනවා.

ඒ හැරුණාම pension, ආබාධිත සෙබළුන්ට දීමනා, free medicine, fertilizer subsidy, සමෘද්ධි, school uniforms, school textbooks, nutrition programmes කියන ඒ දේවලට විතරක් තව රුපියල් මිලියන 595ක් 2021 වර්ෂයේදී වියදම් කරලා තිබෙනවා. ඒ අනුව, ඒ සහනාධාරවලටත් මදි, අපි උපයා ගත්ත ආදායම. ඒ එක්ක බලනකොට මෙච්චර කල් -1952 ඉඳලා- නිදහස් ශ්‍රී ලංකාවේ අපි ණය අරගෙන තිබෙනවා. ඒ ණයවලට ගිය අවුරුද්දේ විතරක් අපි පොලිය හැටියට රුපියල් මිලියන 1,048ක් ගෙවලා තිබෙනවා. ඒ මුදල අතිවිශාල ප්‍රමාණයක්. ඒක තමයි සත්‍ය තත්ත්වය.

ඒ හැරුණාම මම විදේශ ණයවල තත්ත්වය පිළිබඳවත් මේ අවස්ථාවේ කරුණු ඉදිරිපත් කරනවා, ගරු කථානායකතුමනි. මේ ප්‍රස්තාරයේ දැක්වෙන රේඛාවට අනුව අපේ බදු ආදායම සියයට 24 සිට සියයට 8.6 දක්වා ක්‍රම ක්‍රමයෙන් අඩුවෙලා තිබෙනවා. ඒ තොරතුරු ඇතුළත් ප්‍රස්තාරය මම මීට කලින් සභාගත කළා, මේ කාරණය ඔබතුමන්ලා දැනගන්න ඕනෑ නිසා.

1954 අවුරුද්දේ තමයි පළමුවැනි වතාවට අපි විදේශ ණය අරගෙන තිබෙන්නේ. එතකොට විදේශ ණය අරගෙන තිබෙන්නේ රුපියල් බිලියන 0.06යි.

2019 වර්ෂයේදී තමයි අවසාන වශයෙන් අරගෙන තිබෙන්නේ, මේ ළඟදී ගත්ත එක හැරුණාම. එම ප්‍රමාණය බිලියන 542යි. 2020 වර්ෂයේදී සමස්ත ණය ගැනීම සෘණ අගයක්. ඒ කියන්නේ අපි වැඩියෙන් ගෙවලා තිබෙනවා. ණය අරගෙන නැහැ. ණය ගන්න අපට හැකියාවක් නැහැ. ඒ වෙනකොට අපේ ණය ගැනීමේ හැකියාව නැති වෙලා ගිහින් තිබෙනවා. 2021 වර්ෂයේදී අපි බිලියන 3ක් ගෙවලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කරන මේ ණය පිළිබඳ දත්ත ඇතුළත් වාර්තාව මා **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ ඔක්කෝම එකතු වෙලා තමයි අද මේ බිලියන 51ක ණය ප්‍රමාණය හැදිලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒකෙන් අපි පසුගිය කාලය තුළදී ගෙවන ලද මුදල පෙන්වා තිබෙනවා. ඒ අනුව 2015 වර්ෂයේදී බිලියන 2ක් පමණ, 2016 වර්ෂයේදී බිලියන 1.6කුත්, 2017දී බිලියන 2.1කුත්, 2018 වර්ෂයේදී බිලියන 3ක් පමණත්, 2019දී බිලියන හතරහමාරකුත්, 2020දී බිලියන හතරකුත්, 2021දී බිලියන හතරකුත් ගෙවලා තිබෙනවා. පසුගිය අවුරුදු දෙකේ ණය නොගත්තාට, ගත් ණයවල පොලිය සහ capital එක හැටියට බිලියන අටක් ආපසු ගෙවලා තිබෙනවා. එසේ ගෙවන ලද සම්පූර්ණ ගෙවීම් චක්‍රය සහිත දත්ත මම **සභාගත*** කරනවා. මේවා අනාගත පරපුර දැනගත යුතුයි.

ගරු කථානායකතුමනි, ඊළඟට මෙම දත්තවල concession loans කියලා රතු පාට රේඛාවෙන් පෙන්වා තිබෙන්නේ IMF එකෙන්, ADB එකෙන්, World Bank එකෙන් අඩු පොලියට ලබා ගත්ත ණය ප්‍රමාණය සමස්ත ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් හැටියට. මුලින් තිබී තිබෙන්නේ සියයට 57ක ණය ප්‍රතිශතයක්. කාලයක් තිස්සේ කෙටි කාලීන ණය අරගෙන තිබෙනවා, අධික පොලියට.

මේ සියලුදෙනාම ඒක කරලා තිබෙනවා. *[බාධා කිරීම්]* මම කථා කළාට පස්සේ උත්තර දෙන්න. ඒක තමයි මම කිව්වේ. කාටවත් ඇඟිල්ල දිගු කරන්න නොවෙයි මම මේ උත්සාහ කරන්නේ. මේ තත්ත්වය අපි තේරුම් ගන්නට ඕනෑ. හැමෝම ණය අරගෙන තිබෙනවා. ඒවා කියන්න ගියොත් නිකම් බාධා කරන එක විතරයි වෙන්නේ. මේ සියලුදෙනාම ණය අරගෙන තිබෙනවා. ඒ අනුව, වැඩි පොලියට ගත්ත ණය ප්‍රමාණය එන්න එන්න වැඩි වෙලා තිබෙනවා. මේක ජාතික ප්‍රශ්නයක්. අපි කියන්න හදන්නේ නැහැ, අපි වැරදි කළේ නැහැ කියලා. ඒක නොවෙයි මම කියන්න උත්සාහ කරන්නේ. අපි වග කියන්නේ මේ රටේ ජනතාවට. අපි මේ පෙනී ඉන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන්. කවුරුවත් ආරක්ෂා කරන්න මම උත්සාහ කරන්නේ නැහැ. මගේ වාර්තාව ලැබුණාම ඒ බව ඔබතුමන්ලාට දැනෙයි. එහි කිසි දෙයක් හංගලා නැහැ. බොරුවට පාට තවරපු හොඳ picture එකක් දෙන්න අපි උත්සාහ කරන්නේත් නැහැ. අපි ඉන්නේ කොතැනද කියන යථාර්ථය අපි තේරුම් ගන්නට ඕනෑ.

ඊයේ පෙරේදා වෙබ් අඩවියක කවුද කියලා තිබෙනවා මම දැක්කා, මාසයකින් මේ ප්‍රශ්නය විසඳනවා කියලා මම කිව්වාය කියලා. එහෙනම් මම පිස්සෙක් වෙන්න ඕනෑ. මාසයකින් තියා අවුරුදු දෙකකින්වත් අපට මේ ප්‍රශ්නවලට විසඳුමක් දෙන්න පුළුවන් වෙයිද කියලා මම දන්නේ නැහැ. අවුරුදු දෙකකින් විසඳුමක් දෙන්න පුළුවන්ද, නැත්නම් ඒ සඳහා අවුරුදු පහක්, දහයක් දක්වා ගත කරනවාද කියන වගකීම අපි සියලුදෙනා අතේ තියෙන්නේ. ඒක තමයි ඇත්ත කථාව. එක පාරටම කවුරු හරි ආපු ගමන් ඔක්කොම ප්‍රශ්නවලට විසඳුම් දෙනවා කියලා කවුරු හරි හිතනවා නම් ඒක වැරදියි. එහෙම වෙන්නේ නැහැ. ඉදිරියට යනකොට මම ඒ ගැන විස්තර කරන්නම්. නමුත් මේ ප්‍රශ්නවලට කෙටිකාලීනව විසඳුම් අරගෙන මේක හැරවුම් ලක්ෂ්‍යයක් කර ගන්නවාද, ඉන්දියාව 1990-1991දී ඉගෙන ගත්ත පාඩම් අපිත් ඉගෙන ගෙන ඒ හා සමානව අපි ආර්ථිකය ඉදිරියට අරගෙන යනවාද, නැත්නම් උද්ධච්ච ලෙස අපි ගැන විතරක් හිතලා, එකිනෙකාට ඇඟිල්ල දිගු කරගෙන මේ රට ලෙබනනයක්, වෙනිසියුලාවක් කරනවාද කියන එක පිළිබඳව මතු පරපුරට වගකීමේ ලොකු අවස්ථාවක් අපට තිබෙනවා කියලා මා හිතනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
This had arisen two years ago, Hon. Sabry.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
There is going to be a Debate. You can say that during the Debate.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Yes.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, 2019 වර්ෂය අවසානයේදී අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක සංචිතයක් තිබුණා. හැබැයි, 2015 වර්ෂයේදී සංචිතයත් ඊට සමානවම ඇමෙරිකානු ඩොලර් බිලියන 8යි. ඒ අවුරුදු හතරේදී සංචිතය ඩොලර් බිලියනයකින් අඩු වෙනවා. නමුත් ඒ කාලය තුළත් බිලියන 15ක් ණය වශයෙන් අරගෙන තිබෙනවා. ඒ හා සමානවම අපි බිලියන 10ක් විතර ගෙවලාත් තිබෙනවා. මම ඒකත් නැහැ කියන්නේ නැහැ. කාලයක් තිස්සේ ගත්ත ණය තමයි මේ ඩොලර් බිලියන 51ක් වෙලා තිබෙන්නේ. පසු ගිය අවුරුදු දෙක තුළ ණය කිසිවක් අරගෙන නැහැ. හැබැයි, අපි බිලියන අටක් ගෙවලා තිබෙනවා.

කථා දෙකක් නැහැ, මම මෙන්න මේ කාරණයට නම් එකඟ වෙනවා, ගරු කථානායකතුමනි. Tax rate එක වැඩි විය යුතු කාලයක අපි tax අඩු කළා. මම ඒක ඓතිහාසික වරදක් විධියට පිළිගන්නවා. *[බාධා කිරීමක්]* ප්‍රශ්නයක් නැහැ. මම ඒක පිළිගන්නවා. *[බාධා කිරීමක්]* ඒ වෙලාවේ මම හිටියේ නැහැ. *[බාධා කිරීමක්]* මම හිටියාද, නැද්ද කියන එක වැඩක් නැහැ. ඔබතුමන්ලාත් ඒ වාගේ දේවල් කළා. *[බාධා කිරීම්]* මට කථා කරන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]* අහගන්නකෝ. *[බාධා කිරීම්]* මට කථා කරන්න අවස්ථාව දෙන්න. අද මුළු දවසේම අපට මේ ගැන විවාද කරන්න පුළුවන්. මට මේ කරුණු ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න. 2015 වර්ෂයේදී රාජ්‍ය සේවක වැටුප රුපියල් 10,000කින් වැඩි කළා. ඒක නිසා රුපියල් බිලියන 180ක් වැඩියෙන් ගෙවන්න වුණා. නමුත්, ඒක ගෙවන්න පුළුවන් ක්‍රමයක් ගැන කවුරුවත් කිව්වේ නැහැ.

ඒ නිසා, හැමෝම එකතුවෙලා විඳගත්ත දේවල් තමයි මේ තිබෙන්නේ. ඒ නිසා මම,- *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. මේ සුබසාධන ප්‍රතිපත්ති කාලයක් තිස්සේ-*[බාධා කිරීම්]* යැපුම් මානසිකත්වය උඩ, මිනිසුන්ට බිලී පිත්තක් දෙනවා වෙනුවට මාළුවෙක් තමයි දීලා තිබෙන්නේ. ඒ ප්‍රතිපත්තියේ අවසාන ඵලයට තමයි අද අපි මේ ඇවිල්ලා ඉන්නේ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න *[බාධා කිරීම්]* අපට මේ සම්බන්ධයෙන් මුළු දවසේම විවාද කරන්න පුළුවන් නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමතිතුමාට බාධා කරන්න එපා. එතුමා වැදගත් ප්‍රකාශයක් කරන්නේ.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, මේ කාලයේ අපට විදේශ සංචිත අහිමි වීමට කරුණු කිහිපයක් බලපෑවා. ඉන් එක කාරණයක් තමයි,-

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Speaker, I need one clarification.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please, Hon. Sumanthiran! You all are going to have the whole day to debate this.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
මට කථා කරන්න ඉඩ දෙන්න. Later, you can speak. Otherwise, there would not be an end to this. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please stop disturbing the Hon. Minister. Let him make the Statement with peace of mind.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, 2019 වර්ෂය අවසාන වෙනකොට අපේ විදේශ සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන හතයි. ඒ වාගේම ද්‍රවශීලී සංචිතයෙන් පාවිච්චි කළ හැකි සංචිත ප්‍රමාණය මිලියන 50ක්වත් නැහැ. ඒක මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. හැබැයි, පසු ගිය අවුරුදු දෙකේ අපි බිලියන 8ක් ණය ගෙවලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ ඇරුණාම, ඩොලරය රුපියල් 203ට ආරක්ෂා කිරීම සඳහා ඩොලර් market එකට මුදා හැරලා තිබෙනවා.

අපි ණය ගෙවා තිබෙනවා. ඒ සියල්ල හේතුකොටගෙන අද ද්‍රවශීලීත්වය ඉතාම පහළට ගිහින් තිබෙනවා. ඒකට හේතු වූ කරුණු රාශියක් තිබෙනවා. එක කාරණයක් තමයි, අපි සියලු දෙනාම දන්නවා, 2018 වර්ෂය කියන්නේ මෙරට සංචාරක ව්‍යාපාරයෙන් ඉහළම ආදායමක් ගත්ත අවුරුද්ද බව. 2018දී අපට සංචාරක ව්‍යාපාරයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4.4ක පමණ ආදායමක් ලැබුණා. ඒක පසු ගිය අවුරුද්ද වනකොට මිලියන 200කට කඩා වැටුණා. අපි හැමෝම දන්නවා, කොවිඩ් වසංගතය හේතුකොටගෙන විශාල ප්‍රශ්න රාශියකට අපට මුහුණ දෙන්න සිද්ධ වුණු බව. ඒ ඇරුණාම ලෝකයේ අද වනකොට,- *[බාධා කිරීම්]* Please!

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Let him make the Statement. What is this nonsense! - *[Interruption]*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ඔබතුමන්ලා පොඩ්ඩක් අහගෙන ඉන්න.

ඒ ඇරුණාම ගරු කථානායකතුමනි, ඇමෙරිකානු ඩොලර් 40ට, 45ට තිබුණු බොර තෙල් බැරලය අද ඇමෙරිකානු ඩොලර් 107ක්, 108ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත් මේක තමයි ඇත්ත. අපි මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. පසුගිය අමාත්‍ය මණ්ඩලයේ හිටපු අයත් මෙතැන ඉන්නවා. අපේ පැත්තෙන් මම පිළිගන්නවා, IMF එකට මීට ඉස්සර අපට යන්න තිබුණා කියන එක. එහි කථා දෙකක් නැහැ. *[බාධා කිරීම්]* හරි, අපි පිළිගන්නවා. අපි නැහැ කියන්නේ නැහැ. *[බාධා කිරීම්]*

දෙවැනි කාරණය මේකයි. අපිට මීට ඉස්සෙල්ලා රුපියල ක්‍රම ක්‍රමයෙන් depreciate කරන්න තිබුණා.

*[බාධා කිරීමක්]* දැන් ඒක නොවෙයි නේ, කාරණය. මේකට පිළිතුර මොකක්ද කියලා සොයන එකයි දැන් අපි කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා. එහෙම නැතිව මෙතැන එක එක්කෙනාට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ කිසිම රජයක් තමන් ගත්ත විදේශ ණයවලින් හම්බ කරලා, invest කරලා, ඒ මුදල්වලින් ඒ ගත්ත ණය ගෙවලා නැහැ. තව ණයක් අරගෙන තමයි මුලින් ගත්ත ණය ගෙවලා තිබෙන්නේ. මේක තමයි මේ රට පාලනය කරපු හැමෝම කරලා තිබෙන්නේ. වඩා ලොකු ණයක් අරගෙන පොඩ්ඩක් ණය ගෙවලා, ඉතිරි ටික වැඩි කරලා තිබෙනවා. ඒ හේතුව නිසා තමයි අපේ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 51ක් දක්වා වැඩි වුණේ. එ් ගණන් හිලව් ඒ ආකාරයෙන්ම මා ළඟ තිබෙන මේ වගුවේ සඳහන් වෙනවා. මේ සියල්ල අපි ඉදිරිපත් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා අසත්‍ය කියන්නේ.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
මම අසත්‍ය කියන්නේ නැහැ. මේ කියන හැම වචනයකම වගකීම මම බාර ගන්නවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please, let him make the Statement.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, එ් අනුව බලද්දී අපි අපේ ප්‍රමාණයට වැඩිය කාලා තිබෙනවා. Credit cards අරගෙන, අවුරුදු 51ක් තිස්සේ එක credit card එකක් top-up වෙනකොට තව credit card එකක් අරගෙන, ඒ credit card එකෙන් පළමු credit card එකේ ණය ගෙවලා ජීවත් වෙනවා වාගෙයි අපි කටයුතු කරලා තිබෙන්නේ. අන්තිමේදී අපි දැන් CRIB එකට ගිහිල්ලා තිබෙන නිසා credit card එකෙන් මුදල් ගන්න බැහැ. ඒ වාගේ දෙයක් තමයි දැන් වෙලා තිබෙන්නේ. ඒ අනුව අපේ ණයවල sustainability එක නැහැ කියන නිසා, ඒ කියන්නේ ණය ගෙවීමේ හැකියාව නැති හින්දා, සාමාන්‍ය market එකෙන් නැවත ණය විධියට මුදල් ගන්න බැරිවෙලා තිබෙනවා. පසුගිය ආණ්ඩුවේ අවුරුදු 5 තුළත් බිලියන 15ක් ණය අරගෙන, බිලියන 11ක් ගෙවලා තිබෙනවා. අපි එක සතයක්වත් අරගෙන නැහැ; ඒකට

අපට හැකියාවකුත් නැහැ. ඉතිහාසයේ ඉඳලා මේ මහා ණය කන්දරාව ගොඩ ගැහුණේ කරුණු 3ක් උඩයි. මම මේක හය නැතිව කියනවා.

සියලු රජයන් යැපුම් මානසිකත්වය මත කටයුතු කර තිබෙනවා. මිනිසුන්ට බිලී පිත්තක් දෙනවා වෙනුවට මාළු කෑල්ලක් දීලා -ඒ වෙලාවේ සන්තෝෂම් ලබා දීලා- කාලයක් තිස්සේ ණය බරිත කරපු එකේ ප්‍රතිඵලය තමයි අද අපි මේ භුක්ති විඳින්නේ. ඒක පළමුවැනි කාරණය, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය තමයි අපේ පසුගිය අවුරුදු දෙක තුනක කාලය තුළත් ගත යුතුව තිබූ යම් යම් තීන්දු තීරණ නොගැනීම. ඒ වැරදි ප්‍රතිපත්ති මේ තත්ත්වයට උදව් කරලා තිබෙනවා. ඒ ගැන කථා දෙකක් නැහැ. මම මුලින් කියපු ආකාරයට, පසුගිය අවුරුදු දෙක තුන තුළ tax කැපීම, IMF එකට නොයෑම, ඩොලරය අල්ලාගෙන සිටීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කල්ගත වීම ආදිය නොකළ යුතුව තිබුණා. ඒක මේ රජය පැත්තෙන් සිද්ධ වුණු වරදක්. ඒ ස්වයං විවේචනය පිළිගන්න අපට අයිතියක් තිබෙනවා. අපට ඒකට ශක්තියත් තිබෙනවා, ගරු කථානායකතුමනි.

තුන්වැන්න තමයි, අපේ පාලනයෙන් තොර වුණු කොවිඩ් උවදුර සහ යුක්රේනයේ යුද්ධය. ලංකාව විතරක් නොවෙයි, ලෝකයේ හැම රටක්ම වාගේ මේ තත්ත්වයට මුහුණ දෙනවා. ගරු කථානායකතුමනි, වසර 50කට පසුව වැඩිම උද්ධමනය අද ඇමෙරිකාවෙන් වාර්තා වෙනවා. යුරෝපයේත් එහෙමයි. පාකිස්තානයත් මේකට මුහුණ දෙනවා; ඊජිප්තුවත් මුහුණ දෙනවා. නමුත්, ඔවුන්ට යම් සංචිත ප්‍රමාණයක් තිබුණා. හැබැයි, අපේ සංචිත අපි අහිමි කර ගෙන තිබෙනවා. මේක තමයි ඇත්ත කථාව. එම නිසා අපි මුලින්ම බලන්න ඕනෑ, කොහොමද ඉදිරියේදී මේකට මුහුණ දෙන්නේ කියලායි. අපි එකිනෙකාට බැණ ගත්තාය කියා ඩොලර් එනවාද? අපට ඩොලර් එන ක්‍රම කිහිපයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
උසාවියේදී වාගේ බොරු තර්ක ගෙනැල්ලා, බොරු කියලා හරියන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, අපට ඩොලර් හම්බ වෙන ක්‍රම කිහිපයයි තිබෙන්නේ. අපට ඩොලර් අච්චු ගහන්න බැහැ. මොකද, අපි ඇමෙරිකා එක්සත් ජනපදය නොවෙයි. අපට ඩොලර් හම්බ වෙන්න නම්, එක්කෝ සංචාරක ව්‍යාපාරය නැවත ගොඩ නැඟෙන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරයෙන් පසුගිය මාස තුන තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක පමණ ආදායමක් අපට ලැබුණා. නමුත්, මේ මාසය වන විට ඒක සියයට 47කින්, සියයට 50කින් අඩු වෙලා තිබෙනවා. ඒ, ඩොලර් හම්බ වෙන පළමුවැනි ක්‍රමය.

දෙවැන්න තමයි, විදේශ රටවලින් එන ප්‍රේෂණ. 2020 වර්ෂයේ දී අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 7.2ක ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබුණා. 2021 වර්ෂයේ දී එය ඩොලර් බිලියන 5.7ක් දක්වා අඩු වුණා. මේ වර්ෂයේදීවත් පක්ෂ, පාට භේදවලින් තොරව අප සියලු දෙනා එකතු වෙලා අපේ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලුවේ නැත්නම්, එම ප්‍රමාණය බිලියන තුනහමාරකට, තුනකට විතර පහළ යන්න ඉඩ තිබෙනවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඔබතුමන්ලා ඉන්න කල් ගෙවන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා, කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමතිතුමා වැදගත් කථාවක් කරන්නේ. *[බාධා කිරීම්]* එතුමා වැදගත් කථාවක් කරන්නේ. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා මේ සභාවේ ගෞරවය නැති කරනවා.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ඔබතුමන්ලා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුණාම ඇහුම්කන් දෙන්නත් පුරුදු වෙන්න ඕනෑ. ඒ විනීතභාවය තිබෙන්න ඕනෑ; discipline එකක් තිබෙන්න ඕනෑ. මිනිස්සු අපටත් බණිනවා. නමුත්, අපි කෑ ගහන්නේ නැහැ. අහගෙන ඉන්නවා. අහගෙන ඉඳලා, අපේ අවස්ථාව ආවාම අපි උත්තර දෙනවා. ඒකයි ශීලාචාරකම කියන්නේ. අපි උසාවියේදීත් ඒක දැකලා තිබෙනවා. *[බාධා කිරීම්]* අපි පනින්නේ නැහැ නේ. ඕනෑ දෙයක් කියන්නකෝ ඔබතුමන්ලාට නියමිත වෙලාව ආවාට පස්සේ. *[බාධා කිරීම්]* අප සියලු දෙනා දිහා බලාගෙන ඉන්නවා නේ, මේ රටේ මිනිස්සු. ඕනෑ දෙයක් කියන්න, ඔබතුමන්ලාගේ වෙලාවේ. අපි ඇහුම් කන් දෙන්නම්. *[බාධා කිරීම්]*

තුන්වැන්න තමයි, මේ පරිසරය තුළ අපි ආයෝජකයන් ගෙන්වා ගන්න ඕනෑ කියන එක. මේ තිබෙන තත්ත්වය තුළ රටට ආයෝජකයෝ එන්නේ නැහැ. හතරවැන්න තමයි, නැවත වතාවක් අපේ market access එක ලබා ගැනීම. ඒ කියන්නේ, අපේ ණය මුදල් ටික,- *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ මේවා මිනිසුන්ට තිබෙන ප්‍රශ්නවලට උත්තර ද කියලා. ගරු කථානායකතුමනි, අපි හැකි ඉක්මනින් මේ ණය ටික ප්‍රතිව්‍යුහගත කරලා යළි මුදල් වෙළෙඳ පොළට ගිහිල්ලා යම් ප්‍රමාණයක ණය ලබා ගැනීම සඳහා ද්‍රවශීලතාවක් ඇති කර ගන්නේ කොහොමද? අපි කෑ ගැහුවාට, මේ කාරණා හතර ඇරුණාම මේ ප්‍රශ්නයට වෙන කිසිම විධියකින් විසඳුම් නැහැ. ගරු කථානායකතුමනි, ඒ හින්දා තමයි අප මේ කියන්නේ. එය එසේ නම්, එය සිදු විය යුතු නම් එය සිදු කළ හැක්කේ කොහොමද කියන ප්‍රශ්නය තමයි අද මිනිසුන්ට තිබෙන්නේ. ඔළු ගෙඩි මාරු කරන එක ගැනවත් වෙනත් දෙයක් ගැනවත් නොවෙයි, ප්‍රශ්නය. ඒ හින්දායි මම ගරු විපක්ෂ නායකතුමාගෙන් සහ විපක්ෂයේ ඉන්න සියලු දෙනාගෙන්ම මේ ඉල්ලීම කරන්නේ. මම පෞද්ගලිකව විශ්වාස කරන දෙයක් තිබෙනවා. මම එදාත් කිව්වා, මම මේ කරන්නේ nightwatchman කෙනෙකුගේ job එක බව. ක්‍රිකට් සෙල්ලම් කරද්දී මුලින් wickets

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

යනකොට ඉදිරි පෙළ ආරක්ෂා කරගන්න පසුපෙළ ක්‍රීඩකයෙක් ඇවිල්ලා wicket එක බේරා ගන්න සෙල්ලම් කරනවා. මම මේ වෙලාවේ කරන්නේ ඒක. මම ආර්ථික විද්‍යාඥයෙක් නොවෙයි. මම ඒක එදාත් කිව්වා. මට පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් මගේ වැඩ ටික කරනවා. ආර්ථික විද්‍යාඥයෝ ඉන්නවා නම් එන්න. ඇවිල්ලා මේ ආණ්ඩුව භාර ගන්න. අපි දෙන්නම්. නමුත්, ගරු කථානායකතුමනි, මා හිතන ආකාරයට මේකට විසඳුම් සෙවීම සඳහා අපට,- *[බාධා කිරීමක්]* මම දැන් කියන්නම් IMF එක ඉදිරියේ සිද්ධ වෙච්ච සාකච්ඡාවල ප්‍රතිඵල. IMF එක ඉදිරියට යෑම සඳහා අපට ප්‍රධාන වශයෙන් කළ හැකි දේවල් කිහිපයක් තිබෙනවා. මේ ප්‍රශ්නවලට කෙටිකාලීනව විසඳුම් දෙන්නේ කොහොමද? මේ පෝලිම් ටික නැති කරන්නේ කොහොමද? මේ තිබෙන අර්බුදවලට ඉක්මනින් පිළිතුරු සොයන්නේ කොහොමද? අපි කොහොමද මේ අවුරුද්දට අවශ්‍ය bridging finance හොයා ගන්නේ? කොහොමද ඒ බිලියන තුනහතර හොයා ගන්නේ? දීර්ඝ කාලීනව, මේ රට නැවත වතාවක් සංවර්ධනයේ මාවතට යොමු කරන්නේ කොහොමද? IMF එකට ගියා කියලා ඒක ඇලඩීන්ගේ පුදුම පහන නොවෙයි නේ. ඒකෙන් අපට අවශ්‍ය ස්ථාවරත්වය ලැබෙයි. හැබැයි, අප ගත්තු මුදල් නැවත ගෙවන්න අපි හම්බ කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය පරිසරයයි සකසන්න ඕනෑ. ඒ නිසා මේ වෙනුවෙන් වහාම මධ්‍ය කාලීනව හා දීර්ඝ කාලීනව තිබෙන සැලසුම් මොනවාද කියන එක ගැන තමයි ලෝකය බලාගෙන ඉන්නේ.

ගරු කථානායකතුමනි, අපි ඉතා ඉක්මනින්ම IMF එකට යෑම සඳහා කටයුතු කළා. අපි වොෂින්ටනයට ගිහිල්ලා ඉතා සාර්ථකව ඒ සාකච්ඡා පැවැත්වූවා. ඒ ප්‍රකාශන ඒ ආයතන විසින් නිකුත් කරලා තිබෙනවා ඔබතුමන්ලා දකින්න ඇති. ඒ අනුව, පළමුවැනි පියවර හැටියට ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය උපදේශකවරුන් සහ නීති උපදේශකවරුන් පත් කර ගැනීම සඳහා අපි කටයුතු කරමින් සිටිනවා.

මම බලාපොරොත්තු වෙනවා, ඊළඟ කැබිනට් රැස්වීම් දිනට හෝ වැඩිම වුණොත් තව සතියකින්, -ලබන සඳුදා නොවෙයි, ඊළඟ සඳුදා වන කොට- අපට ඔවුන් පත් කර ගන්න පුළුවන් වෙයි කියලා. ගරු කථානායකතුමනි, ඔවුන් පත් කර ගත්තාට පස්සේ ඔවුන් එක්ක සාකච්ඡා කරලා මේ ණය ප්‍රතිව්‍යුහගත කර ගන්න අපට හැකියාව ලැබුණොත්, අපට නැවතත් market access ලබා ගැනීමට -අවම වශයෙන් IMF එකෙන් මුදලක් ලබා ගැනීමට- හැකියාවක් ලැබෙයි කියලා මම විශ්වාස කරනවා.

චීන තානාපතිතුමා මුලින් කියා තිබුණා, අපි IMF එකට යෑම පිළිබඳව ඔවුන් එච්චර සන්තෝෂ නැහැ කියලා. නමුත්, පෙරේදා මම ඔවුන් සමඟ පැය එකහමාරක් තිස්සේ සාකච්ඡා කළා. ඉන් පසුව ඔවුන් ප්‍රකාශ කළා, චීනය IMF එකේ ප්‍රධාන කොටස්කාරයෙක් හැටියට, IMF එකේ අපේ සම්පූර්ණ සාකච්ඡාවලට පූර්ණ සහයෝගය ලබා දෙනවා කියලා. මම හිතනවා, එය අප ලබාගත් ලොකු ජයග්‍රහණයක් කියලා. IMF එකට ගිහිල්ලා සාකච්ඡා කරන අතරතුරදී මේ ණය ටික ප්‍රතිව්‍යුහගත කරගන්න අපට පුළුවන් වුණොත්, අපට හැකි වේවි, මේ සම්බන්ධයෙන් යම් සාර්ථක පිළිතුරක් ලබා ගන්න.

ගරු කථානායකතුමනි, ණය ප්‍රතිව්‍යුහගත කිරීම කියන්නේ මොකක්ද? එහි උපාංග තුනක් තිබෙනවා. එකක් තමයි, මුළු මුදල අඩු කර ගන්නේ කොහොමද කියන එක. ඊළඟ එක තමයි, interest එක අඩු කර ගන්නේ කොහොමද කියන එක සහ කල්පිරෙන කාලය - maturity period එක - වැඩි කර ගන්නේ කොහොමද කියන එක. එහෙම නැත්නම්, මේ උපාංග තුනේම සංකලනයක්. මේ උපාංග තුන ඇති කර ගැනීම සඳහා මහ බැංකුවේ අධිපතිතුමා සහ භාණ්ඩාගාරයේ නව ලේකම්තුමා ඇතුළු වෙනම professional කණ්ඩායමක් කටයුතු කරගෙන යනවා. දේශපාලනඥයන් වශයෙන් අපි ඒකට මැදිහත් වෙන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි අවශ්‍ය උපදෙස් ලබා දීලා, ඒ කටයුත්ත වෙනම professional team එකකට භාර දීලා, ඒක professionally handle කිරීම සඳහා කටයුතු කරගෙන යනවා. ඒ අතරතුර අපට හැකියාව ලැබුණා, කෙටි කාලීනව මේ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා කටයුතු කරන්න. මේ වන විට ඉන්දියාව අපට තෙල් ගන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් වටිනා credit line එකක් ලබා දීලා තිබෙනවා. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් අපි වියදම් කරලා ඉවරයි. තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් විතර ඉතිරිව තිබෙනවා. ඒ හැරුණාම අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම සඳහා ඩොලර් බිලියනයක credit line එකක් ලබා දීලා තිබෙනවා. ඒ credit line එකෙනුත් තව ඩොලර් මිලියන 200ක් අපට fuel සඳහා ලබා දීලා තිබෙනවා. අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක ප්‍රමාණයක් දෙන්න කියලා තව ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ අනුව ජූනි අවසන් වන තෙක් වාගේ තෙල් ටික සපයා ගැනීම සඳහා අපි උත්සාහ කරමින් ඉන්නවා. ඒක තමයි පොළොවේ තත්ත්වය. ඊට පසුව, එය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා. ගැටලුවක් නැහැ කියන්නට බැහැ. ඒ ලොකු අවදානම අප හැම දෙනාම ඉදිරියේ තිබෙනවා. ඒ අවදානම අඩු කර ගන්නේ කොහොමද කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය.

ඊළඟට තුන්වැන්න. දීර්ඝ වශයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට යෑමෙන් පසුව අපි බලාපොරොත්තු වෙනවා, IMF එක හරහා අපට ලැබෙන ආධාර ටික අප ඉක්මනට ලබා ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් කටයුතු කරන්න. එය ලබා ගැනීම සඳහා කොච්චර කල් ගත වෙයි ද කියලා මට හරියටම කියන්නට බැහැ.

හැබැයි, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, අපි කරන සාකච්ඡාවල ප්‍රතිඵල යන සියල්ල අවසානයේ තමයි මේ ආධාර ලැබෙන්නේ. එහෙම නැතිව, ඉතා ඉක්මනින් ලැබෙන්නේ නැහැ. මම හිතනවා, අපට ප්‍රායෝගිකව ඒ programme එකට enter වෙන්න අවම වශයෙන් මාස හයක්වත් ගතවෙයි කියලා. ඒ අතරතුරදී අපි emergency loan එකක්, ඒ කියන්නේ RFI එකක් ඉල්ලා තිබෙනවා. අපට ඒකට ඉන්දියාව ගොඩක් උදව් කළා. මම වොෂින්ටනයේ ඉන්නකොට ඉන්දියාවේ ගරු මුදල් අමාත්‍යතුමිය දෙවතාවක් මුණ ගැසුණා. ඔවුන්ගේ පැත්තෙනුත් අපට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. ඉදිරියේ දී ඒක අපට ලැබෙනවාද, නැද්ද කියන එක තීරණය කරන්නේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී අපි විසින් දක්වන ප්‍රගතිය අනුවයි. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ අතරතුර, මේ අවුරුද්දට අවශ්‍ය ඩොලර් බිලියන තුන, හතර දක්වා වූ bridging finance එක ලබා ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපි දැන් විවිධ රටවල් සමඟ සාකච්ඡා කරගෙන යනවා. ඒ හැර වහාම ක්‍රියාත්මක වන පරිදි ලෝක බැංකුව විසින් මානුෂික ආධාර වශයෙන් අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් release කරන්නට එකඟ වෙලා තිබෙනවා. ඒක ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් දක්වා වැඩි කර ගන්න අපි සාකච්ඡා කරගෙන යනවා. අපට ඒක ලැබෙයි කියලා මම හිතනවා. ඒ අනුව අපි මේ මැයි මාසයේ සිට මාස තුනක කාලයක් සඳහා අවම වශයෙන් මාසිකව රුපියල් 7,500ක පමණ මුදලක් මේ රටේ දරිද්‍රතාවෙන් පීඩා විඳින මිලියන 3.3ක් වන පවුල්වලට දැන් තිබෙන ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ලබා දෙන්න කටයුතු කරනවා. මෙය විසඳුමක් නොවෙයි. නමුත්, මේ තිබෙන දරිද්‍රතාවෙන් ඔවුන් බේරා ගන්න ඕනෑ. ඒ සඳහා අපි කටයුතු කරගෙන යනවා.

ඊළඟට, බෙහෙත් ටික ගන්න මුදල් සොයා ගැනීම සඳහා අපි ADB එකට කථා කරලා තිබෙනවා. ඒ වාගේම ලෝක බැංකුව

එක්කත් කථා කරලා තිබෙනවා; Indian Credit Line එකත් එක්ක කථා කර තිබෙනවා. සෞඛ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අපි එතුමා එක්ක සාකච්ඡා කරලා ඊළඟ මාස නවයට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. හැබැයි, මේවා ඉතාම කෙටි කාලීන විසඳුම් විතරයි. එම නිසා IMF සාකච්ඡා ඉදිරියට යනකොට, - IMF එක කිව්වත්, නැතත් අපට දෙපයින් නැඟී සිටින්න ක්‍රමවේදයක් හදන්න සිදු වෙනවා. යැපුම් මානසිකත්වය මත අපට හැම දාම සුබසාධන ආර්ථිකයක් පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා අපි කෙටි කාලීනව අවශ්‍ය පියවර ගැනීමට උත්සාහ කරනවා. 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය තවදුරටත් යථාර්ථවත් නැහැ. එය යථාර්ථවත් නැති නිසා අපි ඉක්මනින්ම අලුත් අය වැයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් අපට ආදායම් බදු වැඩි කරන්න සිද්ධ වෙනවා. මම හිතන විධියට, සල්ලි හම්බ කරන මිනිසුන් සල්ලි ටිකක් බෙදා ගන්න ඕනෑ. නැත්නම් වෙන්නේ සම්පූර්ණ සමාජයම කඩා වැටීමයි. ඒ නිසා මම හිතන විධියට, ආදායම් උපයන සියලුදෙනා; අපි සියලුදෙනා අනෙක් අයට lectures දෙන්න ඉස්සෙල්ලා තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා විමසා බලන්න ඕනෑ, "මේ රට පවත්වා ගෙන යන්න මම ආදායම් බදු ගෙවනවාද?" කියලා.

නීතිඥවරුන් හැටියට, වෛද්‍යවරුන් හැටියට, ව්‍යාපාරිකයන් හැටියට, එහෙම නැත්නම් මේ රටේ ප්‍රජාව හැටියට හැම දෙනාම බලන්න ඕනෑ, තමන්ගේ යුතුකම් තමන් ඉෂ්ට කරනවාද, තමන්ගේ කොටස තමන් ගෙවනවාද කියලා. අපි ආදායම වැඩි කර ගන්න ඕනෑ. ආදායම වැඩි කරලා බදු ආදායම සියයට 15කට වාගේ වැඩි කර ගන්න අපට සිද්ධ වනවා, ඊළඟ වසර දෙක, තුන ඇතුළත. නැත්නම් ඉතින් කවුරු ආවත් කරන්න දෙයක් නැහැ, තව තවත් ණය අරගෙන ඊළඟ පරම්පරාවට දෙන්න තමයි වෙන්නේ. ඒ හැරුණාම අපට සිද්ධ වනවා, IMF එකත් එක්ක එකතු වෙලා ඒ අවශ්‍ය ප්‍රතිසංස්කරණ රාශිය කරන්න. මේක හොඳ අවස්ථාවක් කියා මම හිතනවා. කවුරු මොනවා කිව්වත්, කවුරු ලොකු කථා කිව්වත්, රොනී ද මැල් මහතාගෙන් පසු පාර්ලිමේන්තුවට ඇවිල්ලා මුදල් ඇමතිවරයා කියෙව්වේ භාණ්ඩාගාරයේ සිටින නිලධාරින් ලියා දෙන අය වැයක්. ඒක දන්නා අය දන්නවා. ඒ සංස්කෘතිය නැති කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට වැඩි මූල්‍ය බලයක් ලැබෙන්න ඕනෑ. යම් යම් ප්‍රමාණවලින් එළියට යන්නේ නැතිව එය සිදු කළ යුතුයි. අපි දන්නවා, හැමෝම පිළිගන්නා දක්ෂ නිලධාරියෙකු ප්‍රථම වතාවට දැන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා හැටියට පත් කර තිබෙන බව. මම ඊයේ ලෝක බැංකුව එක්කත් කථා කළා. ලංකාවේ දක්ෂ ආර්ථික විද්‍යාඥයකු උපදේශකවරයෙකු හැටියට පත් කර තිබෙනවා. ඒ, ආර්ථිකය පිළිබඳව දිගු කාලීනව කල්පනා කර බලා තීරණ ගත යුතු නිසා. නැත්නම් උදේ ඉඳලා හවස් වෙනකම් අපි ඩොලර් ටික හොයා ගන්නේ කොහොමද , පඩි ගෙවන්නේ කොහොමද, මුදල් අලුතින් print කරනවාද, නැද්ද කියන කරුණුවලට විතරක් හිර වුණොත් දිගු කාලීනව ආර්ථිකය පිළිබඳව තිබෙන දැක්ම එහෙම පිටින්ම කඩා වැටෙනවා. ඒක වළක්වා ගැනීම සඳහා අපි ඒ දේ කරලා තිබෙනවා.

ඊළඟට, UNDP එකත් එක්ක කථා කරලා අමාත්‍යවරයාට - අමාත්‍යවරයා කවුරු වුණත් කමක් නැහැ. - ආර්ථික විද්‍යාව පිළිබඳව උපදෙස් දීමට research and analysis unit එකක් ඇති කර ගැනීමට මේ කෙටි කාලය තුළ මට පුළුවන් වුණා. ඒ තුළින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරින්, භාණ්ඩාගාරයේ නිලධාරින්, ආර්ථික විශේෂඥයන් පත් කරලා, අනිකුත් රටවල සිද්ධ වෙච්ච දේවල් අධ්‍යයනය කරලා ඒ දත්ත මත, තොරතුරු මත තීන්දු, තීරණ ගැනීම සඳහාත්, දැනට සිටින මුදල් ඇමතිවරයාට උපදෙස් දීම සඳහාත් අවශ්‍ය වෙනම unit එකක් හදන්න අපි කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව, අනෙකුත් රටවල වාගේ අපි සියලුදෙනාම එකතුවෙලා අවුරුදු 10ක blueprint එකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා, UNDP එකත් එක්ක එකතුවෙලා; සිටියත්, නොසිටියත්. ඒ පිළිබඳව සාකච්ඡා කරලා, ඒ සඳහා විපක්ෂයේත් අදහස් ලබාගෙන, එකඟතාවෙන් යුතුව අපට ඉදිරියට යන්න පුළුවන් නම්, ලේකම්වරුන් මාරු වුණාට, අමාත්‍යවරුන් මාරු වුණාට, ආණ්ඩු මාරු වුණාට නොවෙනස් වන දීර්ඝ කාලීන ප්‍රතිපත්තියක් සකස් කර ගැනීමට අපට හැකියාව ලැබෙනවා. ඒ තැනට යන්න අපි උත්සාහ කරනවා.

ගරු කථානායකතුමනි, මෙන්න මේ කාරණය මම නැවත වතාවක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. රටවල් රාශියක් මෙවැනි ආර්ථික අර්බුදවලට මුහුණ දීලා තිබෙනවා. අපි සියලුදෙනාම දන්නවා, දකුණු කොරියාවට සිද්ධ වුණේ මොකක්ද කියලා. 1997 දී, ASEAN Region එකේ සිදු වුණු මහා කඩා වැටීමේදී, දකුණු කොරියාවේ, මැලේසියාවේ, තායිලන්තයේ, ඉන්දුනීසියාවේ ආර්ථිකය පහළටම වැටී තිබුණා. නමුත් ඔවුන් හැම දෙයක්ම කළමනාකරණය කරගෙන, ඊට වඩා ශක්තිමත්ව ඉදිරියට එන්න කටයුතු කළා. ඒ හා සමාන තත්ත්වයක තමයි ඉන්දියාව තිබුණේත්. 1990-1991 කාලයේ ඉන්දියාවේ මහා ආර්ථික අර්බුදයක් තිබුණා. ගරු කථානායකතුමනි, ඔවුන්ට import කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන දෙකයි තිබුණේ. ප්‍රායෝගිකව, භූමියේ රත්‍රන් ටික අරගෙන ගිහින් එංගලන්තයේ තිබෙන ඉන්දියානු බැංකු ශාඛාවක ඒවා තැන්පත් කරන්න ඔවුන්ට සිද්ධ වුණා. නමුත් සියලු කටයුතු නිසි පරිදි කළමනාකරණය කරගෙන අද ලෝකයේ බලවත්ම ආර්ථිකයක් තිබෙන රටක් බවට ඔවුන් පත්වෙලා තිබෙනවා. මේ වනකොට ඔවුන්ගේ reserve එක ඩොලර් බිලියන දෙකේ සිට ඩොලර් බිලියන අටසිය ගණනක් දක්වා ශක්තිමත්වෙලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අපිත් මේ සියල්ල කළමනාකරණය කර ගත යුතුයි. එහෙම කර ගත්තේ නැත්නම්, තව මාස දෙක තුනක් යනකොට අපට විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න සිද්ධවෙයි කියලා මට හිතෙනවා. අපි ඉන්නේ ආර්ථික අර්බුදයේ එළිපත්තේ. මෙයට කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වශයෙන් නිසි විසඳුම් ලබා නොදුන්නොත්, අපට දේශපාලනය කරන්න රටක් ඉතුරු වන්නේ නැහැ. එළියේ සිටින ජනතාවට අදාළ නැහැ, පවතින ආණ්ඩුව "X" ද , "Y" ද කියන එක. ඔවුන්ට ඕනෑ, තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමයි. *[බාධා කිරීමක්]* ඉන්න. *[බාධා කිරීමක්]* අනිවාර්යයෙන්ම. මේ අවස්ථාවේ මතු වී තිබෙන මේ ආර්ථික අර්බුදයේ වගකීම පවතින රජය විසින් භාර ගත යුතුයි.

මේ ආණ්ඩුවට ඒ වගකීමෙන් පිටතට දුවන්න බැහැ. නමුත් අපි එක දෙයක් මතක තියා ගන්න ඕනෑ. මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා නොදුන්නොත්, අනෙක් අයටත් හැරිලා එන්න කෙටි කාලයයි යන්නේ. ඒ නිසා ඩොලර් එන ක්‍රම මොනවාද කියලා අධ්‍යයනය කරලා, ඩොලර් නැවත ලබා ගැනීමට අපි කටයුතු කරන්න ඕනෑ.

අද විවිධ අය නොයෙක් දේවල් කියනවා. මේක ආර්ථික අර්බුදයක්. ආර්ථික අර්බුදය විසින් දේශපාලන අර්බුදයක් නිර්මාණය කරලා තිබෙනවා. මේ දේශපාලන අර්බුදය නිම කිරීම ඉතා වැදගත්. දේශපාලන අර්බුදය නිම කළොත් තමයි ආර්ථික ආර්බුදයට විසඳුම් ලබා ගන්න පුළුවන් වෙන්නේ. හැබැයි, නිසි කළමනාකරණයකින් තොරව කටයුතු කළොත්, දේශපාලන අර්බුදය නිම කළා වුණත් භූමියේ පවතින ආර්ථික අර්බුදවලට විසඳුම් ලැබෙන්නේ නැති බව අප දැන ගන්න ඕනෑ. මේ දේශපාලන අර්බුදය හෙට අවසන් වෙන්න පුළුවන්. නමුත්, තෙල් ටික ගෙන්වා ගන්නේ කොහොමද, තිරිඟු ටික ගෙන්වා ගන්නේ කොහොමද, ගෑස් ටික ගෙන්වා ගන්නේ කොහොමද, medicines ටික ගෙන්වා ගන්නේ කොහොමද කියන ප්‍රශ්න තමයි ජනතාවගේ පැත්තෙන් තිබෙන්නේ. අප අතර මොන මතිමතාන්තර තිබුණත්

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

මේ වෙලාවේ අප සියලුදෙනාටම වටින්නේ ශ්‍රී ලංකාව, මේ රටේ අනාගතය සහ මේ රටේ අනාගත පරපුරයි කියා මා හිතනවා. අපි එකිනෙකාට මඩ ගසා ගනිමු. ඔබ කියනවා, අප වැඩියෙන් වග කියන්න ඕනෑ කියලා. මා කියනවා, "නැහැ, ඔබ තමයි වැඩියෙන් වග කියන්න ඕනෑ." කියලා. නැවත ඔබ කියනවා, "නැහැ, ඔබ තමයි වැඩියෙන් වග කියන්න ඕනෑ." කියලා. ඒ ඔක්කොම කමක් නැහැ කියමුකෝ. නමුත් අපි කොහොමද මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා ගන්නේ? ඒ නිසා තට්ටු මාරු වුණාට කවදාවත් මාරු නොවන දීර්ඝ කාලීන ආර්ථික ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම සඳහා අපි මේ අර්බුදය වෙස් වළා ගත් ආශිර්වාදයක් කර ගත යුතුයි කියන තැන මා ඉන්නවා.

ගරු කථානායකතුමනි, මම මේ බොරුවට කියනවා නොවෙයි. මම දැක්කා, විවිධ අය විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, ශ්‍රී ලංකා නීතිඥ සංගමයත් ඉතාම හොඳ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන බව. ඔවුන් කියා තිබෙනවා, මාස දහඅටක කාලයකට සියලුදෙනා එකතු වෙලා මේ ආර්ථික අර්බුදයෙන් රට එළියට ගන්න, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරලා, තවත් වැඩි දියුණු කිරීම් කරලා නැවත දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න කියලා. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කවුද ඒක ගෙනාවේ? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please!

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගෙනාවා තමයි, ඉතින්. එහෙම නම්, විධායක ජනාධිපති ක්‍රමය ගෙනාවේ කවුද? *[බාධා කිරීම්]* විධායක ජනාධිපති ක්‍රමය ගෙනාවේ කවුද? අපිද? *[බාධා කිරීම්]* වැඩකට නැති කථා නේ, කියන්නේ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, නීතිඥ සංගමය ඉතා පැහැදිලිව කියා තිබෙනවා, මාස 18ක කාලයකට පොදු ආණ්ඩුවකට යන්න, minimum programme එකකට එකතු වෙන්න, මේ ප්‍රශ්නවලට විසඳුම් හොයන්න, ඊට පසුව සති පහක භාරකාර ආණ්ඩුවක් යටතේ ඡන්දය තියලා, මේ රටේ වැඩිදෙනාගේ කැමැත්ත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා පාර්ලිමේන්තු ක්‍රමයට යාම නම්, ඒක කරන්න කියලා. ඒ යෝජනාව ඔවුන් ඉදිරිපත් කර තිබෙනවා.

මම හිතන විධියට ඒක ඉතා හොඳ යෝජනාවක්. එය පදනම් කරගෙන සාකච්ඡාවක් ආරම්භ කිරීම සුදුසුයි කියා මේ වෙලාවේදී මා ප්‍රකාශ කරනවා. මම හිතන විධියට කිසිම ආණ්ඩුවකට මෙයට තනිවම විසඳුම් සොයන්නට බැහැ. ඔබතුමන්ලා මේ ප්‍රශ්නයේදී "Go home, Gota!" කියමින් දේශපාලන වාසි ලබා ගන්න උත්සාහ කරනවා. හෙට ඔබතුමන්ලා ආණ්ඩුව ලබා ගත්තොත්, ඒ එන නායකයාටත් "Go home!" කියමින් පාරට බහීවි. මෙය, මේ ප්‍රශ්නවලට විසඳුමක් නොවෙයි. මේ වෙලාවේ මිනිස්සු ඉල්ලන්නේ ඒ විසඳුම නොවෙයි. මම ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නය දිහා ඊට වඩා එහාට ගිහින් බලන්න කියලා. මගේ මේ ආසනය, මගේ Ministry එක විතරක් නොවෙයි, මගේ මන්ත්‍රී ධුරයත් මම දෙන්නම් ඔබ යෝජනා කරන දක්ෂ කෙනෙකුට, මේක කරන්න පුළුවන් නම්. නීතිඥ සංගමය කියනවා, හොඳ 15දෙනෙක් තෝරාගෙන මාස 18කට මේ ආණ්ඩුව කරන්න දෙන්න කියලා. ඒ 15දෙනා තෝරා ගන්නකොට හොඳ අය තෝරා ගන්න. එතකොට මුලින්ම මම මේ පාර්ලිමේන්තුවෙන් ගිහිල්ලා මගේ seat එක දෙන්නම්. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, මේ දේශපාලන අර්බුදය ඉක්මනට විසඳාගෙන, මහ පොළොවේ තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සඳහා අපි සියලුදෙනාම එක්ව කටයුතු කළ යුතුයි කියන එකයි අපට දැන් මේ තත්ත්වය තුළින් පෙනෙන්නේ. මේ ඇති වෙලා තිබෙන තත්ත්වය වෙස් වළා ගත් ආශිර්වාදයක් කරගෙන, යළිත් වතාවක් මේ රට නිවැරදි මාවතකට යොමු කිරීම සඳහා කැප වෙලා වැඩ කටයුතු කරන්න කියා සියලු දෙනාගේම මා ඉල්ලා සිටිනවා.

අපි ඉදිරිපත් කර තිබෙන ලංකාවේ Fiscal Report එක, මගේ කථාවේ සාරාංශය, IMF එකේ සාකච්ඡා කළ දේවල් සම්බන්ධ වාර්තාව තව සුළු මොහොතකින් ඔබතුමන්ලාට බෙදලා දෙනවා. අපි කිසිම දෙයක් සඟවන්නේ නැහැ. ජනතාවට ඇත්ත ඇති සැටියෙන් දැන ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා; ඔවුන්ට ඒ අයිතිය තිබෙනවා. ඒ අයිතිය අපි ලබා දෙනවා. *[බාධා කිරීමක්]* අවුරුදු 70ක් තිස්සේ හැමෝම හැංගුවා. *[බාධා කිරීමක්]* අවසාන වශයෙන්, වත්මන් තත්ත්වය වෙස් වළා ගත් ආශිර්වාදයක් කරගෙන කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, න්‍යාය පත්‍රයේ ප්‍රධාන යෝජනා හතර අවසන් කර ගන්න මට විනාඩි හතරක් දෙන්න.

ගරු සභානායකතුමනි, යෝජනා ටික ඉදිරිපත් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - அரச சேவை, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, පළමුකොටම, මුදල් අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා, අද රටේ පවතින මූල්‍ය හා ආර්ථික අර්බුදය පිළිබඳ ඉතාම සාධාරණ හා සත්‍ය කරුණු පාර්ලිමේන්තුවට හෙළිදරව් කිරීම හා ඒ සම්බන්ධව කරන ලද සාකච්ඡා පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව හමුවේ තැබීම පිළිබඳව. ඒ සියලු දේ වෙනුවෙන් එතුමාට යළිත් වරක් අපි හැමෝම ස්තුතිවන්ත වනවා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order 8 of the Parliament and the motion agreed to by Parliament on 19th January, 2022, the hours of Sitting of Parliament on this day shall be 10.00 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 5.30 p.m.. At 5.30 p.m., Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
## அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEES

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I move,

"That in terms of the provisions of Standing Order 112 (1) of Parliament and the decision taken on 28th April, 2022 by the Committee of Selection, Ministerial Consultative Committee on Samurdhi Development be appointed to be designated, in addition to the thirty-two (32) Ministerial Consultative Committees approved by the Parliament on 21st January, 2022.

Above Ministerial Consultative Committee shall consists of the Cabinet Minister in charge of the relevant subject as the Chair, State Minister, Deputy Minister and Five (5) other Members of Parliament to be nominated by the Committee of Selection to discuss and report upon such matters as are referred to it.

The quorum of the above Ministerial Consultative Committee shall be three (3) Members."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I move,

"That notwithstanding the Resolution adopted by Parliament on 21st January, 2022, the designation of the Ministerial Consultative Committee on Plantation shall be re-designated as "Ministerial Consultative Committee on Plantation Industries" as per the decision taken by the Committee of Selection on 28th April, 2022."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### III

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I move,

"That notwithstanding the Resolution adopted by Parliament on 21st January, 2022, the designation of the Ministerial Consultative Committee on Public Services, Provincial Councils and Local Government shall be re-designated as "Ministerial Consultative Committee on Public Administration, Home Affairs, Provincial Councils and Local Government" as per the decision taken by the Committee of Selection on 28th April, 2022."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වූ එකඟතා ගිවිසුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශ නිවේදනය පිළිබඳ සාකච්ඡාව
## சர்வதேச நாணய நிதியத்துடனான பேரம்பேசல் குறித்து மாண்புமிகு நிதி அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட கூற்று தொடர்பான கலந்துரையாடல்
## DISCUSSION ON THE MINISTERIAL STATEMENT OF THE MINISTER OF FINANCE REGARDING NEGOTIATIONS WITH THE INTERNATIONAL MONETARY FUND

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

[පූ.භා. 10.54]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ අදහස්වලට ප්‍රතිචාර දක්වන්න මූලිකව මටත්, ඉන් පසුව තිබෙන කාල වේලාව අනුව අපේ හර්ෂ ද සිල්වා මැතිතුමාටත් අවස්ථාව ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මම ඉල්ලීමක් කරනවා, අපේ ගරු අලි සබ්රි මුදල් අමාත්‍යතුමාගෙන්. ගරු ඇමතිතුමා, මම ඔබතුමාගේ කථාවට හොඳින් සවන් දුන්නා. මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, මේ අදහස්වලට හා යෝජනාවලට කරුණාකර සවන් දෙන්න කියලා. ඔබතුමා ප්‍රකාශ කළා, දැවැන්ත අර්බුදයක් පිළිබඳව. එහි දිග, පළල ගැන ඔබතුමා කථා කළා. එහි දිග, පළල වැඩියෙන්ම දැනිලා තිබෙන්නේ මේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාවටයි. ඇහිලි දිගු කරන්න එපා කියා ඔබතුමා කිව්වා. ඊළඟට ඔබතුමා ජාතික වගකීම ගැන කථා කළා; ප්‍රකෘති විසඳුමක් ගැන කථා කරමු කිව්වා. මම සතුටු වනවා, මාස තිහක් පැවති විකෘතිය ප්‍රකෘතියක් බවට පත් කරන්නට අඩු ගණනේ ඔබතුමා දැන්වත් ඉදිරිපත් වීම ගැන වාගේම ඒක පිළිගැනීම පිළිබඳවත්.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඔබතුමා කථා කළා, රටවල් ගණනාවක් ගැන. ගරු මුදල් අමාත්‍යතුමනි, මේ රටේ පුරවැසියෙකු හැටියට මට කනගාටුවෙන් වුණත් කියන්න සිද්ධ වෙනවා, මේ රට දැනටමත් වෙනිසියුලාවක්, ලෙබනනයක් බවට පත් කරලා හමාර බව. මේ රට බංකොලොත් රටක් බවට පත් කරලා හමාරයි. මේ බංකොලොත්භාවයට අපේ රට පත් වුණේ පසුගිය මාස තිහ තුළ ගත් වැරැදි තීන්දු තීරණ නිසායි. ඔබතුමාට බොහොම පැහැදිලිව මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. අද මේ රටට සාධාරණ බදු ප්‍රතිපත්තියක් ගෙන එන්න ඕනෑ කියන කොට එතුමන්ලා අත්පුඩි ගහනවා. හැබැයි, එතුමන්ලාම තමයි කෝටිපතියන්ට බිලියන 600ක බදු සහන ලබා දෙනකොටත් අත්පුඩි ගැහුවේ. මම දන්නේ නැහැ, එතුමන්ලාට මේවා තේරෙන්නේ නැද්ද කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට, රාජ්‍ය ආදායම බින්දුවටම බැස්සේ මේ අසාධාරණ බදු ප්‍රතිපත්තිය නිසා බව.

බලයට ඇවිල්ලා මාස දෙකක් ඇතුළත කරපු අමනෝඥ ක්‍රියාවලිය නිසා, පිස්සු ක්‍රියාවලිය නිසා, මෝඩ ක්‍රියාවලිය නිසා මොකක්ද සිද්ධ වුණේ? Fitch, Moody's සහ Standard & Poor's කියන ශ්‍රේණිගත කිරීමේ ආයතන අපේ රටේ ණය ශ්‍රේණිය පහළට දැම්මා. ඒ ගැන ප්‍රශ්න කරනකොට අජිත් නිවාඩ් කබ්රාල් කිව්වා, "මේවා ජාත්‍යන්තර කුමන්ත්‍රණ" කියලා. ගරු ඇමතිතුමනි, අපි ශ්‍රේණිගත කිරීම්වලින් පහළට වැටුණ නිසා තමයි ඔබතුමාත් ඔය කියන, ජාත්‍යන්තර ප්‍රාග්ධන මූල්‍ය වෙළෙඳ පොළට ගිහිල්ලා refinancing ගැනීමේ අවස්ථාව අපට අහිමි වුණේ.

ඔබතුමා දැන් ණයබරතාව ගැන ලොකුවට කථා කළා. GDP එකේ කොටසක් හැටියට ගත්තාම දළ වශයෙන් අපේ රටේ සියයට 119ක, සියයට 120ක ණයබරතා ප්‍රතිශතයක් තිබෙනවා. ඔබතුමා දන්නවාද, ජපානයේ එය සියයට 250යි කියලා? මේ ණයබරතාව තුළ, සුදු අලි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ නැතුව, එලක් නැති ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් හදන්නේ නැතුව ණය කළමනාකරණය හරියට කළා නම්, ඒ කියන්නේ ණය ටික අරගෙන ඒවා ප්‍රතිලාභ ලබන, ආදායම් ලබන, විදේශ විනිමය ලබන ව්‍යාපෘතිවලට යෙදෙව්වා නම් අද මෙහෙම වෙන්නේ නැහැ. ජාත්‍යන්තර වරායවල් හදන්න ගිනි පොලියට, commercial ratesවලට, ණය අරගෙන, බද්ධ ණය අරගෙන, tight loans අරගෙන, tight aid අරගෙන, export credits අරගෙන කරපු මහා විනාශය නිසා, ආදායමක් නොලැබෙන, ඩොලර් නොලැබෙන එවැනි ව්‍යාපෘති නිසා තමයි අපි මේ මහා වළේ වැටුණේ.

මම ඔබතුමාට දෙයක් කියන්න කැමැතියි. ඔබතුමා ලොකුවට කථා කළා, බිලී පිත්ත ගැන. ඒ බිලී පිත්ත පාවිච්චි කරලා අර 'පැන්ඩෝරා වළෙන්' හොරා කාපු සල්ලි ටික ගෙනාවොත්, ඒ ඩොලර් ටික ගෙනාවොත් මේ රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැද්ද? මම ඒ ගැන ඔබතුමාගෙන් අහන්න කැමැතියි. *[බාධා කිරීම්]* කෝටි ගණන් ඩොලර්, බිලියන ගණන් ඩොලර්, මේ රටට අහිමි වුණු දේශීය සම්පත, මේ රටට අහිමි වුණු විදේශ සංචිත ඇතුළු හොරා කාපු දේවල් පිළිබඳව අද ඕනෑ තරම් තොරතුරු තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, UN organizationsවලට කථා කරලා, World Bank එකේ organizationsවලට කථා කරලා කරුණාකර මේ රටට අහිමි වුණු ඩොලර් ටික ආපසු මේ රටට ගෙන එන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා. ඔබතුමා ඒක කරන්න. මේ රටේ තිබුණු ඩොලර් ටික ආපසු මේ රටට ගෙන්වා ගන්න. එතකොට එක එකා පස්සේ හිහාකන්න යන්න ඕනෑ නැහැ.

ඒ වාගේම මම ඔබතුමාට තව දෙයක් කියන්න කැමැතියි. ඔබතුමා කිව්වා, උද්ධච්ච වෙන්න එපා කියලා. කවුද උද්ධච්ච වුණේ මෙච්චර කල්? *[බාධා කිරීම්]* කවුද උද්ධච්ච වුණේ? *[බාධා කිරීම්]* කවුද අහංකාර වුණේ? *[බාධා කිරීම්]* කවුද තනි මතයට වැඩ කළේ? කවුද expertsලාව අයින් කරලා, science පැත්තකට දමලා වැඩ කළේ? දැන් ඔබතුමා බොහොම ලස්සනට කියනවා, දත්ත මත පදනම් වෙන්න ඕනෑ කියලා, ගරු ඇමතිතුමනි. හරියටම හරි. තොරතුරු මත පදනම් වෙන්න ඕනෑ කියනවා. හරියටම හරි. නමුත් මෙතෙක් කල් ඔබතුමන්ලා හිටපු කැබිනට් මණ්ඩලයත් මිථ්‍යාවට මුල් තැන දුන්නා. ලුණු කෑවා. ගොවියාගේ පොහොර ටික නැති කළා. මුට්ටි ගඟට දැම්මා. එන්නත ගැන විශ්වාසය නැතුව එන්නතේ මිල වැඩි වෙනකම් පැණියක් ගැන කථා කළා. ගරු ඇමතිතුමනි, මම අහන්න කැමැතියි, මොනවාද ඔබතුමාත් හිටපු කැබිනට් මණ්ඩලය කරපු මේ පිස්සු වැඩ? මේ පිස්සු වැඩ කරන කොට, ඔබතුමන්ලා ඇයි බලාගෙන සිටියේ? මම ඒ ගැන අහන්න කැමැතියි.

මම ස්තුතිවන්ත වෙනවා ඔබතුමාට. වැදගත් වචනයක් ඔබතුමා පාවිච්චි කළා. ඒ තමයි ඓතිහාසික වරදක් කරලා තිබෙනවාය කියන එක. ඒ වරද පිළිගැනීමත් හොඳ ලක්ෂණයක්. අපි සූදානම් මේ රට ගොඩගන්න, මේ වැඩසටහනට අතහිත දෙන්න. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, අපේ රටේ international donor conference එකක් කැඳවන්න කියලා.

මේ විපක්ෂයේ සමගි ජන බලවේගය -සමගි ජන සන්ධානය- සූදානම්, ඒ international donor conference එකක් මේ රටේ කැඳවනකොට ඒකට සහභාගි වෙලා, කිසිම දේශපාලන භේදයකින් තොරව මේ රට ගොඩගන්න යම්කිසි ස්ථාවරයක්, විනිවිදභාවයෙන් යුක්ත වූ වැඩ පිළිවෙළක්, ලැබෙන සහන ටික සෘජුව ජනතාවට යන වැඩසටහනක් නිර්මාණය කරනවා නම් පැහැදිලි, පිරිසිදු වගවීම, වගකීම යන ගුණාංග තිබෙන ක්‍රමයකට උදව් කරන්න. මේ රටේ ලක්ෂ 220ක් ජනතාව වෙනුවෙන් ඒ සූදානම අපි සතුව තිබෙනවාය කියන එක මම කියන්න කැමැතියි.

ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා යැපුම් මානසිකත්වයක් ගැන කථා කරලා, සුබසාධන රාජ්‍යයට පහර එල්ල කරන්න එපා. මේ රටේ නිදහස් අධ්‍යාපනය තිබිය යුතු දෙයක්. නිදහස් සෞඛ්‍යය මේ රටේ තිබිය යුතු දෙයක්. දුප්පත්කම තුරන් කිරීම මේ රටේ තිබිය යුතු දෙයක්. හැබැයි, දුප්පත්කම තුරන් කිරීමේ සහන ලැබෙනකොට දුප්පතුන්ට ඒක ලැබෙන්නට ඕනෑ. තමුන්නාන්සේලා ඉතිහාසය පුරාවටම දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන දේශපාලනීකරණය කරලා, ඒක ඡන්ද බාගන්න බිලී පිත්තක් බවට පත් කරගෙන සම්පූර්ණයෙන්ම ඒක විකෘති කරපු නිසා තමයි අද සුබසාධන රාජ්‍යයටත් මරු පහරවල් එල්ල වෙන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේට පැහැදිලිව කියනවා, සුබසාධන රාජ්‍යයට පහර එල්ල කරන්න එන්න එපා කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළා, රාජ්‍ය සේවකයන්ට ඒ ලබා දුන්න වැටුප් වැඩි කිරීම වැරැදියි කියලා. මම ප්‍රතික්ෂේප කරනවා තමුන්නාන්සේගේ ඒ ප්‍රකාශය. ඒ ප්‍රකාශය වැරදියි. ඒ වැටුප් වැඩි කිරීම හරි. එදා 2015 යහ පාලන ආණ්ඩුව බලයට ආපු හැටියේ දුන්න සහන ටික ඔක්කොම හරි. මොකද, ඒ සහන දීමත් සමඟ අපි රාජ්‍ය ආදායම අහිමි කරගත්තේ නැහැ. රාජ්‍ය ආදායම double-digit percentage එකක තිබුණා. නමුත් තමුන්නාන්සේලා තමුන්නාන්සේලාට ඡන්දයේදී සල්ලි දුන්න මහ ලොකු කෝටිපතියන්ට බිලියන 600ක බදු සහන දීලා තමයි රාජ්‍ය ආදායම සියයට 8කට බස්සාගෙන තිබෙන්නේ. ඒක තමුන්නාන්සේලා කරපු වරද. ඒ නිසා තමුන්නාන්සේලා දැන් හොඳට අහගන්න. තමුන්නාන්සේලා මෙතැනට ඇවිල්ලා බොරුවට පාපෝච්චාරණය කරන්න එපා. මේවාට වග කිව යුත්තෝ අනිවාර්යයෙන්ම ගෙදර යන්න ඕනෑ. ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව ගෙදර යන්න ඕනෑ. අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව ගෙදර යන්න ඕනෑ. අපි විශ්වාස භංග යෝජනා දෙකක් ගෙනැවිල්ලා තිබෙනවා. මන්ත්‍රීවරු 225දෙනා ඉන්නේ ජනතාවගේ පැත්තේද, එහෙම නැත්නම් හොරුන්ගේ පැත්තේද කියලා මේ රටේ ජනතාවට ඒ අවස්ථාවේදී බලාගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා විශේෂයෙන්ම ආයෝජකයන් ගැන කථා කළා. ගරු මුදල් ඇමතිතුමනි, මම එදා යෝජනාවක් කළා. ඉන්දියාවේ නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යතුමා COVID-19 crisis එක ආරම්භයේදීම චීනයෙන් එළියට යන investments ගෙන්වා ගන්න Prime Minister's Office එකේ වෙනමම special unit එකක් - one-stop shop එකක් - හැදුවා. දකුණු කොරියානු, ජපන්, ඇමෙරිකානු investments චීනයෙන් එළියට යනකොට ඒවා ඉන්දියාවට ගෙන්වා ගන්න වැඩසටහනක් ක්‍රියාත්මක කළා. මම ඒ යෝජනාව කරනකොට මෙතැන හිටපු 'තුනෙන් දෙක' හිනා වුණා. දැන් කියනවා, මේක කලාපීය ආර්ථික අර්බුදයක් කියලා. ගරු අමාත්‍යතුමනි, මේක කලාපීය ආර්ථික අර්බුදයක් නම්, අපේ රටට විතරක් ඩොලර් මිලියන 400ක investments එන්නයි, අනෙක් රටවලට ඩොලර් බිලියන ගණන් investments යන්නයි හේතුව මොකක්ද? මේක කලාපීය ආර්ථික අර්බුදයක් නොවෙයි, මේක ශ්‍රී ලාංකීය අර්බුදයක්. මේක ඔබතුමන්ලාගේ මාස තිහේ ආණ්ඩුව නිර්මාණය කරපු අර්බුදයක්.

අපි පිළිගන්නවා, දැන් ඒ සඳහා විසඳුම් අවශ්‍යයි කියලා. මොනවාද විසඳුම්? මාස තිහක් තිස්සේ මේ රටේ ක්‍රියාත්මක වුණු ළිං මැඩි සංකල්පයෙන් ඉවත් වෙලා ඔබතුමා සූදානම් දැන් ලෝකයත් එක්ක කථා කරන්න. ඒ පිළිබඳව මම සතුටු වෙනවා. තමුන්නාන්සේ දන්නවා, එදා මෝදි අගමැතිතුමා මේ රටට එන්න හදනකොට තමුන්නාන්සේලා කළු කොඩි දැම්මා. එතුමා වෙනුවෙන් උදාගමක් හදනකොට දොස් කිව්වා; විවේචනය කළා. නමුත්- ඔබතුමන්ලා කොහොම හරි, ඉන්දියාවෙන් හරි යම් කිසි මුදලක් ලබාගෙන, ඉන්දියාවේ මුදල් ඇමතිතුමියගේ සහාය ලබාගෙන, ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලට ගිහිල්ලා යම් කිසි උත්සාහයක් දැරීම ගැන මම සතුටු වෙනවා. හැබැයි, එකක් කියන්න ඕනෑ, සබ්රි මැතිතුමනි. මිනිස්සු දුක් විඳිනවා.

මම පිළිගන්නවා, තමුන්නාන්සේ වගකීම භාර ගත්තේ මීට සති කිහිපයකට පෙර කියලා. තමුන්නාන්සේලා අපෙන් කරපු ඉල්ලීමකුත් අපි ඉෂ්ට කළා. හොඳට මතක තියාගන්න, අපි වගකිව යුතු පක්ෂයක්, වගකිව යුතු සන්ධානයක්. IMF එකට යන නිසා ස්ථාවරත්වයේ ප්‍රශ්නයක් ඇතිවෙයි කියලා යම් යම් දේවල් කරන්න එපා කියලා අපට කිව්වා. අපි ඒකට සවන් දුන්නා. මේ ආණ්ඩුවේ කවුරු හරි කියනවා නම්, අපි සහයෝගය, ශක්තිය දෙන්නේ නැහැයි කියලා, අපි ලබා දුන් උදව් ටික ඔක්කෝම එළිදරව් කරන්න මම සූදානම්. එම නිසා මතක තියාගන්න, බල තණ්හාවෙන් අගමැතිකම් ගන්න, ජනාධිපතිකම් ගන්න, ඇමති අංතට්ටු ගන්න අපට රුදාවක් නැහැ කියලා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. අපට තනතුරු, තාන්නමාන්න අවශ්‍ය නැහැ. හරි දේ කළොත්, නිවැරදි දේ කළොත්, රට වෙනුවෙන් නිවැරදි තීන්දු ගත්තොත් එතැන අපි ඉන්නවා කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. අපට ඔය අගමැති, ඇමති, ජනාධිපති කියන අං තට්ටු අවශ්‍ය නැහැ. ඒවා ලබා ගත යුත්තේ ජන වරමෙන්. ඇතුළත ක්‍රියාත්මක වෙන දේශපාලන ඔළුගෙඩි සුදුවකින් තාන්නමාන්න, තනතුරු ලබා ගන්න අපි සූදානම් නැහැ. ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. හැම විටම අපි හමු වෙනවා, තානාපතිවරුන්. EU Ambassador හම්බ වුණාම අපි මොකක්ද කිව්වේ, ගරු ඇමතිතුමනි? මොනම හේතුවක් මතවත් GSP Plus ඉවත් කරන්න එපා කියලා අපි කිව්වා. ඔබතුමා ඒ ගැන අහන්න. ඉන්දියාව තමුන්නාන්සේට උදව් කරන්න ඉස්සෙල්ලා මගෙන් ඇහුවා, උදව් කරන්නද, එපාද කියලා. *[බාධා කිරීම්]* ඔව්, ඒකයි ඇත්ත කථාව. ඒක හොඳද, නරකද කියලා ඇහුවා. *[බාධා කිරීම්]* ඒක අසත්‍යයක් කියලා හිතනවා නම් අහන්න තමුන්නාන්සේගේ ඇමතිවරයාගෙන්. ඒකයි ඇත්ත කථාව. අපි කිව්වා, මේ රටේ ජනතාව වෙනුවෙන් ලබා දිය හැකි උපරිම සහාය ලබා දෙන්න කියලා. එළියෙදි එකක් කියලා පිටුපස්සෙන් ගිහිල්ලා කේලාම් කියන විපක්ෂයක් නොවෙයි, අපි. කේලාම් බෑග් පිටින් උස්සාගෙන ජීනීවා ගිය විපක්ෂ මතකයි නේද? අපි එහෙම විපක්ෂයක් නොවෙයි. අපි එළිපිට කථා කරනවා; එළිපිට ක්‍රියා කරනවා. අපි ළඟ කේලාම් දේශපාලනය නැහැ. හැබැයි, අපි ජාත්‍යන්තරයට එක් කාරණයක් කිව්වා. ඒ ලබා දෙන සල්ලි ටික මේ රටේ ජනතාවට යන්නට ඕනෑ.

මොළ හතාරෙණෝ රටේම ග්‍රාම සේවා වසම් 14,000න් වසමකින් පොදුජන පෙරමුණේ එක සාමාජිකයෙකු තෝරා ගෙන ඉන්දියානු ආධාර හරහා Budget Shops දාන්න හැදුවා. ඒවාට අපි විරුද්ධයි. ඉන්දියාවෙන් ආධාර දෙන්නේ, ග්‍රාම සේවා වසම් 14,000කට Budget Shops දාලා පොදුජන පෙරමුණේ සාමාජිකයන්ට බඩු බෙදන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරන්න නොවෙයි. ඒවාට අපි විරුද්ධයි. ඒ ආධාර විනිවිදභාවයෙන් යුක්ත වූ යන්ත්‍රණයක් හරහා ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. ඔබතුමා කිව්වා Rapid Financing Instruments - RFIs - ගැන. ඔබතුමන්ලාට සහාය අවශ්‍ය නම් අපිත් ඒ ආයතනවලට කථා කරන්නම්. Rapid Financing Instruments මේ රටේ ජනතාවට අවශ්‍යයි. ජනතාව අද අමාරුවෙන් ජීවත් වෙන්නේ; දුෂ්කර ජීවිතයක් ගත කරන්නේ. දරුවන්ට දෙන්න අම්මලාට කිරි පිටි ටික නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද දැන් මාස ගණනාවක් තිස්සේ ත්‍රිපෝෂ කම්හල වහලා කියලා? අම්මලාට ත්‍රිපෝෂ නැහැ. ගර්භිණී මව්වරුන්ට ත්‍රිපෝෂ නැහැ. දරුවන්ට ත්‍රිපෝෂ නැහැ. මේ වාගේ තත්ත්වයක් තුළ, මේ අභේනිය, මේ විනාශය තුළින් අපි රජ වෙන්න උත්සාහ කරන්නේ නැහැ.

ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේගෙන් මම එක ඉල්ලීමක් කරනවා. මේ රටේ බරපතළ ආහාර හිඟයක් එනවා. කරුණාකර Food and Agriculture Organization එකට කථා කරන්න; කරුණාකර UNICEF එකට කථා කරන්න; කරුණාකර UNFPA එකට කථා කරන්න; කරුණාකර World Food Programme එකට කථා කරන්න. කථා කරලා, මේ රටේ ජනතාවට අවශ්‍ය මූලික ආහාරවලින් අඩුම ගණනේ වසරක buffer stock එකක් store කර ගන්න. එතකොට අපට පුළුවන් වෙයි මේ ප්‍රශ්නවලින් අඩු ගණනේ මිනිසුන්ගේ බඩගින්නේ ප්‍රශ්නයට යම්තාක් දුරට හෝ විසඳුමක් ලබා දෙන්න.

මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි, ගරු ඇමතිතුමනි. මේ රටේ බරපතළ ඖෂධ හිඟයක් තිබෙනවා. මේ බරපතළ ඖෂධ හිඟයට විසඳුමක් ලබා දෙන්න ඕනෑ. ගිලන් වෙච්ච රෝගීන්ට අද බෙහෙත් ටික නැහැ. සමහර operations නතර වෙලා. ඒවාට අවශ්‍ය drugs නැහැ. කරුණාකර ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු අමාත්‍යතුමනි, Foreign Direct Investments මේ රටට ගෙන එන්නට නම් කළ යුතු වැදගත්ම දෙයක් තිබෙනවා. ඒ තමයි, අපේ රටේ Ease of Doing Business Index එකේ අපි ප්‍රගතියක් ලබන්න ඕනෑ; Corruption Perceptions Index එකේ ඉහළට යන්න ඕනෑ. මම ඔබතුමාට කියනවා කරුණාකර වංචාව, දූෂණය, හොරකම නතර කරන stand-alone වැඩ පිළිවෙළක්, independent වැඩ පිළිවෙළක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ entrenched clause එකක් හැටියට ගෙන එන්න කියලා. අපිත් සූදානම් අපේ යෝජනා ලබා දෙන්න. අපි ඒක ක්‍රියාත්මක කරමු. එතකොට එක එක්කෙනා ඉල්ලන සියයට පහ, සියයට දහය, සියයට පහළොව, සියයට විස්ස නැති වෙනකොට අනිවාර්යයෙන්ම මේ රටට ආයෝජන එනවා. ඒ සඳහා සුදුසු වාතාවරණය නිර්මාණය කරන්න අපි සූදානම්; ඒ සහයෝගය ලබා දෙන්න අපි සූදානම්.

ගරු කථානායකතුමනි, අද අපි එක යථාර්ථයක් අවබෝධ කර ගන්න ඕනෑ. අපේ මුදල් ඇමතිවරයාට යම් වුවමනාවක් තිබෙනවා; යම් අවශ්‍යතාවක් තිබෙනවා. ඒක මම පිළිගන්නවා. හැබැයි ගරු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මුදල් ඇමතිතුමනි, ඔබතුමා ගෙනාපු විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසාම තමයි ඒක පුද්ගල රංගනයක් නිර්මාණය වෙලා, මේ රටේ ඒකාධිපතිත්වයක් නිර්මාණය වෙලා, ආඥාදායකත්වයක් නිර්මාණය වෙලා, විද්‍යාව පැත්තක තියලා මිථ්‍යාවට තැන දීලා, ගොවියා, ධීවරයා, කම්කරුවා, දුප්පතා, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා, ඉහළ පන්තිය, මැද පන්තිය, පහළ පන්තිය, නාගරික ජනතාව, ස්වයං රැකියාලාභියා, දිනපතා වේතන ලබන පුද්ගලයා, කුලීකරුවා, කම්කරුවා කියන මේ හැමෝම විනාශයට පත් වුණේ. ඒ නිසා ආර්ථිකය හදන්න උත්සාහ ගන්නවා වාගේම දේශපාලන තලයේ ප්‍රධාන වෙනස්කමක් ඇති කරන්නත් ඔබතුමා නායකත්වය ගන්න. ඒ වෙනස්කම ඇති කරන්නට මූලික පියවරක් වශයෙන් අපේ පක්ෂයේ මහ ලේකම්, රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ඉදිරිපත් කර තිබෙනවා විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා වූ යෝජනාව. ඒක තමුන්නාන්සේලාගේ යෝජනාවක් හැටියට ගෙනැල්ලා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා, ස්වාධීන ආයතන ක්‍රියාත්මක කරලා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහමුලින්ම ඉවත් කරලා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යළි ස්ථාපනය කරන්න කටයුතු කරන්න. ඒ වාගේම, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කටයුතු කරන්න.

ගරු කථානායකතුමනි, මේකේ යථාර්ථය මොකක්ද? මේ ජනාධිපතිවරයා යටතේ මේ රට ගොඩ නඟන්න බැහැ. මේ අග්‍රාමාත්‍යවරයා ඇතුළු මේ ආණ්ඩුව යටතේ මේ රට ගොඩ ගන්න බැහැ. මේ රටේ පොදු ජනතාව කියන ආකාරයට, කරුණාකර තමුන්නාන්සේලා ඉවත් වෙලා ජනතාවට අවස්ථාව දෙන්න, අලුත් ආණ්ඩුවක් බිහි කරන්න. ජනතාවට ඒ අවස්ථාව දෙන්න. ජනතාවට තීන්දුව ගන්න ඉඩ දෙන්න. ඒකෙදි එක් එක් පාර්ශ්ව ඉදිරියට එන්න පුළුවන්. තවත් පාර්ශ්ව පස්සට යන්න පුළුවන්. නමුත් ජන සම්මතවාදයට, ජන මතයට, ජන ආශිර්වාදයට අපි තැන දෙන්න ඕනෑ. මේ ඔළු ගෙඩි සෙල්ලම් දමලා, මේ political musical chairs තරග ක්‍රියාත්මක කරලා මිනිස්සු අන්දවන්න එපා. ආපහු අර නාගරාජ නාඩගම නටන්න එන්න එපා; ආපහු අර මුට්ටි නාඩගම නටන්න එන්න එපා. තමුන්නාන්සේලාට ලජ්ජා නැතිව ගරු කථානායකතුමාටත් පැණිය පෙව්වා. මොන ලජ්ජා නැති වැඩක්ද? එතුමාට දෙන්න තිබුණේ එන්නත. නමුත්, එතුමාටත් පැණිය පෙව්වා. රට විනාශ කළා. මම තමුන්නාන්සේලාගෙන් බොහොම පැහැදිලිව ඉල්ලීමක් කරනවා, අපි ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනා දෙකට ඉතාම ඉක්මන් දිනයක් දෙන්න කියලා. පුළුවන් නම් Standing Orders suspend කරලා හෙට දවසේ අපි ඒක ගනිමු. ඒ වාගේම තටම-තටම ඉන්න එපා, නියෝජ්‍ය කථානායකවරයාගේ පුටුවට තිබෙන තරගයට. ඒ ප්‍රජාතන්ත්‍රවාදී තරගයට ඉඩ දෙන්න. ඒක ක්‍රියාත්මක කරන්න. නිකම් බොරුවට කියනවා, එතුමා ලියුම දුන්නේ නැහැ ලු, ලියුම නැහැ කියනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමනි, පක්ෂ නායක රැස්වීමේදී කියනවා, ඔබතුමා ඉල්ලා අස් වුණා කියලා ලියුමක් දුන්නේ නැහැ ලු; ඒක ජනාධිපතිවරයාට ගිහිල්ලා නැහැ ලු. ඔබතුමා පුළුවන් නම් ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න. අපි කියන එක හරිද, වැරදිද කියලා කියන්න. මගේ කථාවෙන් පසු ඔබතුමාට ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්. මම මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. මම ඉල්ලීමක් කරනවා, මගේ කථාවෙන් පස්සේ හර්ෂ ද සිල්වා මැතිතුමාටත් එතුමාගේ පාර්ශ්වයෙන් වචන කිහිපයක් ප්‍රකාශ කරන්න කරුණාකර අවස්ථාව ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම මේ ජනාධිපතිවරයා සහ මේ අගමැතිවරයා සහ ආණ්ඩුව තුළ මේ රටට ආලෝකයක් නිර්මාණය වෙන්නේ නැහැ, ඒ අය යටතේ සදාකාලික අන්ධකාරයක තමයි අපට සිටින්න වෙන්නේ කියන කාරණය මතක් කරමින්, ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, හිටපු නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගෙන් අහන්න, එතුමා ඒ තනතුරෙන් ඉල්ලා අස්වුණාද, නැද්ද කියලා. ඒ පිළිබඳ පැහැදිලි කරන්න එතුමාට අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය නාස්ති කරන්නත් එපා, සභාවේ කාලය නාස්ති කරන්නත් එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම කියන්න බැහැ නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැනට මා වෙත ලිපිය ලැබිලා තිබෙනවා. ඒ අනුව, එතුමාගේ ඉල්ලා අස්වීම පිළිගෙන තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ තර්කය මේකයි, ගරු කථානායකතුමනි. එතුමා ඉල්ලා අස්වුණා කියලා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කෙරුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඉල්ලා අස් වූ බව ජනාධිපතිතුමාත් දන්වා තිබෙනවා. ඊට වැඩිය මොකක්ද? *[බාධා කිරීම්]* දැන් මට ලිපිය ලැබී තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම නම්, නියෝජ්‍ය කථානායකවරයකු තෝරන්න ඡන්දය තියන්න ඕනෑ. *[බාධා කිරීම්]* Please, let the Hon. Ranjith Siyambalapitiya speak.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හෙට ඒ සඳහා ඡන්දය විමසමු. *[බාධා කිරීම්]* ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමනි, ඔබතුමා දීපු ලිපිය මට ලැබී තිබෙනවා. ජනාධිපතිතුමා එය පිළිගෙන තිබෙනවා. මේ ගැන තවත් කථා කරන්න දෙයක් නැහැ නේ. *[බාධා කිරීම්]* ඒක දැන් ඉවරයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64(2) ව්‍යවස්ථාව අනුව, මම ඉල්ලා අස්වීමේ ලිපිය ජනාධිපතිතුමාට දෙවරක් භාර දුන්නා. එතුමා එය පිළිගත් බවට ගරු

කථානායකතුමාට යැවූ ලිපියේ පිටපත මට ලැබිලා තිබෙනවා. දැන් ගැටලුවක් නැහැ. ඒ ලිපියේ පිටපත දැන් තමයි ලැබුණේ. *[බාධා කිරීම්]*

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මිලියන 22ක් පමණ වන මේ රටේ ජනතාව අද පාර්ලිමේන්තුවේ මේ තුන්වෙනි රැස්වීම් සතිය දිහාත් බලා ගෙන ඉන්නවා. මිනිස්සු කලින් පාර්ලිමේන්තුව රැස්වුණු සති දෙකක් තිස්සේම බලාගෙන හිටියා. මොකද, මිනිසුන්ට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මුදල් අමාත්‍යතුමා අද ඉතාම හොඳින් මේ සභාවට සහ රටට සත්‍යය කිව්වා. ඒ නිසා මුලින්ම අපි ගරු මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ වාගේ අමාරු අවස්ථාවක සියලු දෙනා මේ වගකීම භාර ගන්න බැරුව ඉඳිද්දී එතුමා කිව්වා, එතුමා nightwatchman කෙනෙක් විධියට වැඩ කරනවා කියලා. ඕනෑ කෙනෙකුට මේක භාරදීලා යන්න කැමැතියි කියලාත් එතුමා කිව්වා. එතුමා අවංකවම මේ සභාවට, මේ රටට ඉදිරිපත් කරපු ඒ වාර්තා පිළිබඳව අපි මුලින්ම එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ, අපි දැන ගන්න ඕනෑ අප හමුවේ තිබෙන ආර්ථික අර්බුදයේ තරම පිළිබඳව. හෙට කවුරු නායකත්වයට ආවත්, කවුරු ජනාධිපති වුණත්, කවුරු අගමැති වුණත්, කවුරු කැබිනට් මණ්ඩලයට ආවත්, මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ ක්‍රමවේදය පිළිබඳව එතුමා කිව්වා.

ගරු කථානායකතුමනි, අපි අද දවස තුළත් මේ පිළිබඳ සාකච්ඡා කරලා යාවි; තව සාකච්ඡා ඕනෑ තරම් තියාවි; විවිධ විද්වතුන් විවිධ යෝජනා දේවි. හැබැයි, ඒ යෝජනා පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ආවාම ඉතිහාසය පුරා අපි දැකලා තිබෙනවා, පක්ෂ විපක්ෂ අය ඒ පිළිබඳව කථා කරන හැටි. ගරු කථානායකතුමනි, අපි සියලු දෙනා ගැටලුව දන්නවා; ප්‍රශ්නය දන්නවා. රට හමුවේ තිබෙන අභියෝගය අපි සියලු දෙනා දන්නවා. ඒ නිසා ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, පක්ෂ භේදයක් නැතිව අඩුම තරමින් විශේෂ කාරක සභාවක් හෝ පත් කරලා එක දිගට සති දෙකක් අපි රැස්වෙලා මේ ආර්ථික අර්බුදයට කෙටි කාලීනව විසඳුම් සෙවීමට කටයුතු කරමු කියලා. අඩුපාඩුවක් නැතිව, අවශ්‍ය භාණ්ඩ ටික ජනතාවට ලබා දීලා, පෝලිම් යුගය අවසන් කරන්න අපි සියලු දෙනා එකතු වෙලා කටයුතු කරමු.

ඒ වාගේම, අපි සියලුදෙනා පක්ෂ භේදයෙන් තොරව එකතුවෙලා, ජනතාවට බලපා තිබෙන උද්ධමනය අඩු කිරීම සඳහා ගන්න පුළුවන් සියලු ක්‍රියා මාර්ග ගත යුතුයි කියන එකත් මම මතක් කරනවා. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් සොයා බලන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මධ්‍ය කාලීනව අපි ගන්න ඕනෑ තීන්දු තීරණ ඉතා ඉක්මනින් ගන්න ඕනෑ. පක්ෂ භේදයෙන් තොරව ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කියා මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම, කවුරු මේ සභාවේ බලයට පත් වුණත් මේ ආර්ථික අර්බුදය ජයග්‍රහණය කරලා මේ රටේ අහිංසක මිනිසුන්ගේ ජීවිත නඟා සිටුවන්න පුළුවන් ආකාරයෙන් කටයුතු කරන්න, ඉදිරියේදී -අවුරුදු 10ක, අවුරුදු 20ක කාලයක්වත්- එය වෙනස් නොවී තිබෙන ආකාරයට කටයුතු කරන්න කියලාත් මම මේ ගරු සභාව නියෝජනය කරන සියලු පක්ෂවලින් ආදරයෙන්, ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාට මේ සම්බන්ධයෙන් විශාල වග කීමක් තිබෙනවා. එළියේ තිබෙන ප්‍රශ්න ටික විසඳන්න ඉදිරි සති දෙක තුළ හෝ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂවල නියෝජිත මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා මම යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, අප්‍රේල් මාසයේ 8වැනි දා හැන්සාඩ් වාර්තාව කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එදින හැන්සාඩ් වාර්තාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ ප්‍රකාශයක් සඳහන්ව තිබෙනවා. Volume 290 - No. 4 ලෙස නිකුත් කර ඇති එම හැන්සාඩ් වාර්තාවේ සඳහන් පරිදි එතුමා කියා තිබෙනවා, "අප්‍රේල් මාසයෙන් පස්සේ මම කිසිසේත්ම මේ තනතුරේ ඉන්නේ නැහැ" කියලා. ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා දැන් වැදගත් ලිපියක් පෙන්වූවා. එතුමාගේ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා පිළිගෙන ඇති බව එහි සඳහන්ව තිබෙනවා කිව්වා. එහෙම නම් ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගවලට අනුව අද දින මෙම ගරු සභාවේ ප්‍රමුඛ කාර්යය වන්නේ නියෝජ්‍ය කථානායකවරයකු පත් කර ගැනීමයි. දැන් මුදල් ඇමතිවරයා කළ ප්‍රකාශය නිසායි අපි ඒ ගැන අහලා බාධා නොකළේ. නමුත්, අද දින ප්‍රමුඛ කාර්යය වන්නේ නියෝජ්‍ය කථානායකවරයකු පත් කර ගැනීමයි. නමුත්, තවම එය සිදු වුණේ නැහැ. ඒ නිසා දැන් ඔබතුමා රටේ නීතියෙන් බැහැර වෙලා කටයුතු කරනවා කියන කාරණය මෙතැනින් ඔප්පු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපි,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම තවම කියලා අවසන් නැහැ.

අනෙක් කාරණය මේකයි. ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා තමයි ඔය හොරකම් කරපු අයගේ නඩුවලට පෙනී සිටියේ. ඔබතුමාට වග කීමෙන් කියන්න පුළුවන් ද, නැවත මේ රට හැදුවාට පසු ඒ ලැබෙන සල්ලිත් හොරා කෑවොත් ඒ නඩුවලට ඔබතුමා පෙනී සිටින්නේ නැහැ කියලා? ඔබතුමා තමයි ඒ හොරකම් කරපු අය බේරා ගන්න උසාවියේ පෙනී සිටින්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකේ රීති ප්‍රශ්නයක් නැහැ. කරුණාකර ඔබතුමාගේ කථාවේදී ඒ ගැන කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා. ගරු අලි සබ්රි ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ අවධානය යොමු කරවමින් කරුණු දෙකක් සම්බන්ධයෙන් මම අදහස් දක්වන්න කැමැතියි. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන සහ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කළා. කැබිනට් මණ්ඩලය පසුගිය දිනයේ රැස්වූ

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

අවස්ථාවේදී ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමාගේ නායකත්වය යටතේ වෙනම Subcommittee එකක් පිහිටුවලා, අගමැතිතුමා ගෙනාපු යෝජනාවක් අනුව විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම සඳහා දැනටමත් තීන්දුවක් අරන් තිබෙනවා. ඒක අපි නීති කෙටුම්පත් සම්පාදකවරයාට යවා තිබෙනවා. ඒක ලැබුණාට පසුව ඒ අනුව කටයුතු කරලා, එය ඉක්මනින් කිරීම සඳහා අපි කටයුතු කරනවා. ඒ අනුව යම් යම් සංශෝධන සහිතව නැවත වතාවක් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබුණු තැනට ගෙන යන්න බලාපොරොත්තු වෙනවා. ඒ කටයුතු අපි කරලා තිබෙනවා. ඒක විතරක් නොවෙයි අපි කරන්නේ. අපි පිළිගන්නවා, යම් යම් දේශපාලන සංශෝධන සහ ව්‍යවස්ථානුකූල සංශෝධනත් කළ යුතුයි කියලා. ඒක ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. ඒ නිසා තමයි අපි කිව්වේ, එළියේ සිටින ජනතාව කියන දෙයට කන් දෙන්න අපි සූදානම් කියලා.

දෙවැනි කාරණය මෙයයි. බෙහෙත් වර්ග ගැනීම සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මම මුලින් කිව්වා වාගේ මේ වනකොට අපට ලෝක බැංකුව, ADB බැංකුව සහ AIIB බැංකුව ඊයේ නැවත කථා කරලා ඇමෙරිකානු ඩොලර් මිලියන 160ක් ලබා දීම සඳහා ප්‍රාථමිකව එකඟතාව ලබා දී තිබෙනවා. තුන්වැනි කාරණය මේකයි. අපි කවදාවත් කිව්වේ නැහැ නිදහස් අධ්‍යාපනයට සහ නිදහස් සෞඛ්‍යයට අත ගහන්න කියලා. අපි කිව්වේ, මේකට වඩා ආදායම් සොයාගෙන වියදම් කරන ක්‍රමවේදයකට යමු කියන එක විතරයි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා. *[බාධා කිරීමක්]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂය එකඟ නම්, මෙම විවාදය පවත්වාගෙන යාමට අවශ්‍ය කාලය, හෙට දිනයේ ප්‍රධාන කටයුතුවලින් පසුව ලබා දෙන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභානායකතුමනි, හෙට අපට කථා කරන්න දෙන්න කිව්වා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොඳයි. හෙට අනිවාර්යයෙන්ම අපට එකඟතාවකට එන්න පුළුවන්. But, Sir, you will have to summon a meeting of the Committee on Parliamentary Business. We are in agreement.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We also agree with that.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Right, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

[පූ.භා. 11.25]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කියූ එක කාරණයක් ගැන කථා කරන්න මට ඉඩ දෙන්න. පළමුවෙන්ම මම ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරනවා අමාරු වැඩ කටයුත්තක් භාර ගැනීම පිළිබඳව. මේක ලෙහෙසි පහසු වැඩ කටයුත්තක් නොවෙයි. ඔබතුමා ඇවිල්ලා මේක භාරගත්තා. ඔබතුමා කිව්වා, ඔබතුමා nightwatchman කෙනෙක් කියලා. ඔබතුමා cricket match එකේ nightwatchman නොවෙයි. ඔබතුමා "Watergate" එකේ nightwatchman. Nightwatchman තමයි පොලිසියට කිව්වේ ඩිමොක්‍රටික් පක්ෂයේ මූලස්ථානය කඩලා කියලා. පොලිසිය ඇවිල්ලා තුන් හතර දෙනෙක් අල්ලාගෙන ගියා. ඒක අවසාන වුණේ උප ජනාධිපති ස්පයිරෝ ටී. ඇග්නිව් සහ ජනාධිපති රිචඩ් නික්සන් යන දෙන්නාම ඉවත් වෙලා. අපි දන්නේ නැහැ, ඒකද ඔබතුමා කරන්න යන්නේ කියලා. කොහොම වුණත්, nightwatchman කෙනෙක් හැටියට ඔබතුමා වැඩ කටයුතු කර තිබෙනවා.

මම එක් කාරණයක් කියන්න කැමැතියි. පසුබිමේදී, අපි කරපු වැඩ කටයුතු කිහිපයක් ගැනත් කියන්න කැමැතියි. විශේෂයෙන් මේ සංඛ්‍යාලේඛන දිහා බලනකොට 1948 සිට බලන්න එපා. කැල්ඩෝර් ක්‍රමය තිබුණාට අපි දියුණු වුණේ නැහැ. ඒ නිසා 1977න් පසුව බලන්න. ඒ කාලයේ සහනාධාර විධියට ලැබුණු මුදල් සියල්ල අපි සංවර්ධනයට යෙදෙව්වා. එහෙමයි කටයුතු කළේ. ඒ කාලයේ එක දෙයක් වුණා. මේ රටේ දළ දේශීය නිෂ්පාදනය වැඩි වුණා. ඒකට එක හේතුවක් තමයි අපි කළ අපනයන. අපි අපනයනවලට බදු සහන දුන්නා. ඊට පස්සේ බදු සහන තවත් කාලයකට දීර්ඝ කළා. ඒකයි අපට බදු ආදායම අඩු වුණේ.

2009දී අපි විදේශීය වාණිජ ණය ගත්තා. එදා පොලිය අඩු නිසා වාණිජ ණය අරගෙන, අරගෙන 2014 වන විට අපි හිටියේ අමාරු තැනක. ඉතින් මේ දෙකම විසඳන්න IMF එකත් එක්ක සාකච්ඡා කරද්දී එක කාරණයක් කිව්වා. අපට කරන්න තිබුණේ ණය බර අඩු කරන එකයි. ණය බර අඩු කළා නම් 2014 අපේ රජයේ වියදම්වලටවත් ආදායම තිබුණේ නැහැ. ඒ නිසා, ණය ගෙවන්නේ නැති රජයේ ආදායම්වලට අතිරික්තයක් ලබා දෙන එකයි කළේ. 2018-2019 කාලයේ ප්‍රශ්න තිබුණත්, IMF ගැන කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. එතැනදී අපට සිදු වුණා බදු වැඩි කරන්න. ඒ නිසා බදු වැඩි කළා. ඊළඟට, බදු සහන අඩු කරන්න වුණා. එතැනදී පෞද්ගලික අංශය විශාල වශයෙන් විරුද්ධ වුණා. බදු වැඩි කරන එකටත් කැමැති වුණේ නැහැ. බදු සහන අඩු කරන එකට කැමැති වුණේත් නැහැ. සමහර බදු සහන අවුරුදු 30කට දුන්නා.

මම ගරු ඇමතිතුමාට තවත් කාරණයක් කියන්න කැමැතියි. ඒ කාලයේ IMF එකෙන් ලිපියක් දීලා තිබෙනවා. මම දන්නේ නැහැ ඒක තවම තිබෙනවාද කියලා. There was a note given by the IMF in the Finance Ministry. Whether it is still there, I do not know. ඇත්ත වශයෙන්ම ඒ වැඩසටහනේදී පෙන්වා දීලා තිබෙනවා කොහොමද අපේ අය වැය පරතරය අඩු වුණේ කියලා. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 12කට ගියේ. ඊට පස්සේ වුණේ දේශපාලන කාරණයක්. වෘත්තියවේදීන් ඇතුළු සියලු දෙනාම ගිහිල්ලා ජනාධිපතිතුමාගේ ඡන්ද ව්‍යාපාරයට උදව් කළා. එතුමා බලයට පත් වුණා; ආණ්ඩුව හැදුවා. අපි මේ පැත්තට ආවා. ඊට පස්සේ ආණ්ඩුව බදු අඩු කළා. ඒ බදු අඩු කළේ මේ මන්ත්‍රීවරු කියලා නොවෙයි. මම ඒකට මේ මන්ත්‍රීවරු කාටවත්

ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. ඒක මේ කවුරුවත් ගිහිල්ලා කිව්වේ නැහැ. ඒක කිව්වේ පෞද්ගලික අංශයයි. පෞද්ගලික අංශය කිව්ව නිසා බදු අඩු කළා. ඊට පස්සේ IMF එක තරහා වුණා. 2020, 2021 අවුරුදු දෙකේම IMF එකට යන්න තිබුණා. IMF එකට ගියා නම් බදු වැඩි කරන්න වෙනවා. කවුරු ආරක්ෂා කරන්නද බදු අඩු කළේ?

මම මුලින්ම කියන්නේ මේකයි. දැන් පෞද්ගලික අංශයත් උපදෙස් දෙනවා ලු, Chambersවලින් උපදෙස් දෙනවා ලු, ඒ වාගේම උපදේශක සභාවක් තිබෙනවා ලු. මම කියන්නේ ඒ ඔක්කෝම ඉවත් කරන්න කියලායි. මේ ගැන බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ආණ්ඩුවේ වුණත්, විපක්ෂයේ වුණත් කමක් නැහැ, අපි ඔක්කෝම මේ දිහා එක විධියට බලමු. නිලධාරින් වුණත් මෙහාට ඇවිල්ලා වාර්තා කරන්න ඕනෑ. මම එක් දෙයක් ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා. ගරු ඇමතිතුමනි, නිල නිවේදන සියල්ලම කරුණාකර පාර්ලිමේන්තුවේ කරන්න. පාර්ලිමේන්තුව නැත්නම් ඔබතුමා කරන්න. එහෙම නැතිව එක එක නිලධාරින්ට මේවා කරන්න ඉඩ දෙන්න එපා. ඒක තමයි අපට ගිය සැරේ වුණු විශාලම ප්‍රශ්නය.

අපි හිතන්න ඕනෑ මෙතැනින් අපි ඉදිරියට යන්නේ කොහොමද කියලා, ගරු කථානායකතුමනි. මට පෙනෙන විධියට සමහර තැන්වල බදු වැඩි කළ යුතුව තිබෙනවා. ඒක සිදු විය යුතු දෙයක්. ඒ එක්කම අපි අපේ බැංකු ගැනත් බලන්න ඕනෑ. කරුණාකර, බැංකු ගැන බලන්න. බැංකු කඩා වැටෙන්න පුළුවන්. Finance company එකක් කඩා වැටුණොත් අපට විශාල ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඒකයි මම කියන්නේ බැංකු ආරක්ෂා කරන්න දැලක් දාන්න කියලා. ඒ වාගේම ආණ්ඩුව හැටියට අපේ සංස්ථා වියදම් ගැන බලන්න. ගරු මුදල් ඇමතිතුමනි, මම එකක් කියන්න කැමැතියි. එක එක්කෙනාට කැමැති විධියට කටයුතු කරන්න දෙන්න එපා. ශ්‍රී ලන්කන් ගුවන් සේවයෙන් Airbus 25ක් ගත්තා. ඒ ගොල්ලන්ගේ එක එක සැලසුම් තිබෙනවා. නමුත්, ඒවා නොවෙයි බලන්න ඕනෑ. අපි ලංකාවේ ආර්ථිකය දිහා බලලා කළ යුත්තේ මොනවාද කියා තීරණය කරන්න ඕනෑ. මුදල් ඇමතිතුමනි, කරුණාකර ශ්‍රී ලන්කන් ගුවන් සේවයට කියන්න, මාස තුනක් නොවෙයි, පාර්ලිමේන්තුවෙන් අනුමැතිය දෙන තෙක් කිසිම ගුවන් යානයක් මිල දී ගන්න එපා කියලා. මොකද, COPE එකෙන් කියලා තිබෙන්නේ ගුවන් සේවය විකුණන්න කියලායි. ඉතින්, මේ වෙලාවේ අපි ගිහිල්ලා Airbus 25ක් ගන්නවා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. So, what I am saying is, do not put it off for three months. There should be no buying of aircraft till this House decides. First, we must decide on the future of the Airline. මේක ඉදිරියට අරගෙන යන්න. ඒ වාගේම බැංකු ආරක්ෂා කරන්න. අලාභ ලබන ආයතන ගැන මොනවා ද කරන්නේ කියන එක බලන්න. මිල වැඩි කළොත් අලාභ ලබන සමහර ආයතන ලාභ ලබන තත්ත්වයට එයි.

මම අහන අනෙක් කාරණය මෙයයි.

අද ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙනවා. අපට 2020 - 2021 කාලයේ කිව්වා, තෙල් මිල අඩු වුණාම වෙනම අරමුදලක් - stabilization fund එකක් - ඇති කරනවා කියලා. දැන් ඒ අරමුදලේ මුදල් තිබෙනවාද, නැද්ද? ඒ මුදල් තිබෙනවාද? මොකක්ද ඒවාට වෙලා තිබෙන්නේ? මුදල් නැත්නම් අපි ඒ නිලධාරින්ට දඬුවම් කරන්න ඕනෑ. එච්චරයි මම කියන්නේ. ඒ මුදල් තිබුණා නම් සහනයක් ගන්න තිබුණා. ඒ මුදල් තිබුණා නම් අද ඒක ඩීසල් සහනයක් සඳහා යොදවන්න තිබුණා. අපි ඒ එකක්වත් කරලා නැහැ. ඒකයි මම විශේෂයෙන් ඔබතුමාට කියන්නේ, අප ගන්නා පියවර කුමක්ද කියලා අපි විශේෂයෙන්ම තීරණය කරන්න ඕනෑ බව. දැන් අපි මහ අවුලක වැටිලා ඉන්නේ. අපි කොහොමද මෙතැනින් ගොඩ යන්නේ? ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්ව පියවරවලට වඩා තව පියවර ගන්න තිබෙනවා කියලායි මම හිතන්නේ.

අපි විදේශ රටවලින් ආධාර ලබා ගන්නවා නම් කරන්න ඕනෑ මොකක්ද? අපි ඒ රටවල් එක්ක ප්‍රශ්න ඇති කර ගත්තා. අපි දැන් ඒ ප්‍රශ්න විසඳා ගන්න ඕනෑ. ජපානය කරන්න ගිය LRT ව්‍යාපෘතිය අහෝසි වීම නිසා ඔවුන් අනෙකුත් ව්‍යාපෘති සියල්ලම අවලංගු කළා. මම ඒක ජනාධිපතිතුමාට දැනුම් දුන්නා. මම සතුටු වෙනවා, දැන් LRT එක පිළිබඳ පියවර ගැනීම පිළිබඳව. ඉන්දියාව තරහා කරගෙන තිබුණා වුණත් ඉන්දියාව කොහොම හරි අපට උදව් කරනවා. චීනය එක්කත් ප්‍රශ්න තිබෙනවා. අනෙක් කාරණය, යුරෝපා සංගමය. අපට GSP සහනය නැති වුණොත්? මානව හිමිකම් ගැන යුරෝපා සංගමයට අපි දෙන පිළිතුර මොකක්ද? තව මාස කිහිපයකින් GSP සහනය නැති වුණොත් අපි මොකක්ද කරන්නේ? මෙන්න මේ ප්‍රශ්න දිහා අපි බලන්න ඕනෑ. මේ ඔක්කොම මූල්‍ය කටයුතු - monetary affairs - තමයි. දැන් කොහොමද අපේ ව්‍යාපාර ගෙන යන්නේ? මේ ව්‍යාපාර කඩා වැටෙනවා; ඒවායේ මුදල් නැති වෙනවා. ඉදිරි කාලයේ කී දෙනෙකුට රැකියා නැති වෙයිද? ලක්ෂ ගණනකට රැකියා නැති වෙයි. ව්‍යාපාර ලක්ෂ ගණන් කඩා වැටෙනවා, බැංකු බේරන්න ගියාම. අපි ඒකට කොහොමද මුහුණ දෙන්නේ? අන්න ඒ සඳහා සහන දෙන එක ගැන බලන්න ඕනෑ.

අය වැයෙන් සහන දෙනවා නම් අය වැයේ තිබෙන අවශ්‍ය නැති වියදම් සියල්ල කපන්න. ඒ කටයුත්ත භාණ්ඩාගාරයට කරන්න කිව්වොත් සිදු වෙන්නේ නැහැ; එක එක අමාත්‍යාංශ බලපෑම් කරයි. මම කියන්නේ, මේක වෙනස් කරන එක අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට භාර දෙන්න කියලා. එතකොට එතැනින් සොයා බලන්න පුළුවන්. අපි ඒ කමිටුවට සහභාගි වෙලා ඉවත් කරන්න පුළුවන් හැම එකක්ම ඉවත් කරලා ඒ ඔක්කොම සහන විධියට ජනතාවට දෙමු. ඒ සහන දෙන්න ඕනෑ. ඒ සහන ඉදිරියට ගෙන යන්න ඕනෑ.

අපට ණය ගන්න පුළුවන් වුණාට අපි තව අවුරුදු 10කින් ඒ ණය ගෙවන්නේ කොහොමද? එහෙම නම් මේ ආර්ථික ව්‍යුහය වෙනස් කරන්න ඕනෑ. අපි තරගකාරි ආර්ථිකයකට ගිහින් අපනයනය සඳහා යන්න ඕනෑ. ඒවා කිව්ව නිසා පෞද්ගලික අංශයේ ඔක්කොම මා එක්ක තරහා වුණා. එතැන තිබෙන්නේ මේ තත්ත්වය. අපි එතැනට යන්න ඕනෑ. අපට අලුත් මාර්ග ගණනාවක් හොයන්න පුළුවන්.මේ සභාවේ දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවොත් ඕනෑ තරම් අලුත් මාර්ග කියයි. අපි එතැනට යන්න ඕනෑ. දැන් ඉතින්, මේ වැඩ කටයුතු කරගෙන යන්නයි තිබෙන්නේ. මම මෙතැනට ඇවිත් දේශපාලනය කරනවා නම් මට මේ හැම කෙනාටම කරුණු කියන්න පුළුවන්. මම කරපු හැම එකටම විරුද්ධ වුණා. අන්තිමට ගෙදර ගියේ ගෝඨා නෙවෙයි, මමයි. කොහොම හරි මම ආපහු ඇවිත් ඉන්නවා.

මේ ප්‍රශ්නය විසඳන්න අපට දේශපාලන විසඳුමක් ඕනෑ. දේශපාලන විසඳුමකට යද්දී ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. විපක්ෂය කියන්නේ ජනාධිපතිතුමායි, අගමැතිතුමායි දෙන්නාටම යන්න කියලා. ආණ්ඩුවේ ඔබතුමන්ලා ඒ ස්ථාවරයේ නැහැ. කොටසක් කිව්වා අගමැතිතුමාට යන්න කියලා. අගමැතිතුමා අද මේ සභාවට ඇවිත් ඉන්නවා. ඒ, එක ප්‍රශ්නයක්. දෙවනුව තිබෙන්නේ, අපි ඡන්දයකට යනවාද, වෙනත් ආණ්ඩුවක් හදනවාද කියන එක. තුන්වනුව තිබෙන්නේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාද කියන එක. මෙතැන ප්‍රශ්න වැඩියි. මම හිතන විධියට, අපි එකකින් ආරම්භ කළොත් හොඳයි. එකකින් ආරම්භ කරලා විධායක ජනාධිපති ක්‍රමය ගැන සහ ගත යුතු පියවර ගැන කථා කරමු.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා නීතිඥ සංගමයේ යෝජනාව අරගන්න කියලා. මම ලැහැස්තියි. ඒ වාගේම ජෙෆ්රි අලගරත්නම් මැතිතුමා සහ අපේ කාලිංග ඉන්ද්‍රතිස්ස මැතිතුමා ඇතුළු වෘත්තියවේදීන් කිපදෙනෙකුත් කරුණු දක්වා තිබෙනවා. ඒ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

යෝජනා අරගෙන, ඒවා පදනම් කරගෙන අපි ඔක්කොම කථා කරමු. ඒ හැම එකක් ගැනම කථා කරමු. අන්තර් කාලීන ආණ්ඩුව ගැන විතරක් නොවෙයි, එහි පළමුවැනි අකුරේ ඉඳන් අන්තිම අකුර වෙනකම් අපි කථා කරමු. ඒකේ මොකටද එකඟ වෙන්නේ කියලා බලමු. දෙවනුව, අපි ඊළඟට ගත යුතු පියවර, විශ්වාස භංග යෝජනා ආදී ඔක්කොම තිබෙනවා. ඒවා පක්ෂ නායකයන් කථා කරලා ගත යුතු තීරණ. ඒ අපට බෙදෙන ඒවා. ඒක කරන ගමන් අපි එකතු වෙන ඒවා ටිකක් කරමු. මම ඒකයි විශේෂයෙන්ම කියන්නේ. අපි මේ යෝජනා ගැන සාකච්ඡා කරමු.

අනෙක, පාර්ලිමේන්තුවට බලය ගන්න. මම එක යෝජනාවලියක් දීලා තිබෙනවා. තවත් යෝජනා තිබෙනවා ඇති. මම කියන්නේ නැහැ මේකම ගන්න කියලා. මේවා පදනම් කරගෙන අපි සාකච්ඡා කරමු. මෙතැන වාද කරන ගමන්, රටේ මූලික ප්‍රශ්න ගැන අපි හැම කෙනාම එකඟ වෙලා සාකච්ඡා කරමු. අන්තිමට කවුද ආණ්ඩුවේ ඉන්නේ, කවුද යන්නේ කියන ඔක්කොම ගැන අපි වෙනම කථා කරමු. අපට එකට වැඩ කරන්න පුළුවන් ඒවා එකට ගනිමු.

දේශපාලන විසඳුම ලබා ගන්න එක ගැන කථා කරලා අප අතර එකඟතාවකට එමු. කොහොම වුණත්, සුමාන දෙක තුනක් ඇතුළතදී අපි ඒ ගැනත් එකඟත්වයකට එන්න ඕනෑ. අපට මෙහෙම පාවෙන්න බැහැ. මොකද, මිනිසුන්ට දැන් පාර්ලිමේන්තුවත් එපා වෙලා තිබෙන්නේ. කවුරුත් තමන් ගැන කියනවා මිසක්, විසඳුම් ගැන කථා කරන්නේ නැහැ. ඉතින් අපි මේ කාරණය ගැන සාකච්ඡා කරලා විසඳුමක් ගන්න බලමු.

මම ආණ්ඩුවට දොස් කියලා ඇති. නමුත්, මේ වෙලාවේදී දොස් කියන්නේ නැහැ. මුදල් ඇමතිතුමනි, ඔබතුමාට උදව්වක් හැටියටයි මේ කියන්නේ. ආණ්ඩුව මේ කාරණා සැලකිල්ලට අරගෙන ඉදිරියට යන්න ඕනෑ. මම කියන්නේ නැහැ, මේ එක කාරණාවක්වත් ඉවතලන්න කියලා. විශ්වාස භංග යෝජනා ඇතුළු ඔක්කෝම ගැන වෙනම කථා කරමු. ඒ, අපි බෙදෙන කාරණා. ඒකෙන් කොහොමද එකඟතාවක් ඇති වෙන්නේ. ආර්ථික ප්‍රශ්න විසඳීම සම්බන්ධයෙන් අප එකඟ වෙන්නේ කොහොමද කියා බලලා අවශ්‍ය කමිටු පත් කරලා ක්‍රියාත්මක වෙමු කියලා මම ඔබතුමාට මේ අවස්ථාවේදී යෝජනා කරනවා, ගරු ඇමතිතුමනි. තව බොහෝ දෙනෙක් කථා කරන්න ඉන්න නිසා මම මීට වඩා කථා කරන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.37]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මම කථා කරන්න හදන කොටම මුදල් අමාත්‍ය අලි සබ්රි මැතිතුමා සභාවෙන් පිට වෙලා යනවා. ඇමතිතුමනි, ඇත්තටම ඒකෙන් ඔබතුමාගේ genuineness එක පෙනෙනවා. ඔබතුමා මෙච්චර වෙලා මේ ගරු සභාවේ විවේචන ඉදිරිපත් කළා. ඒවාට උත්තර දෙන කොට ඔබතුමාට අහගෙන ඉන්න ශක්තියක් නැහැ. ඇත්තටම කනගාටුයි!

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Shame! - [*Interruption.*]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Why can he not stay? If he wants our - [*Interruption.*] Now listen! අපට මෙච්චර කල් කිව්වා, අපේ අදහස් දෙන්න කියලා. ගරු අගමැතිතුමනි, අපේ අදහස් ඉල්ලුවා. අපි අදහස් ඉදිරිපත් කරන්න යන කොට එතුමා නැඟිටලා යනවා නේ. ඒකේ genuineness එකක් නැහැ නේ.

ගරු කථානායකතුමනි, එතුමා කිව්වේ මොකක්ද? IMF එකට මීට කලින් යන්න තිබුණා ලු; ගියේ නැති එක ඓතිහාසික වැරැද්දක් ලු. බදු කපා හැරපු එක ඓතිහාසික වැරැද්දක් ලු. රුපියල කලින් depreciate කරන්න තිබුණා ලු. ඒක නොකිරීම ඓතිහාසික වැරැද්දක් ලු. අපි එදා ඒවා කිව්වා නේ, ගරු අගමැතිතුමා. මට මතක විධියට ඔබතුමාගේ උපන් දිනය දවසේ තමයි, 2021 අය වැය විවාදය ආරම්භ කළේ. ඒ, 2020 නොවැම්බර් මාසයේ 18වැනි දා. එදා එම අය වැය විවාදය ආරම්භ කරමින් මම ඔබතුමාට කරුණු කිව්වා. ගරු අගමැතිතුමනි, ඔබතුමාගේ උපන් දිනයටත් සුබ පතලා මම කිව්වා, "අගමැතිතුමා, මේ යන ගමන වැරැදියි" කියලා. ඔබතුමා අපට කිසි විධියකින්වත් සවන් දුන්නේ නැහැ. එදා සවන් දුන්නා නම් අද අපේ රට බංකොලොත් වෙන්නේ නැහැ, ගරු අගමැතිතුමා. එදා අපේ රටේ ණය තිරසාරව තිබුණා. අදයි තිරසාර නැත්තේ.

අලි සබ්රි ඇමතිවරයා දැන් පිළිගන්නවා, වැරැද්දක් වුණා කියලා. අඩු ගණනේ දැන් හෝ ඒ වැරැද්ද නිවැරදි කර ගන්න එතුමා උත්සාහ ගන්නා නිසා ඇත්ත වශයෙන් අපි ඒ සම්බන්ධයෙන් එතුමාට අපේ ස්තුතිය පිරිනමනවා. මම වැඩි වෙලා කථා කරන්නේ නැහැ. නමුත්, වචන කීපයක් හෝ කථා කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

මුදල් ඇමතිතුමා කිව්වා, බදු අඩු කිරීම තමයි ප්‍රශ්නය කියලා. අපි කවුරුත් එය පිළිගන්නවා. අපේ මිත්‍ර, ආචාර්ය බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා කොයි වෙලාවේත් කියන විධියට, ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ රටේ බදු ආදායම සියයට 20ක් තිබුණා. ගරු අගමැතිතුමනි, 1994 ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගන්න කොට, - ඔබතුමා අගමැති වන කොට- බදු ආදායම සියයට 17යි. හැබැයි, ඔබතුමා නැවත අපට -රනිල් වික්‍රමසිංහ මෛත්‍රීපාල සිරිසේන ආණ්ඩුවට- රට භාර දෙන කොට බදු ආදායම සියයට 9ට අඩු වෙලා තිබුණා. ඊට පස්සේ කරපු දේවල් අමතක කරන්න නරකයි. අද මේ පාර්ලිමේන්තුවේ රවි කරුණානායක මැතිතුමා නැති වුණාට එදා එතුමා කළ දේවල් ගැනත් මම කථා කරන්න ඕනෑ. රවි කරුණානායක හිටපු ඇමතිතුමාට, ඒ වාගේම මංගල සමරවීර හිටපු ඇමතිතුමාට පුළුවන් වුණා ඔබතුමන්ලා ආයෙත් ආණ්ඩුව ගන්න කොට සියයට 12 ½ දක්වා බදු ආදායම නැවත වැඩි කරන්න. හරි ද? 2019 දී සිදු වුණු පාස්කු ඉරුදින ප්‍රහාරය නිසා යම්කිසි කලබගෑනියක් වුණා. ඊට කලින් සිදු වූ ව්‍යවස්ථා කුමන්ත්‍රණය නිසාත් යම්කිසි ප්‍රශ්න වගයක් ඇති වුණා. හැබැයි, ඊට පසුව නැවතත් බදු කපා හැරියා. අද ලෝකයේ බදු අඩුම රට ලංකාව. අලි සබ්රි ඇමතිතුමා කිව්වා, බදු ආදායම සියයට 8 ½ යි කියලා. ඒක වැරැදියි. බදු ආදායම සියයට 7 ½ යි කියලා මහ බැංකු වාර්තාවේ තිබෙනවා. එතුමා සියයට 8 ½ ක් කියන්නේ, බදු සහ බදු නොවන සියලු ආදායම. හැබැයි, බදු ආදායම සියයට 7 ½ යි. මෙහෙම රටක් ගෙන යන්න හැකියාවක් නැහැ.

එදා මංගල සමරවීර ඇමතිතුමා ගෙනා අලුත් බදු ප්‍රතිපත්තිය - බදු පනත- IMF එකත් එක්ක ක්‍රියාත්මක වන කාලයේදී නේ ඔබතුමන්ලා ඒක ඉරලා කුණු බක්කියට විසි කළේ. එහි ප්‍රතිඵලය ඔබතුමන්ලාට දැනගෙන ඉන්න තිබුණා නේ. තවදුරටත් ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. ඔබතුමන්ලා කලින් මේ දේ කළා නම් අද අපේ මිනිස්සු මේ විධියට දුක් විඳින්නේ නැහැ, ගරු අගමැතිතුමා.

අපේ ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේ, අද සියලු ස්තරවල මිනිසුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. මැද පන්තියේ මිනිස්සු ඒවා කියන්නේ නැහැ, ලජ්ජාවට. ගෙදර husband and wife විතරයි කථා කරන්නේ, අපේ වියදම කොච්චර අඩු කරන්න ඕනෑ ද, අපේ ඉතිරි කිරීමක් තිබෙනවා නම් ඒකෙන් අරගෙන එදිනෙදා ජීවත් වීම සඳහා වියදම් කරන්න ඕනෑ ද කියලා. අද පුවත් පත්වල සඳහන් වෙලා තිබෙනවා, සමෘද්ධි සහනාධාර ලබන අයටත්, අනෙක් සමහර අයටත්, රුපියල් 7,500 ගණනේ දෙන්න කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා කියලා. ඒක වැරැදියි. ඒ මුදල මදි. ඒ මුදල හැම දෙනාටම දෙන්න ඕනෑ. දරිද්‍රතාවෙන් පෙළෙන හැම දෙනාටම ඒ මුදල දෙන්න ඕනෑ.

ගරු අලි සබ්රි ඇමතිතුමා කථා කළා, යැපුම් මානසිකත්වයක් ගැන. ගරු අගමැතිතුමනි, අපේ සහනාධාරවලින් අතිබහුතරයක් පරිභෝජනය කරන්නේ ලංකාවේ සිටින පොහොසත්ම පවුල් ලක්ෂ දහය විසින්. ඒ පොහොසත්ම පවුල් ලක්ෂ දහය පරිභෝජනය කරනවා, සියයට 50කට වැඩි ප්‍රමාණයක්. අඩුම ආදායමක් ලබන පවුල් ලක්ෂ 10ක් සියයට 5ක විතර ප්‍රමාණයක් තමයි පරිභෝජනය කරන්නේ. ඒ විධියටම තමයි ඒ අයට සහනාධාරත් ලැබෙන්නේ. මේ සහනාධාරවලින් අතිබහුතරයක් ලබා ගන්නේ මේ රටේ වැඩිම ආදායමක් ලබන අයයි. අපි කරන්න ඕනෑ, සම්පූර්ණයෙන්ම මේක අනෙක් පැත්තට හරවන එකයි. සමෘද්ධි සහනාධාරය දෙන එක පිළිබඳව විශාල ගැටලුවක් තිබෙනවා. මොකද, එය දේශපාලනීකරණයවෙලා තිබෙන නිසා. සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු සමහර අයට එය ලැබෙන්නේ නැහැ. ඒ ගැන අපි දන්නවා. ලෝක බැංකුව මේ ළඟදි කරපු සමීක්ෂණයකින් පෙන්වනවා, සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු සියයට 60කට එය ලැබෙන්නේ නැහැ, සමෘද්ධි සහනාධාරය නොලැබිය යුතු සියයට 60කට එය ලැබෙනවා කියලා. ගරු අගමැතිතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් නැවතත් කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ බෙදන්න යන සල්ලි ප්‍රමාණයත් තම තමන්ගේ හෙන්චයියන්ට බෙදලා ඒ වැඩ පිළිවෙළත් දේශපාලනීකරණය කරන්න එපා කියලා. මේ ලබාදෙන රුපියල් 7,500ක මුදල් ප්‍රමාණය මදි. හැබැයි, ඒ මුදල හෝ දෙනවා නම්, දේශපාලන භේදයකින් තොරව සියලුදෙනාටම ඒ මුදල ලැබෙන්න සලස්වන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලනවා, ගරු අගමැතිතුමනි.

ගරු කථානායකතුමනි. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව සිකුරාදා දිනයේ ඉදිරිපත් කළා. දැන් මෙච්චර වෙලා කථා කරන්නේ, අය වැය පරතරය ගැන නේ. බදු අඩු වෙලා, වියදම වැඩි වෙලා කියලා අලි සබ්රි ඇමතිතුමා මහ ලොකුවට කිව්වා. අපි මේ සභාවේදී විවාද කළා, 2020 අය වැය පරතරය වැරැදියි කියලා. 2020 දී අය වැය පරතරය සියයට 14යි. හැබැයි, එය සියයට 11ක් කියලා ඔබතුමන්ලා මහ බැංකු වාර්තාවේ සඳහන් කරනවා. මහ බැංකු වාර්තාවේ පොඩි note එකක් දමලා කියනවා, "මේකට අපි වග කියන්නේ නැහැ. මුදල් ඇමතිතුමා එතුමාගේ අයවැය කථාවේදී කිව්ව ඉලක්කම තමයි අපි මෙහෙම සඳහන් කරන්නේ" කියලා. එහෙම කරන්න එපා. මේවා එළියට එනකොට, මේකේ debt analysis එක කරනකොට, forensic audit තුළින් මේක පෙනෙනකොට, අපි තවදුරටත් බොරු කරන්න යනවාය කියලා පෙනෙනවා. තවදුරටත් දත්ත හංගන්න එපා, ගරු අගමැතිතුමනි. එසේ කිරීම අපි අපටම වංචා කිරීමක් හැටියට තමයි අපි දකින්නේ.

මම දීර්ඝව කථා කරන්නේ නැහැ. මොකද, කියන්න තිබුණු බොහෝ දේවල් අපේ ගරු විපක්ෂ නායකතුමා ඉතාම පැහැදිලිව කියපු නිසා. නමුත් මට තව කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. හෙට අනිද්දාට ජීවත් වෙන්න ඩොලර් බිලියන 4ක් අවශ්‍යම වෙනවා කියලා කිව්වා. මේ මුදල් ලැබෙන්නේ කොහෙන්ද? ඩොලර් මිලියන 500ක් අවශ්‍ය බව කිව්වාම, ඉන්දියාව ඩොලර් බිලියන 5කට ආසන්න මුදල් ප්‍රමාණයක් ඔබතුමාට දීලා තිබෙනවා. මොකද, මුළු අවුරුද්දටම ගන්න බඩුවලට LCs හරහා ගෙවන්න ඕනෑ නැහැයි කියලා එතුමන්ලා එකඟවෙලා තිබෙනවා. මාසයකට ඩොලර් මිලියන 200ක් බැගින් අවුරුද්දකට ඩොලර් බිලියන දෙකහමාරක් අවශ්‍ය වෙනවා. තව ඩොලර් බිලියනයක් ආහාර සහ බෙහෙත් ගෙනෙන්න අවශ්‍ය වෙනවා. තව ඩොලර් මිලියන 500ක් ඉන්ධනවලට අවශ්‍ය වෙනවා. තවත් ඩොලර් මිලියන 500ක් ඉන්ධනවලට අවශ්‍ය වෙනවා. තව ඩොලර් මිලියන 400ක් swap එකට. එතකොට ඩොලර් බිලියන 5කට කිට්ටු වෙනවා. ඇත්ත වශයෙන්ම චීනයෙන් තවම එවැනි ආධාරයක් කරලා නැහැ.

ගරු අලි සබ්රි ඇමතිතුමා කියනවා, IMF එකට යෑම සම්බන්ධයෙන් ඒ අයත් එක්ක කථා කළාම, ඒ සඳහා ඒ ගොල්ලන්ගේ සහයෝගය තිබෙන බව කිව්වා කියලා. හැබැයි ඒ ගොල්ලෝ debt restructure කරන්න සූදානම් නැහැ. ඒ ගැන මීට වඩා දීර්ඝව කල්පනා කරන්න වෙනවා. එහෙම නම්, මේ ඩොලර් බිලියන ගණන අපට ලැබෙන්නේ කොහෙන්ද?

අද විශාල හෙළි කිරීමක් කළා. ගරු අගමැතිතුමනි, ඩොලර් මිලියන 50යි ලු, අපට තිබෙන්නේ. අපේ හිටපු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා දන්නවා, ඩොලර් මිලියන 50කින් මොනවාද කරන්න පුළුවන් කියලා. ඒ මුදලින් ඉන්ධන නැවක්වත් බා ගන්න බැහැ නේ. ඒ කියන්නේ, මේ රට බංකොලොත්භාවයෙනුත් පහළට වැටිලා තිබෙනවාය කියන එකයි අද මුදල් ඇමතිවරයා කියන්නේ. සල්ලි ගෙනෙන්නේ කොහෙන්ද? මට ආරංචියි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජපානයේ අගමැතිතුමාට ලියුමක් ලිව්වා කියලා. ඩොලර් බිලියන 3ක ආධාරයක් දෙනවා කියලා ඉස්සෙල්ලා කිව්වාය, එහි මුදල් ප්‍රමාණය සඳහන් නොකර එවන්න කියලා ඒ ගොල්ලෝ කිව්වාය කියලා සඳහන්වෙලා තිබෙනවා. යම්කිසි ධනාත්මක movement එකක් තිබෙනවා කියලා අපට ආරංචියි. ජනාධිපතිතුමා කිව්වා කියලා ආරංචියි, - මට සමා වෙන්න ඕනෑ.- LRT එකත් නැවත දෙනවාය කියලා. කෙසේ වෙතත්, අපට ජපානයෙන් සල්ලි ආවේ නැත්නම්, අපි හිරවෙනවා. අගමැතිතුමනි, ඒක තමයි ඇත්ත කථාව. වෙන කෙහෙන්වත් අපට සල්ලි එන්නේ නැහැ. අපි දැක්කා නේ, අජිත් නිවාඩ් කබ්රාල් හිටපු රාජ්‍ය ඇමතිවරයා කියපු දේවල්. අපට ඩුබායිවලින් අච්චර එනවාය, ඕමාන්වලින් මෙච්චර එනවාය, මැද පෙරදිග රටවලින් අච්චර එනවාය කිව්වා. නමුත්, ශත පහක්වත් ආවේ නැහැ නේ, ගරු අගමැතිතුමනි.

ජපානයෙන් එනතුරු විතරයි අපි දැන් බලාගෙන ඉන්නේ. අපේ සම්පූර්ණ බලාපොරොත්තුව තිබෙන්නේ ජපානය මත. ඒ නිසා අපේ විපක්ෂ නායකතුමා කියපු කාරණය ගැන පොඩ්ඩක් කල්පනා කර බලන්න. එතුමා මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, international donor conference එකකට කථා කරන්න, සමගි ජන බලවේගය හැටියට අපි ඒකේ වාඩි වෙලා දේශපාලන භේදයකින් තොරව මේ කටයුත්ත කර ගන්න එතුමාගේ නායකත්වය ලබා දෙනවා කියලා. ඒ ගැන ධනාත්මකව හිතන්න, ගරු අගමැතිතුමනි. ඒ යෝජනාව පිළිගන්න. ඒ යෝජනාව පිළිගෙන තවත් සති දෙකකින් මේ ගැන කථා කරන්න. එහෙම කරලා කොහොම හරි ජාත්‍යන්තරයට කථා කරලා, මේ ප්‍රශ්නය විසඳා ගන්න උත්සාහ කරන්න.

හිටපු අගමැතිතුමා බැංකු සම්බන්ධයෙන් කියපු කථාවේ ලොකු වැදගත්කමක් තිබෙනවා. මම මේ වෙලාවේ ඒ පිළිබඳ කථා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කරන්න යන්නේ නැහැ. නමුත් ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න සිදු වෙනවා. මා ඊට වඩා ඒ ගැන කියන්නේ නැහැ. ඊළඟට මේ macroeconomic stabilization කියන එක ස්ථාවර කර ගන්න ඕනෑ. දැන් බලන්න, ඩොලරය තවමත් වැටෙනවා නේ. ඩොලර් එකක් officially රුපියල් 360යි; unofficially 420යි. *[බාධා කිරීමක්]* අද බැංකුවේ රුපියල් 371යි ලු. කොහෙන්ද, මේක නවතින්නේ? අද කිව්වා, ඩොලර් මිලියන පනහයි තිබෙන්නේ කියලා. එය තවත් වැටෙනවා. එතකොට මිනිස්සු දන්නවා, රුපියලේ අගය අල්ලා ගන්න කිසිසේත් ආණ්ඩුවට හැකියාවක් නැහැ කියලා. මොන ඔළමොට්ටළ වැඩක්ද මේ කළේ? කවුද, මේ විධියට රටක මුදල් ඒකකයක් පා කරන්නේ? පා කරන ක්‍රමයක් තිබෙනවා; අච්චු පොතේ ලියා තිබෙනවා. ඒක විශේෂඥයෝ දන්නවා. ඒ සියලු දේ දැනගෙන මේ මනුස්සයෝ මේ වාගේ ඔළමොට්ටළ වැඩක් කළා නේ. ඒකට කවුද වග කියන්නේ? ගරු අගමැතිතුමනි, ඔබතුමා රජය භාර ගන්නකොට ඩොලරය රුපියල් 180ට තිබුණේ. පසු ගිය ආණ්ඩුව කාලයේ -අවුරුදු පහකදී- රුපියල් 130 ඉඳලා රුපියල් 180 දක්වා රුපියල් පනහකින් රුපියල අවප්‍රමාණය වුණාය කියලා ඔබතුමන්ලා අපට විවේචනය කළා. දැඩි විවේචනයක් කළා. එයිනුත් රුපියල් දහයක් අවප්‍රමාණය වුණේ 2018 ඔක්තෝබර් කුමන්ත්‍රණය දවස්වල. හැබැයි, අද තත්ත්වය කොහොමද? ඔබතුමා ආණ්ඩුව භාර ගන්නකොට රුපියල් 180ට තිබුණු ඩොලරය අද රුපියල් 370යි. සියයට සියයකට වඩා අවප්‍රමාණය වෙලා තිබෙනවා. මොන ලෝකයේද, මෙහෙම වෙන්නේ අගමැතිතුමනි? මෑත ඉතිහාසයේ ලෝකයේ කිසිම රටක මෙහෙම සිදු වෙලා නැහැ. ඔබතුමා රුපියල් 180ට ගත්ත ඩොලරය අද රුපියල් 371යි. ඒක අපරාධයක් නොවෙයිද? එතකොට මේ රුපියල වැටීම නිසා කී දෙනෙකුගේ ජීවිත අමාරුවේ වැටිලා තිබෙනවාද, කී දෙනෙකුට කිරි පිටි ටික ගන්න බැරි වෙලා තිබෙනවාද, කී දෙනෙකුට බෙහෙත් ටික ගන්න බැරි වෙලා තිබෙනවාද, ගරු කථානායකතුමනි? මේ දේවල් වෙලා තියෙද්දී නිකම් ඉල්ලා අස් වෙලා යන්න බැහැ. නිවාඩ් කබ්රාල් ඉල්ලා අස් වුණා ලු. මොකක්ද ඒකේ තේරුම? එහෙම පුළුවන්ද? අපේ රට, ජනතාව මෙච්චර විනාශ කරලා නිකම් ඉල්ලා අස් වෙලා යන්න බැහැ. මේක සාපරාධී ක්‍රියාවක් හැටියටයි අප දකින්නේ. මේ කට්ටිය accountable වෙන්න ඕනෑ; මේවාට වග කියන්න ඕනෑ; මේ කට්ටියගේ වග වීමක් තිබෙන්න ඕනෑ. අපි ඔබතුමන්ලාට කියනවා, කරුණාකර මේකේ නීති පැත්ත කල්පනා කරලා බලන්න කියලා. අලි සබ්රි ඇමතිතුමා තමයි අද Justice Minister වෙන්නෙත්. එතුමාට පුළුවන් ඒවා කරන්න.

පොලී අනුපාතය අද සියයට 25යි, ගරු අගමැතිතුමනි. සියයට 25යි, 26යි, 27යි, සමහර වෙලාවට සියයට 30ටත් යන්න ඉඩ තිබෙනවා. මා මිත්‍ර බන්දුල ගුණවර්ධන මැතිතුමා ඒ ගැන කියාවි. එතකොට කොහොමද, කුඩා හෝ මධ්‍යම පරිමාණ ව්‍යාපාර කරගෙන යන්නේ? අද කුඩා හෝ මධ්‍යම පරිමාණ ව්‍යාපාරයක් ගැන හිතන්නවත් පුළුවන්ද? සියයට 30ක පොලියට ණය අරගෙන ඒවා කරන්නේ කොහොමද? දැන් කියනවා, කරන්න දෙයක් නැහැ ලු. දැන් කරන්න දෙයක් නැහැ තමයි. තව මාස හයක්වත් මේ තැන තියා ගන්න වෙයි. එතකොට මේකට වග කියන්න කෙනෙක් ඉන්න ඕනෑ.

අනෙක් කාරණය තමයි උද්ධමනය. ගරු අගමැතිතුමනි, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ඔබතුමා යටතේ නේ තිබෙන්නේ. අන්න, official figure එක දමලා තිබෙනවා. අප්‍රේල් මාසයේ ආහාර උද්ධමනය සියයට 47යි ලු. Unofficial figure එක ඊටත් වඩා වැඩියි. ආහාර මිල සියයට 47කින් ඉහළ යනවා නම්, කොහොමද දෙවියනේ ජීවත් වෙන්නේ? පොල් ගෙඩියක් කීයද, අගමැතිතුමනි? රුපියල් 100යි. පරිප්පු කිලෝ එකක් කීයද? රුපියල් 520යි. හාල් කිලෝ එකක් කීයද? රුපියල් 240යි. සීනි කිලෝ එකක් කීයද? රුපියල් දෙසිය ගණනක්. ඔබතුමා ආණ්ඩුව භාර ගන්නකොට, අපේ තිබුණා "ශක්ති" කියලා ව්‍යාපාරයක්. ඒ හරහා එදා සම්බා කිලෝවක් වික්කේ රුපියල් 85ට. 2019 නොවැම්බර් මාසයේ 18 වැනිදා වනකොට සම්බා කිලෝවක් රුපියල් 85යි. රුපියල් 85ට තිබුණු සම්බා කිලෝ එක අද රුපියල් 240යි. ඊටත් වැඩි ඇති. මේක stabilize කරන්න ඕනෑ. When it comes to stabilization, I am talking about interest rates, inflation rates and exchange rates. There has to be a system to stabilize this economy. Without stability, it is going haywire. So, you need to take the essential steps to do that.

අනෙක් එක තමයි, restructuring. ඒ ගැන මම දීර්ඝව කථා කරන්නේ නැහැ, but it is important. ගරු අගමැතිතුමා, තවම ඔබතුමන්ලා පත් කරලා නැහැ නේ Financial and Legal Adviser කෙනෙක්. Financial and Legal Adviser ඉතාම වැදගත්. ඒ ගොල්ලන්ට experience තිබෙන්න ඕනෑ. අපට එහෙන් මෙහෙන් කනට ඇහෙනවා නොයෙකුත් කණ්ඩායම් පත් කරන්න යනවා කියලා. එහෙම කරන්න බැහැ. පත් කරන පුද්ගලයාට experience එකක් තිබෙන්න ඕනෑ. අපට ආරංචිය ආවේ වෙනිසියුලාවේ නිකොලස් මඩුරෝ ගැන කථා කළ කණ්ඩායමක්, ඩොලර් මිලියන 13.8ක් අය කරපු කණ්ඩායමක් පත් කරන්න යනවා කියලා. මම විශ්වාස කරනවා, මේ එහෙම දෙයක් නොවෙයි කියලා. Who is the Head of the Technical Evaluation Committee? They must be certain that they are going to hire the best people. අපි ඉතාම අන්ත, අමාරු තැනකට වැටිලා තිබෙන්නේ. Therefore, we have to hire the best in the world to speak on our behalf. So, do not appoint any third-grade people or people who do not have the necessary experience in proper debt restructuring. සමහරු debt restructure කරලා තිබෙනවා, ඩොලර් මිලියන 500ක්, එහෙම නැත්නම් එක series එකක්. එහෙම නොවෙයි, අපේ තිබෙනවා ඩොලර් බිලියන 51ක්. ඩොලර් මිලියන 500ක් නොවෙයි, ඩොලර් මිලියන 51,000ක්. ඩොලර් බිලියන 51ක් කියන්නේ ඒක තමයි. It is a huge amount! Hon. Ali Sabry, as you know, it is not one series; it is a multiple series. We will have to redo the whole thing. So, you have to have the best in the world to do this. Therefore, do not go and hire some two-bit operator who operates on a franchise basis.

The last point I want to make is about social protection. අපේ විපක්ෂ නායකතුමා නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය පිළිබඳව කිව්වා. ඒවාට අත තියන්න එපා. මම ඉතා වගකීමෙන් මේක කියන්නේ. ගරු අගමැතිතුමනි, 1990 සුව සැරිය සේවය පවත්වාගෙන යන්න අද සල්ලි නැහැ. මගෙන් සභාපතිතුමා ඇහුවා, "අපි මොකද හර්ෂ කරන්නේ?" කියලා. අද දවස වනකොට එක දවසකට සුව සැරියෙන් මිනිස්සු 1,000කට වඩා critical careවලට ගෙනෙනවා. ලංකාවේ හැම තැනකම සිටින මිනිස්සු අද 1990ට call කරනවා. මේ සේවාව නිසා ඒ මිනිස්සු මැරෙන්නේ නැතිව ජීවිතය බේරා ගන්නා තැනක අද ඉන්නවා. 1990 සුව සැරිය සේවාවට සල්ලි ටික දෙන්න, ගරු අගමැතිතුමා. ඒවා තමයි emergency කියන්නේ. ඒකට සල්ලි නැහැ; දුවන්න විධියක් නැතිව හෙට වහයිද දන්නේ නැහැ. Hon. Minister of Finance, I am making a personal appeal. Please, allocate the necessary funds to run this free emergency ambulance service! I will ask the Chairman to call you later this morning. ඒ නිසා මේ social protection ඉතාම වැදගත්. සමෘද්ධිලාභීන්ට විතරක් රුපියල් 7,500ක් දීලා මේක කරන්න බැහැ. යැපුම් මානසිකත්වය ගැන එතුමා කියපු කාරණය මම පිළිගන්නවා. එතුමා සභාවේ හිටපු නැති වෙලාවේ මම ඒ පිළිබඳ

කථා කළ නිසා නැවත මම ඒ ගැන කියන්නේ නැහැ. හැබැයි, අලුතින්ම හිතන්න වෙනවා, මිනිසුන්ට ජීවත් වෙන්න අවශ්‍ය social safety net එකක් සම්බන්ධයෙන්. මට කියන්න නම් තව ගොඩක් දේවල් තිබෙනවා. නමුත්, කාල වේලාව මදි නිසාත්, තවත් අය කථා කරන්න සිටින නිසාත් මම මීට වඩා කථා කරන්නේ නැහැ. අවසාන වශයෙන්, අලි සබ්රි මැතිතුමා ගැන මම එක දෙයක් appreciate කරන්න ඕනෑ. I am happy that you finally told this country the truth from your side. We appreciate that and that is what we expected from you as a professional and you have delivered it. I want to acknowledge that. That is why I wanted you to stay when you were trying to leave, not for anything else.

විපක්ෂ නායකතුමා කියපු විධියට, මේ කර්තව්‍යයට සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. හැබැයි, වෙන විධියකට මේ කටයුත්ත කරමු කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අද, -

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. පසුව ඔබතුමාට කථාවක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
මට පොඩ්ඩක් කථා කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඔබතුමා මගේ කථාවෙන් පස්සේ කථා කරනවාද?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
මට පොඩ්ඩක් කථා කරන්න දෙන්න. අපේ ජනතාව වෙනුවෙන් මම කථා කරන්නේ. මට point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ගරු කථානායකතුමනි, සමෘද්ධිලාභීන්ට රුපියල් 7,500ක මුදලක් දෙනවා කියලා අද කියා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. නමුත්, වතු කම්කරුවන් දුප්පත් වෙලා කන්න නැතිව ඉන්නවා. ඒ ගොල්ලන්ට මොකක්ද කරන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[පූ.භා. 11.55]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, අද රට මුහුණ දී තිබෙන ආර්ථික අර්බුදයේ ගැඹුරත්, ඊට විසඳුම් සොයා ගත යුතු මාවත පිළිබඳවත් මුදල් අමාත්‍යතුමා යම් අදහසක් ඉදිරිපත් කළා. ඒ වාගේම එතුමා කිව්වා, "මේ අර්බුදය වෙස් වළාගත් ආශීර්වාදයක්" කියලා. හැබැයි, මුදල් ඇමතිතුමනි, මේ අර්බුදය වෙස් වළාගත් මාරාන්තික ආශීර්වාදයක්. වෙස් වළාගෙනවත් මේ වාගේ ආශීර්වාදයක් නොපැමිණේවා කියා තමයි මම ප්‍රාර්ථනා කරන්නේ. ඒ මොකද? දීර්ඝ කාලයක් අපේ රට අනුගමනය කරන ලද වැරදි ආර්ථික ප්‍රතිපත්තියේ බරපතළ ප්‍රතිවිපාකවලට අද අපි මුහුණ දෙමින් සිටිනවා. පාර්ලිමේන්තුවේදීත්, පිටතදීත් දීර්ඝ කාලයක් මුළුල්ලේ අපි පෙන්වා දෙනු ලැබුවා පැවති පාලන සහ පවතින පාලනය අනුගමනය කරමින් තිබෙන ආර්ථික සංවර්ධන උපාය මාර්ග අපේ රට ඉතා අසීරු තැනකට හෙළන බව. ඒක අද අපේ ඇස් ඉදිරිපිට පෙනෙමින් තිබෙනවා. ඒ වාගේම, අපි බොහෝ විට ඉදිරිපත් කළ අදහස් අද මුදල් අමාත්‍යවරයා විසින් පුනරුච්චාරණය කර තිබෙනවා.

අපේ ආර්ථිකය දිගු කාලීන වශයෙන් ප්‍රධාන අර්බුද පහකට මුහුණ දී තිබුණා. පළමුවැනි අර්බුදය තමයි, ඔබතුමා කියූ පරිදිම රාජ්‍ය ආදායම හීන වීම. 1996දී සියයට 23ක් ලෙස තිබුණු රාජ්‍ය ආදායම 2015 වනකොට සියයට 11.5 දක්වා හරි අඩකින් කඩා වැටුණා. අපිට සැලැස්මක් තිබුණේ නැහැ, කෙසේද අපි මේ රාජ්‍ය ආදායම් පංගුව වැඩි කර ගැනීම සඳහා නිශ්චිත දැක්මක් සහිතව පාලනය කරන්නේ කියන එක සම්බන්ධයෙන්. ඔහේ ගෙනිච්ච ආර්ථිකයක් තමයි අපිට තිබුණේ.

ඊළඟ ප්‍රධාන අර්බුදය හැටියට අපේ රටේ නිර්මාණය වුණේ ආනයන හා අපනයන අතර පරතරයයි. අපේ වෙළෙඳ ශේෂය දීර්ඝ ලෙස වර්ධනය වෙන්න පටන් ගත්තා. 1978ට පෙර අපට ධන වෙළෙඳ ශේෂයක් තිබුණා. හැබැයි, එය ගිය අවුරුද්ද වනකොට බිලියන 8.5ක ඍණ වෙළෙඳ ශේෂයක් දක්වා වර්ධනය වී තිබෙනවා. ඒ අනුව පේනවා, ආනයන හා අපනයන අතර ඇති වී තිබෙන මේ පරතරය විසඳා ගැනීම සඳහා වූ දැක්මක් සහිතව රට පාලනය කළේ නැහැ කියලා.

තුන්වනුව, අපි විශාල ණය අර්බුදයකට මුහුණ දුන්නා. විශේෂයෙන්ම 2007 ඉඳලා ජාත්‍යන්තර බැඳුම්කර විකිණීමෙන්

[ගරු අනුර දිසානායක මහතා]

ණය ලබා ගැනීමට පෙලඹුණා. විශාල කොන්ක්‍රීට් වනාන්තර ගොඩ නැඟුවා විනා සැබැවින්ම රටේ සංවර්ධන උපාය මාර්ගවලට සහ ජන ජීවිතයත් එක්ක සම්බන්ධ වුණු සංවර්ධන මාවතකට මේ ණය යොදවන්න අසමත් වුණා. අද ඒකේ ප්‍රතිවිපාකයක් ලෙස ණය ගෙවා ගන්න බැරි රාජ්‍යයක් බවට අපේ රට පරිවර්තනය වී තිබෙනවා. දිගු කාලයක් තිස්සේ ණය ගනිමින් ගොඩ නඟන මේ කොන්ක්‍රීට් වනාන්තරවලින් ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව මා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා මට මතකයි, ගරු කථානායකතුමනි. 2003 වකවානුවේ ග්‍රීසියේ මෙවැනිම අර්බුදයක් මතු වනකොට එහි කොමියුනිස්ට් පක්ෂයේ නායිකාව ඔලිම්පික් උළෙල පවත්වා අවසන් වනකොට කිව්වා, "මේ රටේ ජනතාවට කන්න වෙන්නේ මේ ඉදිකර තිබෙන කොන්ක්‍රීට්" කියලා. අපිටත් එහෙමයි. අපි මහා සංවර්ධන ව්‍යාපෘති ලෙස මේවා හුවා දක්වන්න පටන් ගත්තා. ඒවා අස්සේ අතිශය දූෂිත ගනුදෙනු සිදු වුණා. අද මේ ණය බර, මේ රටේ සංවර්ධනය වෙනුවෙන් හෝ මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම වෙනුවෙන් ගන්නා ලද ණය බරට වඩා බරක් බවට පත් වී තිබෙන්නේ ඒ අතර සිදු වුණු මේ අතිශය දූෂිත ගනුදෙනු නිසායි. මේ ණය අර්බුදය අද අපේ රටේ ගෙල දක්වාම ගිලී තිබෙනවා. එයට තමුන්නාන්සේලා උපාය මාර්ගයක් හැදුවේ නැහැ.

හතරවනුව, අපේ රටේ නිෂ්පාදන ක්‍රමානුකූලව කඩාගෙන වැටෙන්න පටන් ගත්තා. අපේ කර්මාන්තශාලා වැහෙනකොට, අපේ තේ නිෂ්පාදනයේ ඵලදායිතාව අඩු වනකොට කිසිදු සැලැස්මක් සකස් කර ගන්න අපට බැරි වුණා. ඒ නිසා හැම දෙයම ආනයනය මත රඳා පවතින, රටේ ජාතික සම්පත් විකුණමින්, පාළුවට යමින්, කඩා වට්ටමින්, කඩදාසි කම්හල් වහමින්, රසායනික කර්මාන්තශාලා වහමින්, සීනි කර්මාන්තශාලා වහමින්, පොහොර කර්මාන්තශාලා වහමින්, තේ වතු ටික විකුණමින්, අපේ වැදගත්ම නැව් තෙල් අංශය, marine service එක විකුණමින් තමුන්නාන්සේලා අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිවිපාක හැටියට මහා පරිමාණ ලෙස අපේ රටේ නිෂ්පාදනය කඩාගෙන වැටෙන්න පටන් ගත්තා. ඒ ප්‍රතිවිපාකවලට අද අපි මුහුණ දී තිබෙනවා.

පස්වනුව, අපේ රටේ ආර්ථික අර්බුදයේ පවතින ප්‍රධාන අර්බුදය තමයි මේ රටේ ජාතික නිෂ්පාදනය සාධාරණ ලෙස බෙදෙන්නේ නැතිකම. ඉහළ ඉන්න ඉතා කුඩා පංගුවක් රටේ ජාතික නිෂ්පාදනයෙන් අතිශය විශාල ප්‍රමාණයක් බුක්ති විඳිනවා. සංඛ්‍යා දත්තවලට අනුව රටේ ඉහළම ආදායම් ලබන සියයට 10 රටේ ජාතික නිෂ්පාදනයෙන් සියයට 38.4ක් බුක්ති විඳිනකොට පහළම ආදායම් ලබන සියයට 10ට හම්බ වෙන්නේ රටේ ජාතික නිෂ්පාදනයෙන් සියයට 1.1යි. අතිශය අසාධාරණ ආදායම් විෂමතාවක් ඇති වෙලා තිබෙනවා. මෙය සමනය කර ගැනීම සඳහා වූ ආර්ථික වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න තමුන්නාන්සේලා අසමත් වී තිබුණා. ඒ නිසා දශක ගණනාවක් මේ රට පාලනය කරන ලද පාලක කණ්ඩායම් විසින් ඇති කරන ලද ඒ දිගු ආර්ථික අර්බුදය, දිගු ආර්ථික වැරැදි උපාය මාර්ගයේ ප්‍රතිවිපාකවලට අද අපි මුහුණ දෙමින් සිටිනවා.

මම හැම දාමත් කියනවා ගරු කථානායකතුමනි, අපේ රට දුප්පත්, හැබැයි, අපේ රටේ පාලකයෝ පොහොසත් කියලා. රටක් දුප්පත් වී පාලකයෝ පොහොසත් වුණේ කොහොමද? රටක් දුප්පත් වී පාලකයෝ පොහොසත් වුණේ අන් කවරක් නිසාවත් නොවෙයි, රට සංවර්ධනය කිරීම සඳහා ආ ධනය පාලකයන් මත තොග ගණන් ගොඩ ගැහෙන්න පටන් ගත්ත නිසායි. අද ඒකේ ප්‍රතිවිපාකවලට අපේ රටේ සාමාන්‍ය ජනයා -පුරවැසියා- මුහුණ දෙමින් තිබෙනවා. ආහාර වේලක් සපයා ගන්න බැරුව, වාහනයට තෙල් ටිකක් ගහගන්න බැරුව, ගෑස් සිලින්ඩරයක් මිලදී ගන්න බැරුව, දරුවාට කිරිපිටි ටිකක් මිලදී ගන්න බැරුව, කුඹුරට පොහොර ටිකක් ගහගන්න බැරුව අතිශය වේදනාකාරී ජන ජීවිතයකට අපේ රටේ පුරවැසියා අද මුහුණ දී තිබෙනවා.

දිගු කාලයක් ආපු මේ ආර්ථික ගමන තුළ විශාල ලෙස අර්බුදයක් ඇති කළා, පසුගිය අවුරුදු දෙකහමාරකට ආසන්න කාලය තුළ ගනු ලැබූ තීන්දු. විශේෂයෙන්ම මුදල් අමාත්‍යතුමා එම තීන්දු වැරදි බව පිළිගන්නවා. හැබැයි, මේවා සාමාන්‍ය වැරදිද? බිලියන 650කට ආසන්න මුදල් ප්‍රමාණයක්, භාණ්ඩාගාරයට ලැබෙන මුදල් ප්‍රමාණයක් කපා හැරීම, අත් වැරැද්දක්ද? කෘෂිකර්මාන්තයට අවශ්‍ය ප්‍රධාන යෙදවුමක් වන පොහොර නතර කිරීම අත් වැරැද්දක්ද? මේ අර්බුදය තවත් වර්ධනය වන ප්‍රධාන හේතුවක් වුණා, තොග ගණනින් මුදල් මුද්‍රණය කිරීම. එසේ තොග ගණන් මුදල් මුද්‍රණය කිරීම අත් වැරැද්දක්ද? මෙම අර්බුදය තීව්‍ර වෙන්න එතුමා කියපු පරිදිම රුපියල ඉතාම තක්කඩි ලෙස, හිතුවක්කාර ලෙස 203 රඳවා තබා ගැනීමට දැරූ උත්සාහය, සරල අත් වැරැද්දක්ද? නැහැ, මේවා මාරාන්තික අත් වැරදි.

ඔබතුමා දන්නවා, 1997 මැයි මාසයේ 02 වැනි දා තායිලන්තයේත් මේ වාගේම අර්බුදයක් ආවා. ඩොලරයක් වෙනුවෙන් ගෙව්වේ බාට් 25යි. පහුව දා ඩොලරය වෙනුවෙන් බාට් 50ක් දක්වා ගෙව්වා. බාට් එකට සාපේක්ෂව ඩොලරය විශාල අගයකින් ඉහළ ගියා. පසුව මොකද කළේ? එහේ සාමාන්‍ය පුරවැසියෙක් ගිහිල්ලා නඩුවක් දැම්මා. එම නඩුව අනුව තායිලන්තයේ මහ බැංකු අධිපතිවරයා හිරේ ගියා. මුදල පාලනය කරගන්න බැරි වීමේ වැරැද්දට තායිලන්තයේ මහ බැංකු අධිපතිවරයා හිරේ ගියා. නමුත් මෙහේ කොහොමද? රටක ආර්ථිකය මුළුමනින්ම විනාශ කරලා, රටක් මුළුමනින්ම කාබාසිනියා කරලා, රටේ පුරවැසියන්ට, ලෙඩුන්ට බෙහෙතක් ගෙනෙන්න බැරි තත්ත්වයක් ඇති කරලා, රටට පොහොර ටික ලබා දෙන්න බැරි තත්ත්වයක් ඇති කරලා, කුසට ආහාර වේලක් උපයා ගන්න බැරි තත්ත්වයක් ඇති කරලා, කර්මාන්තවලට අමුද්‍රව්‍ය ගෙන්වා ගන්න බැරි තත්ත්වයක් ඇති කරලා මුළු රටක්ම ආර්ථික අමු සොහොනක් බවට පරිවර්තනය කරලා "අනේ අපි අතින් හීනි වැරැද්දක් වුණා" කියලා පිළිගැනීම සාධාරණ ද? ඒක කොහොමද කුඩා වැරැද්දක් වෙන්නේ? ඒක මාරාන්තික වැරැද්දක්. ඒ වැරැද්ද හැදුවේ කවුද? ඒ වැරැද්දට මූලික වශයෙන් මේ ජනාධිපතිවරයා වග කියන්න ඕනෑ. එතුමා තමයි මේ රට පාලනය කිරීමේ මූලිකයා. එතුමාට මේ වගකීමෙන් අත් හැරෙන්න පුළුවන් ද? මේ කැබිනට් මණ්ඩලයට ඒ වගකීම මඟ හරින්න පුළුවන් ද? කැබිනට් පත්‍රිකා සම්මත වෙනකොට, මුදල් තොග ගණන් අච්චු ගහනකොට, බොරු අය වැය ලේඛන ඉදිරිපත් කරනකොට, බොරු සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරනකොට, ඒවා අනුමත කරපු කැබිනට් මණ්ඩලයක් තමයි හිටියේ. ඒ කැබිනට් මණ්ඩලයට මේ වගකීමෙන් අත් මිදෙන්න පුළුවන් ද? මේ වගකීමෙන් මුදල් අමාත්‍යවරයාට අත් හැරෙන්න පුළුවන් ද?

විශේෂයෙන්ම ඔබතුමන්ලා දන්නවා හිටපු මුදල් අමාත්‍යවරුන් දෙදෙනා ගැනම. එක්කෙනෙක් මහින්ද රාජපක්ෂ, අනෙක් එක්කෙනා බැසිල් රාජපක්ෂ. මේ දෙදෙනාට මේ වගකීමෙන් අත්හැරෙන්න පුළුවන් ද? රටක් ආර්ථික වශයෙන් අමු සොහොනක් බවට පරිවර්තනය කරලා, "අනේ, අපි අතින් වැරැද්දක් වුණා. අපි ස්වයංව ඒක පිළිගන්න කැමැතියි. පිළිගැනීමත් ලොකු දෙයක් නේ." වාගේ කියන එක සාධාරණ නැහැ. මේක කුඩා වැරැද්දක් නොවෙයි, මේක මාරාන්තික වැරැද්දක්. එහෙම නම් මේ මාරාන්තික වැරැද්ද නිවැරදි කරගත හැකි වන්නේ ආර්ථික වශයෙන් රට මෙවැනි විශාල ප්‍රපාතයකට, ජනතාව විශාල පීඩාවකට ලක් කරපු පාලක කණ්ඩායම ඉවත්වීමෙන්. එසේ නැතුව කොහොමද මේකට සාධාරණයක් ඉටු

වන්නේ? එය කළ හැක්කේ කුඩා කුඩා පුටු මාරු කිරීම්, කුඩා කුඩා තනතුරු මාරු කිරීම්වලින් නොවෙයි. මම ඔබතුමාගේ තනතුර පිළිබඳව ප්‍රශ්න කරනවා නොවෙයි. හැබැයි, එයින් මීට විසඳුමක් ලැබෙන්නේ නැහැ.

ඔබතුමා අවසාන වශයෙන් කිව්වේ මොකක්ද? මේ සඳහා පාර්ලිමේන්තුවේ ඔක්කෝම එකතු වෙන්න ඕනෑ කිව්වා. ඔව්, එහෙම එකතුවක් අවශ්‍යයි. මොකද, අපේ ඇස් ඉදිරිපිට තිබෙන්නේ විශාල විනාශයක් නම්, විශාල ආර්ථික කඩා වැටීමක් නම්, ඒ ආර්ථික කඩා වැටීම අපේ ඇස් ඉදිරිපිට විද්‍යමාන වී තිබෙනවා නම්, මැයි අග ජුනි මුල වෙනකොට මොන තරම් ආර්ථික අවපාතයකට, කඩා වැටීමකට අපේ රට යාවිද, පුරවැසියන්ට ආහාර වේලක් සපයා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා නේද කියන ව්‍යසනය අපි ඉස්සරහා දකින කොට, අපට බියජනක චිත්‍රයක් මැවෙනවා. ඒක ඇත්ත. බියජනක චිත්‍රයක් අපි ඉස්සරහා තිබෙන්නේ. එහෙම නම් සද්භාවය එන්න ඕනෑ කාගෙන්ද? සද්භාවය එන්න ඕනෑ විපක්ෂයෙන් නොවෙයි, ආණ්ඩුවෙන්. ආණ්ඩුවෙන් සද්භාවය එන්න ඕනෑ. මේ අර්බුදය වර්ධනය කරන්න අවුරුදු දෙකහමාරක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේදීත්, මීන් පිටතදීත් ගනු ලැබූ තීන්දු පිළිබඳව මොන තරම් කථා කළාද? මේ බදු සහනය 2020 ජනවාරි මාසයේ 01වැනි දා ලබා දෙන කොට, 2021දීවත් අත්හරියි කියලා බලාපොරොත්තු වුණා, 2022දීවත් අත්හරියි කියලා බලාපොරොත්තු වුණා. නමුත් එහෙම කළේ නැහැ, තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා ඒ ගැන ඉතා ආස්වාදයෙන් කථා කරන්න පටන් ගත්තා, "අපේ කර්මාන්ත ඉහළ නංවන්න, අපේ ආයෝජන ඉහළ නංවන්න, අපේ පෞද්ගලික අංශයට දිරි දෙන්න තමයි මේවා කළේ." කියලා. නමුත් එයින් කිසි ප්‍රතිඵලයක් අත්පත් කරගෙන නැහැ.

මුදල් තොග ගණන් අච්චු ගහනකොට පාර්ලිමේන්තුවේදී අපි කිව්වා, "මේ විධියට මුදල් අච්චු ගහන්න එපා. උද්ධමනය විශාල ලෙස ඉහළ යනවා. පුරවැසියන්ට භාණ්ඩ සහ සේවා මිලදී ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. මේ රට සිම්බාබ්වේ ආර්ථික උපාය මාර්ගයේ තමයි යන්නේ" කියලා. ඒ වෙලාවේ නව ආර්ථික න්‍යායක් -නව මූල්‍ය න්‍යායක්- ගැන කබ්රාල් මෙතැන දොඩන්න පටන් ගත්තා. එහෙමයි වුණේ. මේ පාලකයන් කිසිවෙකුට ඇහුම්කන් නොදුන්න පාලකයෝ, කිසිවක් බැරෑරුම්ව කල්පනා නොකරපු පාලකයෝ. ඒ පාලකයන්ටම හරියන කණ්ඩායමක් හිටියා. එතුමන්ලා මේවා ගැන ආස්වාදයෙන් දොඩවන්න පටන් ගත්තා. සමහරු ඇමතිවරු ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේම කිව්වා, "අපට ඇති තරම් මුදල් තිබෙනවා. කලබල වෙන්න එපා" කියලා. දැන් තමුන්නාන්සේලා අද කියනවා මුදල් අර්බුදයක් ගැන. මේ ඉදිරිපෙළ ඉන්න ආණ්ඩුවේ ඇමතිවරුම කිව්වා ඇති තරම් මුදල් තිබෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න. මම අවසන් කරනවා.

පාරවල් කිලෝමීටර 100,000ක් කොන්ක්‍රීට් කරනවා කියලා එතුමන්ලා කිව්වා. මෙවැනි දැවැන්ත අර්බුදයක් තිබෙද්දී රුවන්පුර Expressway එක හදන්න මුල්ගල තියන්න පටන් ගත්තා. මෙවැනි අර්බුදයක් තිබියදී රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරලා තව expresswaysවලට මුල්ගල් තියන්න පටන් ගත්තා. ජනතාවගේ කුසගින්න පිළිබඳ ප්‍රශ්නය කල්පනා කළේ නැහැ. ඒ නිසා දැන් මේ රට අලුත් පරිවර්තනයකට ලක් කරන්න අවශ්‍ය නම්, ඉස්සෙල්ලාම ආණ්ඩුව පැත්තෙන් සද්භාවය පෙන්වන්න ඕනෑ. ඒකට අපි ලෑස්තියි. හැබැයි ගරු කථානායකතුමනි, මේ අර්බුදයට මූලික වග කිවයුත්තා වන ගෝඨාභය රාජපක්ෂ මුලසුනේ තබාගෙන ගොඩනඟන කිසිදු සර්ව පාක්ෂික ආණ්ඩුවකින් මේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නේ නැහැ. එතුමා ඉවත් වෙනවා නම්, අග්‍රාමාත්‍යවරයා ඉවත් වෙනවා නම්, පාර්ලිමේන්තුව තුළ යම් එකඟතාවකට එන්න අපි සූදානම්. එහෙම නැතුව, කිසිවකුට ඇහුම්කන් නොදී, කෘෂි විද්‍යාඥයන්ට ඇහුම්කන් නොදී, ආර්ථික විශේෂඥයන්ට ඇහුම්කන් නොදී, වෛද්‍ය විශේෂඥවරුන්ට ඇහුම්කන් නොදී හිතුවක්කාර ලෙස රට පාලනය කරපු පාලකයෙක් මුලසුනේ තියාගෙන ඔබතුමා අපට යෝජනා කරනවාද සර්ව පාක්ෂික ආණ්ඩු හදන්න? ඒකට අපි ලෑස්ති නැහැ. ඔබතුමාට මතක ඇති, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට දැන් බන්දුල ගුණවර්ධන මැතිතුමා වාඩි වෙලා ඉන්න තැන ඉඳගෙන ඔබතුමා කියපු කරුණු. ඒ වෙලාවේ අපි අනතුරු ඇඟවුවා ඒකෙන් විය හැකි ප්‍රතිවිපාක ගැන. හැබැයි තමුන්නාන්සේලා ඒ ගැන සැලකිල්ලක් කළේ නැහැ. කමක් නැහැ. හැබැයි තමුන්නාන්සේලා පශ්චාත්තාපයකට ඇවිල්ලා සද්භාවයෙන්, විවෘත මනසින් පාර්ලිමේන්තුවේ යම් එකඟතාවක් සහිතව මේ අර්බුදයට විසඳුම් සෙවීම සඳහා යෝජනාවක් ගෙන එනවා නම්, අපි ඒකට පක්ෂපාතියි. හැබැයි මේ අවුරුදු දෙකහමාර තුළ මේ අර්බුදයේ පොල්මෑකාරයා, උරුමක්කාරයා කවුද? ඒ තමයි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා. එතුමා මුලසුනේ තියාගෙන හදන සර්ව පාක්ෂික ආණ්ඩුව මොකක්ද? එවැනි සර්ව පාක්ෂික ආණ්ඩුවකට අපි සම්බන්ධ වෙන්න සූදානම් නැහැ. එතුමා ඉවත් වෙන්න ඕනෑ. අග්‍රාමාත්‍යවරයා ඉවත් වෙන්න ඕනෑ. එතකොට කෙටි කාලයකට මේ පාර්ලිමේන්තුවේ අපි එකඟතාවකට එමු. ඒකට අපි ලෑස්තියි. මොකද, මේක අපේත් රට. ගරු කථානායකතුමනි, මේ රට ගොඩක් අයගේ රට නොවුණාට අපි මියැදෙන, අපේ සිරුරු පස්වන රට. අපේ රටේ ඥාතීන් මේ දුක් විඳින්නේ; අපේ රටේ අසල්වැසියන් මේ දුක් විඳින්නේ; අපිත් එක්ක එකට ඉගෙන ගත්ත, අපිත් එක්ක එකට ගමේ දුවපු, පැනපු මිනිස්සු මේ දුක් විඳින්නේ. ඒ පිළිබඳ වේදනාව කවරදාටත් වඩා අපට තිබෙනවා. අන් කවර කෙනෙකුටත් වඩා අපට තිබෙනවා, ගරු කථානායකතුමනි.

අවසන් වශයෙන් මා මේ කාරණය කියනවා. මේ දේශපාලන අර්බුදය විසඳීම සඳහා ආණ්ඩුව සද්භාවයෙන් ප්‍රයත්නයක් දරනවා නම්, ඒ ප්‍රයත්නය දැරිය යුතු වන්නේ, ගෝඨාභය රාජපක්ෂත්, මේ ආණ්ඩුවත් ඉවත් වීමෙන් මේ පාර්ලිමේන්තුව ඇතුළේ පොදු සම්මුතියක් ගොඩනැඟීම සඳහා අවස්ථාව ලබා දීමෙන් පමණයි. එවැනි අවස්ථාවකදී අපේ සහාය ලබා දෙන්න අපි සූදානම්.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට කථාවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

[අ.භා. 12.09]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු කථානායකතුමනි, නිදහසින් පස්සේ අපේ රටේ ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදය ඇති වෙලා තිබෙන අවස්ථාවේ මුදල් අමාත්‍යාංශයේ වගකීම භාර ගත්ත අපේ ගරු අලි සබ්රි මැතිතුමා හෘදය සාක්ෂියට එකඟවත්, අවංකවත් මේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳ මේ ගරු සභාවට සංඛ්‍යා දත්ත සහිතව ඉතා පැහැදිලි විග්‍රහයක් ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි ව්‍යවස්ථාවට අනුව මුදල් පිළිබඳ සම්පූර්ණ වගකීම පැවරෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ නිසා මේ පාර්ලිමේන්තුව තුළ රජයේ ආදායම, රජයේ වියදම, රජයේ අය වැය ලේඛනය, අය වැය හිඟය, අය වැය හිඟය පියවීම සඳහා ණය ලබා ගැනීම, ණය ආපසු ගෙවීම යනාදිය පිළිබඳ පූර්ණ වගකීම අපි දෙපක්ෂයටම පැවරෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වන්නේ නැහැ, පුද්ගලාබද්ධව එක එක අයට විවේචන, විචාර ඉදිරිපත් කරන්න. නමුත් මට එක දෙයක් කියන්න පුළුවන්. පසුගිය දශක කීපය තුළ මේ උත්තරීතර සභාව තමන්ගේ මූලික යුතුකම, වගකීම ඉෂ්ට කිරීම සඳහා ප්‍රමාණවත්, බුද්ධිමත් දායකත්වයක් ලබා නොදීමේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ අර්බුදය අද නිර්මාණය වෙලා තිබෙන්නේ.

අපි කැමැති වුණත්, අකමැති වුණත් පසුගිය කාල පරිච්ඡේදය පුරාවටම මේ අය වැය ලේඛන සකස් කරලා, ඉලක්කම්, දත්ත හදලා, ඒ සඳහා ක්‍රමවේද සකස් කරලා අපට ලබා දීමේ කටයුත්ත කරන්නේ යම්කිසි නිලධාරින් පිරිසක් විසින්. ඔවුන් විසින් දෙනු ලබන සංඛ්‍යා, දත්ත හා ක්‍රමවේද විශ්වාස කරගෙන ඒ අනුව අපි බෙදිලා හැම දාම කටයුතු කළා. පසු ගිය කාලයේදී ප්‍රධාන නිලධාරින් කිහිප දෙනෙකුගේ කතිපයාධිකාරයක් විසින් දේශපාලනඥයන් හසුරුවනු ලැබූ තත්ත්වයක් තමයි මම නිරීක්ෂණය කළේ. ගරු කථානායකතුමනි, උදාහරණයක් වශයෙන් කිව්වොත්, සමහර අවස්ථාවලදී මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම නොමඟ යවන වැරැදි සංඛ්‍යා, දත්ත සහිතව අය වැය ලේඛනය ඉදිරිපත් කරපු අවස්ථා තිබුණා.

ගරු කරු ජයසූරිය මැතිතුමා කථානායකතුමා හැටියට සිටි අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂය වශයෙන් දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ප්‍රමුඛ අපි කණ්ඩායම ගිහිල්ලා පැමිණිලි කළා, "ඒ සංඛ්‍යා සම්පූර්ණයෙන්ම වැරැදියි. පාර්ලිමේන්තුව නොමඟ යවලා තිබෙන්නේ" කියලා. ඒ පිළිබඳව එදා කථානායකතුමා විභාගයක් කළා. විභාගයක් කරලා මුදල් ඇමතිතුමා කැඳෙව්වා; මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් කැඳෙව්වා. අවසානයේදී ඒ නිලධාරින්, "විපක්ෂයට මේක තේරෙන්නේ නැහැ. මේක අලුත් ක්‍රමවේදයක්" කියලා වැරැදි සංඛ්‍යා, දත්ත සහිතව අය වැය ලේඛනය ඉදිරිපත් කළා. මම ඒ පිළිබඳව පොතක් ලිව්වා, "අය වැය මිථ්‍යාව සහ යථාර්ථය" කියලා. මේ ගරු සභාව නොමඟ යැව්වොත්, ජනතාවගේ නියෝජිතයන්ට ඇත්ත ඇති සැටියෙන් නොකිව්වොත් මේක තාක්ෂණික කරුණක් වන නිසා රටක් විධියට අපි අමාරුවේ වැටෙනවා.

ගරු කථානායකතුමනි, නිදහසින් පස්සේ බලයට පත් වුණු සෑම රජයක්ම සාමාන්‍යයෙන් රටක දළ දේශීය නිමවුම තුළින් තමයි ආදායම් ලබා ගත්තේ. ආදායම සියයට 20ට වඩා වැඩි ප්‍රමාණයකින් පවත්වා ගෙන යන්න ඕනෑ. වියදම් වැඩි කිරීම ලේසියෙන් කරන්න පුළුවන් වුණත්, වියදම් වැඩි කිරීම අසාමාන්‍ය ලෙස කළොත්, අය වැය පරතරය විශාල හිඟයක් වුණොත්, හිඟය පියවා ගැනීම සඳහා වැඩි වැඩියෙන් ණය ගන්න වුණොත්, නොපියවූ අය වැය පරතරය පියවන්න මුදල් අච්චු ගහලා ණය ගත්තොත් උද්ධමනය, ජනතාවගේ පීඩනය, ජීවන වියදමේ අර්බුදය ඇති වෙනවා. නිදහසින් පසුව දිගින් දිගටම ලංකාවේ පාර්ලිමේන්තුව සුබසාධනවාදී, ආර්ථික විද්‍යාත්මක නොවන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති ධුරයේ සිටියදී, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධුරයේ සිටියදී මේ ගරු සභාවට අපි පනතක් ඉදිරිපත් කළා, මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යනුවෙන්. ගරු කථානායකතුමනි, මේ අර්බුදය බේරා ගන්න අවශ්‍ය, ඉතා පැහැදිලි විසඳුම් මේ 2003 මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත තුළ තිබුණා. මොනවාද ඒ විසඳුම්? පළමුවැනි කාරණය මෙයයි. 2006 වන විට අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5ක් බවට පත් විය යුතු අතර, එතැනින් පසු කවර ආණ්ඩුවක් ආවත් හැම දාම අය වැය පරතරය සියයට පහේ මට්ටමක පවත්වාගෙන යන්න ඕනෑ. එතකොට මේ ණය බර දරන්න බැරි තත්ත්වයට පැමිණෙන්නේ නැහැ. මේ පීඩනය මේ විධියට එන්නේ නැහැ. 2006දී ඒක කරන්න තිබුණා. එම පනතින් දෙවැනි කාරණය විධියට කියලා තිබුණා, 2013 වර්ෂයේදී රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදනයේ පංගුවක් ලෙස සියයට 60ට අඩු කරන්න ඕනෑ කියලා. එය සියයට 60ට අඩු කරලා තිබුණා නම් අද ණය ආපසු ගෙවීම් පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. තුන්වැනි කරුණ විධියට තිබුණා, රජයක් විසින් ණය සඳහා ඇප වෙනකොට ඇප විය යුත්තේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 4.5යි කියලා. නමුත්, අද වෙනකොට කුමක්ද සිදු වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි? මේ වන විට අය වැය පරතරය සියයට 10 ඉක්මවලා තිබෙනවා. රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 119ක් වෙලා තිබෙනවා. රජය ඇප වෙන ප්‍රමාණය සියයට 15 දක්වා වැඩි වෙලා තිබෙනවා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ මේ අර්බුදය ඇති කළේ කවුද? ඒක කළේ එක ආණ්ඩුවක් විතරක් නොවෙයි. විවිධ නිලධාරින් හදලා දෙන පනත් ඒ ආකාරයෙන් සංශෝධනය කරන්න ගරු මන්ත්‍රීවරුන් ලෙස අපි මේ ගරු සභාවේදී අත්ඔසවලා ඉඩ දුන්නා. අපේ රජය බලයට පත් වුණාට පස්සේ ඒ පිළිබඳව 2020 දෙසැම්බර් 04 වැනිදා කරපු කථාවක් හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 2157හි සඳහන්ව තිබෙනවා. මා එයින් කොටසක් කියවන්නම්:

"ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන එක හරි. මෙතැන කෑ කෝ ගහගන්නවාට වඩා අපි ඇත්ත වශයෙන් විවාදය හරියට කරන්න ඕනෑ. සමහර වෙලාවට මෙතැන ඉන්න ලජ්ජා හිතෙනවා. කුණුහරුපත් කියනවා. ඒක නොවෙයි මෙතැන වෙන්න ඕනෑ"

එහිදී මම මෙහෙම කියලා තිබෙනවා:

"තමුන්නාන්සේලා විපක්ෂයේ හිටියත්, අපි විපක්ෂයේ හිටියත්, අපි අතරින් කවුරු ආණ්ඩුවේ හිටියත් අවසානයේ රජයට සියලු දේ පිළිබඳව උරුමය හෝ කරුමය කර ගහන්න වෙන්නේ කතිපයාධිකාරි උසස් නිලධාරින් කිහිපදෙනෙකු විසින් තාක්ෂණික කරුණු කියා හදලා දෙන ඒවා, කිසිම තාක්ෂණයක් නැතිව අපි අනුමත කරලා දෙන නිසායි. මෙහිදී අඩු ගානේ තම තමන්ගේ අමාත්‍යාංශවල විෂය භාර ඇමතිවරයා ගෙන්වලා අහන්න එපැයි, තමුන්නාන්සේ මොනවාද කරන්න බලාපොරොත්තු වෙන්නේ කියලා. නිලධාරින් ටිකක් එකතු වෙලා නිලධාරින්ගෙන් අහනවා, මොනවාද කරන්නේ කියලා."

ඔවුන් තීරණය කරලා අපට කියලා ඒක කරවන එක තමයි මේ කරලා තිබෙන්නේ.

එදා එක්සත් ජාතික පක්ෂ රජය සමයේදී - අපි විපක්ෂයේ ඉන්නකොට - මුදල් අමාත්‍යාංශයේ හිටියා පාස්කරලිංගම් කියලා මහත්මයෙක්. එතුමාට තිබුණා, කිසිම දේශපාලනඥයෙකුට නැති සුවිශේෂ බලාධිකාරයක්. එතුමාට තිබුණා, සතියකට දවසක්

ඉන්දියාවට ගිහිල්ලා ආපසු ලංකාවට ඇවිත් සතියේ දවස් පහ වැඩ කරන ක්‍රමවේදයක්. පැනමා පත්‍රිකාවලත් අද එතුමාගේ නම සඳහන් වෙලා තිබෙනවා. එතුමා තමයි සියලුම අමාත්‍යවරුන්ට ඉහළින් ආර්ථිකය හැසිරෙව්වේ. ඊට පසු කාලයේදීත් එවැනිම නිලධාරියෙක් හිටියා. ඒ තමයි ආචාර්ය පී.බී. ජයසුන්දර මහත්මයා. මම මේ ගරු සභාවේදී මීට කලිනුත් මේ කාරණය කිව්වා. එතුමා විසින් ඇමතිවරු රබර් සීල් එකක් බවට පත් කරලා තිබෙනවා; ඇමතිවරු පුලන්නන්ගේ තත්ත්වයට පත් කරලා තිබෙනවා. එතුමා විසින් හදපු දේ අපේ පිට පටවා අද මේ තත්ත්වය උදා කරලා තිබෙනවා. ඒක නිසා මෙය අද ඊයේ ඇති වෙච්ච දෙයක්වත්, එක තැනකට ඇඟිල්ල දිගු කරලා සරල සිද්ධීන් මත පදනම් කරගෙන කරන්න පුළුවන් දෙයක්වත් නොවෙයි.

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේ ගරු සභාවට පවරා තිබෙනවා, මහජනයාගේ මුදල් පිළිබඳ වගකීම. බදු ආදායම් වශයෙන් ලැබෙන ටිකත් ඇතුළුව ඒ හැම සතයක්ම පාර්ලිමේන්තුව විසින් සම්මත කරන අණපනත් අනුව තමයි සම්මත වෙන්නේ. මේක අපට දකින්න තිබුණා. අවුරුදු ගණනකට පෙර අපේ බාහිර ආර්ථිකය මදි වුණා. සාමාන්‍ය ක්‍රමයට ලැබෙන මුදල අපට ප්‍රමාණවත් වුණේ නැහැ. ඒක නිසා 2007දී මුදල් අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සාම්ප්‍රදායික වෙළෙඳ පොළ ක්‍රමයෙන් බැහැරට ගොස් ජාත්‍යන්තර වෙළෙඳ පොළෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක ණයක් ලබා ගත්තා. ඒ අවස්ථාවේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු කණ්ඩායම HSBC බැංකුවට ගිහිල්ලා කිව්වා, "අපේ ආණ්ඩුවක් ආවොත් ඔය ණය ගෙවන්නේ නැහැ. මොකද, ඔය ණය ගත්තේ මුදල් වෙළෙඳ පොළෙන්" කියලා.

යුද්ධය නිම වුණාට පසුව අපේ රටට හොඳට මුදල් ලැබුණා; රටට සංචාරකයෝ ආවා; ආයෝජන ආවා; ඒක නිසා විශාල අර්බුදයක් ඇති වුණේ නැහැ. නමුත් අපට ලැබෙන මුදල් ප්‍රමාණය මදි වෙනකොට 2014 වනතෙක් ඇමෙරිකානු ඩොලර් බිලියන එකහමාරක මුදලක් ජාත්‍යන්තර වෙළෙඳ පොළෙන් ලබා ගත්තා. ගරු කථානායකතුමනි, 2007 සිට 2014 වනතෙක් එලෙසින් ලබා ගත් මුළු මුදල් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන හයයි. නමුත් 2015, 2016, 2017, 2018, 2019 වර්ෂවලදී ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහිල්ලා ඇමෙරිකානු ඩොලර් බිලියන 12.5ක ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කළා, අසාමාන්‍ය ලෙස. මුදල් ඇමතිතුමා පැහැදිලිව සඳහන් කළ පරිදි, පොඩි ණයක් ගෙවන්න ඊට වඩා ලොකු Sovereign Bond එකක් හැම වර්ෂයකම issue කරනවා. ඒ විධියට කරගෙන ඇවිල්ලා 2019 දී පමණක් ඇමෙරිකානු ඩොලර් බිලියන තුනක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කළා. 2019දී නිකුත් කරපු ඒ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල් පිරෙන්නේ - mature වෙන්නේ - 2029දී. ඒක නිසා කාගේ ආණ්ඩුවක් තිබුණත් 2029 වනතෙක් මේ දැවැන්ත මූල්‍ය අර්බුදයට මුහුණ දෙන්න ඕනෑ කියලා මහජන නියෝජිතයන් ලෙස අපි තේරුම් ගත යුතු වෙනවා. අපි ගත්ත ණය ප්‍රමාණය අපි ගෙවන්න ඕනෑ. මුළු විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 51යි. ඒකෙන් 12.5ක්ම සංවර්ධන බැඳුම්කර නිකුත් කර ගත්තාම ගෙවීම් පිළිබඳව අර්බුදය එනවා. මේ අර්බුදයේදී ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යාම පමා වුණාය කිව්වාට, 2017, 2018, 2019 කියන වර්ෂ තුනේම විපක්ෂයේ තමුන්නාන්සේලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියා; ඒකෙන් බිලියන 1.5ක ණය ප්‍රමාණයක් ලබා ගත්තා. ගරු කථානායකතුමනි, "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට විලංගු" නැමැති පොතේ, ඇමුණුම II යටතේ ශ්‍රී ලංකාව ආපදා තක්සේරු කිරීමේ - Matrix - නාභිය යටතේ ආපදා මූලාශ්‍රය, සම්භාව්‍යතා කාලසීමාව, ආර්ථිකමය වශයෙන් බලාපොරොත්තු වන බලපෑම, ප්‍රතිපත්ති මත ප්‍රතිචාරය කියලා කොටස් හතරකට බෙදලා තිබෙනවා.

ඒ අනුව, ආපදා මූලාශ්‍රය යටතේ ප්‍රධාන කරුණු කීපයක් තිබෙනවා. ඒවා මෙසේයි.

01. දළ දේශීය නිෂ්පාදනයට අනුව බදු වැඩි කිරීමේ සැලැස්ම අසාර්ථක විය.

    එහි ප්‍රතිපත්ති මත ප්‍රතිචාරය විධියට සඳහන් වන්නේ බදු ප්‍රතිපත්තිය හා පරිපාලන ප්‍රතිපත්තිය ඉක්මන් කරන්න යන්නයි. ඒක තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේත් නිර්දේශය.

02. ආර්ථික වර්ධනයේ බරපතළ මන්දගාමී බව.

    එනම්, ආර්ථිකය ප්‍රමාණවත් ලෙස දියුණු වී නොතිබීම. ඒකට යෝජනාව වන්නේ, ආයෝජන දිරිගැන්වීම වැනි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කරන්න කියන එකයි. එමෙන්ම, "වර්ධනයට සහාය දැක්වීම තුළ මූල්‍ය ප්‍රතිපත්තිය ඉහළ ඵලදාව නොලබන විට මූල්‍ය ප්‍රබෝධමත් වීමේ විෂය පථය සීමා වනු ඇත" කියා සඳහන් වනවා.

03. ගෝලීය මූල්‍ය අසමතුලිතතාව වේගවත්ව ඉහළ යාම.

    නිර්දේශ විධියට තිබෙන්නේ, සාර්ව මූල්‍ය මූලධර්ම ශක්තිමත් කරන්න, විනිමය අනුපාත නම්‍යතාවට ඉඩ දෙන්න කියන ඒවායි.

04. ඇමෙරිකානු ඩොලරය මතුවී ඒම.

    ඒකටත් නිර්දේශ විධියට තිබෙන්නේ, සාර්ව ආර්ථික මූලධර්ම ශක්තිමත් කරන්න, විනිමය අනුපාත නම්‍යතාවලට ඉඩ දෙන්න කියන එකයි.

05. දියුණු කළ ආර්ථිකයක් තුළ හා මතු වී එන වෙළෙඳ පොළ තුළ ව්‍යුහාත්මක වශයෙන් දුර්වල වර්ධනය.

    ඒකට නිර්දේශ විධියට ඉදිරිපත් කර තිබෙන්නේ, අපනයන හා සංචාරක වෙළෙඳ පොළ විවිධාංගීකරණය කරන්න, විදේශ විනිමය නම්‍යතාවට ඉඩ දෙන්න කියන එකයි.

06. යුරෝපා සංගමයෙන් ඉවත්වීමට බ්‍රිතාන්‍ය ඡන්ද දායකයන් ඡන්දය දීම.

ඒකට මෙහෙ කරන්න ඕනෑ, සාර්ව ආර්ථික මූලධර්ම ශක්තිමත් කිරීමයි.

අද මගේ උගත් මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා සඳහන් කළා, දැන් මේ කරගෙන ගිය වැඩ පිළිවෙළ තුළ විදේශ විනිමය සංචිතය ඉතා විශාල ලෙස පහත වැටීම ගැන ගරු මුදල් ඇමතිතුමා මේ සභාවේදී සඳහන් කළා කියලා. මේක අද ඊයේ ඇති වූ ප්‍රශ්නයක් නොවෙයි. විදේශ සංචිත කඩා වැටීම සම්බන්ධයෙන් ප්‍රධාන හේතු නවයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් එදා තමුන්නාන්සේලාගේ රජයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ හේතු නවය පමණක් මම ඉතා කෙටියෙන් කියන්නම්.

පළමු කරුණ විධියට, "බාහිර තිරසාර බව අවශ්‍යතාවකි. සංචිත ආවරණය සැලකිය යුතු ලෙස පිරිහී ඇති අතර, එළැඹෙන වර්ෂයේ දී විදේශ විනිමය ලැබීම්වල හිඟයක් පවතී. 2015 වසරේදී - තමුන්නාන්සේලාගේ රජය සමයේදී- ඇමෙරිකානු ඩොලර් බිලියන එකකින් දළ ජාත්‍යන්තර සංචිත අඩු වී ගියේය. එය ARA මෙට්‍රිකයේ - මීටරයේ - සංඛ්‍යා සියයට 11කින් පහළ බැසීමක් හා සියයට 76ක් දක්වා පහතට ගෙන ආවේය. 2016 මාර්තු මස මස වනවිට නැවතත් සංචිතය ARA මෙට්‍රිකයේ සියයට 65 දක්වා පහත වැටුණි. කෙසේ නමුත්, දළ සංචිත විශාල වශයෙන් මිලට ගනු ලැබීය. දේශීය බැංකු වෙතින් හුවමාරු ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 2.1ක් ද, ඉන්දියානු රිසර්ව් බැංකුවෙන් බිලියන 700ක්ද, සාර්ක් විධිවිධාන යටතේ මිලියන 400ක් ද තාවකාලික ස්වාරක්ෂණ මහ බැංකුවට සපයයි. නමුත්, එයද වැඩිකල් නොපවතිනු ඇත. 2016 වසර අරම්භයේදීම දළ දේශීය සංචිත අඩු

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

වී ගියේ වසරට අදාළ හිමිකම් නොලැබුණු නිසාය. ශුද්ධ ජාත්‍යන්තර සංචිත ද පහළින් පවතී..." යනුවෙන් සඳහන් වනවා.

මේක තමයි ඇත්ත. 2015දීත්, 2016දීත් මේ තත්ත්වය තිබුණා; ඒ කඩා වැටීම දිගටම ආවා.

ඊළඟට, දෙවන කරුණ විධියට "2014 හා සසඳන විට 2015 දී ගෙවුම් ශේෂය පිරිහී ගියේ පහළ මට්ටමේ ප්‍රාග්ධන අභ්‍යන්තර ගැලීම නිසාය. සැලකිය යුතු ලෙස මිල මට්ටම් පහළ යාමට ස්තුති වන්න වෙළෙඳ අංශයේ සියයට 2.3ක වර්ධනයක ප්‍රබල ගැළපීමක් ලබා දුනි. ඒවා නම්, ඛනිජ තෙල් නොවන ආනයනවල විශාල ඉහළ යාම, විශේෂයෙන් සඳහන් කළොත් පෘථුල ලෙසින් අය වැය ලේඛනයෙන් මුදා හළ මෝටර් රථ ආනයනය, තේ හා රබර් මිල අඩුවීම නිසා අපනයන වටිනාකම් අඩුවීම සහ පහළ තෙල්මිල, වෙළෙඳ ශේෂය සඳහා හානිපූරණය කළ ඉල්ලුම පහත වැටීම හා ඉපිලී ගිය සංචාරක ව්‍යාපාරයයි...." යනුවෙන් සඳහන් වනවා. *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, අද තිබෙන්නේ වැදගත් විවාදයක්. තව කථිකයන් රාශියක් ඉන්නවා කථා කරන්න. ඒ නිසා, මුදල් ඇමතිතුමාගේ අනුමැතිය අරගෙන අද දිවා ආහාර විවේකය නොගෙන දිගටම විවාදය ගෙන යන්න කියා අපි ඉල්ලීමක් කරනවා. ගරු කථානායකතුමනි, කථිකයන් ගොඩක් ඉන්නවා, වැදගත් අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු සභානායකතුමා මේ වෙලාවේ සභාවේ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට එය කරන්න පුළුවන්. විවාදය ඔබතුමාගේ නේ.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
I do not mind listening to anyone. I have no problem.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිවා ආහාර විවේකය නොමැතිව සභාවේ කටයුතු පවත්වාගෙන යාමට ඔබතුමන්ලා එකඟ බව පෙනී යනවා. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, ඒ නිසා ඔබතුමාගේ කථාව දිගටම කර ගෙන යන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු කථානායකතුමනි, මම සඳහන් කරමින් සිටියේ දෙවන හේතුවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දක්වා තිබෙනවා, පසුගිය කාලය තුළ අභ්‍යන්තරයෙන් ප්‍රාග්ධනය වැඩි වශයෙන් ගලාගෙන යාමක් වුණා කියලා. ඒකට හේතුව, අපි පසුගිය රජය සමයේදී ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන ගිණුම සම්පූර්ණයෙන් විවෘත කිරීමයි. ප්‍රාග්ධන ගිණුම සම්පූර්ණයෙන් විවෘත කළාම අපේ රටේ භාණ්ඩාගාර බිල්පත්වල, බැඳුම්කරවල ආයෝජනය කර තිබුණු මුදල් ආපහු අරගෙන යන්න පටන් ගත්තා.

එතකොට මේ රටින් පිටට ගලා යන මුදල් ප්‍රමාණය වැඩිවීම ගැන එදාත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අනතුරු ඇඟෙව්වා. මෙහි කියනවා, "විදේශ ආයෝජන පැවරුම් බිල්පත්වල හා පැවරුම් බැඳුම්කරවල ප්‍රබල ලෙස නියුතු වන නිසා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.1ක් තරම් අඩු අනුපාතයකට රාජ්‍ය බැඳුම්කරවල විදේශීය තැන්පතු පහත වැටුණි. ආයෝජන ව්‍යාපෘති පිළිබඳව ආණ්ඩුවේ විශ්ලේෂණය හේතු කොටගෙන විදේශයෙන් මූල්‍ය සැපයූ පොදු හා පෞද්ගලික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අර්ධ වශයෙන් ඇන හිටුණි." කියලා. විදේශ ආයෝජන ගියා විතරක් නොවෙයි, ඒ කාලයේ සමහර ව්‍යාපෘති ඇන හිටලාත් තිබෙනවා.

ඊළඟට, සංචිත අඩු වීමට තුන්වෙනි හේතුව ලෙස ඒ අය කියා තිබෙන්නේ, "ආයෝජිත විශ්වාසය ඉහළ නැංවීමට තීරණාත්මක ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග නොමැතිවීම තුළ සංචිත ආවරණය තවදුරටත් පිරිහෙන බව පෙනී යයි." කියලා. ඒ වාගේම, "බලධාරීන් විසින් ක්‍රියාවට නංවන ලද විධි ක්‍රියා හේතු කොටගෙන මොටර් රථ ආනයනය එහි මුදුන් පෙත්ත දක්වා වර්ධනයක ගමන් කර ඇති නිසාත් ජංගම ගිණුම මත ඇති පීඩනය තවදුරටත් ඉදිරියට ඇදී යනු ඇතැයි බලාපොරොත්තු වේ." කියා සඳහන් කරනවා. ඒ කියන්නේ අපට ඔරොත්තු නොදෙන ආකාරයට මෝටර් රථ ආනයනය වැඩි කර තිබෙනවා කියන එකයි.

ගරු කථානායකතුමනි, සමහර අවස්ථාවලදී ඇමෙරිකානු ඩොලර් බිලියනයකට වැඩි ප්‍රමාණයක රත්‍රන් ගෙනැල්ලා තිබෙනවා. ඒ අපේ රටේ පාවිච්චියට නොවෙයි. ඒ රත්‍රන් හොරෙන් ඉන්දියාවට අපනයනය කිරීම සඳහාත් ඉඩකඩ සලස්වා තිබුණා.

ඊළඟට, හතරවැනි කරුණ ලෙස සඳහන් කර තිබෙන්නේ, "රුපියලේ අගය අඩුවීමේ පීඩනයට ප්‍රතික්‍රියා ලෙස විදේශ වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ඇති කරන තදබල මැදිහත්වීම ද සංචිත ක්ෂය වීමට දායකත්වය ලබා දී ඇත. 2015 ජනවාරි මස 01 දින සිට 2016 පෙබරවාරි 15 දින දක්වා තත්කාලීන වෙළෙඳපොළ ශුද්ධ මැදිහත්වීම ඇමෙරිකානු ඩොලර් බිලියන 3.7ට ඉහළ නැගුණි..." කියායි.

ගරු කථානායකතුමනි, එක් අවුරුද්දකදී රුපියල ආරක්ෂා කර ගැනීම සඳහා බිලියන 3.7ක් වෙළෙඳපොළේ පුච්චලා තිබෙනවා. මේ සියල්ලේ ප්‍රතිඵලය තමයි අද වෙනකොට මේ ඇවිල්ලා තිබෙන්නේ. මට මේ කෙටි වේලාව තුළ මේ කරුණු නවයම කියන්න විධියක් නැහැ. "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට විලංගු" නමැති මාගේ කෘතියෙහි මේ කරුණු ඇතුළත් කර තිබෙනවා. ඒ අදාළ පිටු කිහිපය මා **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව ලෙස අපි සියලු දෙනා මේ සඳහා වගකිව යුතුයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අපි 16 වතාවක් ගිහිල්ලා තිබෙනවා. ඒ 16 වතාව තුළම අපට කියූ දේ සහ අවසාන ප්‍රතිඵලය එකක්. 16 වතාවේම කියා තිබෙන්නේ අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5ට වඩා අඩු මට්ටමක

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පවත්වා ගෙන යන්න කියලායි. නාස්තිකාරී, අපතේ යන, ඵලදායක නොවන වියදම් කපා හරින්න; බදු හා බදු නොවන ආදායම වැඩි කරන්න කියන එකයි. මේක හැමෝටම හොඳයි නේ. අපි කවුරු පාර්ලිමේන්තුවේ හිටියත් ප්‍රතිපත්තියක් වශයෙන් එකඟ වෙන්න වෙනවා, බදු හා බදු නොවන ආදායම වැඩි කර ගන්න. අපි ජනතාවට හිතවත්ව සුබ සාධනයට කියලා මේ කටයුතු කරන ආකාරය විසඳුමක් නොවෙයි. මුදල් ඇමතිතුමා නිවැරදිව සඳහන් කළා, මාළු අල්ලන්න බිලී පිත්තක් දෙනවා වෙනුවට, මාළු ටිකක් විතරක් දෙනවා වාගේ ඒ ඒ වෙලාවට සරල විසඳුම් දීලා ජනතාව සන්තෝෂ කිරීම තුළ සිදු වෙලා තිබෙන්නේ කුමක්ද කියලා. මැලේසියාව, කොරියාව, චීනය සහ වෙනත් රටවල් කටයුතු කළ ආකාරයට නිෂ්පාදන ක්‍රියාවලියට ජනතාව සක්‍රිය ලෙස දායක කර ගන්නා වැඩ පිළිවෙළ සඳහායි රාජ්‍ය මූල්‍ය බෙදා හැරිය යුත්තේ. ඒ නිසා කාගේ ආණ්ඩුවක් තිබුණත්, අපි ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වෙන්න ඕනෑ, අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5කට වඩා අඩු මට්ටමට පවත්වාගෙන යන්න.

දෙවන කාරණය ණය බර පිළිබඳ කාරණයයි. මුදල් ඇමතිතුමා නිවැරදිව සඳහන් කළ පරිදි, 2020, 2021, 2022 කියන වර්ෂ තුනේම ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කරලා ගෝඨාභය රාජපක්ෂ රජය ශත පහකවත් ණය අරගෙන නැහැ. ඒ ඇයි? පළමු අවුරුද්දේම කොවිඩ්-19 යටතේ ඇති වෙච්ච පසුබෑම තුළ Moody's, Fitch Ratings වැනි ආයතන අපිව downgrade කළා; පහළට ඇද දැම්මා. එලෙස පහළට ඇද දමනකොට අපට පාර්ලිමේන්තුවේ විවාද කළ යුතුව තිබුණේ ලෝකයේ රටවල් මෙහෙම අපව පහළට ඇද දමන්නේ ඇයි කියන එක පිළිබඳවයි. නමුත්, එහෙම වුණේ නැහැ. සමහර අය ඒ අයගේ නෑණ පමණින් කරුණු කිව්වා. විශ්ලේෂණාත්මකව ලෝකයේ රටවල් ගැන වර්ගීකරණය කරන අයට තේරෙන්නේ නැතුව, අපේ රටේ තත්ත්වය තේරුම් ගන්නේ නැතුව එහෙම කර තිබෙනවාය කිව්වා. අපිව පහළට ඇද දාපු ඒ ආයතනවලට බැණ වදින්න පටන් ගත්තා, ප්‍රශ්නය තේරුම් ගන්නේ නැතිව.

අපට කරන්න තිබුණේ, ජාත්‍යන්තර වශයෙන් අපව downgrade කරන්නේ ඇයි, මොකක්ද ඒකට හේතුව කියන එක ගැන ජාතික මට්ටමේ විවාදයක් පවත්වන එකයි. එහෙම වුණා නම්, ජනාධිපතිතුමා වෙත, අගමැතිතුමා වෙත අපට හොඳ පණිවුඩයක් ගෙන යන්න තිබුණා. අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ ජාතික හා රාජ්‍ය මූල්‍ය අර්බුද පිළිබඳ ප්‍රබුද්ධ විවාදයක් නොකරන නිසා නිලධාරිනුත් භය නැතුව ඕනෑ අසත්‍යයක් මේ දෙපැත්තේම අපට ලියා දුන්නා. ඒ පැත්තටත් ලියා දුන්නා, මේ පැත්තටත් ලියා දුන්නා. එහෙම ලියා දුන්නාට පස්සේ අප ඒවා මත මෙතැන බැණ ගන්නවා මිස, ඇත්ත දේ සඳහා කටයුතු කළේ නැහැ කියන එක තමයි මගේ අවංක පිළිගැනීම. එම නිසා අපට හෙට දවසේදීවත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම මේ පාර්ලිමේන්තුවට ඉෂ්ට කරන්න බැරි නම්, අපේ රටේ මේ ණය අර්බුදයටවත්, රටේ ජනයාගේ ජීවන වියදමේ අර්බුදයටවත්, ජනතාව පෙළෙන ප්‍රශ්නවලටවත් කිසිදු විසඳුමක් දෙන්න බැහැ. මොකද, අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරියාකාරව ක්‍රියාත්මක කරන්නේ නැහැ. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරියාකාරව ක්‍රියාත්මක කළ යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනයාගේ මුදල් පිළිබඳ බලය සම්පූර්ණයෙන් දීලා තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ඒ නිසා අපට කියන්න බැහැ, ඒකට වග කියන්න ඕනෑ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමායි, ඒකට වග කියන්න ඕනෑ කැබිනට් මණ්ඩලයයි කියලා. ඒකට අපි ඔක්කොම වග කියන්න ඕනෑ. ඒ නිසා තමයි ගරු මුදල් අමාත්‍යතුමා යෝජනා කළේ, හෙට වෙන කවුරු හරි බලය ගත්තත්, මේ තිබෙන තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා අපි ජාත්‍යන්තරයෙන් භාණ්ඩ ආනයනය කරන්න ඕනෑ කියලා. මගේ උගත් මිත්‍ර කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් පිළිගන්නවා ඇති, විදේශවලින් භාණ්ඩ ආනයනය කරන්න නම් අපි ණයවර ලිපි නිකුත් කරන්න ඕනෑ බව. අද තිබෙන තත්ත්වය තුළ අපි නිකුත් කරන ණයවර ලිපි විදේශ රටවල් පිළිගත්තේ නැත්නම් මොකක්ද තත්ත්වය? අපේ රටේ දැන් තෙල් හිඟයි. තෙල් කඳුළක්වත් ගේන්න අපට බැරි වෙනවා, ණයවර ලිපිය පිළිගත්තේ නැත්නම්. අපට ගෑස් හිඟයි. නමුත්, ණයවර ලිපිය පිළිගත්තේ නැත්නම් අපට ගෑස් ගේන්න බැරි වෙනවා. අපට යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා අමු ද්‍රව්‍ය හිඟයි. නමුත්, අපේ ණයවර ලිපිය පිළිගත්තේ නැත්නම් ඒවා ගේන්න අපට බැරි වෙනවා. එම නිසා මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි.

රටක ආර්ථිකයක් මේ තත්ත්වයට වැටුණාට පස්සේ එතැනින් ගොඩ ඒම සඳහා අපි ජාතික එකඟතාවක් ඇති කර ගන්න ඕනෑ; ඒ ජාතික එකඟතාව අනුව කටයුතු කරන්න ඕනෑ. IMF එක හැමදාම කරන යෝජනාවලින් එකක් තමයි, බර දරන්න බැරි නිසා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යහපත් කරගන්න ඕනෑ කියන එක. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඒ කාලයේදීම තමුන්නාන්සේලාට බොහොම පැහැදිලිව කියලා දුන්නා, මෙන්න මේ කාරණය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ආදි ආයතනවල ණය බර ප්‍රමාණය බැංකුවලට දරා ගන්න බැරි ප්‍රමාණයට ඇවිල්ලා තිබෙනවා. එම නිසා ඒ ණය ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑ. ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා භේදයෙන් තොරව ඒ සඳහා අප අතර එකඟතාවක් තිබෙන්න ඕනෑ. ආණ්ඩුව වෙනස් කරලා හෙට වෙනත් ආණ්ඩුවක් ගෙනාවා කියලා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රාතිහාර්යයකින් ලාභ ලබන්නේ නැහැ නේ. ඒ වාගේම, ලංකා විදුලිබල මණ්ඩලය ලාභ ලබන්නේත් නැහැ නේ; අනෙක් ආයතන ලාභ ලබන්නේත් නැහැ නේ. කවුරු ආණ්ඩුව ගත්තත් කොහොමද මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්නේ? ඒ නිසා තමයි අපි කියන්නේ, මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න අප අතර සර්ව පාක්ෂික එකඟතාවක් ඇති වෙන්න ඕනෑ කියලා. එවැනි එකඟතාවක් නැති වුණොත්, ඒ වාගේම ඒ ගැන පටු දේශපාලන පක්ෂ, පාට හා න්‍යාය පත්‍රවලින් හිතුවොත් මේ රටට දශමයක්වත් මෙතැනින් ඉස්සරහට යන්න බැහැ. ඕනෑම කෙනෙකුට ආණ්ඩු මාරු කරන්න පුළුවන්. මොකද, ජනතාව තුළ තිබෙන වේදනාවට, හිතේ අමාරුවට ඒ අය කාට හරි කෙනෙකුට ඡන්දය දෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, නමුත් ඒ ප්‍රශ්නය විසඳාගන්න බැරි වන නිසා අපි මේ ආර්ථිකයේ ගැටලුව පිළිබඳව, ජාතික දේශපාලන අර්බුදය පිළිබඳව, රටේ ණය වාරික සහ පොලිය ගෙවා ගන්න බැරි වන තත්ත්වය පිළිබඳව, ගෙවුම් ශේෂය, විදේශ විනිමය අර්බුදය පිළිබඳව, රට සල්ලි ප්‍රමාණවත් පරිදි නැතිකම තුළ ඇති වෙලා තිබෙන ජනතා පීඩනය පිළිබඳව සහනදායී විසඳුමක් ලබා දෙන්න ඕනෑ. එසේ කිරීමට නම් ඔබතුමාත් මැදිහත් වෙලා මේ ගරු සභාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරෙන වගකීම ඉෂ්ට කරලා මුදල් අමාත්‍යතුමාට මේ සඳහා අවශ්‍ය ශක්තිය ලබා දීම සඳහා වැඩ කරන්න ඕනෑ. ඒ සඳහා ඔබතුමන්ලා සියලුදෙනා එකතු වෙවා කියන ප්‍රාර්ථනයෙන් මගේ වචන කිහිපය මෙයින් හමාර කරනවා.

[අ.භා. 12.35]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
*(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)*
(The Hon. Field Marshal Sarath Fonseka)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

ගණන් හිලව් ගැන අහගෙන ඉඳලා අප වෙහෙස වෙලා ඉන්න වෙලාවේ, ගරු මුදල් ඇමතිතුමාත් වෙහෙස වෙලා ඉන්න මේ වෙලාවේ රටේ වර්තමාන තත්ත්වය පැත්තට මම මගේ අවධානය

[ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

යොමු කරනවා. ඒ විෂය ගැන තමයි මම මේ කාලයේ වැඩියෙන් කථා කරන්න කැමැති.

වර්තමාන තත්ත්වය ගැන කථා කරන කොට කිව යුතුයි, අපේ දිස්ත්‍රික්කවල, අපේ ආසනවල අපට ඡන්දය දුන් අපේ ඡන්ද දායකයන්ගෙන් බහුතරයක් දුප්පත් කට්ටිය බව.

ගරු ඇමතිතුමනි, මගේ ආසනයේ සියයට 50ක් විතර ඉන්නේ අනවසර පදිංචිකරුවන්. මේ වර්තමාන අර්බුදය නිසා ඒ කට්ටියට ජීවත් වීමට බැරි වෙලා තිබෙනවා. මේ අර්බුදය නිසා බඩු මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේවාට නොයෙක් නොයෙක් හේතු සාධක, තර්ක විතර්ක ඉදිරිපත් කරමින් අප මේ සභාව තුළ නිදහසට කාරණා කිව්වත්, මේ රටේ ජනතාවට ජීවිත පවත්වාගෙන යන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා; කන්න බොන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා; විදුලිය බිලත්, ජල බිලත් ගෙවා ගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා; පෙට්‍රල් ටිකක්, ඩීසල් ටිකක් ත්‍රීවීලර් එකට ගහගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. මෙය ඉතා උග්‍ර තත්ත්වයක්. ඒ හින්දා අපට අනිවාර්යයෙන් පටි තද කරගන්න වෙනවා කියලා අපි දන්නවා. අපි IMF යනවා. නමුත් මේ ජනතාව ජීවත් කරවන්න, ඒ අයගේ ජීවිත සම්බන්ධයෙන් අපට යම් යම් තීන්දු තීරණ ගන්න වෙනවා.

පසුගිය දවස්වල අපි මාධ්‍ය හරහා දැක්කා, මේ අර්බුදය අතරේත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඉන්දියාවෙන් ලැබුණු ඩොලර් බිලියනයෙන්, ඩොලර් කෝටි 75ක යකඩ ගේන්න හදනවා කියලා. පසුව ඒක වෙනස් වෙලා තිබෙනවා. දැන් ඒක ඩොලර් කෝටි 25කට විතර අඩු වෙලා තිබෙනවා කියලා තමයි ආරංචි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
Industrial raw materials, ඒ කියන්නේ කර්මාන්ත සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය. යකඩ ගෙනැල්ලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක විතරයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ස්තුතියි, ගරු මුදල් ඇමතිතුමනි.

මේ අවස්ථාවේදී හැම දෙයම අමතක කරලා, නතර කරලා හෝ ජනතාව ජීවත් කරවීමට අවශ්‍ය දේවල් කරන්න ඕනෑ කියලායි මා හිතන්නේ. ඒ ආකාරයට මිනිසුන්ට මේ රටේ ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හදා ගැනීම අත්‍යවශ්‍යයි. පසුගිය දවස්වල ගෑස් කොම්පැනියේ සභාපති ජනතාවට කියනවා අපි දැක්කා, "දර ලිප් පාවිච්චි කරන්න ලැස්ති වෙන්න" කියලා. මේක පුදුම රටක්! එහෙම නම් අපි ගෑස් කොම්පැනියේ සභාපතිගේ තනතුර වෙනස් කරන්න ඕනෑ. දර ලිප් පාවිච්චි කිරීමේ සමාගමක් හදලා ඔහු ඒකේ සභාපති කරන්න ඕනෑ. මොකද, ඔහු ගෙනෙන්නේ දර විකුණන්න පුළුවන් විධියේ තර්ක විතර්ක.

මේ රටේ වර්තමානයේ විශාල අරගළයක් තිබෙනවා. ඒක දිනපතා වර්ධනය වෙනවා. විශාල වැඩ වර්ජනවලට යනවා. දැන් හතර දිග් භාගයේම දිස්ත්‍රික්ක මට්ටමින්, ගම් මට්ටමින් "ගෝ ගම්මාන" පැතිර යනවා, අරයා ගෝ ගම, මෙයා ගෝ ගම ආදි වශයෙන්. වර්ජනය වර්ධනය වෙනවා. නමුත්, පාර්ලිමේන්තුව ඇතුළේ කෙරෙන හුඟක් කථා බහවලින් මට පෙනෙන්නේ මේ වර්ජනය අවතක්සේරු කරලා කථා කරන බවකුයි. 'ඒක නැති වෙලා යයි. ඒක නිකම් දිය වෙලා යයි.' වාගේ මානසිකත්වයක ඉඳගෙනයි කථා කරන්නේ. නමුත්, මට විශ්වාසයි මේ වර්ජනය එන්න එන්න වර්ධනය වෙන බව. මේ අරගළය කරමින් ඒ ගොල්ලන් ඉල්ලන්නේ, මේ රටේ සිටින හොරා කන දේශපාලනඥයන් ඉස්සෙල්ලාම ගෙදර අරින්න කියලායි. "ගෝඨා ගෝ", "මයිනා ගෝ" කියලා විතරක් අප සැනසෙන්න හැදුවාට අරගළය කරන අය ඉල්ලා සිටින්නේ හොරා කන දේශපාලනඥයන් ගෙදර යවන්න කියලායි. එතකොට අපි අවිවාදයෙන්ම දන්නවා, ඒ ගොල්ලන් ඒ කථා කරන්නේ මේ සභාවේ ඉන්න බහුතරයක් ගැනයි කියලා. ඒ දේශපාලනඥයන් ගෙදර යවන්න කියලා තමයි කියන්නේ. ඊළඟට ඒ ගොල්ලෝ කියනවා, ඒ කියන දේ කෙරෙන්න නම් ඊළඟ bottom line එක විධියට දේශපාලන සංස්කෘතිය වෙනස් වෙන්න ඕනෑ කියලා. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්නේ නැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා, අන්තර් කාලීන ආණ්ඩු ආදි වශයෙන් එක එක විධියේ, නොයෙක් නොයෙක් දේවල් ගෙනැල්ලා මේකෙන් ගොඩ එන්න හැදුවාට හරි යන්නේ නැහැ. අනිවාර්යයෙන් අරගළය වර්ධනය වෙනවා. මේ පාර්ලිමේන්තුව මෙහෙයවන ව්‍යවස්ථාවක් තිබෙනවා. ඒක එහාට මෙහාට කළාට, තනතුරු අයින් කළාට හරි තැනකට යනවා කියා මට නම් විශ්වාසයක් නැහැ. මා දකින දේශපාලනය අනුව නම් මා හිතන්නේ ඒවා කරලා අපට ගොඩ වෙන්න බැහැ කියලා. ඒ කොහොම වුණත්, "අරගළය වර්ධනය වේවා! අරගළය ජයග්‍රහණය කරන්න ඕනෑ. ජය වේවා!" කියන ප්‍රාර්ථනාවේ අපි ඉන්නවා.

මේ දවස්වලත් පාර්ලිමේන්තුවේ ඉතා තදින්ම කථා බහට ලක් වන මාතෘකාවක් තිබෙනවා. ඒ ගැන හැම දාම වාගේ පාර්ලිමේන්තුවේ කථා බහ කළා. පසුගිය අවුරුදු 20, 25ක කාලය තුළත් කථා කළා. ඒ තමයි, ජනාධිපති ධුරය අහෝසි කරන්න කියන එක. දැන් නැවතත් ඒක කැරකිලා ඇවිල්ලා තිබෙනවා. ඒක සුළි කුණාටුව වාගේ වටේ ගිහිල්ලා ආපහු එනවා. ජනාධිපති ධුරය අහෝසි කරන එකේ හොඳ සලකුණු තිබෙනවා. ඒ තුළ යම් යම් හොඳ දේවල් අපි දකිනවා. නමුත්, එය රටේ ආරක්ෂාව අවතක්සේරු වන විධියට, අඩාළ වන විධියට නොකළ යුතුයි. ජනාධිපති ධුරය අහෝසි කළාම අගමැතිට සහ පාර්ලිමේන්තුවට බලය එන බව අපි දන්නවා. මොනවා කිව්වත්, අගමැතිවරයා කියන්නේ ජනාධිපතිවරයා තරම් බලවත් පුද්ගලයෙක් නොවෙයි. අගමැතිවරයා කියන්නේ, තමාගේ පුටුව රැකගන්න, තමාගේ පක්ෂය ජයග්‍රහණය කර තබා ගන්න, මන්ත්‍රීවරුන් 113 හදා ගන්න මන්ත්‍රීවරුන් කරන බලපෑම්වලට අනිවාර්යයෙන් යටත් වන කෙනෙක්. ඒ වෙනස සිදු වුණාට පස්සේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ජනාධිපති කරපු කාර්ය භාරයම ඔහුට කරන්න පුළුවන් ද කියන එක ප්‍රශ්නයක්. ජනාධිපතිවරයෙකු නැති හුඟක් රටවල ශක්තිමත් ආණ්ඩුවක් තිබෙන්න ඕනෑ හින්දා මනාප ක්‍රමය නොවෙයි තිබෙන්නේ.

නමුත්, මේ රටේ මනාප ක්‍රමය තිබෙන්න ඕනෑ කියා මම විශ්වාස කරනවා. සුළු ජාතීන්ගේ නියෝජිතයන්ට පාර්ලිමේන්තුවට එන්න; සුළුතර පක්ෂවල නියෝජිතයන්ට පාර්ලිමේන්තුවට එන්න මනාප ක්‍රමය තිබෙන එක හොඳයි. ඒ නිසා මනාප ක්‍රමයත් රැකගෙන, අගමැති ධුරයත් මෙතැනට ගෙනැල්ලා ජනතාවගේ සහ රටේ ආරක්ෂාව -ජාතික ආරක්ෂාව- රැක ගන්නේ කොහොමද කියන එක ගැන අපට අනිවාර්යයෙන්ම විශාල වශයෙන් කල්පනා කරන්න වෙනවා. දැන් පළාත් සභාවලට බලය බෙදිලා තිබෙනවා. මේ වෙලාවේ ඒවා පාලනය වෙන්නේ ජනාධිපති අතින්. ඒ බලය අගමැතිට ආවාම, අගමැතිවරයාට පළාත් සභාවල සිටින උදවියට වෙනත් නියෝජිතයන් හරහා වක්‍රාකාරයෙන් බලපෑම් කරන්න පුළුවන් තත්ත්වයක් ගොඩනැඟුණොත්, නැවතත් ජාතික ආරක්ෂාවට

බලපෑමක් එල්ල වෙන්න පුළුවන්. ජාතික ආරක්ෂාව කියන්නේ සෙල්ලම් කරන්න පුළුවන් දෙයක් නොවෙයි, සියයට 1,000ක් ශක්තිමත්ව තිබෙන්න ඕනෑ දෙයක්. පසුගිය කාලයේ ජාතික ආරක්ෂාව දුර්වල වුණු වෙලාවේ මේ රටේ සිදු වුණු විනාශය, විපත්තිය අපි දැක්කා. ඒවා නැවතත් සිදු වෙන්න ඉඩ තියන්න බැහැ.

පසුගිය දිනක පොල්දූව හන්දියේ ගොවි අරගළයක් තිබුණා. ඔවුන් මට ආරාධනා කරලා, මම එතැනට ගිහිල්ලා පැය භාගයක් පමණ ගත කළා. ඒ වෙලාවේ එම ගොවි මහත්වරුන්ගේ "ජාතික ගොවිජන එකමුතුව" මඟින් "ආර්ථික හා දේශපාලන අරාජිකත්වයෙන් මිදී ජන දිවිය නංවාලන තෙවැදෑරුම් ගොවිජන යෝජනාවලිය" කියන වාර්තාව මට ඉදිරිපත් කරලා, එය පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා ඉල්ලීමක් කළා. ගරු කථානායකතුමනි, එම වාර්තාව මේ අවස්ථාවේ දී මම ගෞරවයෙන් **සභාගත*** කරනවා. ඒක මට ලැබුණු ගෞරවයක් හැටියටයි මම සලකන්නේ.

අද අන්තර්වාර පාලනයක් ගැන කථා කරනවා. අන්තර්වාර පාලනය කියලා ජනාධිපති ඉවත් වෙලා, අගමැති ඉවත් වෙලා, ඒ දෙදෙනා වෙනුවට වෙනත් දෙදෙනෙක් පත් කරන්න ඕනෑත් ඒ පැත්තෙන්මයි. දැන් තිබෙන විධියට අපි ඒ අන්තර්වාර පාලනයට එකඟ නැහැ. ඔය පැත්තේ හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරු එක්ක එකට වැඩ කරන්න අපි කැමැති නැහැ. එතකොට අපට අපේ ප්‍රතිපත්ති පවත්වාගෙන යන්න බැරි වෙනවා. අන්තර්වාර පාලනය සඳහා ඒ පැත්තෙන්ම ඇමතිවරුන් පත්වෙනවා නම්, මම එදා කිව්වා වාගේ එය "අලුත් බෝතලයක පරණ වයින්" වාගෙයි. උදාහරණයක් හැටියට අපි හිතමු, ජනාධිපති, අගමැති දෙදෙනා ඉවත් වෙලා, ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා ජනාධිපති වෙනවා, මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමා අගමැති වෙනවා කියලා. එතකොට මේ අරගළය නවතියිද? අරගළය කෙළවර වෙයිද? ජනතාව කිරිබත් කාලා, රතිඤ්ඤා පත්තු කරලා ජයග්‍රහණයක් හැටියට එය සමරයිද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. රණ විරුවෝ මේ කාලයේ ඉතාම දුෂ්කර, පීඩාකාරී ලෙස තම රැකියාව කරනවා; වග කීම් දරනවා. ඉතාම දුෂ්කර විධියට තමයි ඒ ගොල්ලන්ගේ රාජකාරිය ඉෂ්ට කරන්නේ. හරියට, ගිරේට අහු වුණු පුවක් ගෙඩි වාගෙයි. ඒ වුණත් රණ විරුවන්ගෙන් අපි ඉල්ලීමක් කරනවා. මේ අරගළ කරන්නේ, මේ විරෝධතා දක්වන්නේ, මේ වර්ජන කරන්නේ ඔය ගොල්ලන්ගේම නෑදෑයෝ; ඔය ගොල්ලන්ගේම දෙමව්පියෝ; ඔය ගොල්ලන්ට බත සපයන ගොවියෝ; ඔය ගොල්ලන්ගේ සහෝදර සහෝදරියෝ. ඒ නිසා ඔය ගොල්ලෝ අනිවාර්යයෙන්ම රැකියාව නැති වෙයි කියලා භයට හෝ රැකියාව බේරාගන්න ඕනෑ නිසා හෝ කිසිම වෙලාවක මේ අරගළ කරන අයට හිරිහැර කරන්න එපා. මොකද, මේ අරගළය ජයග්‍රහණය කරනවා. ලක්ෂ ගණනකගේ රැකියා අහිමි කරන්නට බැහැ. රණවිරුවෝ සියලුදෙනාගේම රැකියා අහිමි කරන්නත් බැහැ. පොලීසියේ 60,000කගේ රැකියා අහිමි කරන්නත් බැහැ. එහෙම අහිමි කළොත්, මේ අරගළය ජයග්‍රහණය කළාම නැවතත් මාස තුන, හතරක් ඇතුළත ඒ රැකියා අනිවාර්යයෙන්ම ලැබෙනවාමයි. ඒක නිසා ඒවා ගැන හිතන්නේ නැතිව මේ අරගළකරුවන්ට සාධාරණයක් ඉෂ්ට වන විධියට රැකියාව කරන්න; රාජකාරිය කරන්න; යුතුකම ඉෂ්ට කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ සිටිනවා. ඔබතුමාගේ අවසරය ඇතිව, එතුමා කියපු කරුණු කීපයක් පිළිබඳව පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමා කිව්වා, චීන ණය ප්‍රතිව්‍යුහගත කිරීම ගැන කථා කරද්දී ඔවුන් ප්‍රකාශ කළා කියලා, "මේක ප්‍රතිව්‍යුහගත කරන්න බැහැ, ණය ගෙවන්න ණයක් දෙනවා" කියලා. එතුමා එක්ක ඊයේ-පෙරේදා පැය ගණනක් සාකච්ඡා කළා කිව්වා. එතැනදී මොකක්ද වුණේ? ඒ, එක ප්‍රශ්නයක්. අනෙක් කාරණය, බන්දුල ගුණවර්ධන මැතිතුමා කිව්වා, රාජ්‍ය ආයතනවලට ණය දෙන සීමාව සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කළාය කියලා. සියයට 15 කළේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්, දැනට අවුරුද්දකට පෙර. ඒ පිළිබඳව එතුමා යම් වැරදි ප්‍රකාශයක් තමයි මේ රටට කළේ. ඒ වාගේම එතුමා කිව්වා, දැනට විදේශ ණය බිලියන 51ක් තිබෙනවා කියලා. බිලියන 51ක් කිව්වාම, පසුගිය කාලයේ ඩොලරයේ අගය රුපියල් 178ට වාගේ නේ, තිබුණේ. සාමාන්‍යයෙන් ඩොලරයේ අගය රුපියල් 200යි කියලා ගත්තොත්, ඒක 51න් ගුණ කළාම සමස්ත ණය ප්‍රමාණය රුපියල් කෝටි දස ලක්ෂයක් පමණ වෙනවා. දැන් ඩොලරයේ අගය රුපියල් 370ක් වෙලා තිබෙනවා. ඒ අනුව ගත්තාම ඒ ප්‍රමාණය රුපියල් කෝටි 18 ලක්ෂයක් පමණ වෙනවා. එතකොට සමස්ත ණය රුපියල්වලින් ගත්තොත්, බිලියන 18,000ක් -ට්‍රිලියන 18ක්- පමණ වෙනවා. ගරු කථානායකතුමනි, ඊයේ -පෙරේදා මුදල් අමාත්‍යාංශය මහ බැංකු වාර්තාව ඉදිරිපත් කළා. ඒක තවම පාර්ලිමේන්තුවට දුන්නේ නැහැ. ඒ වාර්තාව,-

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, හදිසි කාරණයක් කියන්න මට විනාඩි කීපයක් දෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, කාරණය?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මේක ආරක්ෂාව සම්බන්ධ ගැටලුවක්, ගරු කථානායකතුමනි.

[ගරු මනූෂ නානායක්කාර මහතා]

ගරු කථානායකතුමනි, මේ වෙලාවේ පාර්ලිමේන්තුව ඉස්සරහා වැටවල් ගහලා ආරක්ෂාව තර කර තිබෙනවා. සාමකාමී විරෝධතාවක හිටපු බුවනෙක එස්. පෙරේරා, මෙලනි, විභීදක පෝද්දුවගේ, නිරාශාන් ඇතුළු පිරිසක් දැන් පොලීසිය බලෙන් පැහැර ගෙන යනවා. මේ ගැටුමකටයි යන්න හදන්නේ. මෙහෙම කරන්න දෙන්න එපා. මේ ළමයින්ව ගැටුම් ඇති කරන තත්ත්වයට පත් කරන්න එපා. මේ කරන වැඩේ වැරදියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි,-

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මට මේ කාරණා ටික කියලා අවසන් කරන්න ඉඩ දෙන්න.

නිදහසින් පසුව අපේ රටේ මහ බැංකුව 1950 දී ආරම්භ කරලා, මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට එනතුරු තිබුණු සමස්ත විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 11යි. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා අපට 2015දී රට භාර දෙනකොට විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 42යි. ඒකෙන් ඩොලර් බිලියන 11ක් අඩු වුණාම ඉතිරි ප්‍රමාණය ඩොලර් බිලියන 31යි. එතකොට මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ කාලය තුළ ඩොලර් බිලියන 31ක් ණය අරගෙන තිබෙනවා. ඊට පස්සේ යහ පාලන රජය පැවති 2015- 2019 කාලය ගත්තාම, මුළු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 54යි. ඒ ඩොලර් බිලියන 54න් ඩොලර් බිලියන 42ක් අඩු වුණාම ඉතිරි ප්‍රමාණය ඩොලර් බිලියන 12යි. එතකොට අපේ රට නිදහස ලබලා මහ බැංකුව ආරම්භ කළාට පස්සේ ඒ පැවති සමස්ත ආණ්ඩු විසින් අරගෙන තිබෙන ණය ප්‍රමාණය ඩොලර් බිලියන 11යි, ඩොලර් බිලියන 12යි. ඔක්කෝම ඩොලර් බිලියන 23යි. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ රාජපක්ෂ පාලනය තිබුණු අවුරුදු 11ක කාලය තුළ අරගෙන තිබෙන ණය ප්‍රමාණය ඩොලර් බිලියන 31යි. මේ කාලයේ ගත්ත swap එකත් එක්ක සාමාන්‍යයෙන් ඩොලර් බිලියන 35ක් විතර අරගෙන තිබෙනවා. එතකොට විදේශ ණය වැඩියෙන් අරගෙන තිබෙන්නේ රාජපක්ෂ පාලන කාලය තුළදීයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී කරුණු පැහැදිලි කරද්දී යම් යම් දේවල් අතපසු වෙලා තිබුණා. ඒ නිසා ඔබතුමා දැන් හෝ පසුව පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි, චීනයේ ප්‍රශ්නය හා සියයට 15 ඇපකර වැඩිවීම පිළිබඳව.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, මම ඒ පැහැදිලි කිරීම කරන්නම්. මට කිසි දෙයක් අතපසු වෙලා නැහැ. මම ඒ සියලු ලේඛන ඉදිරිපත් කරලා තිබෙනවා. වසරින් වසරට ගත්ත ණය ප්‍රමාණය ඒ ලේඛනවල සඳහන් කරලා තිබෙනවා. ඒ අනුව ඉතාම පැහැදිලියි, 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ඔබතුමන්ලා බිලියන 15ක් ණයට අරගෙන තිබෙන බව.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
බිලියන කීයක්ද?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
බිලියන 15ක්. ඔබතුමන්ලා බිලියන 12.5ක් ISBs අරගෙන තිබෙනවා. Term loans බිලියන දෙකහමාරක් අරගෙන තිබෙනවා. එතකොට ඔක්කෝම බිලියන 15ක් අරගෙන තිබෙනවා. පසුගිය 2020 හා 2021 අවුරුදුවල, - *[බාධා කිරීමක්]* බලන්නකෝ. මම ඉදිරිපත් කළා. ISBs, ඒ කියන්නේ ස්වෛරී බැඳුම්කර, බිලියන දොළහමාරක්. ඒ හැරුණාම, කෙටි කාලීන ණය මුදල් - short-term loans - අරගෙන තිබෙනවා. ඒ දෙකම එකතු වුණාම බිලියන 14.8ක්. ඒ, පළමුවැන්න.

දෙවැනි කාරණය, 2020-2021 අවුරුදුවල දී කිසිම මුදලක් ණයට අරගෙන නැහැ. බිලියන 8ක් ගෙවලා තිබෙනවා. ඒ නිසා තමයි මම මේ විධියට කියන්නේ. මම අද උදේ ඉඳලා කිව්වේත් ඒකයි. ණය ගත්තේ කවුද, ණය ගෙව්වේ කවුද කියන එක නොවෙයි ප්‍රශ්නය. අවසාන වශයෙන් ණය ගෙවන්න වෙන්නේ පවතින රජයටයි. මේ රටේ මිනිස්සුයි ඒ ණය ගෙවන්න ඕනෑ. අපි ඒකට ක්‍රමවේදයක් හදා ගනිමු කියන එක තමයි මම කියන්නේ. ඒ නිසා, ණය ප්‍රතිව්‍යුහගත කිරීම තමයි ඉතාම වැදගත්. ණය ප්‍රතිව්‍යුහගත කිරීම වැදගත්, IMF එකට යන්න. IMF එකට ගියාට පස්සේ තමයි අපට නැවත වතාවක් market එකට යන්න වෙන්නේ. ගරු විපක්ෂ නායකතුමා කියපු කාරණයට මම එකඟ වෙනවා. ණය ගත්තාය කියන එක ප්‍රශ්නයක් නොවෙයි. රටක් දියුණු වෙනකොට, ව්‍යාපාරයක් දියුණු වෙනකොට ණය ගන්නවා වාගේම, ඒ ණය නිසි පරිදි ආයෝජනය කරන්නත් ඕනෑ; කළමනාකරණය කර ගන්න ඕනෑ. ඒ වාගේම ඒවා නැවත ගෙවීම සඳහා ක්‍රමවේදයක් තිබෙන්නත් ඕනෑ.

ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා චීනය ගැනත් කිව්වා. චීනය මට කවදාවත් කිව්වේ නැහැ, ඒ ගොල්ලන් කවදාවත් මේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන්නේ නැහැ, ආපසු ගෙවන්න මුදලක් දෙන්නම් කියලා. නමුත්, පොදුවේ එවැනි දෙයක් තිබෙනවා කියලා විශ්වාසයක් තිබෙනවා. ඒ හැරුණාම චීන තානාපතිතුමා කියලා තිබුණා, IMF එකට යාම පිළිබඳ එතුමා දුකට පත් වෙනවා, that he is saddened කියලා. නමුත්, පෙරේදා මම එතුමාත් එක්ක පැයක්, එකහමාරක් කථා කළා. එහෙම වාර්තා වෙලා තිබුණාට, එතුමා මට එහෙම කිව්වේ නැහැ. නමුත්, අපි IMF එකට යාම සම්බන්ධයෙන් සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න එතුමා එකඟ වුණා. ඔවුන් IMF එකේ ප්‍රධාන කොටස්කාරයෙක් හැටියට, අපට ඒ ක්‍රියාවලිය ඉක්මනින් අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ඉක්මනින් ම ලබා දෙනවා කියලා කිව්වා, ගරු මන්ත්‍රීතුමනි. ඒක ඉතාම හොඳ දෙයක්. මොකද, දැන් අපි වහාම කළ යුත්තේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම. එහෙම නැතිව අපට IMF එකෙන් ආධාර ලැබෙන්නේ නැහැ. එම නිසා මම නැවත වතාවක් කියන්නේ මේකයි. මේකට වැඩියෙන් වග කියන්න ඕනෑ කවුද, අඩුවෙන් වග කියන්න ඕනෑ කවුද කියලා අපට අවුරුදු ගණනක් තර්ක කරන්න පුළුවන්. නමුත්, සරත් ෆොන්සේකා මැතිතුමා කිව්වා වාගේ, ඒ කිසි දෙයකින් රටේ මිනිසුන්ගේ ප්‍රශ්නවලට උත්තර ලැබෙන්නේ නැහැ. මට භය තිබෙන්නේ, කවදා හරි මේ සාමකාමී උද්ඝෝෂණ සාමකාමී බවින් එහාට යයි ද කියන එක ගැනයි. දැනට "Gota, go home!" කියනවා, අගමැතිතුමා සහ අපි ආණ්ඩුවේ සිටින නිසා. නමුත්, මම නැවතත් එකඟ වෙනවා සරත් ෆොන්සේකා මැතිතුමා කියපු කාරණයට. එතුමා කිව්වා වාගේ, මේ අරගළය පවත්වන්නේ සම්පූර්ණ ක්‍රමයට විරුද්ධවයි; අවුරුදු 70ක පාලනයට විරුද්ධවයි; පාර්ලිමේන්තුවේ සිටින සමස්ත 225දෙනාටම විරුද්ධවයි. ඒ නිසා අපි මේ අවස්ථාවේදී මෙන්න මේ ටික තේරුම් අරගෙන මෙය කළමනාකරණය කර ගත යුතුයි කියන ස්ථාවරයේ තමයි මම සිටින්නේ. මම ඒ සඳහා කැපවෙලා සිටින බව කියන්න කැමතියි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමා.

[අ.භා. 12.50]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු කථානායකතුමනි, අද දවසේ අපි සාකච්ඡා කරන්නේ ගරු මුදල් ඇමතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පවත්වපු සාකච්ඡා සම්බන්ධයෙන් සහ අද අපේ රට මුහුණ දෙන ආර්ථික අර්බුදය පිළිබඳවයි. මේ අවස්ථාවේදී කාරණා ගණනාවක් තිබෙනවා, මට කියන්න.

ගරු කථානායකතුමනි, ඒ කාරණා ගණනාව අතර මූලිකවම කියන්න ඕනෑ දෙයක් තිබෙනවා. අපි අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන සහ වෙනත් දේ ගැන කථා කළත් එළියේ මහ ජනතාවගේ ප්‍රධානම සටන් පාඨය පිළිබඳ, ඔවුන්ගේ ප්‍රධානම ඉල්ලීම පිළිබඳ වහා අවධානය යොමු කළ යුතුයි කියලායි මම ප්‍රකාශ කරන්නේ. ගරු ඇමතිතුමා හොඳින්ම දන්නවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාව පිළිබඳ ඉතාම සියුම්ව අධ්‍යයනය කරලා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන බව. මේ 2021 Article IV Consultation නැමැති වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා, මේ වෙනකොට ප්‍රධාන වශයෙන්ම රජයේ ආදායම, රජයේ වියදම සහ අය වැය හිඟය සම්බන්ධයෙන් ඉතාම අමිහිරි තත්ත්වයක් තිබෙන බව. ගරු කථානායකතුමනි, කාගේ, කාගේ වරදින් වුණත් අද වෙනකොට රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයට අනුපාතිකව සියයට 8.9ට ආසන්න මට්ටමකට ඇවිත් තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය වියදම සාමාන්‍යයෙන් දළ දේශීය නිෂ්පාදනයට අනුපාතිකව සියයට 20 අබිබවා ගිහින් තිබෙනවා. 2022 අවුරුද්දේ අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදනයට අනුපාතිකව සියයට 10කට වැඩි මට්ටමකට යන්න පුළුවන් කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශ කරන තොරතුරුවලට අනුව, මීට මාස හයකට කලින් ලංකාවේ රක්‍ෂිත සංචිතය ඩොලර් මිලියන 800කට ආසන්න ප්‍රමාණයක තිබුණා. මේ මාර්තු මාසයේ නිල රක්‍ෂිත සංචිතවල ප්‍රමාණය ඩොලර් මිලියන 29.3ක් කියලායි සඳහන් කරන්නේ. මේ හැම දර්ශකයකින්ම පෙන්වන්නේ ලංකාවේ ආර්ථිකය අද තිබෙන්නේ ඉතාම ගැඹුරු අගාධයක බවයි. මේක මරියානා අගාධයටත් වඩා යටින්ද තිබෙන්නේ කියලා සමහර වෙලාවට අපට හිතෙනවා.

අද මේ ආර්ථිකය මේ වාගේ දැවැන්ත කඩා වැටීමකට ලක් වෙලා තිබෙන්නේ නිදහස ලබා ගත්ත දා ඉඳලා අවුරුදු 74ක් මුළුල්ලේ කාගේ අතින් සිදු වුණු වරදකින්ද කියන එක තවදුරටත් සාකච්ඡා කිරීම අර්ථ විරහිතයි. අද අපට යම් කෙනෙකුට චෝදනා කරන්න පුළුවන්, "පසුගිය කාලයේ ඔබ විපක්ෂයේ හිටියේ. 2015දී ඔබ ගත්ත ක්‍රියාමාර්ගයක් නිසා තමයි මේක සිද්ධ වුණේ. එදා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් රුපියල් 10,000කින් වැඩි කළා" කියලා. රාජ්‍ය සේවකයන් වෙනුවෙන් රුපියල් ලක්ෂයකින් වැටුප් වැඩි කරන්න ඕනෑ නම්, ඒක කරන්න පුළුවන් නම් අපි අත් දෙකම උස්සලා කියන්නේ, "ඒක කරන්න" කියලා. හැබැයි, රුපියල් ලක්ෂයකින් නොවෙයි, යම් ප්‍රමාණයකින් වැටුප් වැඩි කරනවා නම්, රටේ නිෂ්පාදනයට එකඟව, රටේ ඵලදායිතාවට එකඟව, රටේ සශ්‍රීකත්වයට එකඟවයි එය කළ යුතු වන්නේ. ගරු කථානායකතුමනි, අපේ පැත්තෙන් ඇඟිල්ල දිගු කරන්න පුළුවන්, රුපියල් 10,000කින් වැටුප් වැඩි කළ නිසා ලංකාවේ වැටුප් වියදම රුපියල් බිලියන 400 සිට 550 දක්වා වැඩි වුණා කියලා. අපට එහෙම චෝදනාවක් කරන්න පුළුවන්. ඔබ නිසා නිරර්ථකව රටේ රාජ්‍ය වියදම වැඩි වුණා කියලා කියන්න පුළුවන්. ඊළඟට, විපක්ෂයෙන් අපේ පැත්තට චෝදනා කරන්න පුළුවන්, ඔබ ආණ්ඩුව භාර ගන්න වෙලාවේ VAT එක සහ වෙනත් බදු ආදායම් පහළ දැමීම නිසා මොකක්ද වුණේ කියලා අසමින්. සියයට 15ට තිබුණු VAT එක සියයට 8 දක්වා අඩු කළා. සාමාන්‍යයෙන් රුපියල් මිලියන 12ක වාර්ෂික ආදායම මත VAT එක අය කළා නම්, ඒක මිලියන 300 දක්වා ඉහළ දැම්මා නම් මේ අර්බුදය ඇති වෙනවාද? අන්න එතැන තමයි වැරදුණේ කියලා කෙනෙකුට අපේ ආණ්ඩුවටත් චෝදනාවක් එල්ල කරන්න පුළුවන්. ඔබ නිසා ලංකාවේ VAT සහ වෙනත් බදු ආදායම් රුපියල් බිලියන 681කින් අඩු වුණා කියලා අපේ පැත්තට බෝලේ පාස් කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, 1971දී කැරැල්ලක් ඇති වුණා. ඒකෙදි දහස් ගණනක් මිනිසුන්ගේ ජීවිත වගේම දේපළත් අපට අහිමි වුණා. ඒ වාගේම 1988-89 ආසන්න කාලයේ මොන තරම් වැඩ වර්ජන සිද්ධ වුණාද? ඒ වාගේම මිනිස් පැය මොන තරම් ප්‍රමාණයක් අපට අහිමි වුණාද? අදත් මහ පාරේ සිද්ධ වෙන වර්ජන නිසා, මේ මොහොතෙත් ඇති වන කැරලි කෝලාහල නිසා මිනිස් පැය කොයි තරම් නම් ප්‍රමාණයක් අහිමි වෙනවාද කියලා ඔබ දන්නවා. වෘත්තීය සමිති පසුපස, වෙනත් සංවිධාන පසුපස දේශපාලන යන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙනවා කියන එක අපි දන්නවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ ඉන්න පක්ෂ, විපක්ෂ හැමෝටම අද මේ ආර්ථිකය කඩා වැටීම පිළිබඳ චෝදනාව එකවිට, එක ප්‍රමාණයට එල්ල වන බව මා කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මේ උදා වෙලා තිබෙන ආර්ථික අගාධයෙන් ගොඩ එන්නයි අපි සාකච්ඡා කළ යුතු වන්නේ.

මුදල් අමාත්‍යතුමා, ඒ වාගේම මහ බැංකුවේ නව අධිපතිතුමා ඉතාම සද්භාවයෙන් ජාත්‍යන්තරයත් එක්ක සාකච්ඡා කරලා රටට හිතකර ආර්ථිකයක් කෙටි කාලීනව ගොඩ නැඟීමට සහ දිගු කාලීනව පදනමක් සකස් කිරීම වෙනුවෙන් වෙහෙසෙනවා. අපි විශ්වාස කරනවා, මෑත ඉතිහාසයේ අපට එකතු වීම සඳහා ලබා දී තිබෙන ස්වර්ණමය අවස්ථාව තමයි මේකයි කියලා. මේ වෙලාවේ කාටත් කැප කිරීම් කරන්න පුළුවන් නම් හොඳයි. ඒක, ගෝල්ෆේස් එකේ ඉන්න අයට කරන්න පුළුවන්; අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ අයට කරන්න පුළුවන්; දේශපාලන පක්ෂවලට කරන්න පුළුවන්; වෘත්තීය සමිතිවලට කරන්න පුළුවන්; ආණ්ඩු පක්ෂයේ අයට කරන්න පුළුවන්; විපක්ෂයට කරන්න පුළුවන්. අපි හැමෝටම කැප කිරීම් කරන්නටයි මේ කාලය උදා වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මා ඇතුළු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 10දෙනෙක් පසුගිය 19වැනි දා ජනාධිපතිතුමාට ප්‍රකාශයක් භාර දුන්නා, "එක්ව මේකට විසඳුම් හොයමු" කියලා. අපි සද්භාවයෙන් හා පවිත්‍ර චේතනාවෙන් ඒ අදහස ගෙනාවේ, ගරු කථානායකතුමනි. පසුගිය මාසයේ 5වැනි දා පාර්ලිමේන්තු රැස්වීමට එන කොට අපි හිතුවා මේ ගැන වහාම විශේෂ කාරක සභාවක් පත් කරයි; කථානායකතුමා වහාම දැවැන්ත මැදිහත් වීමක් කරයි; ආණ්ඩු පක්ෂය මැදිහත් වීමක් කරයි; විපක්ෂ නායකතුමා මැදිහත් වීමක් කරයි කියලා. සියලුදෙනා එක මේසයක් වටේට ඇවිල්ලා මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා ගන්න සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයකට යයි කියලා අපි විශ්වාස කළා. නමුත්, අප්‍රේල් 5වැනි දායින් පටන් ගත්ත පාර්ලිමේන්තු සතියේ දින හතර අපේ අතින් ගිලිහිලා ගියා. ඊට පස්සේ අපි නැවත, පසුගිය සතියට කලින් සතියේ පාර්ලිමේන්තුවට ආවේත් ඒ විධියටම සාකච්ඡා කරලා, විසඳුමකට

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

එයි කියලා බලාපොරොත්තුවෙන්. අපි අදත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා උදැසන ඉඳලා ඒ බලාපොරොත්තුවෙන් ඉන්නවා. එළියේ ඉන්න මහ ජනතාව ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම ඔබතුමා දන්නවා, අද වන කොට මහානායක ස්වාමීන් වහන්සේලා ඉල්ලීමක් කර තිබෙන බව. සංහිඳියාව තුළින් කෙටි කාලයකට අන්තර්වාර පාලනයක් ඇති කර රටේ ජනතාව ඉල්ලන ත්‍රිපෝෂ පැකට් එකේ ඉඳලා කෑම - ආහාර මල්ල- පිළිබඳව, ඛනිජ තෙල් -ඉන්ධන- පිළිබඳව, බෙහෙත් පෙත්ත පිළිබඳව විසඳුමක් ලබා දෙන්න කියලා. ඔවුන් ඉන්නේ ඇවිලෙන දුක් ගින්දරක. ඒ ගින්දර නිවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *took the Chair.*

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි එක් කණ්ඩායමක් විධියට එකතු වෙලා එළියේ ඉන්න ගොවියා, තරුණයා, ඒ වාගේම ශිෂ්‍යයා ඇතුළු මහ ජනතාවට පොදුවේ පිළිගන්න පුළුවන් විධියට පවතින තත්ත්වයට විසඳුම් ගෙනෙන්න සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයකට යා යුතුයි. අපේ මහානායක ස්වාමීන් වහන්සේලා ඉල්ලා සිටින්නේත් අන්තර්වාර පාලනයක් ඇති කරන්න කියලායි. බෞද්ධයෙක් විධියට මම දන්නේ නැහැ මේ රටේ උන් වහන්සේලාට වැඩිය කවුද කථා කරලා, ඇහැට ඇනලා කියන්න ඕනෑ කියලා. මහා නායක ස්වාමීන් වහන්සේලා ඒ විධියට ඉල්ලීමක් කරනකොට අපට අහක බලන්න පුළුවන් ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? ඔබතුමා දන්නවා, සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයකට එකඟ වෙන්න කියලා අපි ඉල්ලීමක් කරන්නේ ඇයි කියලා. මේ එකඟතාවත් එක්ක රටේ මහ ජනතාව සහ අපට හිතවත් ජාත්‍යන්තරය අපට පිළිගැනීමක් දෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර සංවිධානවලට අපට ඩොලරයක් හෝ ණයක් හෝ ආධාරයක් හෝ දෙන්න, අප ගැන විශ්වාසයක් ඇති වනවා. ඔබතුමා දන්නවා, දින 35ක් තිස්සේ demurrage ගෙව ගෙවා තවම ඉන්ධන නැව් කීපයක් වරායේ නැංගුරම් දාලා තිබෙන බව. ක්‍රමානුකූලව අඩු වෙමින් පැවතුණ ඉන්ධන පිළිබඳ ප්‍රශ්නය ආයෙත් හිස ඔසවන්නයි යන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දිනකට ඩොලර් 18,000 ගණනේ දින 35කට demurrage ගෙවන්න වෙන්නේ මේ රටේ මිනිසුන්ගේ බදු මුදලින් නේද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? උගත්, විද්වත් සංවිධානයක් වන නීතිඥ සංගමය කියනවා, මාස 18කට සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයක් ගෙනෙන්න කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බුද්ධිමතුන් කියද්දී, උගතුන් කියද්දී, මහා නායක හිමිවරු කියද්දී, පූජක පක්ෂය කියද්දී ඇයි පියවරක් නොගන්නේ? කාටද, අපි මේ බීරි අලියෙකුට ද වීණා වයන්නේ කියලා මම අහනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මොහොත අතිශයින් සංකීර්ණ අවස්ථාවක්. මේ සති කීපය ගත වෙලා තව මාසයක් දෙකක් යනකොට එළියේ ඇති වූ ගිනි දැල් ලැව් ගිනි වී මේ රට ගිනි ගන්න තත්ත්වයට පත් වනවා. ඒ නිසා අපි 10දෙනා යළි වතාවක් ඉල්ලා සිටිනවා, කරුණාකර සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයක් ගෙනෙන්න එකඟතාවට එන්න කියලා. එතකොට අපට ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් හදන්න, ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් හදන්න, ජාතික බලශක්ති ප්‍රතිපත්තියක් හදන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙටි කාලයකට හදන ඒ අන්තර්වාර පාලන ක්‍රමය මේ රටේ සෑම ප්‍රශ්නයකටම විසඳුම් ලබා දෙන ඇලඩින්ගේ පුදුම පහන නම් නොවෙයි. කෙසේ වුණත්, ඒ අන්තර්වාර පාලනය හරහා මේ රටට විසඳුම් ගෙනෙන යම්කිසි අඩිතාලමක් දමන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපට කොහොමටත් තව අවුරුදු දෙක තුනක්ම පටි තද කර ගන්න වනවා.

අපට කියන්න, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට ඕනෑම වග කීමක් දරන්න අපි සූදානම්; ඕනෑම කැප කිරීමක් කරන්න අපි සූදානම්. ඉහළ ඉඳලා අපේ වරප්‍රසාද කපන්න. අපට දෙන යම් දීමනාවක් තිබෙනවා නම් කපන්න. මේ භෝජනාගාරය වහන්න. අපට මුද්දර දෙනවා නම්, ඒවා අඩු කරලා, ඒවා නැති කරලා අපේ කැප වීම පෙන්වන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ඉල්ලීම කරන්නේ, මේවා කරන්න තවත් විනාඩියක්වත්, තවත් දවසක්වත් ප්‍රමාද කරන්න එපා කියලායි. දැනටමත් ප්‍රමාදවෙලායි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලීමක් කරනවා. එළඹෙන කාලය අතිශය දුෂ්කරයි. එදා වින්ස්ටන් චර්චිල්ගේ කාලයේ, 1940 කාලයේ, ලෝක යුද්ධය ඇති වුණු කාලයේ මේ මොඩලය සාර්ථක වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමාන පරම්පරාවේ අපට සිද්ධවෙලා තිබෙන්නේ, කැප කිරීම් කොට ජාතියට නිදහස හා ආලෝකය ලබාදීම වෙනුවෙන් වන කථාවකට මුල පුරන්නයි. අපි ගත්ත උත්සාහය ගැන මේ පාර්ලිමේන්තුවේ වැදගත් මන්ත්‍රීවරුන් 225දෙනාට ශ්‍රවණය වෙන්න ඇතියි කියලා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප විසින් ලබාදෙන ආදර්ශය මත මේ එළඹෙන කාලය තුළ ජාත්‍යන්තරය අපට උදව් කරාවි. ඒ වාගේම අපේ මිනිස්සු කැප කිරීම් කරාවි. ඒ නිසා තවදුරටත් කාලය ගන්න එපා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු කථානායකතුමාගේ නායකත්වයෙන් විශේෂ කාරක සභාවකට මේ ප්‍රශ්නය ගෙන යන්න. එහිදී පක්ෂ නායකයන් එකම තැනකට ගෙනැවිත් මේ රටේ දැවෙන ප්‍රශ්න -ඉන්ධන ප්‍රශ්නය, ගෑස් ප්‍රශ්නය, ඖෂධ ප්‍රශ්නය, ඒ වාගේම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය- හා ගැටලු ලිහා දැමීම සඳහා විසඳුම් යෝජනා ඇතුළත්වන අන්තර්වාර පාලනයක් ගොඩ නඟන්නය කියන ඉල්ලීම කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳව නායකත්වය ගන්න කියලා ඔබතුමාට මා කියනවා.

අදත් එළියේ කෑ ගහන තරුණයන්ට, කෑ ගහන ගොවීන්ට ප්‍රශ්නයක් තිබෙනවා. ඊළඟ කන්නය වගා කිරීමට ඔවුන්ට පොහොර තිබෙනවාද? ඒ ගැන අපට සාධාරණ ප්‍රශ්නයක් තිබෙනවා. අපි ගිය සතියේ සිටියේ, බටහිර අනුරාධපුරය මැතිවරණ කොට්ඨාසයේ අපේ කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමාගේ ඡන්ද බලප්‍රදේශයේ. අද වනකොට ඒ ගොඩක් කුඹුරුවල වගා කටයුතු ආරම්භ කරලායි තිබුණේ. ඒ ප්‍රදේශයේ ඉඳලා එනකොට සමහරු භාගෙට වගා කරලා තිබෙනවා දැක්කා. ඒ අහිංසක ගොවීන් අපෙන් ඉල්ලන්නේ මොකක්ද? "පොහොර ටික දියල්ලා. අපි වගා කරන්නම්" කියලායි කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම අපි ඉතිහාසයේ වරදක්

කළා. අපි කියනවා, ඒ වරද යළි කරන්න එපාය කියලා. අපි තේරුම් ගනිමු, අපි හැමදෙනාටම වෙච්ච වැරැදි. ඒ නිසා මේ මොහොතේ බිම් මට්ටමේ ජනතාව ඉල්ලන ප්‍රශ්නවලට අපි උත්තර ලබා දිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැංකු පද්ධතිය රටේ ආර්ථිකයේ ශක්තිමත්භාවය පෙන්වන ඒකකයක්. ඉන්ධන පෝලිම් වාගේ, ගෑස් පෝලිම් වාගේ බැංකු පද්ධතියටත් කිසියම් වෙලාවකදී ගැටලුවක් ඇති වෙන්න පුළුවන්. මා මේ පිළිබඳව විස්තර කරන්නේ නැහැ. ආර්ථික විද්‍යාව පිළිබඳව අංශු මාත්‍රයක අවබෝධයක් තිබෙනවා නම්, බැංකු පද්ධතියේ බුර-බුරා නඟින ගින්න අපි කාටත් තේරෙන්න ඕනෑ. ඒ නිසා බැංකු පද්ධතිය ආරක්ෂා කරගන්න වහාම එක් වෙන්න කියන ඉල්ලීමයි කෑ ගහලා කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි විවිධ හඬින්, විවිධ භාෂණයෙන් ඉදිරිපත් කරන්නේ, "කල් මරන්න එපා. කල් මැරුවා හොඳටම ඇති. දැන් අපි එකතු වන වෙලාවයි ඇවිල්ලා තිබෙන්නේ. උද්ධච්ච කථා කිව්වා. අපි පොර ටෝක් දුන්නා. ඒ දුන්නු උද්ධච්ච පොර ටෝක්වල යථාර්ථය අද කාටත් පෙනෙන්න තිබෙනවාය" කියන කාරණයයි. ඒ නිසා මේ ප්‍රශ්නය කාගේ හෝ පොල්මෑකාර අයිතියට පවරන්නේ නැතුව ප්‍රශ්නයට උත්තරය සොයන්න සියලුදෙනා සහෝදර කැලක් වාගේ එකට එකතු වෙන්නය කියන ඉල්ලීමයි මා කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Kabir Hashim. You have 15 minutes.

[1.05 p.m.]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Deputy Chairman of Committees, I am happy to speak today. Hon. Ali Sabry, when I was a young politician, I always used to think as an economist and loved to become a Finance Minister because that is my profession. But, today, I do not envy your position; I would not want to be in your shoes. When you spoke in the morning, I was thinking that you were lucky that you were not speaking in the holy month of Ramazan because, usually, in the holy month of Ramazan, we speak very carefully; we speak the truth; we speak with conviction. So, you managed to jump out of that holy period. I do not know how much conviction you had in what you said. So, you were fortunate.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්තරා නාළිකාවක විකාශය වූ අලි සබ්රි මුදල් ඇමතිතුමාගේ සම්මුඛ සාකච්ඡාවක් මා දැක්කා. එතුමා ඉතාම දක්ෂ ලෙස ඒකට මුහුණ දුන්නා. ඒ නාළිකාවේ ඔබතුමා කථා කරනකොට ලෝනා දේවරාජ්ගේ "ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය" කියන පොත මට මතක් වුණා. මොකද, මුස්ලිම්වරු සිංහල රජ කාලයේ අනුරාධපුර යුගයේ සිට, ඒ වාගේම මහනුවර යුගයේ සිට රටට විශාල සේවයක් කළ ඇත්තන්. ඒ අය විවිධ තනතුරුවල සිටියා. ඒ කාලයේ රට වෙනුවෙන් ලොකු කැපවීමක් කළා. ඒ සමහර අය උපදේශකවරු, සමහර අය තානාපතිවරු, සමහර අය ඇමතිවරු හැටියට කටයුතු කළා. මම එක උදාහරණයක් කියන්නම්. දහතුන්වන ශත වර්ෂයේ බුවනෙකබාහු රජතුමාගේ කාලයේ එතුමා අබු උස්මාන් කියන පුද්ගලයා ඊජිප්තුවට යැව්වා. ඊජිප්තුව සමඟ ජාත්‍යන්තර වෙළෙඳාම වැඩි කර ගැනීම සඳහා තානාපතිවරයකු හැටියට මාම්ලුක් රාජධානියට යැව්වා. එතුමා ඒ වෙලාවේ ගිහිල්ලා රටට ලොකු සේවයක් කළා. ඒ ඔක්කොම -සිය ගණනක්- අය රටට සේවය කළා. මගේ ප්‍රශ්නය මේකයි. ඔබතුමා අද මේ තනතුරේ ඉන්නේ අවංකව රට දිනවන්නද, රට වෙනුවෙන්ද, නැත්නම් ඔබතුමාගේ හාම්පුතාලා රකින්නද කියන ප්‍රශ්නයට උත්තරය ඔබතුමාගේ හෘදය සාක්ෂියේ හරියට තිබෙන්න ඕනෑ. මොකද, හාම්පුතා රකිනවා නම්, ඒක අපට පිළිගන්න බැරි දෙයක් බව අපි කියන්න ඕනෑ.

බොහෝ දෙනෙක් අද හිතනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ bailout එකක්, නැත්නම් ඒ අයගේ සහාය ලබා ගත්තාම අපේ සියලු ප්‍රශ්න, ආර්ථික ප්‍රශ්න අතුරුදහන් වෙයි කියලා. නමුත් එහෙම වෙන්නේ නැහැ. මොකද, IMF එක කරන්නේ අපේ මූල්‍ය අංශයේ ප්‍රශ්නවලට උත්තර සපයා දීම - උදවු කිරීම - විතරයි. ඒක සාධකයක් වුවත් ඒක ප්‍රමාණවත් සාධකයක් වෙන්නේ නැහැ. අපි එතැනින් එහාට ගිහිල්ලා ආර්ථික වර්ධනය නැවත ස්ථාවර කිරීමේ තවත් නිර්ණායක කිහිපයක් සකස් කර ගත යුතුයි. මා හිතන විධියට ඔබතුමාත් ඒක තේරුම් අරගෙන ඇති. IMF එක කියන්නේ එක විසඳුමක් පමණයි කියලා මා හිතනවා.

අද මේ රටේ සමාන්තර අර්බුද දෙකක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. මම ඔබතුමාගේ ඒ interview එක දැක්කා. ඔබතුමා කිව්වා, දේශපාලන අර්බුදයෙන් ආර්ථික ප්‍රශ්න විසඳෙන්නේ නැහැ කියලා. හැබැයි, ආර්ථික අර්බුදයෙන් දේශපාලන ප්‍රශ්න විසඳෙන්නේත් නැහැ. සමාන්තර අර්බුද දෙකක් තිබෙනවා. මේ අර්බුද දෙකටම සමාන්තරව උත්තර දිය යුතුයි, අපි මේ පාර්ලිමේන්තුව තුළ. එකක් ආර්ථික අර්බුදය. අනෙක් එක දේශපාලන අර්බුදය. අපි ඒ දෙක හඳුනා ගන්න ඕනෑ. ඒ ප්‍රශ්න දෙකටම ඔබතුමා නියෝජනය කරන පක්ෂයේ නායකයා - ගෝඨාභය රාජපක්ෂ මහත්මයා- වග කිව යුතුයි. ඔබතුමා නියෝජනය කරන ආණ්ඩුව වග කිව යුතුයි. ඒකත් ඔබතුමා පිළිගත යුතුයි. ඒ වග වීම සහ වග කීම ඔබතුමාට සහ ඔබතුමාගේ රජයට පැවරෙනවා. ඒ නිසා ඒ ගැන හිතලා වැඩ කරන්න ඕනෑ. අද තිබෙන දේශපාලන අර්බුදය ඇත්ත වශයෙන්ම ආර්ථික අර්බුදයත් අභිභවා විදියටත් ඇවිල්ලා තිබෙන බව අපට පෙනෙනවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට එන්නේ වෛරය, ක්‍රෝධය, බෙදීම් ඇති කරලා බව අද රට හොඳටම තේරුම් අරගෙන තිබෙනවා. සිංහල බෞද්ධයාට හිමි පංගුව ලැබෙන්නේ නැහැ, ඒක ලබා දෙන්න යම් යම් දේවල් කරන්න ඕනෑ, ඒකට පූර්ණ බලය දෙන්න කියන තේමා පාඨයෙන්, සටන් පාඨයෙන් තමයි බලය ගත්තේ. අපි ඇත්ත කථා කරන්න ඕනෑ. ඒකට තුනෙන් දෙකේ බලය ඉල්ලුවා. තුනෙන් දෙකේ බලයත් මේ රටේ පුරවැසියන් ලබා දුන්නා. ඒ වාගේම විසිවන ආණ්ඩුක්‍රම සංශෝධනය හරහා උපරිම බලය ජනාධිපතිතුමාට ඕනෑ කිව්වා, රට හරියට ගෙන යන්න නම්. ඒකත් දුන්නා. ඒ අනුව ලෝකයේ බලවත්ම ජනාධිපතිවරයා හැටියට එතුමා පත් වුණා. එතුමා ඒ වනකොට ඒ ඡන්ද දායකයාගේ ඉල්ලීම්, පුරවැසියාගේ ඉල්ලීම් දිහා නොවෙයි බැලුවේ. එතුමා හැදුවේ මොකක්ද? පශ්චාත් ධනේශ්වර සංවර්ධන මාදිලියක් හදා ගත්තා. ඒ පශ්චාත් ධනේශ්වර සංවර්ධන මාදිලිය හරහා මොකක්ද වුණේ? අපි දන්නවා කාම්බෝජයේ මොකක්ද කළේ කියලා. පොල් පොට් ඒ වාගේම පූර්ණ බලය ඉල්ලුවා. වෙනිසියුලාවේ හියුගෝ චාවේස් ඒ වාගේ පූර්ණ බලය ඉල්ලුවා. ඒ වාගේම සිම්බාබ්වේහි රොබට් මුගාබේ ඒ පූර්ණ බලය ඉල්ලුවා. ඒ ගොල්ලන් බලය ඉල්ලුවේ ජනතාවට උදවු කරන්න කියලා. හැබැයි මොකක්ද කළේ? ඔවුන් රට විනාශ

[ගරු කබීර් හෂීම් මහතා]

කරලා දැම්මා. ඒකම තමයි ලංකාවේත් වුණේ. ඒක තමයි අපට සිද්ධ වුණේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට පූර්ණ බලය දුන්නාට පස්සේ මොකක්ද වුණේ? මේ රටේ රාජ්‍ය ආදායම කප්පාදු කරලා, තෝරා ගත්ත කණ්ඩායම්වලට, ව්‍යාපාරකයන්ට, ගජ මිතුරන්ට සහන දුන්නා.

ඊළඟට, සංවෘත ආර්ථිකයක් ගැන කථා කළා. ආර්ථිකය වහලා මොකක්ද කළේ? සමහර වෙළෙඳ ව්‍යාපාරිකයන්ට හම්බ කරන්න අවස්ථාව සලසා දුන්නා, සමහර අයට ඒකාධිකාරියක් ඇති කරන්න අවස්ථාව දුන්නා. අද පළමුවැනි වතාවට මේ රටේ කළු කඩ ආර්ථිකය සාමාන්‍ය ආර්ථිකය අභිභවා ගිහින් තිබෙනවා. මේ ප්‍රශ්න නිසා මිනිස්සු පාරට බැහැලා ඉන්දෙද්දි සමහර අය කෝටිපතියෝ වෙනවා. එවැනි තත්ත්වයක් බිහි කිරීමට උදව් කළේ ඔබතුමන්ලාගේ රජයයි. මේ ක්‍රමය තුළ පාර්ලිමේන්තුවට තිබූ මූල්‍ය පාලනය විනාශ කර දැම්මා; ඒක දියාරු කළා. මේ අලුත් ක්‍රමය තුළ වග වීම සහ වග කීම නැති වෙලා ගියා. මේ අසීමිත බලය නිසාම තමයි, මේ රටේ දූෂණය, හොරකම, නාස්තිය තවදුරටත් වර්ධනය වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ කාල පරිච්ඡේදය තුළ සුළුතරයක් පොහොසත් වෙලා බහුතරයක් හිඟමනට පත් වී තිබෙන බව ඉතාම පැහැදිලියි. ඇති අය සහ නැති අය අතර පරතරය වර්ධනය වී තිබෙනවා. මේක තමයි ප්‍රධානම ප්‍රශ්නය වන්නේ. ඒ නිසා තමයි අද පොදු ජනයා මහ පාරට බැහැලා තිබෙන්නේ. ආර්ථික ප්‍රශ්නය එක්ක මේ ක්‍රමය පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා තමයි, system change එකක් ගැන මිනිස්සු කථා කරන්නේ. System change එක කියන්නේ, ආර්ථික ක්‍රමයේ වෙනසක් පමණක් නොවෙයි, පාලන ක්‍රමයේත් වෙනසක් ඇති කිරීමයි. මේ රටේ තිබෙන පරතරය, සාමාන්‍ය ආදායම් විෂමතාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒකේ system change එකක් කරන්න ඕනෑ. ඒ නිසා තමයි අද මිනිස්සු විශාල වශයෙන් විරෝධතා කරන්නේ. සමාජය තුළ සමගි ජන බලවේගය පිළිබඳ විවිධ මත ඇති කර තිබෙනවා, "අපි ආණ්ඩුවේ කොටස්කරුවෝ වෙන්නේ නැහැ; සජිත් ප්‍රේමදාස මැතිතුමා මේකේ වග කීම ගන්නේ නැහැ" කියලා. අපි ඒ වග කීම ගන්නේ නැත්තේ, කොටස්කරුවෝ වෙන්නේ නැත්තේ භය වෙලා නොවෙයි. අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපේ හෘදය සාක්ෂිය අනුව මේ තට්ටු මාරු ක්‍රමයට අපට එකඟ වෙන්න බැහැ. මේ තිබෙන ක්‍රමය මේ විධියටම රකිනවා නම්, අපේ දර්ශනය අපට ක්‍රියාත්මක කරන්න බැහැ, මෙහෙම තියෙද්දි රටේ පුරවැසියෝ ඉල්ලන දේවල් අපට දෙන්න බැහැ කියලා අපි හිතනවා. ඒ නිසා මේක වෙනස් වෙන්න ඕනෑ.

ඔබතුමන්ලා දැන් මොකක්ද කරන්නේ? ඔබතුමන්ලා කොට්ට මාරු ක්‍රමය මිසක් එතැනින් එහාට යන්න උත්සාහ කරන්නේ නැහැ. කොට්ටය මාරු කරන්නේත් නැහැ. ඇත්තටම කොට්ට උරය විතරයි මාරු කළේ. ඇමතිවරු මාරු කළා කියන්නේ කොට්ටයවත් මාරු කළේ නැහැ කියන එකයි. කොට්ට උරය විතරයි මාරු කළේ. කොට්ටය මාරු කරලා, මෙට්ටය මාරු කරලා විතරක් මදි. අපි හිතන විධියට ඊට වඩා එහාට යන්න ඕනෑ. කොට්ටෙයි, මෙට්ටෙයි දෙකම මාරු කරලා ඇඳේ රාමුව පවා අපි වෙනස් කරන්න ඕනෑ. ඒක තමයි අපි හිතන්නේ. ඒක තමයි system change කියන්නේ. ඒ system change එකට ඔබතුමන්ලා මේ සභාව තුළ එකඟවනවා නම්, අපි ලැහැස්තියි වග කීම ගන්න. එහෙම නැත්නම් නිකම් අගමැතිකම් ගන්නයි, ඇමතිකම් ගන්නයි, ජාතික ආණ්ඩු හදන්නයි, තනතුරු ගන්නයි සජබ එතැන නැහැ; සජිත් ප්‍රේමදාසත් එතැන නැහැ. හැබැයි, ඕනෑ වෙලාවක ප්‍රශ්නයට මුහුණ දෙන්න, common minimum programme එකකට යන්න කොන්දේසි මත අපි ලැහැස්තියි. ඒක අපට අවාසි වෙන්නත් පුළුවන්. හැබැයි, රට ආපහු නැඟිට්ටවන්න නම්, economic revival එකක් කරන්න නම්, අපි ඒකට උදව් කරන්න කැමැතියි. හැබැයි, ඒ මේ කොන්දේසි මත. ඒ නිසා තමයි සමගි ජන බලවේගය road map එකක් ඉදිරිපත් කළේ. අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. මොකද, මේ ආණ්ඩුව කෙරෙහි ඒ විශ්වාසය නැහැ. මේ වග කීම ඔබතුමන්ලාගේ. එතකොට මෙතැන කී දෙනෙක් හෘදය සාක්ෂියට අනුව ඒ විශ්වාස භංග යෝජනාවට ඡන්දය දෙනවාද? නැත්නම් ඔබතුමන්ලා එකඟද, මේ ආණ්ඩුව කරපු සියල්ලම අනුමත කරන්න? අපි ජනාධිපතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. ඒකට නීතියේ බලපෑමක් නැතිව ඇති. හැබැයි, මේ රටේම මතය ඒකයි. එතුමා ඒකේ වග කීම ගන්න ඕනෑ. ඒ නිසා දේශපාලනඥයන් වශයෙන් අපි මේ system change එක තුළින් බලාපොරොත්තු වන්නේ පරණ හොරු අල්ලන එක විතරක් නොවෙයි, අලුතින් පත් වන අයටත් නැවත හොරකම් කරන්න බැරි වෙන්න සිංගප්පූරුවේ වාගේ දැඩි නීති ගෙනෙන එකයි. ඇමතිවරයෙකුගේ, මන්ත්‍රීවරයෙකුගේ අතින් වරදක් සිදු වුණොත් තමන්ව හිර කරන්න පුළුවන් නීති රීති ඒ system change එක තුළ ඇති වෙන්න ඕනෑ. ඒ නිසා අලුත් ක්‍රමවේදයක් ඇති වෙන්න ඕනෑය කියා අපි හිතනවා. ඒ නිසා තමයි, සමගි ජන බලවේගය roadmap එකක් ඉදිරිපත් කරන්නේ. අපේ රටේ පුරවැසියෝ තිත්ත ඇත්ත දැනගන්නත් ඕනෑ.

ගරු ඇමතිතුමනි, අද ඔබතුමා කථා කරනකොට මට හිතුණා නැඟිටලා කථා කරන්න. ඔබතුමන්ලා දැනුයි IMF යන්නේ. ඔබතුමා කිව්වා, "අපි දැනගෙන හිටියා. අපි කලින් කිව්වා" කියලා. හරියටම අවුරුදු එකහමාරකට කලින් අපි මේ ගැන කථා කළා. ඒ හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න. පසු ගිය අය වැයේදී අපේ විපක්ෂය වෙනුවෙන් මමයි අන්තිම කථා කළේ. මම බැසිල් රාජපක්ෂ මහත්මයාට කිව්වා, "තව මාස ගණනකින් මේ රට බංකොලොත් වෙයි, මේ අය වැයෙන් මේ ප්‍රශ්නය ආමන්ත්‍රණය කරලා නැහැ, මෙන්න මේ දේවල් වෙයි, post-default එකකට යන්නේ නැතිව pre-emptive default එකකට යන්න" කියලා. නමුත්, ගණන් ගත්තේ නැහැ. එතකොට එතැනින් එහාට අපි මොකක්ද කරන්නේ? 1980 දශකයේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණා. රටේ ආර්ථිකයේ ගැස්මක් ඇති වුණා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට බොහෝ දෙනෙක් කිව්වා, IMF එකට යන්න කියලා. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා මොකක්ද කළේ? IMF එකට යන එක ගැන එතුමා හොඳට විශ්ලේෂණය කළා. එතුමා උපදෙස් ගත්තේ සිංගප්පූරුවේ පළමු මුදල් ඇමතිවරයා, නැත්නම් නියෝජ්‍ය අගමැතිවරයා වුණු Dr. Goh Keng Swee මැතිතුමාගෙන්. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එතුමාට කථා කරලා කිව්වා, "මට මේකට උපදෙස් දෙන්න" කියලා. Dr. Goh Keng Swee මැතිතුමා මොකක්ද කළේ? එතුමා පිටු 27ක වාර්තාවක් සකස් කරලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට දුන්නා. ඒකේ තිබුණා, IMF එකට යා යුතු ඇයි කියන උපදෙස. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඒ උපදෙස් අරගෙන තමයි එදා IMF එකට ගියේ. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මොකක්ද කළේ? මෙච්චර අපි පාර්ලිමේන්තුවේ මේ පිළිබඳව කථා කළත්, ආර්ථික විශේෂඥයන් එතුමාට කිව්වත් -රටේ හැම කෙනාම කිව්වත්- එතුමා ඒවාට ඇහුම් කන් දුන්නේ නැහැ. එතුමා අජිත් නිවාඩ් කබ්රාල්ගෙන් උපදෙස් ගත්තා වෙන්න පුළුවන්. එහෙම නම් ඒ වගකීම ජනාධිපතිවරයා බාර ගන්න ඕනෑ. එතුමා ඒ කාරණය පිළිගෙන තිබෙනවා. කවුද, ඒ වගකීම බාර ගන්නේ? එතුමා නිසි වෙලාවට රටට ඒ ප්‍රතිකාර කරන්න ඉඩ දීලා තිබුණා නම් අද මේ රටට මේ තත්ත්වය ඇති වෙන්නේ නැහැ. අපි හරි දේ කරලා තිබුණා නම් මේ රට මේ තත්ත්වයට පත් වෙන්නේ නැහැ.

එක්තරා රූපවාහිනී නාලිකාවක පැවති සම්මුඛ සාකච්ඡාවකදී අලි සබ්රි මැතිතුමා කිව්වා, ආර්ථික ප්‍රතිසංස්කරණ ගැන වාගේම

කකුලෙන් අදිනවා යම් දෙයක් කරන්න යනකොට කියලා. අලි සබ්රි මැතිතුමනි, කකුලෙන් ඇද්දේ තමුන්නාන්සේලාගේ කඳවුර. හැම දාම ඒක තමයි එතුමන්ලා කළේ. බලයට එන්න ජාතිවාදය පාවිච්චි කළා. එහෙම නැත්නම් වෙනත් ජනප්‍රිය සටන් පාඨ පාවිච්චි කළා. ඒක නිසා තමයි මේ රට මෙතැනට වැටුණේ කියලා එක පැත්තකින් අපි කියන්න ඕනෑ. ඒ කාරණය ඔබතුමා දැනගන්න ඕනෑ, අලි සබ්රි මැතිතුමා. අපි කලින් හිටපු කඳවුරේ - 2001-2004 - එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණා. ඒ වෙලාවේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලංකා විදුලිබල මණ්ඩලය - CEB එක - unbundle කිරීම සඳහා බෙදා හැරීමට ඒකක හතරක්, සම්ප්‍රේෂණය සඳහා එක ඒකකයක්, උත්පාදනය සඳහා වෙනම ඒකකයක් සකස් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, give me two minutes extra.

ඒ වාගේම එතුමා පාඩු ලබන ආයතන ජනතාකරණය කිරීම සඳහාත්, ප්‍රතිව්‍යුහගත කිරීම සඳහාත් වැඩ ආරම්භ කළා. රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා VR Scheme එකක් පටන් ගත්තා; බඳවා ගැනීම් නතර කළා. නමුත් මොකක්ද වුණේ? එදා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත්, ජනතා විමුක්ති පෙරමුණත් එකතුවෙලා මොකක්ද කළේ? මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කරන්න අපි බලයෙන් එළියට දැම්මා. මේ ප්‍රතිව්‍යුහගත කිරීම් නැවැත්තුවේත් ඒ කණ්ඩායමයි. එහෙම නම්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත්, ජනතා විමුක්ති පෙරමුණත් -ඒ දෙගොල්ලන්ම- මේකට වග කියන්න ඕනෑ. මොකද, මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ගෙනෙන්නේ එදා ඒ කණ්ඩායම් දෙක එකතුවෙලා. හැබැයි, එහෙම කථා කරපු අය අද ඩොලර් හොයන්න මොකක්ද කරන්නේ? ඒ අය අද ඩොලර් හොයන්න රටේ භූමිය පවා විකුණන්න ලෑස්තියි. රටේ භූමිය විකුණලා අවසානයි, එක පැත්තකින්. අද අපේ ස්වෛරීත්වය පවා වෙන්දේසි කරලා තිබෙනවා. සමහර විට අපිට හිතෙනවා, අපි කොයි රටක ප්‍රාන්තයක් වෙයිද ඊළඟට කියලා. මොකද, ඒ මට්ටමට අපි වැටිලා ඉන්නේ; හතර ගාතෙන් ගිහිල්ලා අපි ණය ගන්නවා. ඔබතුමන්ලා ඒකේ වගකීමත් බාර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යහ පාලන ආණ්ඩුව පැවති 2015 - 2019 කාලයේ අපි මේ හැම දෙයක්ම වෙනුවෙන් නිසි පියවර ගන්න උත්සාහ කළා. අපනයන වැඩි කිරීම සඳහාත්, ඩොලර් ආදායම වැඩි කිරීම සඳහාත් අපි වෙළෙඳ ගිවිසුම් අත්සන් කරන්න උත්සාහ කළා. වෙනත් වෙළෙඳ පොළවල් ආක්‍රමණය කරන්න අපි උත්සාහ කළා. නමුත් මොකක්ද වුණේ, FTAs - ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් - අත්සන් කරන්න ගියාම? ඉන්දියාවේ තමයි මේ කලාපයේ තිබෙන ලොකුම වෙළෙඳ පොළ තිබෙන්නේ. ඉන්දියාවත් එක්ක ඒ ගිවිසුම අත්සන් කරන්න ගියාම මේ ආණ්ඩුවේ ඉන්න අයම එදා ඊට විරුද්ධ වුණා. අපිට පහර ගැහුවා, "ඉන්දියන්කාරයෝ මෙහාට එනවා, රස්සාවල් ගන්න" කියලා. ව්‍යාජ දේවල් කියලා ඒ ගිවිසුම නතර කළා. අපි ඒ ගිවිසුම අත්සන් කළා නම් අද ඉන්දියාවේ වෙළෙඳ පොළ අපිට ආක්‍රමණය කරන්න තිබුණා. සිංගප්පූරු වෙළෙඳ පොළත් එක්ක ගිවිසුමක් අත්සන් කරන්න ගියා. මොකක්ද කිව්වේ? සිංගප්පූරුවේ කම්කරුවෝ මෙහාට එයි කියලා කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Just give me a minute, Sir.

සිංගප්පූරුවෙන් හාල් මෙහාට ගෙනෙයි කියා කිව්වා. සිංගප්පූරුවෙන් අපි ආනයනය කරන්නේ ඩොලර් මිලියන 1,293ක වාගේ මුදලකට සරිලන ප්‍රමාණයක්. ඒකෙන් සියයට 60ක්ම අපි ආනයනය කරන්නේ පෙට්‍රෝලියම් -ඛනිජ තෙල්-. ඒ, ඩොලර් මිලියන 750කට. ඉතුරු ටික රත්තරන්. අපි සිංගප්පූරුවත් එක්ක ගිවිසුමක් අත්සන් කරලා තිබුණා, සිංගප්පූරුවේ තාක්ෂණය අපිට ආනයනය කරන්න කියලා. හැබැයි, ඒක නැවත,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Just give me a minute, Sir. From my side, that time will be deducted.

මම කියනවා, මේකට වග කියන්න ඕනෑ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියලා. මේ ගොල්ලෝ එදා බලය ගැනීම සඳහා අපනයන ක්ෂේත්‍රය වට්ටන්න යම් පියවර ගත්තා. 1977 සිට 1994 දක්වා අපේ කඳවුර මේ රට පාලනය කරනකොට රටේ අපනයනය දළ දේශීය නිෂ්පාදිතයේ පංගුවක් හැටියට සියයට 32යි. ඒ ප්‍රමාණය 1994න් පසුව -2014 වනකොට- සියයට 12ට පහත දැම්මා. ඒ වාගේම මේ රටේ රාජ්‍ය ආදායම 1994 වනකොට සියයට 22යි. හැබැයි, ඒ ප්‍රමාණය 2014 වනකොට සියයට 10 දක්වා පහත වැටුණා. එම වගකීම නැවත ඔබතුමන්ලා බාර ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, there is time. I have been asked to take time from the Opposition. Please give me that time.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, I have not been informed of that.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
The Hon. Chief Opposition Whip is not here. But, you can check it with him.

1994න් පසුව තමයි මේ අර්බුදය නිර්මාණය වුණේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2005 වෙනකොට මොකක්ද වුණේ? මේ අර්බුදය එන එක කඩිනම් කළා. කඩිනම් කළේ මහින්ද රාජපක්ෂ මහත්මයා. මහින්ද රාජපක්ෂ මහත්මයා 2005-2014 කාලය තුළ ණය කන්දරාවක් ගත්තා; ඩොලර්වලින් ණය ගත්තා. ඒ ඩොලර් ණය එතුමා ආයෝජනය කළේ මොනවාටද?

[ගරු කබීර් හෂීම් මහතා]

යටිතල පහසුකම් හදන්න, මහා මාර්ග හදන්න, ගොඩනැඟිලි හදන්න. හැබැයි, එතුමා ඩොලර් ආදායම් උපයන එක ව්‍යාපෘතියක් කළාද? 1994න් පසුව මේ රටට ඩොලර් එන එක ව්‍යාපෘතියක් හැදුවාද කියන්න. අදටත් ඩොලර් එන්නේ ඇඟලුම් කර්මාන්තවලින්. ඒකත් එදා ප්‍රේමදාස මහත්මයා ආරම්භ කරපු දෙයක්. ඊළඟට, ඩොලර් එන්නේ නිදහස් වෙළෙඳ කලාපවලින්. ඒ, එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ආරම්භ කරපු එකක්. ඊළඟට, අපට ඩොලර් ලැබෙන්නේ විදේශ රැකියා කරන අයගෙන්. ඒකත් එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලයේ තමයි ඇරඹුණේ. ඒ ඩොලර් ටික ආවේ නැත්නම් මේ රට මීට කලින් බංකොලොත් වෙනවා.

2005 දී ගත් ඩොලර් ණය ආපසු ගෙවන්න, එක ඩොලරයක් උපයන ව්‍යාපෘතියක් රාජපක්ෂලා ආරම්භ කළේ නැහැ. ඒක තමයි මේ අර්බුදයේ මුල. ඒ නිසා, අපිට ඩීල් දමන ආණ්ඩුවලට එන්න බැහැ. ඔබතුමන්ලාට අපි road map එකක් දීලා තිබෙනවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කර, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැත්, පාර්ලිමේන්තුව තුළ system change එකක් සිදු කර, වගවීම සහ වගකීම හැම දේශපාලනඥයෙකු තුළම ඇති කරන එක වැදගත්. අපි IMF එකට ගිහිල්ලා ඒ ටික කරද්දී, මේ ටිකත් සමාන්තරව සිදු විය යුතුයි කියන එක මුදල් ඇමතිතුමාට මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Member?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමාට ලිපියක් භාර දෙන්න තරුණ පිරිසක් ඇවිත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු කථානායකතුමාගේ මාධ්‍ය ලේකම්තුමා ගේට්ටුව ළඟට ගිහිල්ලා එම ලිපිය භාරගෙන තිබෙනවා. ඊට පසුව පොලීසියෙන් එම තරුණ පිරිසෙන් දහ දෙනෙකු පමණ අත්අඩංගුවට අරගෙන මහරගම සහ වැලිකඩ කියන පොලීසිවලට ගෙනිහින් තිබෙනවා. මම මේ කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරනවා.

මම තලංගම පොලීසියටත් ගියා. නමුත්, ඒ අය තලංගම පොලීසියේ නැහැ. ගරු කථානායකතුමා දැනුවත් කිරීමෙන් පසු එතුමාගේ මාධ්‍ය ලේකම් ගිහිල්ලා ලියුම භාර ගත් පසුව ඒ තරුණයන්ව අත්අඩංගුවට ගත්තේ මොන පදනම මතද? ඒ ගොල්ලන් සම්බන්ධයෙන් යම් මැදිහත්වීමක් ගරු කථානායකතුමාගෙන් අපි බලාපොරොත්තු වෙනවා. මොකද, කථානායකතුමාගේ මාධ්‍ය ලේකම් ගිහිල්ලා ලියුම භාර භාර ගත්තාට පසුව තමයි ඔවුන් අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
I will refer that to the Hon. Speaker.

The next speaker is the Hon. (Prof.) Ranjith Bandara. You have 15 minutes.

[අ.භා. 1.23]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම ගරු සභාව තුළ මීට පෙර කථා කළ ගරු මැති-ඇමතිවරු අපේ රටේ ආර්ථිකයේ වර්තමාන තත්ත්වය පිළිබඳව විවිධ කෝණ ඔස්සේ කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම බොහෝ අය කියන්න උත්සාහ කළා, "අපි තමයි හොඳටම කළේ" කියලා. සමහර කථිකයෝ තමන්ගේ කථිකත්වය ප්‍රදර්ශනය කිරීමට තම කාලය පාවිච්චි කළා. නමුත් අවාසනාවකට, ප්‍රශ්නයට උත්තර හොයා දෙන්න සමත් වුණේ නැහැ.

පශ්චාත් මරණ පරීක්ෂණයකින් පුළුවන්කම ලැබෙන්නේ මරණයට හේතුව හොයා ගන්න පමණයි. ඒ කෙනාව ජීවත් කරවීම සඳහා අපි කළ යුතුව තිබුණේ මොන වාගේ දෙයක් ද කියන එක පිළිබඳව ඒ තුළින් කරුණු විමසා බලන්න අපිට පුළුවන්කමක් නැහැ. ඒ වාගේ, මේ ගරු සභාව තුළ ඒ කෙරුණු බොහොමයක් සාකච්ඡා අවාසනාවකට පශ්චාත් මරණ පරීක්ෂණවලට පමණක් සීමා වුණා.

ඉතිහාසය පරීක්ෂා කර බැලුවොත්, බලයේ සිටි හැම ආණ්ඩුවක්ම අද අපි මුහුණ දෙන මේ ආර්ථික, දේශපාලන හා සමාජ අර්බුදවලට අඩු වැඩි වශයෙන් වග කියන්න ඕනෑ බව අපට පෙනෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපිට නිදහස ලැබුණු අවධියේ අපි හිතුවා, අපේ ආර්ථිකය ශක්තිමත් කරගන්න පුළුවන්කම තිබෙන්නේ වැඩිපුරම අපේ යටත් විජිත ස්වාමියා සතුටු කරන ආකාරයේ ප්‍රතිපත්තියක් අනුගමනය කළොත් පමණයි කියලා.

අපි එහෙම කළා. අපි ඒකට කිව්වා, "නව යටත් විජිත ආර්ථික ප්‍රතිපත්තිය" කියලා. අපි එවැන්නක් අනුගමනය කළා. මට පෙර කථා කළ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාත්, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාත්, මමත් -අපි තුන්දෙනාම- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරීන්. කාල වකවානු තුනකයි අපි ඉගෙන ගත්තේ. නමුත් සමහර විට එකම ගුරුවරු අපි තුන්දෙනාටම උගන්වා ඇති.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වෙලාවේ අපි කිව්වා, "මේ නව යටත් විජිත ආර්ථික ප්‍රතිපත්තිය හොඳ නැහැ, අපි අලුත් ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනෑ" කියලා. 1956, 1965, 1970, 1977, 1989, 1994, 2005, 2015, 2019 වර්ෂවල සිදු වුණු ආණ්ඩු පෙරළිත් එක්ක අපි අඛණ්ඩව විවිධ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැඟුවා. නමුත් අවාසනාවකට අපිට පුළුවන්කම ලැබුණේ නැහැ, අපිට ගැළපෙන, අපිට අනාගතයක් තහවුරු කර ගන්න පුළුවන් ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නඟන්න. ඒ නිසා තමයි ගත්ත ණය ගෙවන්න අලුතෙන් ණය ගන්න සිද්ධ වුණේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඡන්දය ළං වෙනකොට ඡන්දය ඉලක්ක කරගෙන අත දිග හැර සහන සලසන්න බලයේ හිටපු අපේ බොහොමයක් ආණ්ඩු මැළි වුයේ නැහැ. සමහර වෙලාවට මූර්ත සහන, සමහර වෙලාවට මුල්‍ය සහන වාගේම, ආණ්ඩුවේ රක්ෂා දෙන්නත් මේ ව්‍යාපාර කටයුතු කළා.

අද තත්ත්වය අරගෙන බලන්න. අපේ රටේ සමෘද්ධි සහනාධාරලාභීන් මිලියන 1.8ක් ඉන්නවා. රටේ ජනගහනයෙන් සියයට 23ක් දුප්පත් කියන එකයි මේකෙන් කියන්නේ. හැබැයි අපි දන්නේ නැහැ, කාටද මේ සහනාධාර යන්නේ, ලැබිය යුත්තන් අතටද මේ සහනාධාර යන්නේ කියලා. ඒ නිසා අවසාන ප්‍රතිඵලය වුණේ, රජයේ ආදායමෙන් විශාල කොටසක් සහනාධාර පවත්වාගෙන යෑම සඳහා වියදම් කරන්න අපිට සිදු වීමයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මුදල් ඇමතිතුමා මේ කාරණය ගැන විශේෂයෙන් සඳහන් කළා. ගරු විපක්ෂ නායකතුමා ඒ පිළිබඳව වැරදි වැටහීම් ඇති කර ගත්තා. නමුත් මුදල් ඇමතිතුමාට ධෛර්යයක් තිබුණා, ඒ පිළිබඳව මේ සභාව දැනුවත් කරන්න. එතැනින් නතර වෙන්නේ නැතුව භාෂා තුනෙන්ම මුද්‍රණය කරපු ලිඛිත සටහනකුත් මේ සභාවේ සියලු සාමාජිකයන්ට සපයන්න එතුමා කටයුතු කර තිබෙනවා. ඒ සටහනෙහි එක තැනක සඳහන් වෙනවා, රජයේ ආදායම වාගේ 2.4ක ගුණයක් රජයේ වියදම විධියට ආණ්ඩුව වසරකට වැය කරන බව. රජයේ වියදම පියවා ගන්න ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන අවස්ථාවක ඒ වාගේ 2.4 ගුණයක වියදමක් දැරීමට සිදුවීම මේ ප්‍රශ්නවලට එක හේතුවක් කියන එක අපි අවබෝධ කරගත යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපිට මූලික ප්‍රශ්න තුනකට උත්තර හොයන්න තිබෙනවා. ඉන් පළමු ප්‍රශ්නය තමයි වර්තමානයේ රජයේ ආදායම අපි වැඩිකර ගන්නේ කොහොමද කියන එක. දෙවැනි එක තමයි රජයේ වියදම ප්‍රශස්ත අයුරින් සිදු කරන්නේ කොහොමද කියන එක. තුන්වැනි එක තමයි, රජයේ ආදායම වැඩි කර ගැනීම සඳහා ආදායම් උත්පාදන මාර්ග ධෛර්යවත් කරන්නේ කොහොමද කියන එක. බදු පදනම පුළුල් කරන්නේ නැතුව අපට බදු අය කරන්න පුළුවන්කමක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහජන නියෝජිතයන් විධියට අපිට මේ කරුණු පිළිබඳ වාද විවාද කරන්න මේ සභාව තුළ ඕනෑ තරම් අවස්ථාව තිබෙනවා. හැබැයි, එළියේ ඉන්න පිරිස මේ දිහා බලාගෙන ඉන්නවා. ඒ නිසා අපි සියල්ලෝම දැන් කටයුතු කරන්නේ වීදුරු කුඩුවල ඉඳගෙනයි. අපි කරන කියන දේවල් හැමෝටම පෙනෙනවා.

ගරු මුදල් ඇමතිතුමා, තමන් IMF එකට ගිහිල්ලා කරපු කටයුත්ත පිළිබඳව දැනුවත් කරන්න මේ සභාව ආමන්ත්‍රණය කරන කොට සමහර මන්ත්‍රීතුමන්ලාගේ හැසිරීම අපි දැක්කා. මේ හුදු ජනප්‍රියතාව ඇති කර ගන්න නොවෙයි මේ අවස්ථාවේ අපි කටයුතු කළ යුත්තේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තම ගොඩ වැඩි කර ගන්න කටයුතු කරනවා වෙනුවට, අපේ රට අංක එකේ තියලා කටයුතු කරන ක්‍රමවේදයක් හොයා ගන්න අපට පුළුවන් නම්, ඒක වැදගත්. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් වෙන්නට පුළුවන්. එහෙම නැත්නම් නීතිඥ සංගමය කියපු ආකාරයට, අපි ඔක්කෝම එකතු වුණු එකඟතා රජයක් වෙන්නටත් පුළුවන්. එය මේ ඕනෑම ස්වරූපයක් ගත හැකියි. හැබැයි, අපට පුළුවන්කම තිබෙන්නට ඕනෑ අපේ රට අංක එකේ තියලා කටයුතු කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි රට අංක එකේ තියලා කටයුතු කරන්නේ කොහොමද? එහෙම නම් රටේ ප්‍රශ්න පිළිබඳව අපි මීට වඩා සංවේදී වෙන්න ඕනෑ. ඒ සඳහා වන යෝජනා අපි ඉදිරිපත් කරන්න ඕනෑ. විශේෂයෙන් මා මුලින් සඳහන් කළ ආකාරයට දැනට රජයට ලැබෙන ආදායම වැඩි කර ගන්නේ කොහොමද, ඒ සඳහා උචිත බදු ප්‍රතිපත්තිය මොකක්ද, රජයේ වියදම අප ප්‍රශස්ත ආකාරයට වියදම් කරන්නේ කොහොමද, අප තවදුරටත් පාඩු ලබන රාජ්‍ය ආයතන නඩත්තු කරනවාද, අප තවදුරටත් universal welfare system එක පවත්වාගෙන යනවාද කියලා හිතන්න ඕනෑ. තුන්වැනි කාරණය තමයි, මා මුලින් සඳහන් කළ ආකාරයට අලුත් ආදායම් උත්පාදන මාර්ගවලට අපි ආයෝජකයන් ධෛර්යවත් කරන්නේ කොහොමද කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අවස්ථා ගණනාවකදී මේ රටේ බදු ප්‍රතිපත්තිය වෙනස් කළා; ඒ සඳහා වන විශේෂ කොමිෂන් සභා පත් කළා; වාර්තා ඉදිරිපත් කළා. හැබැයි, පිරුවටය හැම දාම එකම විධියට හෝදලා, එකම විධියට නවලා අපේ අල්මාරියේ තියා ගන්නවා වාගේ අපි ඒ වාර්තා තියාගෙන හිටියා. ඒ නිසා තමයි දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් හැටියට රජයේ බදු ආදායම අවම වශයෙන් සියයට 14ක සීමාවටවත් වැඩි කරගන්න ඕනෑකම තිබුණත් අපට ඒක කරගන්න බැරි වුණේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට, අපේ ව්‍යාපාරිකයන්ට, සාමාන්‍ය මහ ජනතාවට දැන ගන්න අවශ්‍යයි කල් පවත්නා බදු ප්‍රතිපත්තියක් ගැන. විශේෂයෙන් දේශීය සහ විදේශීය ආයෝජකයන්ට දැන ගන්නට අවශ්‍යයි, අපේ රටේ බදු ප්‍රතිපත්තිය මොකක්ද කියලා. මුදල් පිළිබඳව කටයුතු කිරීමේ බලය තිබෙන ව්‍යවස්ථාදායකය තුළ අපි දිගින් දිගටම මේ කාරණය පිළිබඳව සාකච්ඡා කළ යුතුයි. කවර රජයක් බලයට පත් වුණත් අපට වගකීමක් තිබෙනවා, ඒ පිළිබඳව කටයුතු කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයේ වියදම පිළිබඳව විවිධ මැසිවිලි නැඟෙනවා. අපි දන්නවා, රජයේ වියදම රජයේ ආදායම මඟින් පියවා ගන්නට පුළුවන්කම ලැබුණේ නිදහසින් පසු අවස්ථාවකදී, දෙකකදී පමණක් බව. බොහෝ අවස්ථාවල ප්‍රාග්ධන වියදම් පියවා ගැනීම සඳහා වන කිසිදු ආදායමක් රජයේ ආදායමෙන් පියවා ගන්න අපට ලැබුණේ නැහැ. ඒ නිසා අපි මූලික කාරණා තුනක් පිළිබඳව මෙහිදී සලකා බලන්න ඕනෑ. පළමුවැනි කාරණාව මේකයි. රජයේ වියදම් කළමනාකරණය කිරීම සඳහා වන, අප හැමෝටම පිළිගන්න පුළුවන් ජාතික ප්‍රතිපත්තියක් වෙත අපි යා යුතු වෙනවා. රජයේ සුබසාධන වියදම් නිවැරැදි දිශාවට ගමන් කරනවාද කියන එක පිළිබඳව අපි නැවත සොයා බැලිය යුතු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප බොහෝ වෙලාවට කටයුතු කරන්නේ *ad hoc* ආකාරයට; අපට හිතෙන හිතෙන විධියට. ලක්ෂ හයකට සමෘද්ධිය දෙනවා කියලා අප මේ පාර හිතුවොත්, අපි ඒක දෙනවා.

නමුත් ඊට වඩා ක්‍රමවත්, විද්‍යානුකූල වැඩ පිළිවෙළක් අපි අනුගමනය කරන්න ඕනෑ. අපි දන්නවා, අපට රාජ්‍ය ව්‍යවසාය ඉතා විශාල සංඛ්‍යාවක් තිබෙනවා කියලා. ඒවායින් බොහොමයක් එක්කෝ එකට එකතු කරන්න අපට පුළුවන්; එහෙම නැත්නම් වෙනයම් කළමනාකරණ ක්‍රමවේදයකට අනුව ඒවා ලාභ ලබන ඒවා බවට පත් කරන්න පුළුවන්. ඒ නිසා රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය පිළිබඳත් අපි අලුතින් සිතා බැලිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපිත් නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවාව, රජය වෙතින් ලැබුණු විවිධ සහනාධාර නිසා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා ඉගෙන ගෙන සමාජයේ යම්කිසි ස්ථානයකට එන්න පුළුවන්කම ලබා ගත් අය. ඒ නිසා රජයෙන් සහන ලැබිය යුතු අයට සහන ලබා දීම පිළිබඳව අපේ කිසිම විරෝධතාවක් නැහැ. නමුත් "සැමට සහන" කියන එක වෙනුවට සහන සැලසිය යුතු පිරිසටම සහන ලබා දීමේ ක්‍රමවේදයක් අපි අනුගමනය කළ යුතු වෙනවා. කවර රජයක් බලයට පත් වෙලා සිටියත් රජයේ සුබසාධන වැඩ පිළිවෙළ පිළිබඳව මීට වඩා විවෘත, පැහැදිලි සංවාදයකට අපි එළඹිය යුතුයි. දේශපාලනඥයන් යම් යම් කාරණා පිළිබඳව තීරණය කරනවා වාගේම, එම තීන්දු තීරණ සාධාරණීකරණය කිරීම සඳහා ඊට වඩා වැදගත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමත් කළ යුතු වෙනවා. ඒ නිසා නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවාව සහ වෙනත් මහජන සේවාවන් අපි දිගටම පවත්වාගෙන යා යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේක අවස්ථාවක් කර ගනිමු, මේ දවස් දෙක තුළ මේ කාරණා පිළිබඳව දිගින් දිගටම මේ ගරු සභාව තුළ සාකච්ඡා කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ වැදගත් කාරණාවක් ඔබතුමාට ඉදිරිපත් කරන්නට මම අදහස් කරනවා. විශේෂයෙන්ම මේ රටේ නිදහස, ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දැවැන්ත ජනතා උද්ඝෝෂණයක, ජනතා අරගළයක නියැළී සිටින තරුණ තරුණියන් දහතුන් දෙනෙක් ඇවිල්ලා තිබෙනවා, ගරු කථානායකතුමාට ලිපියක් භාර දෙන්න. බුවනෙක එස්. පෙරේරා, නිරාශා විදානගේ, විහිඳුක පෝද්දුවගේ, මෙලනි, චරිත් ෆර්ඩිනැන්ස් ඇතුළු දහතුන් දෙනෙක් ආවා, ඒ සඳහා. ඔවුන් ආවේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න අදාළ යෝජනා ගණනාවක් පිළිබඳව සඳහන් කරපු එම ලිපිය භාර දෙන්නයි. ඒ ලිපිය භාර දීලා පිටව යන අතරතුර මහරගම පොලීසිය ඒ අයව අත් අඩංගුවට අරගෙන තිබෙනවා. අපි හැමෝම අවබෝධ කර ගන්න ඕනෑ, මේක ඒකාධිපති රටක් නොව ප්‍රජාතන්ත්‍රවාදී රටක් බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ තරුණ තරුණියන් ගරු කථානායකතුමාට ලිපියක් භාර දීලා යනකොට ඒ අයට නිදහස අහිමි වනවාද, ඒ අය මේ විධියට අත් අඩංගුවට ගන්න පුළුවන්ද? මේක ඉතාම වැරැදි ක්‍රියාවක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා වහාම ඒ අයව නිදහස් කරන්න කියලා අදාළ පොලිස් ස්ථානයට උපදෙස් දෙන්න කියලා.

මේ වෙනකොට අපට අහන්නට ලැබෙනවා ජනතාව පාර්ලිමේන්තුවේ පිවිසුම් දොරටු අසළට ඇවිල්ලා තමන්ගේ අදහස් ඉදිරිපත් කරනවා කියලා. ඒ අයට සාමකාමීව, නිදහස්ව, නිවහල්ව සිතීමේ, භාෂණයේ අයිතිය තිබෙනවා. ඒක මේ රටේ ජනතාවට තිබෙන මූලික අයිතිවාසිකමක්. Fundamental right එකක්. එම නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමාට ලිපිය ඉදිරිපත් කරපු ඒ කණ්ඩායම නිදහස් කරන්න කියලා මහරගම පොලීසියට උපදෙස් දෙන ලෙස. ගරු කථානායකතුමා මූලාසනයේ නැති නිසා ඔබතුමා අපේ මේ මහ ලේකම්තුමා හරහා මහරගම පොලීසියට ඒ උපදෙස ලබා දෙන්න. මොකද, එහෙම නැත්නම් ලොකු කැලඹීමක් ඇති වෙනවා; ලොකු විනාශයක් ඇති වෙනවා. මිනිසුන්ට කථා කිරීමේ, අදහස් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම නැති වුණොත් ඒ අය වෙන වෙන තීන්දු ගනීවි. ඒ නිසායි මම ඒ ඉල්ලීම ඔබතුමාගෙන් කළේ. මට මේ කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා (සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த - சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) Gayashan Nawananda - State Minister of Health)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. State Minister?

**ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த)
(The Hon. (Dr.) Gayashan Nawananda)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කරපු ප්‍රකාශයක් ගැනයි මම කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතුමා සඳහන් කළා, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, that is not a point of Order.

**ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த)
(The Hon. (Dr.) Gayashan Nawananda)
Sir, during his speech -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Did he mention your name? What is the point of Order?

**ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த)
(The Hon. (Dr.) Gayashan Nawananda)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා "1990 සුවසැරිය" ගිලන් රථ සේවාව ගැන යම් ප්‍රකාශයක් කළා. එහි යම්කිසි වැරැදි අදහසක් තිබෙනවා වාගේම, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, what is the point of Order?

**ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த)
(The Hon. (Dr.) Gayashan Nawananda)
Sir, there was a false -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, that is not a point of Order.

**ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த)
(The Hon. (Dr.) Gayashan Nawananda)
Okay.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Govindan Karunakaram. You have ten minutes.

[பி.ப. 1.41]

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, என்னவோ தெரியவில்லை; நான் பேசும்போதெல்லாம் நீங்கள்தான் அக்கிராசனத்தில் இருக்கின்றீர்கள். இன்று இலங்கை அரசியலில் சர்வதேச நாணய நிதியம் சம்பந்தமாக அதிகம் பேசப்படுகின்றது. ஒரு நாட்டின் அத்திவாரம் அந்த நாட்டின் பொருளாதார ஸ்திரத்தன்மையிலேயே தங்கியுள்ளது. அந்தவகையில், ஒரு நாட்டின் பொருளாதாரத்தில் ஸ்திரத்தன்மை இல்லையேல் அந்த நாடு வங்குரோத்து நாடாகும். கடன்பெறும் நாடானது அந்தக் கடனை அடைக்கும் செயற்றிறன் கொண்டதாக இருக்க வேண்டும். ஆனால், கடன் பெற்ற ஒரு நாடு அந்தக் கடனை அடைக்க முடியாது என்று கைவிரிப்பது அந்த நாட்டுக்கு அவமானமாகும். இந்து சமுத்திரத்தின் மத்தியில் அமைந்துள்ள பெருமைமிகு நாடு எமது நாடாகும். இன்று அது கடனில் சிக்கிச் சீரழிந்து சின்னாபின்னமாகியுள்ளது. இன்று இந்த நாட்டில் அரசாங்கம் ஒன்று உள்ளதா? அரசாங்கத்துக்கென பொருளாதாரக் கொள்கையொன்று உள்ளதா? நாட்டில் பொருட்கள், சேவைகளின் விலை மட்டத்தை நிர்ணயிப்பது அரசாங்கமா? அல்லது வர்த்தக சமூகத்தினரா? அல்லது இடைத்தரகர்களா? அல்லது அமைச்சர்களின் commission deals நடத்தும் இடைத்தரகர்களா? எனக் கேட்க விரும்புகின்றேன். "மழைபெய்தால் மின்சாரம்; மழை நின்றால் மின்சாரம் இல்லை; அப்படியென்றால் நாட்டில் அரசாங்கம் எதற்கு?" என்று எமது சட்டப் பேராசிரியர் ஜீ.எல். பீரிஸ் அவர்கள் அன்று கூறியது தற்பொழுது எனக்கு ஞாபகம் வருகின்றது.

இந்த நாட்டில் அரசியல் ஒழுக்கத்தைச் சீரழித்த விமல் வீரவங்ஸ, உதய கம்மன்பில, வாசுதேவ நாணாயக்கார ஆகியோர் அன்று 20 ரூபாயைவிடக் குறைவான ஒரு தொகையால் பெற்றோலின் விலை உயர்த்தப்பட்டபோது, அதற்கு எதிராகக் குரல் எழுப்பினார்கள். எம் தமிழர் உரிமைகளுக்காகத் தனிநாடு கோரி, ஆயுதம் ஏந்திப் போராடிய நான், அந்த அனுபவம் தந்த பட்டறிவும் பகுத்தறிவும் கண்டு, இன்று ஒருமித்த நாட்டில் பிளவுபடாது ஒன்றாக வாழ இணைந்துள்ளேன். ஆனால், கோட்டாபய ராஜபக்ஷ, மஹிந்த ராஜபக்ஷ தரப்பினர் நாட்டைச் சீரழித்ததாகக் கூறுகின்றார்கள். இதை நான் கூறவில்லை. பெரும்பான்மை மக்களின் பெரும்பான்மையால் வென்றேனென்று பெருமிதம்கொண்டு பௌத்த மதஸ்தலமான ருவன்வெளிசாயவில் பதவியேற்ற கோட்டாபய ராஜபக்ஷவை மல்வத்து, அஸ்கிரிய மற்றும் ராமான்ய பீடங்களின் மகாசங்கத்தினரே வெளியேறுமாறு கோருகிறார்கள். ஆனால், நம் தமிழர் தரப்புக்கு இப்படியான உக்கிரமும் வக்கிரமும் உங்கள்மீது இருந்தாலும், அதனைச் சொல்ல முடியாதுள்ளனர்.

இன்று சிங்கள இளைஞர்கள் "Gota, go home!" எனக் கோஷமிடுகின்றார்கள். இவ்வாறு தமிழ் இளைஞர்கள் கோஷமிட்டால், அவர்களைப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்து, சிறையிலே அடைத்திருப்பீர்கள். இதனால், அவர்கள் தம் வாழ்க்கையின் பல வருடங்களைத் தொலைக்கவேண்டி ஏற்பட்டிருக்கும். காலம் கடக்கவில்லை. "GotaGoGama" என்பது எமது நாட்டின் வரலாற்றுத் தவறுகளைப் புரிந்துகொள்வதற்கான ஓர் அத்திவாரமாகும். அந்த அத்திவாரத்திலிருந்து புதியதோர் இலங்கைத் திருநாட்டைக் கட்டியெழுப்புவோம். இந்தக் கோஷத்துக்கு ஆதரவு தெரிவித்து அனுசரணை வழங்குபவர்களே, இதே கோஷத்தை இதே மொழியில் இதே இடத்தில் எம் தமிழ் இளைஞர்கள் எழுப்பினால் அல்லது உங்களை அடக்க வரும் அரச கூலிப்படையை நீங்கள் எதிர்த்து விரட்டுவதுபோல் எம் தமிழ் இளைஞர்கள் விரட்டினால் என்ன நடக்கும் என்பதைச் சற்றுச் சிந்தித்துப் பாருங்கள்! சர்வதேச நாணய நிதியமோ, உலக வங்கியோ, நீங்கள் commissionக்காக நாட்டின் வளங்களை விற்ற சீனாவோ எமது நாட்டை உய்வடைய வைக்கும் என நம்புவது உங்கள் முட்டாள்தனம்.

பணம் அச்சடித்தால் பணவீக்கம் ஏற்படும் என்பது பொருளாதார அரிச்சுவடி! அது புரியாத, சென்மதி நிலுவைப் பிரச்சினை மற்றும் வர்த்தக இடைவெளி வரும்போது அதனைத் தீர்க்கத் தெரியாத, சர்வதேச வர்த்தகக் கொள்கை தெரியாத ஒருவரை மத்திய வங்கி ஆளுநராகவும் சகோதர பாசத்தில் பொருளாதார அறிவு சற்றும் இல்லாதவரை நிதி அமைச்சராகவும் நியமித்தது ராஜபக்ஷ தரப்பு. எமது நாடான இலங்கை ராஜபக்ஷக்களின் குத்தகைப் பூமியா? இன்று நீங்கள் ருவன்வெளிசாயவுக்கும் செல்ல முடியாது; நீங்கள் நம்பிக்கைவைத்துள்ள எந்தவொரு பௌத்த மதஸ்தலத்துக்கும் செல்ல முடியாது. தானமும் சங்கமும் உங்களைப் பார்த்துச் சந்தி சிரிக்கின்றது. உங்களை IMFஉம் காப்பாற்ற முடியாது; நீங்கள் நம்பிய பௌத்தமும் காப்பாற்ற முடியாது; நீங்கள் ஓடி ஒழியவும் முடியாது. நீங்கள் விதைத்த விதையை நீங்களேதான் அறுவடை செய்யவேண்டும். அது பயிரா அல்லது பதரா? என்று நீங்கள் உங்களுடைய மனச்சாட்சியைச் கேளுங்கள்!

இன்று காலையில் எங்களுடைய நிதி அமைச்சர் அவர்கள் விசேட கூற்றொன்றை முன்வைத்து உரையாற்றும்போது சில விடயங்களை வெளிப்படுத்தியிருந்தார். தற்போது நாட்டில் ஏற்பட்டிருக்கின்ற பொருளாதார நெருக்கடிக்கு தற்போதைய அரசாங்கம் மாத்திரமல்லாது, நீண்ட காலமாக இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்களும் காரணம் என்றார். மேலும், எவர் ஆட்சிக்கு வந்தாலும் இதனை வெகுவிரைவில் நிவர்த்தி செய்ய முடியாதென்றும் கூறினார். இந்த நாடு முதன்முதலில் 1954இலே வெளிநாட்டுக் கடனைப் பெற்ற தென்றும் கூறினார். நாங்களும் இவற்றை ஏற்றுக் கொள்கின்றோம். ஆனால், பார்வைதான் வேறுவிதமாக இருக்கின்றது. சுதந்திரம் அடைந்ததிலிருந்து இந்த நாட்டை மாறி மாறி ஆண்ட ஆட்சியாளர்கள் என்ன செய்தார்கள் என்பதைப் போராடும் இளைஞர்களும் அரசியல்வாதிகளும் புரிந்துகொள்ள வேண்டும். இந்த நாடு சுதந்திரமடைந்த காலத்திலிருந்து இந்த நாட்டின் பூர்வீகக் குடிகளான தமிழர்கள் இரண்டாம் தரப் பிரஜைகளாகக் கணிக்கப்பட்டார்கள். நாடு சுதந்திரமடைந்து சில மாதங்களிலே மலையகத் தமிழர்களின் குடியுரிமை பறிக்கப்பட்டது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam to the Chair?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍ය සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of Foreign Affairs and State Minister of Defence)

Sir, I propose that the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

[ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා]

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please continue with your speech.

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)

நன்றி, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மாவட்டத்தைச் சேர்ந்த, என்னுடைய சக பாராளுமன்ற உறுப்பினரான நீங்கள் தலைமைதாங்குவது எனக்குச் சந்தோஷமாக இருக்கின்றது.

இந்த நாட்டை மாறி மாறி ஆண்ட அரசாங்கங்கள் போருக்காக எத்தனையோ பில்லியன் டொலர்களைச் செலவழித்துள்ளன. 1956ஆம் ஆண்டு எஸ்.டபிள்யு.ஆர்.டி. பண்டாரநாயக்க அவர்கள் ஆட்சிக்கு வந்ததும் தனிச் சிங்கள சட்டமூலத்தை இந்தப் பாராளுமன்றத்திலே நிறைவேற்றினார். அன்று அதை எதிர்த்துஎமது தலைவர்கள் இதே காலிமுகத்திடலில் மொழி உரிமைக்காக உண்ணாவிரதம் இருந்தார்கள்; சத்தியாக்கிரகம் செய்தார்கள். அதன்போது, இந்த நாட்டின் அரச படைகளையும் காடையர்களையும் ஏவிவிட்டு அவர்களது தலைகளைத் தாக்கியது மாத்திர மல்லாமல், காதுகளைக் கடித்த வரலாறும் உண்டு. அன்று எமது தலைவர்கள் இரத்தக் காயங்களுடன் பாராளு மன்றத்துக்கு வந்தபோது நீங்கள் என்ன செய்தீர்கள்? எள்ளி நகையாடினீர்கள். 1960ஆம் ஆண்டு ஆட்சி மாற்றம் ஏற்பட்டு, டட்லி சேனாநாயக்க அவர்கள் தலைமையில் அரசாங்கம் உருவாகியது. அப்போது, எமது தமிழ்த் தலைவர்கள் உங்களுக்கு ஒத்துழைப்பு வழங்கினார்கள். அதன் விளைவாக டட்லி - செல்வா ஒப்பந்தம் ஏற்படுத்தப்பட்டது; தமிழர்கள் அமைச்சரவையில் அங்கம் வகித்தார்கள்; தமிழர் ஒருவர் பிரதிச் சபாநாயகராக அங்கம் வகித்தார். ஆனால், நீங்கள் அவர்களை ஏமாற்றினீர்கள். திருகோணமலையிலுள்ள கோணேஸ்வரத்தை ஒரு புனித பூமியாகப் பிரகடனப்படுத்த உங்களால் முடியவில்லை. அவர்கள் அரசாங்கத்திலிருந்து வெளியேறி னார்கள். 1970ஆம் ஆண்டு ஆட்சியமைத்த சிறிமாவோ பண்டாரநாயக்க அவர்கள் புதியதோர் அரசியலமைப்பைக் கொண்டுவந்தார். அதுமாத்திரமன்றி, குடியுரிமைச் சட்ட மூலத்தை மீண்டும் கொண்டுவந்தார்.

1972ஆம் ஆண்டு தரப்படுத்தலைக் கொண்டுவந்து வடக்கு, கிழக்குத் தமிழ் இளைஞர்கள் பல்கலைக்கழகம் செல்வதைத் தடுத்தீர்கள். இதன் காரணமாகவே தமிழ் இளைஞர்கள் போராட்டத்திற்கான ஆயத்தங்களைச் செய்தார்கள். 1977ஆம் ஆண்டு ஜே.ஆர். ஜயவர்தன அவர்கள் 5/6 பெரும்பான்மை யுடன் பாராளுமன்றத்துக்கு வந்தார். "போர் என்றால் போர், சமாதானம் என்றால் சமாதானம்" என்றார்; "அரசியல் தீர்வு இல்லை; தமிழர்களுடைய உரிமையைத் தரமாட்டேன்" என்றார். 1979ஆம் ஆண்டு பயங்கரவாதத் தடைச் சட்டத்தைக் கொண்டுவந்தீர்கள்.

இந்த நாட்டிலே 1958, 1978, 1983ஆம் ஆண்டுகளிலே இனக் கலவரங்கள் இடம்பெற்றன. நீங்கள் இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்தது மாத்திரமல்லாமல், 1983இலே 3,000இற்கும் மேற்பட்ட தமிழர்களைக் கொன்றுகுவித்தீர்கள். தமிழ் மக்கள் தென்னிலங்கையிலிருந்து வடக்கு, கிழக்கிற்குத் தரை மார்க்கமாகச் செல்லமுடியாத நிலையில், கடல் மார்க்கமாகச் சென்றார்கள். வெலிக்கடைச் சிறையிலே அரசியற் கைதிகளாக இருந்த 53 பேரைக் கொடூரமாகக் கொலை செய்தீர்கள். இவ்வாறான சம்பவங்களினால்தான் இந்த நாட்டில் போராட்டம் உக்கிரமடைந்தது. அதனைத் தொடர்ந்து ஆட்சிக்கு வந்த ஆர். பிரேமதாச, சந்திரிக்கா பண்டாரநாயக்க குமாரதுங்க, மஹிந்த ராஜபக்ஷ அதே போன்று இன்று சனாதிபதியாக இருக்கின்ற கோட்டாபய ராஜபக்ஷ ஆகியோரின் அரசாங்கங்கள் இந்த நாட்டின் வளங்களை விற்று அவற்றை போருக்காகச் செலவழித்தன. போர்க் கருவிகள், ஹெலிகாப்டர்கள், யுத்தக் கப்பல்கள் போன்றவற்றை வாங்குவதற்குப் பல பில்லியன் கணக்கான டொலர்களை நீங்கள் செலவழித்தீர்கள்.

இந்த நாட்டில் ஆயுதப் போராட்டம் மௌனிக்கப் பட்டதற்குப் பின்பு இங்கு நிறைவேற்றப்படும் வரவு செலவுத்திட்டங்களில்கூட, நீங்கள் பாதுகாப்புத்துறைக்கு 20 சதவீத நிதி ஒதுக்கீட்டைச் செய்துகொண்டிருக்கிறீர்கள். 2019இலே கோட்டாபய ராஜபக்ஷ ஆட்சி பீடம் ஏறிய பின்னர், 'வற்' வரியை 8 சதவீதமாகக் குறைத்தார். அன்றிலிருந்து இந்த நாட்டினுடைய பொருளாதாரம் சீரழிய ஆரம்பித்தது. அவர் எப்பொழுது விவசாயிகளின் வயிற்றிலே கைவைத்தாரோ, அப்பொழுதே அவரது ஆட்சி முடிவுக்கு வரத் தொடங்கியது. இரசாயனப் பசளைப் பாவனையைத் தடை செய்தார். அதனால், விவசாயிகள் வீதிக்கு வந்தார்கள். இந்த நாட்டிலே நெல் வேளாண்மையில் மாத்திரமல்ல, சகல பயிர்ச் செய்கைகளின் விளைச்சலும் 50 சதவீதத்தைவிடக் குறை வடைந்தது. நீங்கள் அரிசியை வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யும் அளவிற்கு தள்ளப்பட்டீர்கள். வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யும் அரிசியில் இரசாயனம் கலக்கவில்லை என்பதற்கு என்ன உத்தரவாதம் இருக்கின்றது? நீங்கள் இந்த நாட்டிலே நடைபெற்ற போருக்கு அதிக பணத்தைச் செலவழித்தீர்கள். மீண்டும் மீண்டும் நான் கூறுவது என்னவென்றால், இந்த நாட்டின் இனப்பிரச்சினைக்கு - தமிழர்களின் உரிமைப் போராட்டத்திற்கு ஒரு நிரந்தர அரசியற் தீர்வை நீங்கள் கொடுக்கவில்லை என்றால், தொடர்ச்சியாக இந்த நாட்டின் பாதுகாப்புத்துறைக்குக் கூடுதலான பணத்தைச் செலவழிக்கவேண்டிய நிலை ஏற்படும் என்பதைத்தான்.

இந்திய - இலங்கை ஒப்பந்தத்தினூடாக அரசியலமைப்புக் கான 13ஆவது திருத்தம் கொண்டுவரப்பட்டு, அதனூடாக மாகாண சபை முறைமை உருவாக்கப்பட்டது. ஆனால், இந்த நாட்டில் நீண்ட காலமாக மாகாண சபைகள் வலுவில் இல்லாத ஒரு நிலையே காணப்படுகின்றது. இந்த நாட்டிலே தமிழர்கள் நிம்மதியாக வாழ்வதற்கு ஏற்றவகையில் மாகாண சபைத் தேர்தலை நடாத்தி, அவற்றுக்கான அதிகாரங்களை வழங்குமாறுதான் அயல் நாடான இந்தியாகூட கேட்கின்றது. கடந்த காலங்களில் இந்தியாவை ஒதுக்கிவிட்டு, சீனாவிற்குப் பின்னால் சென்ற நீங்கள் எதைக் கண்டீர்கள்? இந்தியாதான் இன்றைக்கு இந்த நாட்டை காப்பாற்றுகின்றது. இந்தியாதான் இந்த நாட்டு மக்களைப் பட்டினிச் சாவிலிருந்து காப்பாற்றுகின்றது. பில்லியன் கணக்கான டொலர்களைத் தருகின்றது; எரிவாயுவைத் தருகின்றது; எரிபொருளைத் தருகின்றது. சர்வதேச நாணய நிதியத்திடம் உங்களுக்காகச் சிபாரிசு செய்வதும் இந்தியாதான். அதற்கும் மேலாக, இன்று தமிழ் நாட்டு மாநில அரசு ஏகமனதாகத் தீர்மானமொன்றை

நிறைவேற்றி, 40,000 மெற்றிக்தொன் அரிசி, 500 மெற்றிக் தொன் பால்மா, 28 கோடி இந்திய ரூபாய் பெறுமதியுள்ள மருந்து வகைகளை எமது நாட்டுக்குத் தர இருக்கின்றது. இப்படி தமிழ் நாட்டு அரசு இலங்கையிலுள்ள ஒட்டுமொத்த மக்களுக்கும் உதவிசெய்யும்போது, நீங்கள் இங்குள்ள தமிழர்களை வெறுக்கின்றீர்கள். இறுதியாக, எமது நாட்டு மக்களுக்கு உதவிசெய்த தமிழ் நாட்டு மாநில அரசுக்கும் முதலமைச்சர் மு.க. ஸ்டாலின் அவர்களுக்கும் இந்தச் சபையினூடாக நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව අද පක්ෂ නායක රැස්වීමේදීත් සාකච්ඡා වුණා. ඒ අවස්ථාවේදී පාර්ලිමේන්තුව පොලිස්පතිතුමාගෙන් ඉල්ලීමක් කර තිබුණා, මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට එන විට හා එළියට යන විට එතුමන්ලාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඒ අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කියලා. මේ වෙලාවේදී විපක්ෂ නායකතුමාත්, මන්ත්‍රීවරු කීප දෙනෙකුත් යම් ප්‍රකාශයක් කළා අත්අඩංගුවට ගැනීමක් සම්බන්ධයෙන්. මේ වෙලාවේ 'සිරස' නාළිකාවේ ඒ සම්බන්ධ විස්තර ප්‍රචාරය වනවා. මා ළඟ තිබෙන දුරකථනයෙන් මට එම විස්තර පෙන්විය හැකියි. යම්කිසි කණ්ඩායමක් ඇවිල්ලා පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරුන්ට "හූ" කියලා යම් බලපෑමක් කරන්න කටයුතු කර තිබෙනවා. 'සිරස' මාධ්‍යයේ පැහැදිලිව කියනවා, මේ කණ්ඩායම protest එකට ආ කණ්ඩායමක් කියලා. ඒ අය එතැන ඉඳගෙන මන්ත්‍රීවරුන්ට "හූ" කියලා හිරිහැර කරපු නිසා පොලීසිය ඔවුන් අත්අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරන්න කටයුතු කරනවා. 'සිරස' නාළිකාවේ විකාශය වන දර්ශනවලින් පැහැදිලිව එය පෙනෙනවා. මම හිතන විධියට විපක්ෂ නායකතුමා මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. මොකද, මේ වාගේ දේවල් දිගින් දිගටම සිද්ධ වුණොත් අපට මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න බැරි වෙනවා. මන්ත්‍රීවරුන් කරදරයකින් තොරව මේ සභාවට ඇවිල්ලා තමන්ගේ දායකත්වය දෙන්න අවශ්‍ය වෙලාවේ යම්කිසි කණ්ඩායම් ඇවිල්ලා මේ විධියට හැසිරුණොත් අපට පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න බැරි වෙනවා. ගරු කථානායකතුමාගේ ඉල්ලීම අනුව තමයි මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ආරක්ෂාව සපයන්නේ. පොලීසියේ වාර්තා අනුව, ඒ අය අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ විස්තර මම දැන් ඉදිරිපත් කළේ පොලීසිය ලබා දුන් තොරතුරුත්, 'සිරස' මාධ්‍ය තුළින් ලබා ගත් තොරතුරුත් පදනම් කර ගෙනයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පැහැදිලියි, ගරු ඇමතිතුමනි. බොහොම ස්තුතියි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කණ්ඩායම උද්ඝෝෂණයකට ආපු කණ්ඩායමක් නොවෙයි, කථානායකතුමාට ලිඛිතව පැමිණිල්ලක් භාර දෙන්න ආ කණ්ඩායමක්. ඔවුන් මන්ත්‍රීවරුන්ට "හූ" කිව්වෙත් නැහැ, ඒ අවස්ථාවේදී එතැන මන්ත්‍රීවරු හිටියෙත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රංජිත් සියඹලාපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.55]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රථමයෙන් මෙම කරුණ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මට නියමිත ආසනයේ නොවෙයි, මම මේ වෙලාවේ ඉන්නේ. මොකද, මම දැන් නියෝජ්‍ය කථානායකතුමාත් නොවෙයි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකුත් නොවෙයි. එම නිසා මට හෙට දවසේ මගේ නිශ්චිත ආසනය වෙන් කර දෙන්න කියා මුලින්ම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මම ඒ ගැන ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

හොඳයි.

මම විශේෂ කරුණු කිහිපයක් පෙන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා, අද මේ රටේ ආර්ථික තත්ත්වය පිළිබඳ කථා කරන මේ මොහොතේ. *[බාධා කිරීමක්]*

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගොඩක් වෙලාවක ඉඳලා බලාගෙන ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට ඔබතුමාට අවස්ථාව දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා. සමාවෙන්න. මම ඉස්සෙල්ලා බලනකොට ඔබතුමා ආසනයේ හිටියේ නැහැ.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ඔබතුමා එනකොටත් මම මගේ ආසනයේ හිටියේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ආසන ඔක්කෝම වෙනස් කරලා නේ තිබෙන්නේ. දැන් අපටත් පැහැදිලි නැහැ, කොයි ආසනයේ කොයි මන්ත්‍රීතුමා ඉන්නවාද කියලා. සමාවෙන්න, වරදක් වුණා නම්. මම ඊළඟට ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

හොඳයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ලිපියක් සකස් කළා, "සංකීර්ණ ආර්ථික ගැටලු - ආර්ථික අර්බුදයක් කරා යෑමට ඇති

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ඉඩ ප්‍රස්ථාවන්" කියලා. මම මේ රටේ අසීරු අවස්ථාවක සිටි නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයකු හා රාජ්‍ය අමාත්‍යවරයෙක්. මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි, දැනට අපට තිබෙන ගැටලු ඉතා සංකීර්ණ වෙලා තිබෙන බව. ගැටලුවක් කියන්නේ නිශ්චිත කාරණයක්. ඒකට එක අවස්ථාවක උත්තරයක් හොයන්න පුළුවන්. අපේ රටේ තිබෙන ගැටලු දැන් එකිනෙකට බැඳුණු සංකීර්ණ ගැටලු බවට පත් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් අපට ඩොලර් නැහැ. ඩොලර් නැති නිසා ඩීසල් නැහැ. ඩීසල් නැති නිසා විදුලිය නිෂ්පාදනය කරන්න බැහැ. විදුලිය නිෂ්පාදනය කරන්න බැරි නිසා අනෙකුත් අපනයන භාණ්ඩ නිෂ්පාදනය කරන්න බැහැ. එම නිසා අපනයන නැහැ. ආයෙත් ඩොලර් නැහැ. ඒක නිකම් chain එකක් වෙලා තිබෙනවා. ඒකයි මම කිව්වේ ගැටලු සංකීර්ණ වෙලා තිබෙනවා කියලා. මේ සංකීර්ණ ගැටලු දැන් අර්බුදයක් බවට පරිවර්තනය වෙමින් පවතිනවා. මේ ගැටලු අර්බුදයක් කරා ගියොත් ඒකට විසඳුම් නැති තත්ත්වයකට රට, එහෙම නැත්නම් අපේ ආර්ථිකය ළඟා වෙන්න පුළුවන්. අපි හැම දාමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට ජනාධිපතිවරයාට, රජයට කරුණු ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කරන බොහෝ ආර්ථික කරුණු සකස් කළේ මම. අපි හැමවිටකම කිව්වා මෙවැනි වෙලාවකට ජනතාවට ඇත්ත කියන්න උත්සාහ කරන්න කියලා. අද මම දැක්කා, යම්තාක් දුරකට මුදල් අමාත්‍යතුමා එවැනි තත්ත්වයකට ළඟා වෙමින් සිටින බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කරුණු කිහිපයක් ගනිමු. එකක්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා ගැනීම. මේක ඉතාම ප්‍රමාදයි. ඒක අපි පුන පුනා කියන්නේ නැහැ. මුදල් අමාත්‍යතුමාත් පිළිගත්තා, ඒක ඓතිහාසික වරදක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා බලාපොරොත්තු වුණේ මොකක්ද? එකක් තමයි ඉතා හීන වී තිබෙන අපේ විදේශ සංචිත ප්‍රමාණය වර්ධනය කර ගැනීමට යම්කිසි ඩොලර් ණය මුදලක් අපට ලැබේවි කියන එක. තවත් පැත්තකින් අපි බලාපොරොත්තු වුණා, අපි ගෙවීමට ඇති විදේශ ණය ප්‍රමාණය යම්කිසි ප්‍රතිව්‍යුහගත කිරීමක් කරයි කියලා. මේ අවුරුද්දේ අපට ගෙවන්න තිබෙනවා, ඩොලර් බිලියන 6.9කට ආසන්න මුදලක්. ඒවායේ යම්කිසි ප්‍රතිව්‍යුහගත කිරීමක් කරලා, අඩුම ගණනේ එයින් තුනෙන් දෙකක ප්‍රමාණයක් මේ වර්ෂයේ ගෙවීම කල් දමා ගෙන ඒ මුදල් ටික ඉතුරු කර ගන්න ලැබෙයි කියා අපි බලාපොරොත්තු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දන්නා විධියට මීට පෙර 16 වතාවක් අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා තිබෙනවා. ඒ 16 වතාවේම අපට ලැබිච්ච ප්‍රතිචාරය මෙවර ලැබුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. එක වතාවක ගියේ මම නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා විධියට හිටපු 2009 කාලයේ. අපට එදා ආර්ථික ප්‍රශ්න රාශියක් තිබුණා. එදා රටේ අභ්‍යන්තර යුද්ධයක් තිබුණා. තවත් පැත්තකින් අවුරුදු 100කට වතාවක් ඇති වන ලෝක ආර්ථික අවපාතයක් තිබුණා. තවත් පැත්තකින් තෙල් මිල අදටත් වඩා ඉහළ ගියා. තෙල් බැරල් එක ඩොලර් 130ට ගිහිල්ලා තිබුණා. හැබැයි, IMF එක අපට දැක්වූ ප්‍රතිචාරය ඉතාම ඉහළයි. අපේ ඉල්ලීමත් එක්ක බොහෝම ඉක්මන් සහන අපට සැලසුණා. මට මතක විධියට අපේ සංචිත වර්ධනය කර ගන්න අපි ඩොලර් බිලියන 3යි ඉල්ලුවේ. නමුත් අපට ඩොලර් බිලියන 4ක් අනුමත වෙලා තිබුණා. අපි ඉන් 3යි ලබා ගත්තේ. අපි කොතරම් කඩිනමින් ඒකට මැදිහත් වුණාද කියනවා නම්, ප්‍රථම වතාවට ඒ අවබෝධතා ගිවිසුම එක සතියක් තුළ අත්සන් කරන්න අවශ්‍ය වුණා. මම ඒ සතියේ හිටියේ වැඩ බලන මුදල් අමාත්‍යවරයා වශයෙන්. ජනාධිපතිවරයා ලංකාවේ හිටියේ නැහැ. ප්‍රථම වතාවට, 2009දී ඒ IMF ගිවිසුමට අත්සන් කළේ මහ බැංකු අධිපතිවරයා සහ වැඩ බලන මුදල් අමාත්‍යවරයා විධියට මම. ඒ වතාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට ඉතාම හොඳ ප්‍රතිචාරයක් ලබා දුන්නා.

අද ගරු අමාත්‍යතුමා හොඳ කරුණු දැක්වීමක් කළා. ඒ කරුණක් තමයි IMF එක අපට මේ වතාවේ දක්වලා තිබෙන ප්‍රතිචාරය. එයින් එකක් තමයි, අපේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ ණය ප්‍රතිශතය ඉතාම ඉහළයි කියන එක. ඉතිහාසයේ අපි මෙච්චර ඉහළට ගිහිල්ලාම නැහැ. අද රුපියලට සාපේක්ෂව ඩොලරය යන්නේ රුපියල් 370ට කියලා කියනවා මට ඇහුණා. එහෙම නම්, අපේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය ප්‍රතිශතය 170 ඉක්මවා යනවා. ඒ නිසා තමයි ඔවුන් පුන පුනා අපට කියලා තිබුණේ අපේ ණය ස්ථායීතාව හදා ගන්න කියලා. මොකද, ණය ප්‍රතිශතය 170යි කියන්නේ බොහොම ඉහළ අගයක්. ඒ විධියේ ඉහළ අගයන් ලෝකයේ සමහර රටවල තිබෙනවා. නමුත් අපි එච්චර ඉහළ ගිහිල්ලා නැහැ. හැබැයි, ඒ රටවලට ප්‍රශ්නයක් නැත්තේ ඔවුන්ට ඒ ණය ගෙවන ආකාරය පෙන්වන්න පහසුකම් තිබෙනවා; හැකියාව තිබෙනවා. අන්න එතැන තමයි අපි හිරවෙලා ඉන්නේ. ඒ නිසා අපේ ණය ස්ථායීතාව පෙන්වීම අවශ්‍යයි.

ඊළඟට, විශේෂයෙන්ම අපේ රටේ තිබෙන දේශපාලන අස්ථාවරභාවය අපට බලපානවා. දේශපාලන අස්ථාවරභාවය කියන්නේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනවා හෝ උපක්‍රමයක් යොදලා මන්ත්‍රී ආසන 113 හදා ගන්න එක නොවෙයි වැදගත්. අද කී දෙනෙක් මහ පාරේ ඉන්නවා ද? අද මේ සභාවේ කථා කරන්නේත් මේ කාරණා නේ. දවස් ගණන්, මාස ගණන් මේ රටේ මිනිස්සු පොහොර නැහැ කියලා, ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලලා, ඩීසල් පෝලිමේ, පෙට්‍රල් පෝලිමේ දක්වන මහා හඬ තමයි දේශපාලන අස්ථාවරභාවය කියන්නේ. ඒ නිසා 113 හදන එක ගැන අපි කථා කරලා වැඩක් නැහැ. ලෝකය මේ දිහා බලාගෙන ඉන්නවා. අපි ණය ඉල්ලනවා නම්, ඒ ණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත්වීම බලාපොරොත්තු වෙනවා නම්, අපි දේශපාලන ස්ථාවරභාවයක් හදා ගන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය අද හොඳ පත්වීම් දෙකක් කරලා තිබෙනවා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ තමයි නව මහ බැංකු අධිපතිතුමාගේ පත්වීම සහ මුදල් ලේකම්තුමාගේ පත්වීම. මම කාලයක් එතුමන්ලා එක්ක වැඩ කළා. එතුමන්ලා නියෝජ්‍ය අධිපතිවරු හැටියට ඉන්නකොට මම වැඩ කරලා තිබෙනවා. එතුමන්ලා මේ කටයුත්තේදී මුදල් අමාත්‍යවරයා එක්ක එකතු වෙලා ඉහළ මැදිහත්වීමක් කරනවා. ඒ ගැන අපේ අවතක්සේරුවක් නැහැ. හැබැයි, මම කියන්න උත්සාහ කළේ මේකයි. අවුරුදු එකහමාරක් දෙකක් ප්‍රමාදවෙලා IMF එකට ගිහිල්ලා අපි බලාපොරොත්තු වෙච්ච දේ අපට ලැබෙන්න නම්, යම්කිසි සහනයක් ලැබෙන්න නම්, මට තේරෙන විධියට අවම වශයෙන් මේ අවුරුද්දේ අවසානයවත් වෙයි. ඒ නිසා අපේ ඒ බලාපොරොත්තුවට සාධාරණ කාලයක් දෙන්න වෙනවා. ඒ කියන්නේ තව මාස හයක්, හතක් යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි උද්ධමනය ගැන කථා කළා. අද අපේ රටේ තිබෙන්නේ සාමාන්‍ය උද්ධමනයක් නොවෙයි, අධි උද්ධමනයක්. අපි පළමුවෙනිම එහි වරද ගැනත් කථා කරමු. ඉතිහාසයේ නොවෙයි, මෑතදී අපි රුපියල් ට්‍රිලියන තුනක් මුද්‍රණය කර තිබෙනවා. ට්‍රිලියනයක් කියන්නේ කීයක්ද? කෝටි තුන් ලක්ෂයක්. රුපියල් කෝටි තුන් ලක්ෂයක් අපි මුද්‍රණය කරලා තිබෙනවා.

ඒක බින්දු 12ක් සහිත සංඛ්‍යාවක්. තුනේ ඉලක්කමට පිටුපසින් බින්දු 12ක් තිබෙන සංඛ්‍යාවක්. ඉතින්, ආර්ථික විද්‍යාවේ ඉතාම

සරල දැනුමක් තිබෙන කෙනෙක් වුණත්, සාමාන්‍ය පෙළ උගත් ශිෂ්‍යයෙක් වුණත් දන්නවා, භාණ්ඩ හා සේවා නිෂ්පාදනයක් නැතුව මෙවැනි දැවැන්ත මුදලක් ආර්ථිකයට මුදා හැරියාම -මෙවැනි දැවැන්ත මුදලක් මුද්‍රණය කරනකොට- මොකක්ද වෙන්නේ කියලා. ඒ නිසා වැඩි ඉල්ලුමක් ඇති වුණාම ඉතා විශාල විධියට භාණ්ඩ මිල ඉහළ යනවා. අපේ ආර්ථික උපදේශකයන් එතැනින් නතර වුණේ නැහැ. එවැනි මුදලක් ආර්ථිකයට මුදා හැරියාම ඒ මුදල සංසරණය වීම පාලනය කරන්න අපට යම් යම් ආකාරයේ උපකරණ තිබෙනවා. හැබැයි, මේ ගොල්ලෝ ඒ උපකරණ පාවිච්චි කළේ මුදල් සංසරණය තවත් වැඩි වන විධියටයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේ අවස්ථාවක උද්ධමනය පාලනය කිරීමට තිබෙන ප්‍රධානම උපකරණය තමයි බැංකු පොලී අනුපාතය වැඩි කරන එක, මිනිස්සු වැඩි වැඩියෙන් ඉතිරි කරන්න පොළඹවන එක. මේකේ මූලික මහ පෙන්වන්නා තමයි මහ බැංකුව. මහ බැංකුව විසින් නියම කරන පොලී අනුපාතය තමයි පහළ බැංකුවලට, පහළ මූල්‍ය ආයතනවලට, ඉතිරි කරන්නන්ට ලැබෙන්නේ; ඒ වාගේම, ණය සඳහා ගෙවන්න වෙන්නේ. හැබැයි, අපේ රටේ මහ බැංකුව රුපියල් ට්‍රිලියන තුනක මුදලක් ආර්ථිකයට මුදා හැරලා එතැනින් නතර වුණේ නැහැ. බැංකු පොලී අනුපාතය සියයට 4, සියයට 5 දක්වා අඩු කළා. ඒකෙන් මොකක්ද වෙන්නේ? දැවැන්ත මුදලක් රට තුළ සංසරණය වෙනවා වාගේම, සියයට 4ක, 5ක ප්‍රමාණයට පොලී අනුපාතය අඩු කළාට පස්සේ කිසි කෙනෙක් ඉතිරි කරන්න පෙළඹෙන්නේ නැහැ. ඔවුන් තිබෙන මුදල් මිලදී ගැනීම්වලට යොදවනවා. ඒ හේතුවෙන්, මුදල් මුද්‍රණය කිරීමෙන් ඇති වුණු උද්ධමනය තවත් දෙගුණ, තෙගුණ වෙලා ඉස්සරහට යන තත්ත්වයක් ඇති වුණා. එම නිසා අපි දැන් අධිඋද්ධමනයක මුවවිටේ නොවෙයි, අධිඋද්ධමනයකට මුහුණ දෙමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව මහ බැංකු අධිපතිතුමා පැමිණි විගසම මේ සඳහා ගත යුතු පළමුවැනි පියවර ගත්තා. ඒ පිළිබඳව මම සන්තෝෂ වෙනවා. එතුමා බැංකු පොලී අනුපාතය ඉහළ දැම්මා. දැන් ඉතිරි කරන කෙනෙකුට සියයට 20ක වාගේ පොලියක් ලැබෙනවා. ඒ වාගේම ණයක් ගන්න සූදානම් වන කෙනෙකුටත් සියයට 20ක්, 25ක් ගෙවන්න වෙනවා. මේක තමයි උද්ධමනයක් පාලනය කරන්න ආර්ථික විද්‍යාවේ තිබෙන ඉතාම සරල උපකරණය. ඉතින්, අපේ මහ බැංකුව ඒ උපකරණය අද පාවිච්චි කරනවා. බැහැයි, අපි වාගේ අධිඋද්ධමනයක් තිබෙන රටකට ඒ උපකරණ දෙක පමණක් ප්‍රමාණවත්ද කියන ප්‍රශ්නය තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් ආර්ථික විද්‍යාවේ තිබෙන අනෙකුත් උපකරණ මොනවාද? ඒ සඳහා අපි අපේ රටේ සමස්ත නිෂ්පාදන වැඩි කරන්න අවශ්‍යයි. හැබැයි, මේ වගේ වෙලාවක අපට සමස්ත නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන්ද? කාබනික පොහොර පිළිබඳව හදිසියේ එළැඹුණු තීරණයත් එක්ක අද අපේ රටේ කෘෂිකාර්මික නිෂ්පාදනය බිඳ වැටිලා තිබෙන්නේ. ඒ වාගේම ඇතිවෙලා තිබෙන ඩොලර් ප්‍රශ්නය, විදුලිය ප්‍රශ්නය, ඩීසල් ප්‍රශ්නය එක්ක රටේ කර්මාන්ත බිඳ වැටිලා තිබෙන්නේ. එම නිසා ඒ ආර්ථික උපකරණයෙන් අපට ක්ෂණිකව ප්‍රතිඵල බලාපොරොත්තු වෙන්න බැහැ. අනෙක් උපකරණය තමයි, වෙළෙඳ පොළ තුළ ආනයනික ද්‍රව්‍ය සුලභ කිරීම. මේ වෙලාවේ ආනයනික ද්‍රව්‍ය සුලභ කරන්න අපට පුළුවන්ද? අපි ළඟ ඩොලර් නැහැ, අපට විනිමය නැහැ. එපමණක් නොවෙයි, සමාගමකින් සමාගමකට ණයට දෙන්නවත් විදේශීය රටවල් සූදානම් නැහැ. එම නිසා අපට ඒ උපකරණය ක්‍රියාත්මක කරන්නත් බැහැ. ඉතින්, අධිඋද්ධමනය පාලනය කිරීම සඳහා මේ හැම එකකින්ම අපට ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ එකම එක උපකරණයයි. ඒ, පොලී අනුපාතය පමණයි. පොලී අනුපාතයෙන් පමණක් මේ උද්ධමනය නවත්වන්න බැහැ. මේක එක කාරණයක් පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි මේ ඇති වී තිබෙන භාණ්ඩ හිඟයත් එක්ක විශාල කළු කඩයක් නිර්මාණය වෙලා තිබෙනවා. ගෑස් සිලින්ඩරයක් රුපියල් 30,000කට යන තැනට ඇවිල්ලා තිබෙනවා මම දැක්කා. කළු කඩේ ඇති වන මේ ආර්ථික උද්ධමනය කොහේවත් ලියැවෙන්නේත් නැහැ. ඒ වාගේම රුපියලේ අගය නිතර නිතර අවප්‍රමාණ වීමත් එක්ක බඩු මිල තවත් ඉහළ යනවා.

රාජ්‍ය ආදායම අඩු වීමත් අද බරපතළ ප්‍රශ්නයක්. 2022 වසරේ රාජ්‍ය සේවක පඩි, විශ්‍රාම වැටුප්, සමෘද්ධිය ආදී සහනාධාර, රාජ්‍ය ණය පොලිය වැනි පුනරාවර්තන වියදම් සඳහා අඩුම ගණනේ රුපියල් බිලියන 3,400ක් අපට අවශ්‍ය වෙනවා. ඒ ගැන ගරු මුදල් ඇමතිතුමා මාත් එක්ක එකඟ වෙයි. එහෙම නම් පළමුවැනි කාර්තුවේදී අඩු ගණනේ අපට රුපියල් බිලියන 850ක ආදායමක් ඕනෑ. නමුත්, අපි උපයලා තිබෙන්නේ රුපියල් බිලියන 300ත්, 400ත් අතර ප්‍රමාණයක්. එම නිසා විශාල ආර්ථිකමය ගැටලු රාශියක මුවවිටේ අපි ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙවර අපේ වැටුප් ගෙවන කාලය වන විට අපේ භාණ්ඩාගාරයේ බැංකු අයිරාව ඩොලර් බිලියන 1,000 ඉක්මවා යනවා. එයින් ලංකාවේ බැංකු පද්ධතියට ඇති වන බර ඉතාම ඉහළයි. ඉතින්, මේ කාරණයත් එක්ක මම ගරු මුදල් ඇමතිතුමාගේත් අවධානයට ගේන්න උත්සාහ කළේ, ඉදිරි මාස කිහිපය මේ රටේ තත්ත්වය වෙනදාටත් වැඩිය අමාරු තැනකට යන්න පුළුවන් කියන එකයි. එහෙම නම් මොකක්ද විසඳුම? පළමුවැනිම දේ තමයි, මේ ආර්ථික කරුණු කථා කරන්න ඉස්සෙල්ලා අපි අපේ දේශපාලන ස්ථායීතාව ඇති කර ගන්න ඕනෑ. රජය ගැන මිනිසුන්ට විශ්වාසයක් නැහැ; කැබිනට් මණ්ඩලය ගැන විශ්වාසයක් නැහැ. එහෙම නම්, සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයක් පිළිබඳවයි අපි මේ යෝජනාව කරන්නේ. "සර්ව පාක්ෂික" කියන්නේ, බහු පාක්ෂික, නැත්නම් තව කැල්ලක් එකතු වෙලා කරන දෙයක් නොවෙයි. මේ සඳහා සියලුදෙනා සහභාගි වෙන්න ඕනෑ. "මේ කට්ටියත් එක්ක තව ටිකක් අමාරුවෙන් හරි ගිහිල්ලා අපට හොඳ විසඳුමක් ලැබෙයි" කියන විශ්වාසය මේ රටේ මිනිසුන් තුළ ඇති වෙන්න ඕනෑ.

ඒ නිසා මේ සඳහා රජය විසින්, රාජ්‍ය නායකයා විසින් විශාල කැප කිරීමක්, අවංක කැප කිරීමක් කළ යුතු වෙනවා. මේකට පැලැස්තර කොහේවත් නැහැ. මේක කෑලි කෑලි එකතු කරලා හදන්න බැහැ. මේක එක්කෙනෙක් දෙදෙනෙකුට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ රටේ තිබෙන ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්න නම් අන්තර්වාර පාලනයක් සඳහා සර්ව පාක්ෂික කණ්ඩායමක් එකතුවෙලා සියලුදෙනා කැපවිය යුතුයි කියන කාරණාවත් මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරවන්නයි මම මේ ප්‍රශ්නය කියන්නේ. අද උදේ වරුවේ කථානායකතුමාට ලිපියක් බාර දෙන්න පැමිණි තරුණයන් 10

[ගරු අශෝක් අබේසිංහ මහතා]

දෙනෙකුයි, තරුණියන් දෙදෙනෙකුයි පොලිස් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ වන විට ඔවුන් මහරගම පොලීසියේ අත්අඩංගුවේ පසු වෙනවා. ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා කථානායකතුමා දැනුවත් කරලා යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන අපේ ප්‍රසන්න රණතුංග ඇමතිතුමා පැහැදිලි කිරීමක් කළා.

ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.09]

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අපි ඉතාම වැදගත් තීරණාත්මක අවස්ථාවකට මුහුණ දෙන වෙලාවකයි ඉන්නේ. විශේෂයෙන්ම ලෝකයේ අපට ආධාර දෙන රටවල් කියපු ආකාරයට, අපේ ජනතාව කියපු ආකාරයට, විපක්ෂය කියපු ආකාරයට මුදල් ඇමතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හමුවෙලා මේ රට පත්වෙලා තිබෙන අර්බුදය පිළිබඳවත්, රටක් විධියට අපට මොන වාගේ සහනයක් අවශ්‍යයි ද කියන කාරණා පිළිබඳවත් පැහැදිලි කරලා, ඉතාම වගකීමකින් කටයුතු කරමින් අද ඉතා වැදගත් ප්‍රකාශයක් පාර්ලිමේන්තුවේදී සිදු කළා. මේ පාර්ලිමේන්තුවට එතුමා පැහැදිලිවම කියපු කාරණාවලට සවන් දුන්නාම, ආර්ථික විශේෂඥයන් කියන කාරණාවලට සවන් දුන්නාම, අපට ඉතා පැහැදිලියි අද අපි විශාල ආර්ථික අර්බුදයක සිටින බව. මේක අර්බුදයක් විධියට දැකලා, මේ අර්බුදයේ ඇත්ත තත්ත්වය ඉතාම නිවැරදි ආකාරයෙන් මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කිරීම පිළිබඳව මම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා ඒ දැක්ක දේ අපි මීට කලින් දැක්කා නම්, මීට වඩා එහාට ගිය උත්තර ටිකක් අපට සොයා ගන්න තිබුණා. ඒ වාගේම, අපේ බිම් මට්ටමේ ජනතාව අද මේ පත්වෙලා තිබෙන අවාසනාවන්ත තත්ත්වයට පත් නොවෙන්නත් ඉඩ තිබුණා. අපි අද ගිනි කඳු කීපයක් උඩ ඉන්න ජනතාවක් වාගේ තමයි ඉන්නේ. ඒවා කොයි වෙලාවේ පුපුරයි ද කියලා දන්නේ නැහැ. මුදල් ඇමතිතුමා කියපු කාරණා සම්බන්ධව ගත්තත්, ලෝකයේ විවිධ ආර්ථික විශේෂඥයන් ප්‍රකාශ කරන කරුණු අනුවත් අපට පැහැදිලිව පේනවා, අපට ඇතිවෙලා තිබෙන මේ ආර්ථික අර්බුදය තවමත් ආරම්භයේ විතරයි තිබෙන්නේ කියන එක. තවත් අර්බුද රාශියකට, ජීවන වියදම් වැඩිවීමකට, පඩි නඩි ගෙවා ගන්න බැරි වීමකට, සහන ලබා දීමේ අමාරුකම්වලට අපට මුහුණ දෙන්න වෙනවා. ඒ විතරක් නොවෙයි. තෙල් ටික, ගෑස් ටික තවත් මාස කීපයකට තිබුණා වුණත්, ඒ මාස කීපයෙන් පස්සේ මේ දේවල් කොහොමද කර ගන්නේ කියන අර්බුදයක අපි ඉන්නවා.

මුදල් ඇමතිතුමා මේ කාරණා පිළිබඳව අද පාර්ලිමේන්තුවේදී පැහැදිලි කරනකොට විපක්ෂයේ මන්ත්‍රීවරු හැසිරිච්ච විධිය ගැන මම සතුටු වන්නේ නැහැ. අපි හිතුවා විපක්ෂය මීට වඩා වගකීමකින්, වගවීමකින් කටයුතු කරයි කියලා. මුදල් ඇමතිතුමා ඒ ගෞරවනීය පැහැදිලි කිරීම කරන අතරතුර විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඉතාම අශීලාචාර විධියට එතුමාගේ කථාවට බාධා කළා.

මේ තමයි අපේ රටේ ජනතාව පත්වෙලා තිබෙන අවාසනාවන්ත තත්ත්වය; රට පත්වෙලා තිබෙන අවාසනාවන්ත තත්ත්වය. විපක්ෂයේ ඉන්නකම් හිතන්නේ, "හෙට තමන්ට බලය ඒවි, ඒ බලය ලබා ගැනීම සඳහා ඕනෑම දෙයක් කරන්න ඕනෑ. රට වැටුණත්, ජාතිය විනාශ වුණත්, හෙට තමන්ගේ පක්ෂයට බලය එනවා නම්.." කියන ඒ සිහිනය තුළ ඉඳගෙන කටයුතු කිරීම තමයි අද විපක්ෂ කරන්නේ.

අද මේ රටේ සැබෑ ප්‍රශ්නයක් තිබෙනවා. දිනපතා ඉහළ යන භාණ්ඩ මිලත් එක්ක අද තුන්වේල කාලා ජීවත් වෙන්න බැරි තත්ත්වයට මිනිස්සු පත්වෙලා තිබෙනවා. ඒ වාගේම, ගෑස් හිඟය, තෙල් හිඟය, කිරි පිටි හිඟය ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය සහ විදුලිය කැපීම ඇතුළු කාරණා ගත්තාම අද ජනතාව විශාල අර්බුදයක ඉන්නවා; පීඩාවක ඉන්නවා. ඒ ජනතාව ඉල්ලන්නේ ඒ වෙනුවෙන් සහන ලබා දෙන්න කියලායි. ඒ සහන ලබා දෙන්න තිබෙන අමාරුකම පිළිබඳව ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා. එතුමා කිව්වා, "මේක අද-ඊයේ ඇති වෙච්ච ප්‍රශ්නයක්වත්, මේ ආණ්ඩුව පත්වෙලා අවුරුදු 2ක් ඇතුළතදී ඇති වෙච්ච ප්‍රශ්නයක්වත් නොවෙයි, අවුරුදු ගානක් තිස්සේ ඇති වෙච්ච අවාසනාවන්ත තත්ත්වයක්" කියලා. අපි හැම දාම වෙනත් රාජ්‍යයන්වලින්, ආයතනවලින් ණය ගත්තා. ඒ ණය බේරන්න වෙනත් තැනකින් ණය ගත්තා. ඒ ණය ගෙවන්න තවත් ණය ගනිමින් ඉස්සහරට ගියා මිස, ජාතියක් විධියට නැඟිටින විධිය, රටක් විධියට නැඟිටින විධිය ගැන අපි හිතුවේ නැහැ. අපි කොහොමද අපට අවශ්‍ය බඩු ටික ගන්න අපේ ආදායම් උපයා ගන්නේ කියන කාරණාව සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කරලා තිබිලා නැහැ. ඒ තත්ත්වය නිසා තමයි අද මේ වාගේ අවාසනාවන්ත තැනට අපි පත්වෙලා තිබෙන්නේ.

එතකොට මේ වග කීම අපි හැමෝම භාරගන්න ඕනෑ. මේක කාටවත් මඟ හරින්න බැහැ. අද විපක්ෂයේ සිටින අය තමයි අවුරුදු දෙකකට කලින් මේ රටේ බලයේ සිටියේ. ඒ අය එහෙම හැසිරුණේ කොරෝනා වැනි ස්වාභාවික විපතක් ආවේ නැති තත්ත්වය තුළ. දැන් මුළු ලෝකයටම දැනෙන ආර්ථික අවපාතයක්, ආහාර හිඟයක් ඇති වෙලා තිබෙනවා. ඒ ආහාර හිඟයත් එක්ක විවිධ රටවල් තමන්ගේ හැකියාව එක්ක ඒවා කළමනාකරණය කර ගත්තත්, අපි වාගේ ආදායම් අඩු, ණය මත යැපුණු රටවලට තිබෙන අමාරුකම් මැද මේවා කළමනාකරණය කර ගන්නට නොහැකිව අද අපහසුතාවට පත්වෙලා තිබෙනවා. මේක අපට පමණක් බලපාන දෙයක් නොවෙයි. අද පාකිස්තානයේ පැය 18ක් විදුලිය කපනවා. ඉන්දියාවේ පැය 6ක් විදුලිය කපනවා. තවත් රටවල් ගණනාවක් මේ අර්බුදවලට මැදිහත් වෙලා සිටිනවා. ඒ නිසා ලෝකයේ විවිධ අඩු ආදායම් ලබන රටවලට, සංවර්ධනය වෙමින් තිබෙන රටවලට මේ තත්ත්වයට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. අපට තනියෙන් මේ ප්‍රශ්න විසඳාගන්න බැරි නම්, ජාත්‍යන්තර සංවිධානවලින් අපට ආධාර ගන්න තිබෙන ඉඩකඩ අඩු නම්, අපි රටක් විධියට එකට එකතු වෙලා මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න ඕනෑය කියන එක අපට පැහැදිලියි. හැබැයි, අපේ විපක්ෂයත් එක්ක නම් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න පුළුවන් වෙයි කියලා මට හිතෙන්නේ නැහැ. ඒ අය හිතන්නේ තමන්ගේ බලය ගැනයි. හෙට ඡන්දයක් තිබුණොත්, අද මේ ආණ්ඩුවේ සිටින අයට වඩා වැඩි පිරිසක් ඔවුන්ට එයි කියලා හිතනවා. අපි බොහොම පැහැදිලිව කියනවා, හෙට ඡන්දයක් තිබුණොත් ඒ ඡන්දයේදීත් කිසිදු පක්ෂයකට බහුතරයක් ලැබෙන්නේ නැති බව. ඒ නිසා අටවාගත්ත ආණ්ඩුවක් තමයි හදන්න වෙන්නේ. ඒ ආණ්ඩුවටත් මීටත් වඩා වැඩියෙන් මේ අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. එහෙම මුහුණ දෙනකොට නැවතත් මාස 6කින් ඡන්දයක් පවත්වන්න වෙනවා. එතකොට රටේ තරුණයන් සහ විවිධ පුද්ගලයන් නැවතත් මහ පාරට බැහැලා අරගළ කරාවි.

ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, මේ වෙලාවේ බොර දියේ මාළු බාන්නේ නැතිව විපක්ෂයත්, ආණ්ඩුවත් දෙකම එකතු වෙලා, රටේ සමස්ත ජනතාවත් එකතු කරගෙන මේ ප්‍රශ්නය විසඳීමේ යම් වැඩ පිළිවෙළකට යා යුතුව තිබෙන බව. නමුත්, ඒක සිද්ධ වෙන්නේ නැහැ කියන කාරණාව පැහැදිලියි. අද මේ විපක්ෂයේ අය කියනවා, එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ මෙහෙම කළේ නැහැ කියලා. හැබැයි, ඒ ගොල්ලන්ගේ කාලයේ බිලියන 15කට ආසන්න ප්‍රමාණයක් ණය අරගෙන තිබෙනවා. ඒකෙන් යම් ප්‍රමාණයකින් ණය ගෙව්වා වුණත්, යම් මුදල් ප්‍රමාණයක් එදිනෙදා වියදම්වලට අරගෙන තිබෙනවා. එපමණක් නොවෙයි, හම්බන්තොට වරාය ඇතුළු රටේ තිබුණු වටිනා සම්පත් විකුණා ඔවුන් මුදල් ගත්තා. ඒ සියල්ල එදිනෙදා ආණ්ඩුව පවත්වාගෙන යන්න පමණයි පාවිච්චි කළේ; රට ඉදිරියට ගෙනයන්න පාවිච්චි කළේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නවලට විපක්ෂයත් වග කියන්න ඕනෑ, මේ ආණ්ඩුවත් වග කියන්න ඕනෑ, ඊට පෙර හිටපු ජනාධිපතිවරු, අගමැතිවරු වාගේම ඒ ආණ්ඩු හැම එකක්ම වග කියන්න ඕනෑ. ඒ නිසා මේ රටේ අද පවතින අර්බුදයට මුහුණ දීලා, ඒ අර්බුදය කළමනාකරණය කර ගන්න අපි සියලුදෙනාටම වග කීමක් තිබෙනවා.

බිම් මට්ටමේ ජනතාව මේ ආපු අර්බුදයත් එක්ක එළියට බැහැලා සාධාරණව යම් අරගළයක යෙදී සිටිනවා. හැබැයි, අද වෙනකොට ඒ සාධාරණ අරගළයේ තිබුණු නිර්පාක්ෂිකභාවය බිඳිලා තිබෙනවා. මේ වෙනකොට ජනතා විමුක්ති පෙරමුණේ වසන්ත සමරසිංහලා ඒ තැන්වලට ගිහිල්ලා කථා කරනවා. ඔවුන් JVP එකේ මධ්‍යම කාරක සභිකයෝ. එතකොට කෝ නිර්පාක්ෂිකභාවය? ඒ වාගේම පුබුදු ජයගොඩලා ගිහිල්ලා කථා කරනවා. ඒ තිබුණු නිර්පාක්ෂිකභාවය බිඳලා පෙරටුගාමීන් එතැනට යනවා. ඒ වාගේම සමගි ජනබලවේගයේ අයත් දැන් වෙනකොට ඒ අස්සට රිංගලා තම තමන්ගේ බලය වර්ධනය කර ගන්න හදනවා. ජනතාවගේ සැබෑ ඕනෑකම, ජනතාවගේ සාධාරණ අරගළය තුළින් අද එක එක්කෙනා බලයට ඒමේ සිහිනය සැබෑ කර ගන්න උත්සාහ දරමින් සිටිනවා. ඒ නිසා මේ වෙලාවේ බිම් මට්ටමේ ජනතාව සම්බන්ධයෙන් අපට වග කීමක් තිබෙනවා.

අද ආර්ථික අර්බුදයත් එක්ක ගොඩනැඟුණු දේශපාලන සහ සමාජ අර්බුදයක් තිබෙනවා. මේ ආර්ථික අර්බුදයට විසඳුම් සොයන්නත් ඕනෑ. දේශපාලන සහ සමාජීය අර්බුදයට විසඳුම් දෙන්නත් ඕනෑ. හැබැයි, වහා විසඳිය යුත්තේ මොකක්ද? ජනතාව වහ වහා ඉල්ලන්නේ එදිනෙදා කන්න බොන්න අත්‍යවශ්‍ය වන භාණ්ඩ සුලබ කරන්න, ඒවායේ මිල අඩු කරන්න සහ පෝලිම් අඩු කරන්න කියලායි. හැබැයි, සිද්ධ වෙමින් තිබෙන්නේ එක එක්කෙනා ජනාධිපතිවරු වෙන්න බලන එකයි, ආණ්ඩු හදන්න බලන එකයි. දැන් හිතාගෙන ඉන්නේ ජනාධිපතිගේ, අගමැතිගේ තටු කැපුවාම සියලු ප්‍රශ්න විසඳෙනවා කියලායි. විදුලිය නැතිව පීඩාවට පත්වෙච්ච ජනතාවට, කන්න නැතිව පීඩාවට පත්වෙච්ච ජනතාවට ජනාධිපතිගේ තටු කැපුවාය කියලා හෝ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත ගෙනාවා කියලා හෝ සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ ජනතාවගේ සියලු ප්‍රශ්න එකපාරට විසඳෙන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැම දෙනාටම වග කීමක් තිබෙනවා, පළමුව මේ ආර්ථික ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න සහ ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒ වැඩ පිළිවෙළේදී අපට පෙනෙනවා ලෝක ආහාර අර්බුදයක් එන බව. ලෝක ආහාර අර්බුදයක් එන වෙලාවේ අපි වහ වහා සෑම බිම් අඟලකම වගා කරන්න කටයුතු කළ යුතුයි. අපි යම් වගා සංග්‍රාමයක් ආරම්භ කළ යුතුයි. ඒ වාගේම අඩු ආදායම්ලාභී ජනතාවට යම් සහනයක් ලබා දෙන්න ඕනෑ. ස්ථිර ආදායම් ලබන මධ්‍යම පාන්තිකයන් ගත්තත්, ඒ අයටත් අද මේ වියදම එක්ක ජීවත් වෙන්න බැහැ.

එහෙම නම් අඩු ආදායම්ලාභීන් ජීවත් වෙන්නේ කොහොමද? අද ඒ අය කබලෙන් ලිපට වැටිලා ඉන්නේ. අඩු ආදායම්ලාභී ජනතාවට යම් සහනයක් දෙන්න ලෝක බැංකු ආධාර ලැබුණා වුණත්, ඒක ප්‍රමාණවත් කියලා මම හිතන්නේ නැහැ. සමෘද්ධිලාභියෙකුට රුපියල් 4,500ක මුදලක් දැනටත් ගෙවනවා. තවත් රුපියල් 3,000කින් ඒ දීමනාව වැඩි කරන්න කියපු පළියට ඒ මුදල ප්‍රමාණවත් වෙන්නේත් නැහැ. ගරු ඇමතිතුමා කිව්වා සෑම සමෘද්ධිලාභියෙකුටම රුපියල් 7,500 දක්වා ඒ මුදල වැඩි කරනවා කියලා. මම ඉල්ලා සිටිනවා සමෘද්ධිය ඇතුළු ඒ හැම දීමනාවක්ම ලබන අයට අඩුම තරමින් රුපියල් 7,500ක්වත් ලබා දෙනවා නම් යම් සාධාරණයක් තිබෙනවා කියලා. හැබැයි, ඒ කියපු දේ නොවෙයි බිම් මට්ටමට ගිහිල්ලා තිබෙන්නේ. දැනට ලබන රුපියල් 1,900ට තවත් රුපියල් 3,100ක් එකතු කරන්න, එහෙම නැත්නම් දැනට ගන්නා රුපියල් 2,500ට යම් සීමාවක් ඇතුළේ තවත් පොඩි ගණනක් එකතු කරලා ලබා දෙන්න යනවා කියන කාරණයයි දැන ගන්න තිබෙන්නේ. ඒ ජනතාව දැනටමත් අසරණ වෙලායි ඉන්නේ. ඒ අය රටේ තත්ත්වය හොඳට පැවැති කාලයේදීත් අසරණ වෙලා හිටපු අය. එහෙම නම් ඒ අය තවත් අසරණ වෙලා ඉන්න අවස්ථාවේ ඒ අයට වැඩි සහනයක් සැලසිය යුතුයි. නමුත්, ඒ සහන සැලසීම ප්‍රමාණවත් ආකාරයකින් සිද්ධ වෙනවා ද කියන සැකය තිබෙනවා. ඒ නිසා මේ කාරණය මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. වැඩි වුණු ජීවන වියදමට අනුව තුන්දෙනෙකු සිටින පවුලක් ගත්තොත්, අඩුම වශයෙන් රුපියල් 15,000කින්, රුපියල් 20,000කින් විතර භාණ්ඩ සඳහා යන ඔවුන්ගේ වියදම ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේ ලබා දෙන සහනය ඒ තත්ත්වයට විසඳුම් සොයන්න ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ඒ සම්බන්ධව මීට වඩා අවධානය යොමු කරන්න ඕනෑ.

රටට අත්‍යවශ්‍යම භාණ්ඩ පමණක් අපි ආනයනය කළ යුතුයි. පසුගිය දවස්වල සාකච්ඡාවක් තිබුණා, Indian Credit Line හරහා ලැබෙන මුදල්වලින් ගොඩනැඟිලි පහසුකම් සහ ඒ අවශ්‍ය දේවල් ගන්න හදනවා කියලා. මම මේ වෙලාවේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ වන විට සමාජ මතයක් තිබෙනවා මේ වෙලාවේ පීඩාවට පත් වෙච්ච ජනතාවට ජීවත් වෙන්න අත් වැලක් දෙන්න ඕනෑ කියලා. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒ ලැබෙන මුදල් ආහාර ටික ගෙනෙන්න, අත්‍යවශ්‍ය භාණ්ඩ ටික ගෙනෙන්න යොදවන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අවශ්‍ය බෙහෙත් පෙත්තක් -ඖෂධයක්- පැය භාගයකට හෝ නැති වුණොත් ඇතැම් රෝගීන් මිය යනවා. ඒ නිසා ඖෂධ ටික අපට තිබෙන්නම ඕනෑ. අද මෙච්චර ඖෂධ හිඟයක් ඇති වුණේ ඇයි කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මේ රටේ ඒ අදාළ අමාත්‍යාංශය ඇතුළු ආයතන සියල්ල වග කීමෙන් කටයුතු කර තිබෙනවා ද කියන ප්‍රශ්නය තිබෙනවා. අද කියනවා ඖෂධ හිඟයක් තිබෙනවා කියලා. ඒ හිඟයට අද විසඳුම් හොයනවා. හැබැයි, ඒ නිලධාරින් පසුගිය කාලයේත් ඒ ආයතනවල හිටියා. ඒ නිසා අනෙක් කාරණාවලට මුල් තැන දෙනවාට වඩා මිනිසුන්ගේ අත්‍යවශ්‍ය ඖෂධ ටික ලබා දීමේ කටයුත්තට මුල් තැන දීලා කටයුතු කළ යුතුව තිබුණා. නමුත් ඒක කරලා නැහැ. ඒ ගැන අපි කනගාටු වෙනවා. පැහැදිලිවම අපි මේ සම්බන්ධව ජනාධිපතිතුමාටත් ලිව්වා. ජනතාව මුහුණ දෙන මූලික ප්‍රශ්න කිහිපයට විසඳුම් දෙන්නේ නැතිව, රටට අත්‍යවශ්‍ය දේ හඳුනා ගන්නේ නැතිව අපි තව කොච්චර කටයුතු කළත් වැඩක් වෙන්නේ නැහැ. ඒකෙන් වෙන්නේ රට තවත් අර්බුදයෙන් අර්බුදයට යන එකයි.

අද රටේ තිබෙන දේශපාලන අර්බුදය පිළිබඳවත් කථා කළ යුතුයි. අද මේ කාරණයේදී විපක්ෂයට කර අරින්න බැහැ. නමුත්, විපක්ෂය දිගින් දිගටම උත්සාහ කරනවා බලය ලබා ගැනීමට. හෙට ඡන්දයක් තියලා හෝ වෙන ක්‍රමයකින් කටයුතු කර හෝ ඒ

[ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා]

දේ කරන්න හදනවා. අද රටේ ජනතාව ඉල්ලන්නේ, මහනායක හාමුදුරුවරු ඉල්ලන්නේ, කාදිනල් හිමිපාණන් ඉල්ලන්නේ - හැමෝම ඉල්ලන්නේ- එක දෙයයි. එක්කෝ පවතින ආණ්ඩුවෙන් සහන දෙන්න ඕනෑ. මේ ආණ්ඩුවට සහන දෙන්න බැරි නම් සමස්ත පක්ෂ එකතු වෙලා සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදලා ජනතාවට සහන දෙන්න කියලායි ඒ හැමෝම ඉල්ලන්නේ.

ලෝකයේ වෙනත් රටක නම් ආණ්ඩුවක් භාර දෙන්න හදනකොට විපක්ෂය ක්ෂණිකව ඒක භාර ගන්න ලෑස්ති වෙනවා. හැබැයි, අපේ රටේ විපක්ෂය මේ වාගේ වෙලාවක "බුදු අම්මෝ අපට එපා" කියලා මහ හැරීමේ උත්සාහයක යෙදෙනවා. ඒකට හේතු කාරණා විධියට, ජනාධිපතිතුමා එක්ක කරන්න බැහැ කියනවා. හැබැයි, හෙට ඡන්දයකින් ආවත් එතුමන්ලාට ඒ ආණ්ඩුවේ ඉඳ ගන්න වෙන්නේ මේ ජනාධිපතිතුමාත් එක්කම තමයි. අඩුම ගණනේ කෙටි කාලයකට හරි එහෙම කරන්න වෙනවා. ඒ නිසා මේ වෙලාවේ අපි කියන්නේ කෙටි කාලයකට එතුමා සමඟ වැඩ කරන්න කියලායි. ඒ කෙටි කාලය තුළ මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන මේ අර්බුද සහිත වාතාවරණයෙන් ගොඩගන්න කටයුතු කරන එක ජාතියේ අවශ්‍යතාව වාගේම මහා පිනක් කියලායි මා හිතන්නේ. හැබැයි, ඒ පුණ්‍ය කර්මයට එහෙම නැත්නම් ඒ ජාතියේ අවශ්‍යතාව වෙනුවෙන් කටයුතු කරනවාට වඩා ඒ හැමෝම තුළ බලලෝභීත්වය සහිත අවශ්‍යතා ඉස්මතු වෙලා තිබෙනවා.

මේ රටේ ජනතාව පාර්ලිමේන්තුව තුළින් බලාපොරොත්තු වන දේ පාර්ලිමේන්තුව ඉෂ්ට කරනවා ද කියන ප්‍රශ්නය තිබෙනවා. මොකද, අද ගරු මුදල් ඇමතිතුමා හරවත්, වැදගත් කථාවක් කරද්දීත් ඒකට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු බාධා කරමින් කළේ, හැමදාම කරන ජනතා විරෝධී වැඩ පිළිවෙළමයි. ඒ නිසා අපි විපක්ෂයේ, අපි ආණ්ඩුවේ කියන කාරණාවට කොටු වෙන්නේ නැතිව කටයුතු කරන්න අපි හැමෝටම වග කීමක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
නැත්නම් ජනතාව කියන්නේ, "225දෙනාම ගෙදර යන්න" කියලායි; "225 දෙනාම ඕනෑ නැහැ" කියලායි. මීට ඉස්සෙල්ලා ආණ්ඩුව තිබෙනකොටත් කිව්වා, "225දෙනාම දියවන්නාවේ ගිලී මැරුණත් කමක් නැහැ" කියලා. අපි හැසිරෙන විධිය නිසා අපි හැමෝටම අර්බුදයකට ලක් වෙන්නයි වෙන්නේ. ගිනි කන්දක් උඩ ඉන්න වෙලාවක, ගිනි ගනිමින් තිබෙන වෙලාවක අපට නටමින් ඉන්න බැහැ. අපට වග කීමක් තිබෙනවා. ජාතියේ විලාපය අපට ඇහෙන්න ඕනෑ. අපි මේ අර්බුදයට විසඳුම් සොයන්න ඕනෑ. මෙහිදී මහ හරින්නේ නැතිව සියලුදෙනා කථා බහ කරලා කටයුතු කරන්න ඕනෑ. ජනාධිපතිතුමා, අගමැතිතුමා විතරක් නොවෙයි විපක්ෂයේ සියලු පක්ෂ නායකයෝ යම් එකඟතාවකට ඇවිල්ලා මේ අර්බුදයෙන් රට ගොඩ ගත්තොත් විතරයි සහන ඕනෑකමින් ඉන්න මිනිස්සුන්ට උත්තර දෙන්න පුළුවන් වෙන්නේ.

ඇත්ත ඕනෑකමකින් ඉන්න අයට අපි ස්තුතිවන්ත වෙනවා, ගරු කරනවා. හැබැයි, බොර දියේ මාළු බාන්න හදන විපක්ෂයේ සමහර අයට අපි කියනවා, තමුන්නාන්සේලා ඒ හරහා කරන්න හදන්නේ තවදුරටත් රට අරාජික කරන එක, නැත්නම් ජාතිය අවාසනාවන්ත තැනකට ගෙන යන එක කියලා. ඒ අවාසනාවන්ත තත්ත්වයට රට ගෙන යන්න කටයුතු කරන්නේ නැතිව හැම දෙනාම තම තමන්ගේ වගකීම ඉෂ්ට කිරීමට කටයුතු කිරීම මේ වෙලාවේ ඉතාම වැදගත් කියලා මම හිතනවා.

මුදල් ඇමතිතුමා මුදල් සොයා ගන්න විධිය, මුදල් සොයා ගෙන කටයුතු කරන විධිය, ඒ සඳහා ගතවන කාල පරිච්ඡේද ගැන කිව්වා. ඒ නිසා සැහැල්ලුවෙන්, හිනා වෙලා සාමාන්‍ය වාදයකට ගිහින් කරුණු කියනවා වාගේ දෙපැත්තේ අය කරුණු කියලා විතරක් හරියන්නේ නැහැ, මේ හැම කෙනෙකුටම වගකීමක් තිබෙනවා. අප මහජන නියෝජිතයන් හැටියට මෙතැනට එවා තිබෙන්නේ ජනතාවගේ පරමාධිපත්‍ය මේ පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක කරන්නයි. මේ පාර්ලිමේන්තුවට තමයි ඒ බලය දීලා තිබෙන්නේ. එළියේ උද්ඝෝෂණ කරන අයට, වෙනත් අයට වඩා ඒ අවස්ථාව මෙතැනට දීලා තිබෙනවා. ඒ පරමාධිපත්‍ය අපි නිවැරදිව ක්‍රියාත්මක කරනවා නම්, අවබෝධයෙන් කටයුතු කරන්න ඕනෑ. එහෙම නොවුණොත් අපි ජාතියක් විධියට ඉතාම ඉක්මනින් අවසන් ගමන් යනවාය කියන කාරණය පැහැදිලියි. ඒ නිසා අපි එකට එකතු වෙලා මේ ජාතිය මේ අවාසනාවන්ත ඉරණමෙන් ගොඩ ගනිමු කියලා මම හැම දෙනාගෙන්ම ඉල්ලනවා. අපට ඒක කරන්න බැරිකමක් නැහැ. දශක තුනක ත්‍රස්තවාදය නැති කරන්න බැහැ කියද්දී, අපි ඒ ත්‍රස්තවාදය අවසන් කළා. ඒ වාගේම මේ රටේ ආර්ථිකය හදන්න බැහැ කියද්දී ආර්ථිකය හදපු අවස්ථා තිබෙනවා. අද ආර්ථිකය වැටිලා තිබෙනවා. අපි මීට ඉස්සෙල්ලා වැටුණු වළෙන් නැඟිටලා තිබෙනවා. එහෙම නම් අපට නැඟිටින්න පුළුවන්. අපි කණ්ඩායමක් විධියට, රටක් විධියට එකට හිටියොත් අපට ඒ කාර්යය කරන්න පුළුවන්. ඒ සඳහා අපි සියලුදෙනාට එක්වීමට අවස්ථාව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම එළියේ ඉන්න සහෝදරයන්ගෙන් මම ඉල්ලනවා, ඉතාම බුද්ධිමත්ව, සාමකාමීව ඔබගේ ඉල්ලීම ඉදිරිපත් කරන්න කියලා. එයට ඇහුම්කන් දෙන්න රජයක් විධියට අපි සූදානමින් සිටිනවාය කියන කාරණාවත් සඳහන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Mano Ganesan, please. You have ten minutes.

[අ.භා. 2.24]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Thank you.

අපේ ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමාගේ කථාවට මම ඇහුම්කන් දීගෙන හිටියා. එතුමා පුන පුනා අපට කිව්වා, "ඇවිත් ආණ්ඩුව භාර ගන්න" කියලා. එතුමන්ලා මුලින් කිව්වා එතුමන්ලාට තුනෙන් දෙකක බලයක් තිබෙනවා කියලා. ඡන්දයෙන් ආවා කිව්වා. නමුත් අවුරුදු දෙකහමාරක් ගතවෙනකොට පුදුමාකාර විධියට කියනවා, "ආණ්ඩුව භාර ගන්න" කියලා. හරි, අපි ආණ්ඩුව ගන්නම්. ප්‍රශ්නයක් නැහැ. හරි වෙලාවට ගන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගන්න බයයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
දැන් අපි භාර දීලා තිබෙනවා - *[බාධා කිරීමක්]* නැහැ. නැහැ. පොඩ්ඩක් ඉන්න. මේ මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉඳලා මගේ කථාව අහගෙන යන්න. අපි භාර දීලා තිබෙනවා, විශ්වාස භංග යෝජනා දෙකක්. ඒවාට සහාය දෙන්න. එතකොට අපේ ජනතාවට දැන ගන්න පුළුවන් ඔබතුමන්ලා කොතැනද ඉන්නේ කියලා. *[බාධා කිරීමක්]*

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මට විනාඩි 10යි තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
මට මේ රටේ ජනතාව ජනවරම දුන්නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක රට හදන වැඩ පිළිවෙළට යන්න. එහෙම නැතිව විපක්ෂය කියන, කියන විදියට විශ්වාස භංගවලට උදවු කරලා තමුන්නාන්සේලාට බලයට එන්න නොවෙයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ප්‍රශ්නය ඇති වුණේ- *[බාධා කිරීමක්]* වාඩිවෙන්න, වාඩිවෙන්න. දැන් ඔබතුමා නේ කිව්වේ. සිංහලෙන් නේ කථා කළේ. මට මේක තේරෙනවා නේ. ඔබතුමා කිව්වා "විපක්ෂයක් තිබෙනවා. රට භාර ගන්නේ නැහැ" කියලා. මම ඒකට උත්තර දෙන්නයි උත්සාහ කළේ. එච්චරයි.

කෙසේ වෙතත් අපි දැන් විශ්වාස භංග යෝජනා දෙකක් භාර දීලා තිබෙනවා. ඒකට පුළුවන් නම් උදවු කරන්න. මොනවා වුණත් එතකොට රටේ ජනතාව දැන ගනියි, ඔබතුමා කොහේද ඉන්නේ කියලා. එතකොට මේ 225දෙනා අතර අපි කොතැනද ඉන්නේ, ඔබතුමන්ලා කොතැනද ඉන්නේ කියන එක රටේ ජනතාව දැන ගනියි. ඒ නිසා කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ඒ අවස්ථාව ලබා දෙනවා. පසුව ඔබතුමන්ලා ආණ්ඩුවක් හදන්න; වෙන ආණ්ඩුවක් හදන්න. වෙන කණ්ඩායමක් දාලා ආණ්ඩුවක් හදන්න. හදලා ඔබතුමන්ලාගේ අමාත්‍ය මණ්ඩලයේ පළමු ක්‍රියාව හැටියට විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙදර යවන්න. ඔබතුමන්ලා අත උස්සලා ගෙනාපු විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙදර යවලා මහජනතාවගේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න. එහෙම ගෙනාවාට පසු ජනතාවට සලකා බලන්න පුළුවන්. ඉස්සෙල්ලා ඒක ගේන්න. ඒක ගෙනැවිත් විපක්ෂයට කියන්න "එන්න, ආණ්ඩුව භාර ගන්න" කියලා. එතකොට කිසි ප්‍රශ්නයක් නැහැ. එච්චරයි.

මම මෙය අවස්ථාවක් කර ගන්නවා, අපේ ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාට ස්තුති කරන්න. බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. අපේ කඳුකරයේ ජනතාවට දීර්ඝ කාලීන ප්‍රශ්නයක් තිබුණා. ඒ තමයි ගුරු සහායක ප්‍රශ්නය. ඔබතුමා මේ ගැන හොඳටම දන්නවා. ඒ ප්‍රශ්නයට ඔබතුමා සුබවාදීව විසඳුමක් ලබා දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. Thank you very much. ரொம்ப நன்றி. මෙතැන් සිට මම දෙමළ භාෂාවෙන් කථා කරන්නම්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டின் வரலாற்றில் ஒருபோதும் இல்லாத அளவுக்கு இப்பொழுது ஒரு பாரிய நெருக்கடி நிலைமை ஏற்பட் டிருக்கின்றது. இது பொருளாதாரப் பிரச்சினையாக உருவெடுத் தாலும்கூட, அப்பிரச்சினையானது இப்பொழுது அரசியல், சமூக, கலாசாராப் பிரச்சினையாக உருமாறிக் கொண்டிருக்கிறது. இதற்குப் பொறுப்புக்கூற வேண்டியவர்கள் யார் என்பது தொடர்பில் இப்பொழுது நாங்கள் இந்தப் பாராளுமன்றத்திலே வாதிட்டுக்கொண்டிருக்கின்றோம். எது எப்படியிருந்தபோதிலும், 74 வருடங்களாக இந்த நாட்டை மாறி மாறி ஆண்டுவந்த அரசாங்கங்கள்தான் இதற்குப் பொறுப்புக்கூற வேண்டும் என்பதையே தமிழ் மக்களாகிய நாம் கூற விரும்புகின்றோம்.

எங்களைப் பொறுத்தவரையில், இது பொருளாதாரப் பிரச்சினை மட்டுமல்ல; உணவுப் பிரச்சினை மட்டுமல்ல. யுத்தம் நடைபெற்ற காலத்தில் வடக்கு, கிழக்கிலே உணவு, மருந்து, எரிபொருள், மின்சாரம் போன்ற பிரச்சினைகளை நாம் சந்தித்திருக்கிறோம். மலைநாட்டிலுள்ள தோட்டத்தொழிலா ளர்கள் யுத்தமில்லாமல், சத்தமில்லாமல் இவற்றைச் சந்தித்துக் கொண்டுதான் இருக்கிறார்கள். அது எங்களுக்குப் பாரிய பிரச்சினையாகத் தோன்றவில்லை. ஆனால், அவற்றுக்கு அப்பாற்பட்டு உயிர்வாழ்வதில், எங்களுடைய மொழியைப் பேசுவதில், ஓர் இனமாக வாழ்வதில், எங்களுடைய மதத்தைப் பின்பற்றுவதில் இன்று நாங்கள் பிரச்சினைகளைச் சந்தித்துக்கொண்டிருக்கின்றோம். எங்களது கூக்குரல் இப்பொழுது நாடு முழுக்க ஒலித்துக்கொண்டிருக்கிறது; இளைய தலைமுறையினர் ஊடாக அது வெளிப்பட்டுக் கொண்டிருக்கிறது. இந்த நெருக்கடிக்குப் பிறகு வரக்கூடிய மாற்றமானது நல்லதொரு மாற்றமாக, முற்போக்கான மாற்றமாக இருக்கவேண்டுமென நாங்கள் விரும்புகின்றோம்.

இருண்ட குகைக்குள்ளே தெரிகின்ற ஒளிக்கீற்றைப்போல நிகழ்ந்துள்ள ஒரு நிகழ்வை நான் இவ்வேளையிலே இந்த மாமன்றத்தின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவராகவும் இலங்கையின் தலைநகர் உள்ளடங்கியிருக்கின்ற கொழும்பு மாவட்டத்தின் நாடாளுமன்ற உறுப்பினராகவும் இதை வெளிக்கொண்டுவருவதில் மகிழ்ச்சியடைகின்றேன். கடனி னால் சிக்கித் தவிக்கும் இலங்கையில் வாழும் அனைத்து மக்களுக்காகவும் நிவாரண உதவிகளை வழங்குவதென இந்தியாவின் தமிழ் மாநிலமான தமிழ்நாட்டு அரசாங்கத்தின் சார்பிலே அதன் முதல்வர் மு.க. ஸ்டாலின் அவர்கள் தமிழக சட்டமன்றத்தில் அறிவித்திருக்கின்றார். அதை முன்னெடுப் பதற்காக ஒன்றிய அரசின் அனுமதியையும் இலங்கை அரசின் ஒப்புதலையும் அவர் கேட்டுப் பெற்றிருக்கிறார். அவை என்னென்ன உதவிகள் என்று பாருங்கள்! இந்திய ரூபாயில் ஏறக்குறைய 80 கோடி ரூபாய் பெறுமதியான 40,000 மெற்றிக்தொன் அரிசி, இந்திய ரூபாயில் ஏறக்குறைய 15 கோடி ரூபாய் பெறுமதியான 500 மெற்றிக்தொன் பால்மா, இந்திய ரூபாயில் ஏறக்குறைய 28 கோடி ரூபாய் பெறுமதியான 137 வகையான மருந்துகள். சுகாதார அமைச்சர் அவர்கள் எங்கே இருக்கிறார் என்று தெரியவில்லை. இந்தச் சபையிலே அவர் இல்லை. மொத்தமாக சுமார் 125 கோடி

[ගරු මනෝ ගනේසන් මහතා]

இந்திய ரூபாய்! இலங்கை நாணயத்தின்படி ஏறக்குறைய 600 கோடி ரூபாய்! - Rs. 6 billion.

அதுமட்டுமல்ல, நேற்றைய தினம் தமிழக சட்டமன்ற உறுப்பினர்கள் அனைவரும் தமது ஒரு மாதச் சம்பளத்தை இலங்கைக்கு வழங்குவதாக அறிவித்திருக்கிறார்கள். ஆளும் கட்சியான திராவிட முன்னேற்றக் கழகம் ஒரு கோடி இந்திய ரூபாயைத் தருவதாகக் கூறியிருக்கிறது. எதிர்க்கட்சியான அண்ணா திராவிட முன்னேற்றக் கழகம் ஏறக்குறைய 50 இலட்சம் ரூபாய் தருவதாகக் கூறியிருக்கிறது. இதையெல்லாம் பார்க்கும்பொழுது எங்களுக்கு மனம் நெகிழ்கிறது; மனம் மகிழ்கிறது. ஏனென்றால், இதில் அறிவுபூர்வமான பல படிப்பினைகள் இருக்கின்றன.

ஆரம்பத்திலே தமது தொப்புள்கொடி உறவுகள் என்ற வகையிலே இலங்கையில் வாழும் மலையக, ஈழத் தமிழர்களுக்கு உதவிட தமிழக அரசு விரும்பியிருந்தது. இந் நிலையிலே இந்திய வம்சாவளி மலையகத் தமிழர்களைப் பிரதிநிதித்துவப்படுத்தக்கூடிய TPA - தமிழ் முற்போக்குக் கூட்டணியின் சார்பில் நானும் வட, கிழக்கிலே வாழக்கூடிய இலங்கை வம்சாவளி ஈழத் தமிழர்களைப் பிரதிநிதித்துவப் படுத்தக்கூடிய TNA - தமிழ்த் தேசியக் கூட்டமைப்பு சார்பில் நண்பர் சுமந்திரன் அவர்களும் தமிழக முதலமைச்சர் அவர்களுக்கு ட்விட்டர் மற்றும் ஊடகங்கள் மூலமாக ஒரு கோரிக்கையை முன்வைத்தோம். அது என்ன கோரிக்கை? அதன் சாராம்சம் என்ன? இன்று இலங்கையில் நாம் அனைவரும் துன்புறுகின்றோம்; போராடுகின்றோம்; சிங்களவர், தமிழர், முஸ்லிம்கள், பௌத்தர்கள், இந்துக்கள், கத்தோலிக்கர்கள் என்ற வேறுபாட்டைப் படிப்படியாக மறந்து வாழ்ந்துகொண்டிருக்கின்றோம். ஆகையால், தாய்த் தமிழகம் உதவிகளை வழங்கும்பொழுது அவற்றை இந்த நாட்டிலுள்ள தமிழருக்கு மட்டும் வழங்காமல், இன, மத பேதமில்லாமல் சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் அனைவருக்கும் வழங்க வேண்டுமென்று நாங்கள் கௌரவ தமிழக முதல்வர் அவர்களிடம் கோரிக்கை விடுத்திருந்தோம். இதனூடாக நாங்கள் இலங்கையராக வாழ விரும்புகின்றோம் என்பதை எடுத்துக் காட்டியிருந்தோம்.

கௌரவ முதல்வர் மு.க. ஸ்டாலின் அவர்கள் எமது கோரிக்கையின் பின்னணியைச் சடுதியாகப் புரிந்துகொண்டார். மனதை உருக்கும் விதத்திலே தமிழக சட்ட மன்றத்தில் அவர் உரை நிகழ்த்தினார். ஒட்டுமொத்த இலங்கை மக்களுக்கும் உதவி செய்வது தமது கடமை என்றார். இலங்கையை ஓர் அந்நிய நாடாகவோ, இலங்கை மக்களை அந்நிய மக்களாகவோ நினைக்கவில்லையென்பது அவரது உருக்கமான, கண்ணியமான உரையிலே எங்களுக்கு விளங்கியது. "யாதும் ஊரே யாவரும் கேளிர்" என்று பல்லாயிரம் ஆண்டுகளுக்கு முன்னர் எமது தமிழ் அறிஞர் கணியன் பூங்குன்றனார் சொல்லிவைத்த அந்தக் கூற்றின் மெய்யான அர்த்தத்தை சமகாலத்தில் நாங்கள் தமிழக முதல்வர் மு.க. ஸ்டாலின் அவர்களது உரையிலே கண்டோம் என்பதை இங்கே சொல்லிவைக்க விரும்புகின்றேன். எம் கண்கள் கலங்க, மனங்கள் மகிழ்ச்சியடைய அவரது உரையை நாம் செவிமடுத்தோம். முதல்வரின் உதவி இலங்கை மக்களின் பசியைப் போக்கும்; நோய்நொடிகளைப் போக்கும்; பால்குடிப் பாலகர்களின் அழுகையைப் போக்கும். அதேவேளையிலே, சிங்கள மக்களுக்கும் தமிழ் மக்களுக்கும், இலங்கைக்கும் தமிழகத்திற்கும் இடையிலே வரலாற்று ரீதியாக ஏற்பட்டுள்ள சந்தேகங்களையும் அச்சங்களையும் போக்கும் பாதையிலே இது முதலடியாக அமைந்துள்ளது என்பதைப் பொறுப்புடன் கூறிவைக்க விரும்புகின்றேன். தென் இலங்கையிலும் வட, கிழக்கிலும் வாழும் தமிழ் மக்களின் எதிர்காலம் சிங்கள மக்களுடனும் தமிழ் பேசும் முஸ்லிம் மக்களுடனும் பின்னிப்பிணைந்துள்ளது. இனங்களுக்கிடையிலான முறுகல் நிலைமைதான் இலங்கையின் இனப்பிரச்சினையின் அடிப்படை என்பதை தமிழக முதலமைச்சர் புரிந்து கொண்டிருக்கின்றார். இது தமிழ் பேசும் இலங்கையர்களும் சிங்களம் பேசும் இலங்கையர்களும் சமத்துவமாகவும் சந்தோஷமாகவும் வாழ தமிழகம் உதவும் என்ற செய்தியைத் தருவதாகத்தான் நான் கருதுகின்றேன்.

தமிழ் மக்களாகிய எங்களைப் பொறுத்தவரையிலே, ஏறத்தாழ 75 வருடங்கள் இந்த நாட்டை மாறி மாறி ஆட்சிபுரிந்த அனைவரும் எங்களது இந்த நிலைமைக்குப் பொறுப்புக்கூற வேண்டும். இது உலகம் அறிந்த விடயம். பொருளாதாரப் பிரச்சினை மட்டுமல்ல, ஏனைய பல பிரச்சினைகளும் எங்களுக்கு இருந்துகொண்டிருக்கின்றன. இந்தப் பிரச்சினைகளுக்கெல்லாம் தீர்வுகாண அடிப்படையில் சாதகமான விடயம் ஒன்று இருந்தது. பிரச்சினைகளுக்கு மத்தியிலும், போருக்கு மத்தியிலும், துன்பத்திற்கு மத்தியிலும், கண்ணீருக்கு மத்தியிலும் இலங்கையராக வாழ்வதற்கான விருப்பத்தை நாங்கள் வெளிப்படுத்திக்கொண்டே வந்திருக்கிறோம். அதை மீட்டிப் பார்த்தால், இலங்கையில் வாழ்ந்து கொண்டிருக்கக்கூடிய சிங்கள சகோதரர்களுக்கு மத்தியிலே பாரிய வரலாற்று அச்சமும் சந்தேகமும் இருப்பது தெரியும். இலங்கையில் வாழ்கின்ற தமிழர்களின் எண்ணிக்கை 35-40 இலட்சமாக இருந்தாலும்கூட, கடல் கடந்து தமிழ் நாட்டிலே வாழ்ந்துகொண்டிருக்கக்கூடிய ஏறக்குறைய 8 கோடி தமிழர்களோடு சேர்த்துத்தான் அவர்கள் கணக்குப் பார்க்கிறார்கள். அதனால்தான் இலங்கையில் வாழ்கின்ற பெரும்பான்மையின சிங்கள மக்கள் மத்தியிலே, அந்த அச்ச உணர்வு இருக்கின்றது. அதைப் போக்க வேண்டும். இலங்கையின் தேசிய இனப் பிரச்சினைக்கு அதுதான் காரணமாக இருந்தது. அதைப் போக்கும் முகமாக தமிழக முதல்வரின் இந்தச் செயற்பாடு முதலடியாக அமைந்திருப்பதை நான் வரலாற்று ரீதியாகப் பார்த்துப் புரிந்துகொள்கின்றேன். அந்த வகையில், தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் என்ற முறையிலும் இலங்கையில் வாழக்கூடிய தமிழ் மக்களின் ஒரு பிரதிநிதி என்ற முறையிலும் இந்தச் செயற்பாட்டைச் செய்ததற்காக மீண்டும் ஒருமுறை தமிழக முதல்வருக்கு எங்களது மனமார்ந்த நன்றிகளையும் பாராட்டுக்களையும் வாழ்த்துக்களையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

சமூக நீதிக் கொள்கையின் அடிப்படையிலான தமிழக முதல்வரின் செயற்பாடானது தமிழகத்துக்கு அப்பாற் சென்று, இந்தியா முழுவதும் வாழ்ந்து கொண்டிருக்கின்ற மக்களைக் கவர்ந்திருக்கின்றது. சமூகத்தில் வறுமையின் விளிம்பில் வாழக் கூடிய மக்களை அவர் அரவணைக்கின்றார். அவரது அரவணைப்பானது கடல் கடந்து இலங்கைக்குள்ளும் ஏற்பட்டிருக்கின்றது என்று தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். இலங்கையிலே மலையகத்திலுள்ள தோட்டங்களிலே வாழ்ந்து கொண்டிருக்கின்ற இந்திய வம்சாவளி தொழிலாளர்கள்தான் வறுமையின் விளிம்பிலே வாழகின்ற மக்களாக இருக்கின்றார்கள். அவர்கள் இன்றும் பின்தங்கிய நிலையிலே தான் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். தமிழக முதல்வரின் சமூக நீதிக் கொள்கையின் அடிப்படையிலான உதவிகள் அவர்களது வாழ்விலும் ஒளியேற்றும் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. தமிழ் முற்போக்குக் கூட்டணியினராகிய நாங்கள் அவரை "சமூக நீதிக் காவலன்" என்று அழைக்க விரும்புகின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please wind up, Hon. Member.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
இறுதியாக ஒரு விடயத்தைக் கூறி முடித்துக்கொள்கிறேன். அதுமட்டுமல்ல, எதிர்வரும் வருடத்துடன் இந்திய வம்சாவளி மக்கள் இலங்கைக்கு அழைத்து வரப்பட்டு 200 வருடங்கள் பூர்த்தியாகின்றன. அதனை நினைவுகூரும் முகமாக நாங்கள் நடத்தவிருக்கின்ற மாபெரும் விழாவுக்குத் தமிழக முதல்வர் ஸ்டாலின் அவர்கள் பிரதம அதிதியாகக் கலந்துகொள்ள வேண்டுமென்று நான் பகிரங்கமாக இலங்கைப் பாராளு மன்றத்திலிருந்து அழைப்பு விடுக்க விரும்புகின்றேன். அவரை நேரடியாகச் சந்தித்து அதற்கான அழைப்பை நிச்சயமாக நாங்கள் விடுப்போம். அதன்மூலமாக இலங்கைக்கும் தமிழ் நாட்டுக்கும் இடையிலான உறவு பலமடையும் - வலுவடையும் என்று தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. (Ven.) Athuraliye Rathana Thero. You have eight minutes.

[අ.භා.2.36]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. මුදල් අමාත්‍යවරයා හැටියට අලුතින් පත් වෙච්ච අලි සබ්රි මැතිතුමා පාර්ලිමේන්තුවට ඇත්ත ප්‍රකාශ කිරීම පිළිබඳව, සත්‍ය තොරතුරු හා දත්ත ඉදිරිපත් කිරීම පිළිබඳව පළමුවෙන්ම මා එතුමාට අතිශයින් ස්තුතිවන්ත ෙ ඉදිරිපත් කිරීම පිළිබඳව පළමු ෙත වනවා. ආණ්ඩුව මේ වාගේ ඉතාම අසීරු තත්ත්වයක පවතිද්දී, විශේෂයෙන්ම රට ඉතා බරපතළ ව්‍යසන තත්ත්වයකට පත් වෙලා තිබියදී එතුමාගේ කථාව ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළ හෙළිදරව් කිරීම් ගැන මා එතුමාට නැවතත් ස්තුතිවන්ත වෙන්න කැමැතියි.

දෙවැනි කාරණය මෙයයි. එතුමාගේ කථාවට විපක්ෂයේ අවධානය යොමු කළා මදි කියලා මට හිතෙනවා. ආණ්ඩුවේ වැරැද්ද එතුමා පැහැදිලිව ප්‍රකාශ කළා. ඒක තමයි අපි මුලින්ම අවධානයට ගන්න ඕනෑ කාරණය. තමන්ගේ නායකයන් වන්දනා කරන, අත්පුඩි ගහන අයට එදා අපි මේවා කියන කොට, අපට හිනා වුණා. අපට ඒ ගැන කථා කරන්න ඉඩක් තිබුණේ නැහැ. ආණ්ඩුව බලයට පත් වෙච්ච ගමන් කාගේ ඕනෑකමට ද බදු මුදල් කප්පාදු කළේ කියලා මේ අවස්ථාවේදී මම අහන්න කැමැතියි. අවුරුද්දකට රුපියල් බිලියන 500ක් පාඩු වන විධියට, රාජ්‍ය භාණ්ඩාගාරය හිස් වන විධියට කටයුතු කරන්න උපදෙස් දුන් මිනිහාත් හෙළි කිරීමට අලි සබ්රි මැතිතුමාට වගකීමක් තිබෙනවා. ඒක කළේ බැසිල් රාජපක්ෂ මහත්තයා ද, එහෙම නැත්නම් ජයසුන්දර ද, එහෙමත් නැත්නම් වෙනත් භූතයෙක් ද කියලා අපි දැන ගන්න කැමැතියි. ඒක ඉතා වැදගත් කාරණයක්.

ඊළඟට, මුදල් අමාත්‍යතුමා පැහැදිලිව කරුණු ඉදිරිපත් කළා, අය වැය පරතරය පිළිබඳව. මේ අය වැය පරතරය ඉතා බරපතළ තත්ත්වයක්. මේක අද ඊයේ ඇති වුණ තත්ත්වයක් නොවෙයි. පසුගිය රජය කාලයේත්, ඊට ඉස්සෙලාත් මෙවැනි අය වැය පරතර තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கல்வி அமைச்சரும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Education and Minister of Plantation Industries)
Sir, I propose that the Hon. Velu Kumar do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராச மாணிக்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආදායම හා වියදම අතර පරතරය සියයට 240කින් වැඩි වෙලා. මේ තත්ත්වයෙන්වත් රට ඉදිරියට යනවා කියන එකත් පුදුමයි. තුනෙන් දෙකකට කිට්ටු බලයක් තිබුණු ආණ්ඩුව මේ රටේ ප්‍රබුද්ධ මිනිසුන්, දැන උගත් මිනිසුන් සිටියදී කටවාචාල රස්තියාදුකාරයන් තමයි ආණ්ඩු පක්ෂයේ ඉස්සරහ පේළියේ වාඩි කරවා ගත්තේ. බුද්ධිමත් මිනිසුන්ට තැනක් තිබුණේ නැහැ. මොනවා වුණත් අද අපි සතුටු වෙනවා, රමේෂ් පතිරණ මහත්මයා ඇතුළු තරුණ මන්ත්‍රීවරුන් කීප දෙනෙකු ආණ්ඩුව පැත්තේ ඉදිරි පෙළට ඇවිත් තිබීම ගැන. එතුමන්ලා වගකීම හොඳින් ඉටු කරයි ද, නැද්ද කියලා වර්ණනා ඊ ඉදිරි පෙළට ඇවිත් තිබෙනවා. ඒකරන්න තවම මට බැහැ. නමුත් අපි සතුටු වෙනවා, අර වාචාල, රස්තියාදුකාරයන් ටික තාවකාලිකව හෝ පසු පෙළට ගිය එක ගැන.

මේ අර්බුදයට ආණ්ඩුව සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. තනි පවුලක් කෑම මේසේ ඉඳගෙන රටේ ප්‍රශ්න කථා කරන තත්ත්වයට පත් වුණා. ඔබතුමන්ලා ඇබිත්තයන් වාගේ අත්පුඩි ගහමින් ඔවුන් උඩ තියාගෙන හිටියා. ඒ නිසා අද මුළු රටම පත් වෙච්ච මේ අනතුරට ඔබතුමන්ලා වග කියන්න ඕනෑ.

ඒ වාගේමයි පසුගිය ආණ්ඩුවත්. පසුගිය ආණ්ඩුව හරි ෂෝක් ද? පසුගිය ආණ්ඩුව ණය ගත්තේ නැද්ද? මීටත් වඩා නාස්තිකාර විධියට කටයුතු කළා. වැඩකට නැති ව්‍යාපෘතිවලට කෝටි ගණන් ණය අරගෙන නාස්ති කරලා දැමීම සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩුවත් වග කියන්න ඕනෑ. අපි 2005-2010 ආණ්ඩු කාලය පැත්තකින් තියමු. ඒක වෙනම යුගයක්. 2010-2015 අපට මුදල් ඇමතිවරයෙක් සිටියේ නැහැ. ඊළඟට පත් වෙච්ච අලුත් ජනාධිපතිවරයා යටතේත් අපට මුදල් ඇමතිවරයෙක් සිටියේ

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

නැහැ. පසුව බලයට පත් වුණා, තමන්ගේම මල්ලි. කෝටි දෙකකට අධික ජනතාවක් සිටින, දැන උගත් මිනිසුන් සිටින, වටිනා මානව සම්පතක් තිබෙන මේ රට, පුද්ගලයන් හත්අට දෙනෙක් මේ විධියට කාබාසිනියා කිරීම වෙනුවෙන්, මේ අර්බුදයට හෙළීම වෙනුවෙන් එතුමන්ලා ඇත්තටම හිරේ යන්න ඕනෑ. බදු කපා හැරීම ඇතුළුව අද ඇමතිවරයා කියපු කාරණා අනුව මේ අපරාධයට ඒ අය වග කියන්න ඕනෑ. මේක සෙල්ලමක් නොවෙයි. ඒ ගොල්ලන්ගේ ගෙවල් වට කරන්න ඕනෑ තමයි. ඇත්ත ඒක. ඒ ගොල්ලන්ට මේ පොළොවේ පය ගහලා ඉන්න දෙන්න වටින්නේ නැහැ, මේ කරපු ජාතික අපරාධ නිසා. මේ ආකාරයට කාබාසිනියා කරන්න ණය අරගෙන වාගේම බදු මුදල් රැස් කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කරලා කරපු අපරාධවලට ඒ ගොල්ලෝ වග කියන්න ඕනෑ. අද මිනිස්සු ඉන්නේ ඉතා අමාරු තත්ත්වයක. ඒ නිසා හිතන්න එපා මෙය ලේසි කටයුත්තක් කියලා. අපි කාටවත් ගොඩ ගන්න පුළුවන් තත්ත්වයක නොවෙයි රට තිබෙන්නේ. මුළු පාර්ලිමේන්තුවම එපා කියන තත්ත්වයට අද රට පත් වෙලා තිබෙනවා. මොකක්ද දැන් කරන්න ඕනෑ? සාම්ප්‍රදායිකව IMF එකට ගිය එක ගැන අපේ විවාදයක් නැහැ. නමුත් IMF එක කියන්නේ දේවාලයක් නොවෙයි.

මෙවැනි වාතාවරණයක් තුළ විසඳුම තිබෙන්නේ, අප තුළමයි. මේ අවස්ථාවේ මුදල් ඇමතිවරයා මේ ගරු සභාවේ නැහැ. පසුගිය අවුරුදු 15ක කාලය අරගෙන බැලුවොත්, අපට තිබුණු ඉතාම වාසි සහගත කොන්දේසිය තමයි, එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලින් තිරසාර සංවර්ධන ප්‍රතිපත්තියකට ණය ලබා ගන්න එක. ඒ ගැන ව්‍යාපෘතියක් ලියා තිබෙනවාද? ඒ ගැන වැඩසටහනක් සකස් කර තිබෙනවාද? ඒකෙන් රුපියල් බිලියන 100ක් අවුරුද්දකට වෙන් කරනවා. අපි ඒ මුදල අරගෙන නැහැ. අපේ රටේ විදුලි උත්පාදනයේ විභවතාව ගැන බලන්න. අවුරුද්දකට ඩොලර් බිලියන 5ක ඉන්ධන, ගල් අඟුරු අපි පිට රටින් ගෙන්වනවා, වාහනවලට සහ විදුලිය ලබා ගැනීම සඳහා. මේ ඩොලර් බිලියන 5 අපට ඉතුරු කර ගන්න තිබුණා. අපේ රට ඩොලර් බිලියන 20ක සුළං බල විදුලි ධාරිතාවක් තිබෙන රටක්. ලෝකයේ වෙනත් කිසිම පුංචි රටකට මෙවැනි ශක්තියක් නැහැ. අපේ රට වටේටම මුහුද තිබෙන නිසාත්, දූපතක් නිසාත් තමයි සුළං බලයෙන් ඉතා පහසුවෙන් විදුලිය ලබා ගන්න පුළුවන් වෙන්නේ. ගණනය කර නැතත්, අඩු ගණනේ ඩොලර් බිලියන 5ක "සෝලා" විභවතාවක් තිබෙන රටක් තමයි අපේ රට. පසුගිය අවුරුදු හතක, අටක කාලය තුළ අපි ඒ පිළිබඳ කිසිම දෙයක් කළේ නැහැ. විදුලිය මෙගාවොට් 1,000ක් අපි නිෂ්පාදනය කළා නම්, අද අපට මෙවැනි විදුලි අර්බුදයක් පැන නඟින්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඒ විතරක් නොවෙයි. මමත් වගඋත්තරකරුවකු කරලා මට විරුද්ධව නඩුවක් පවරනවා කියනවා. මා ඒකට කැමැතියි. වස විසෙන් තොර ගොවිතැන වෙනුවෙන් අපි පෙනී සිටියා. මෙය වටිනා සංකල්පයක්. මුදල් නැති නිසා ආණ්ඩුව හිටි අඩියේ පැය විසිහතරෙන් මේ කටයුත්ත කරන්න ගියා. ඒකෙන් අපටත් පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයක් ඇති වුණා. අද ජනතාව මාර්ගයෙන් පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක්, දැවැන්ත ගොවිජන ව්‍යාපාරයක්, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අපි ඔක්කොම එකතුවෙලා ක්‍රියාත්මක කරන්න ඕනෑ. දැන් මේවා ගැන කථා කර-කර ඉන්න වෙලාවක් නොවෙයි. ආණ්ඩුවේ සිටියත්, නොසිටියත් ජාතික ව්‍යාපාරයක්, දේශපාලන ව්‍යාපාරයක්, සමාජ ව්‍යාපාරයක් හැටියට ඉදිරියේදී මේ රටට මුහුණ දෙන්න නියමිත දැවැන්තම අර්බුදය වන්නේ කන්න නැති වීමයි. තමිල්නාඩුවෙන් අපට හාල් ටිකක් එවාවි, චීනයෙන් හාල් එවාවි. ඒකේ සීමාවක් තිබෙනවා. ඉදිරියේදී අපි මුහුණ දෙන බලවත්ම අර්බුදය තමයි ආහාර අර්බුදය. ආහාර අර්බුදයකට අපට මුහුණ දෙන්න වෙනවා. ඒ අර්බුදයට මුහුණ දෙන්න නම්, දැවැන්ත වගා සංග්‍රාමයක් පටන් ගන්න ඕනෑ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීම නොවෙයි මේ අවස්ථාවේදී කළ යුත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන් මා කියන්නේ, මේ ආණ්ඩුවට විශ්වසනීයත්වයක් නැහැයි කියන එකයි. අග්‍රාමාත්‍යතුමා අස්වෙලා පොහොට්ටුවේම කෙනකුට හෝ කමක් නැහැ වෙනත් අගමැතිවරයකුට මේ පාර්ලිමේන්තුවේ නායකත්වය දුන්නා නම්, වෙනත් තත්ත්වයක් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන කරනවා. විපක්ෂය විශ්වාස භංග යෝජනා ගෙනෙන්න කථා කරනවා. විශ්වාස භංග යෝජනා ගෙනෙනවා නම්, එයට සහාය දෙන්න අපි කැමැතියි. හැබැයි, ඒ ගොල්ලන් ආණ්ඩුව අරගෙන ආණ්ඩුව පවත්වාගෙන යන්න ඕනෑ. එහෙම නැතුව රට අරාජික කරන විශ්වාස භංග යෝජනාවලට අපි සහාය දෙන්නේ නැහැ. විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ, බොර දියේ මාළු බාලා බලය ගන්න විතරක් නොවෙයි; වාචාලකමට ආණ්ඩුවට බනින්න විතරක් නොවෙයි. රටක් විධියට අපි මේ භයානක අර්බුදයට මුහුණ දෙන්න ඕනෑ. මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න තරම් වටිනවා තමයි. අපටත් ඕනෑ කරන්නේ ඒකයි. හැබැයි, විකල්පය මොකක්ද? විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න. ඒකට අපි සහාය දෙන්නම්. හැබැයි, බලය ලබාගෙන ප්‍රශ්න විසඳනවාය කියලා ඔබතුමන්ලා කියන්න. එහෙම නැතුව අරාජික වැඩවලට සම්මාදම් වෙන්න අපි සූදානම් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

[අ.භා.2.44]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින්, ලෝක බැංකුවෙන් ආධාර ලබා ගැනීමේ වැඩසටහන, එහෙම නැත්නම් ණය ලබා ගැනීමේ

වැඩසටහන පිළිබඳ වාර්තාවක් වර්තමාන මුදල් අමාත්‍යවරයා ඉදිරිපත් කරමින්, අද පාර්ලිමේන්තුව තුළ කථාවක් කළා. එහිදී අද අපි මුහුණ පා තිබෙන තත්ත්වය ගැන හිටපු මුදල් අමාත්‍යවරුන් දෙදෙනාටම වඩා එතුමා මේ පාර්ලිමේන්තුවට ඇත්ත තත්ත්වය ප්‍රකාශ කිරීම මා අගය කරනවා.

එතුමාගේ කථාවේදී එතුමා පිළිගත්තා, වර්තමාන රජය බලයට පත් වීමෙන් පසුව ලබා දුන් බදු සහනය තුළින් අපේ ආදායම විශාල වශයෙන් අඩු වුණා කියලා. හැබැයි, ඒ බදු සහනය දෙනකොටත් එතුමා අමාත්‍යවරයකු වශයෙන් කැබිනට් මණ්ඩලයේ සිටියා. ඒ බදු සහනය තුළින්, ඒ බදු කප්පාදුව තුළින් තමන්ගේ ගජ මිතුරන්ට සහන ලබාදීම නිසා වසර දෙකක් තුළ රුපියල් බිලියන 1,000ක පමණ ආදායමක් අපට අහිමිවෙලා තිබෙනවා.

අපට ණය ගෙවා ගන්න බැහැ, ආදායම් නැහැ කියන ඒ තත්ත්වය තුළ තමයි ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වලින් -ඒආයතන තුනෙන්ම- අප පහළට දමලා ඉතාම අසරණ තැනකට පත් කළේ. අද මේ වනකොට අපේ රටේ ජනතාව පාරට බැහැලා ජනතාවට ජීවත් වෙන්න බැහැ කියන කාරණය කියනවා. අද ඔවුන්ගේ අත්‍යවශ්‍ය කාරණා ඉටු වෙන්නේ නැහැ. අවශ්‍ය ඉන්ධන ටික ලබා ගන්න මේ වනකොටත් ජනතාව පෝලිම්වල ඉන්නවා. ගෑස් ටික, කිරි පිටි ටික නැහැ. මේ වනකොට බෙහෙත් හිඟය නිසා ලෙඩ්ඩු මැරෙන තැනට පත් වෙලා තිබෙනවා. මීට එහා වෙන්න දෙයක් නැහැ.

ඒ නිසා තමයි රටේ ජනතාව ජනාධිපතිවරයාගේ ගේ ළඟට ගිහිල්ලා ජනාධිපතිවරයාට ගෙදර යන්න කියලා කියන්නේ. දැන් මාසයක් තිස්සේ රටේ තරුණයන් Galle Face එකේ "GotaGoHome" කියලා ගම්මානයක් හදාගෙන ඉන්නවා. රට පුරාම ජනතාව, ඒ වාගේම මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේත් නගර ගණනාවක ජනතාව ජනාධිපතිවරයාට ගෙදර යන්න කියලා කියනවා. ඒ විතරක් නොවෙයි. ශ්‍රී ලාංකිකයන් ජීවත් වන ඇමෙරිකා එක්සත් ජනපදය ගත්තත්, යුරෝපයේ රටවල් ගත්තත් එහෙමයි. ඊයේ මාධ්‍ය තුළින් අපි දැක්කා, මේ රාජපක්ෂ පවුල් පාලනය අවසන් කරන්න කියලා රටවල් ගණනාවක උද්ඝෝෂණ පැවතුණ බව. ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත හතළිස්හතක, ස්ථාන පනහක උද්ඝෝෂණ සිදු කළා. මෙවැනි තත්ත්වයක් අපි කවදාවත් දැකලා නැහැ. රට තුළ පමණක් නොවෙයි, රටින් පිටත ශ්‍රී ලාංකිකයන් ජීවත් වන සෑම ස්ථානයකම ඒ අය එකතු වෙලා මොකක්ද කියන්නේ? මේ රාජපක්ෂ ආණ්ඩුවට ගෙදර යන්න කියනවා.

අද උදේ මුදල් ඇමතිවරයා පිළිගත්තා, අද තිබෙන මේ අවාසනාවන්ත තත්ත්වය උද්ගත වෙන්නේ වර්තමාන ආණ්ඩුව ගත්ත යම් ක්‍රියාමාර්ග නිසා බව. ඊට පෙර ඉඳලා තිබෙන ක්‍රියා මාර්ග ගැනත් එතුමා කථා කළා. අපි විපක්ෂය හැටියට එදා කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න කියලා. පසු ගිය අය වැයටත් කලින් -අවුරුද්දකටත් කලින්- විපක්ෂ නායකතුමා මෙතැනදී ඒ ගැන කථා කරලා කිව්වා, අපට මතකයි. එතකොට මේ ඉස්සරහ පෙළේ එවකට හිටපු ඇමතිවරු කිව්වේ මොකක්ද? එතකොට හිටපු මුදල් ඇමතිවරයා කිව්වේ මොකක්ද? ඒවා සමච්චලයට ලක් කළා. විපක්ෂය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අප තල්ලු කරන්න හදනවා කිව්වා. එහෙම චෝදනා කළා. හැබැයි වර්තමාන මුදල් ඇමතිවරයා අද පිළිගත්තා, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න ප්‍රමාද වුණා, ඒක ලොකු වැරැද්දක් බව. එතුමා කරුණු දෙකක් පිළිගත්තා. එකක් බදු කප්පාදු කිරීම. අනෙක, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න ප්‍රමාද වීම.

ජනාධිපතිවරයා මේ ළඟදී ජාතිය අමතලා රසායනික පොහොර තහනම් කිරීමට එක රාත්‍රියකින් ගත්ත තීන්දුව වැරැද්දක් කියලා පිළිගත්තා. එහෙම පිළිගත්තාය කියලා හරි යනවාද? මේ හේතුව නිසා අද මේ රටේ කෘෂිකර්මාන්තයට, ගොවියාට මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? ඔවුන්ගේ අස්වැන්න සියයට 50කින්, 60කින් අහිමි වෙලා, ආදායම අහිමි වෙලා, අසරණ වෙලා සිටිනවා. දැන් මේ වනකොට මේ කන්නයේ වැඩ කටයුතු පටන් අරගෙන තිබෙනවා. නමුත් කෝ පොහොර? ඒ ගත්ත තීන්දු තීරණ නිසා රටේ සමස්ත ජනතාව ලක්ෂ දෙසිය විසිදෙකක් අද පාරට වැටිලා අනාථ වෙලා සිටිනවා. එතකොට මුදල් ඇමතිවරයා හෝ ජනාධිපතිවරයා හෝ "අපි ගත්ත තීන්දු තීරණ වැරදියි" කියලා පිළිගත්තාට හරි යන්නේ නැහැ. ඒ ගත්ත තීන්දු නිසා තමයි අද මේ රටට මෙවැනි අවාසනාවන්ත තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. ඒ වගකීමෙන් ආණ්ඩුවට බැහැර වෙන්න බැහැ.

ඉස්සර වෙලා කථා කළ මන්ත්‍රීතුමා කිව්වා විපක්ෂය වගකීම් භාර ගන්නේ නැහැ කියලා. මතක තියා ගන්න, පසුගිය ජනාධිපතිවරණයේදී තමුන්නාන්සේලා මේ රටේ ජනතාව මුළා කරලා, ජාතිය, ආගම ඉස්සරහට දමාගෙන, සිංහල, බෞද්ධ කියලා නොයෙකුත් දේවල් කළා. කැලණියේ සිද්ධිය අපි දැක්කා. ඒ සිද්ධි ගැන අපි එකින් එක කථා කරන්න යන්නේ නැහැ. එහෙම කරලා ජනතාව රවටලා, ජාතිය, ආගම ඉස්සරහට ගෙනැල්ලා තමයි ඡන්ද ගත්තේ. ඒ වාගේම පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී තමුන්නාන්සේලා තුනෙන් දෙකකට ආසන්න ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තා. විපක්ෂයේ අපට ලැබුණේ මන්ත්‍රී ධුර පනස්හතරයි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී ඒකෙනුත් කණ්ඩායමක් ආණ්ඩුව පැත්තට එකතු කර ගත්තා.

එතකොට ඒ තත්ත්වය තුළ මොකක්ද වුණේ? ඇත්තටම පාර්ලිමේන්තුවේ ඉන්න 225න් හතරෙන් එකයි අපට ඉන්නේ. එහෙම නම් මොකක්ද මේ කථා කරන්නේ? තමන්ට දීලා තිබෙන වග කීම හරිහැටි ඉෂ්ට කරන්නේ නැතිව, ජනාධිපතිවරයාගේ ඉඳලා, මුදල් ඇමතිවරයා දක්වා අද කියනවා, මේවා අපට වෙච්ච වැරදි, අපට වෙච්ච අතපසුකම් කියලා. එහෙම අවාසනාවන්ත තත්ත්වයකට රට ඇදලා දාලා, රටේ ජනතාව ඇද දමලා අද කියනවා විපක්ෂය වග කීම ඉෂ්ට කරන්නේ නැහැ කියලා. විපක්ෂය වග කීම් හරියට ඉෂ්ට කර තිබෙනවා. විපක්ෂය අවුරුදු දෙකක් තිස්සේ තමුන්නාන්සේලාට මේවා කිව්වා. නමුත්, තමුන්නාන්සේලා උද්දච්චකමට ඒ එකකටවත් ඇහුම්කන් දුන්නේ නැහැ. මේ රටේ ජනාධිපතිවරයා ඒවාට ඇහුම්කන් දුන්නාද? ගොවියා පාරට බැහැලා පොහොර අවශ්‍යයි කියලා උද්ඝෝෂණය කරනකොට මොකක්ද කිව්වේ? විපක්ෂය අද ගොවියා පාරට ගෙනැල්ලා තිබෙනවා කිව්වා. විපක්ෂය මොනවා හරි දෙයක් ගැන ඇත්ත පෙන්නුවාම එදා මේ ඉදිරි පෙළේ හිටපු ඇමතිවරු ඒක දේශපාලනයට හරවාගෙන, වෙනත් කාරණාවලට හරවාගෙන වාචාලකමට අපට සමච්චල් කළ ආකාරය අපි දැක්කා. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද මුළු රටේම ජනතාව අසරණ කර තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, මේ වග කීමෙන් බැහැර වෙන්න කියලා. අද මේ රටේ සමස්ත ජනතාව කියනවා රාජපක්ෂ ආණ්ඩුවට ගෙදර යන්න කියලා. ජනාධිපතිවරයාට විතරක් නොවෙයි, මේ ආණ්ඩුවටම ගෙදර යන්න කියනවා. හැබැයි, ආණ්ඩුව මොකක්ද කරන්නේ? ආණ්ඩුව එක කණ්ඩායමක් ඉවත් කර කැබිනට් මණ්ඩලය හැටියට තවත් කණ්ඩායමක් පත් කර තිබෙනවා.

ඊයේ හවස් වෙනකල්ම මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ඉල්ලා අස් වෙනවා, ඒ ගැන අද ප්‍රකාශයක් කරනවා කියලා නොයෙකුත් ප්‍රචාර ගියා. නමුත්, ඊයේ කථානායකතුමාට අපි විශ්වාසභංග යෝජනා දෙකක් භාර දුන්නාට පසුව මොකක්ද කිව්වේ? අපි එහෙම අයින් වෙන්නේ නැහැ කිව්වා. ඒ නිසා මේ විශ්වාසභංග යෝජනාව ප්‍රමාද කරන්න තමයි, ඒ කථාව අරගෙන ගියේ කියන එක අපට පැහැදිලියි. ඒ නිසා අපි තමුන්නාන්සේලාට

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

කියනවා, රටේ ජනතාව රවටන්න ලැස්ති වෙන්න එපා කියලා. අද රටක් හැටියට අපි ඉතා අවාසනාවන්ත තැනකට ඇද දමන්න හේතු වුණේ තමුන්නාන්සේලා ගත්ත ක්‍රියාමාර්ග.

එදා ජනාධිපතිවරණය අවසන් වෙලා, පාර්ලිමේන්තු බලය අරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා. එක අතකින් අද මුදල් ඇමතිවරයා ලජ්ජා වෙන්න ඕනෑ. එතුමා එදා අධිකරණ ඇමතිවරයා හැටියට මේ ගරු සභාවේ කථා කළ ආකාරය මට මතකයි. විපක්ෂය හැටියට අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ජනාධිපතිවරයාට ඒකාධිපති බලයක් ලැබිලා, මේ ආයතන අතර තිබෙන සමතුලිතභාවය නැති වෙලා, පාර්ලිමේන්තු බලයත්, අධිකරණ බලයත් ජනාධිපතිවරයාට ලැබුණාම මේ තත්ත්වය ඇති වෙනවා කියලා පෙන්නුවාම මොකක්ද කිව්වේ? එදා අධිකරණ ඇමතිවරයා හැටියට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරමින් එතුමා කිව්වා, "එහෙම දෙයක් වෙන්නේ නැහැ, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ජනාධිපතිවරයා ප්‍රජාතන්ත්‍රවාදී විධියට ශක්තිමත් වනවා විතරක් නොවෙයි, රටට විශාල හයියක් ලැබෙනවා" කියලා. හැබැයි, අවුරුදු එකහමාරක්, දෙකක් යනකොට අද ඒ අධිකරණ ඇමතිවරයා මුදල් ඇමතිවරයා හැටියට කියනවා, "විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරලා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත ගෙනෙනවා නම් ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න අපි ලෑස්තියි" කියලා. ප්‍රමාද වෙලා හෝ නිවැරදි දේ අවබෝධ කර ගැනීම පිළිබඳව අපි එක අතකින් සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ආණ්ඩුව බලයට පත් වුණු තැන ඉඳලා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු තැන ඉඳලා ජනාධිපතිවරයා වැඩ කළේ කොහොමද? තමන් කථා කරන දේ තමයි මේ රටේ නීතිය කියලා එක වෙලාවක එතුමා කිව්වා. තමන්ගේ කණ්ඩායම විධියට කිහිපදෙනෙක් එකතු කරගෙන මේ රටේ සිටින විශේෂඥයන් කියපු හැම දෙයක්ම අයින් කරලා මහන්තත්ත්වකමට මම තමයි හරි දේ කරන්නේ, මම තමයි හොඳටම කරන්නේ කියලා හිතාගෙන වැඩ කළ නිසා තමයි මේ රට අද අවාසනාවන්ත තැනකට ඇදලා තිබෙන්නේ. අද මේ රටේ සමස්ත ජනතාවම ඉල්ලන්නේ මොකක්ද? ගෝඨාභය රාජපක්ෂ ගෙදර යන්න, මහින්ද රාජපක්ෂ ඇතුළු රාජපක්ෂ පවුල් පාලනය අවසන් කරලා මේ රටේ අලුත් යුගයක් නැවත ආරම්භ කරන්න කියලායි. අන්න ඒ සඳහා අපි ඉදිරිපත් කර තිබෙන විශ්වාසභංග යෝජනා දෙකට මහජන නියෝජිතයන් හැටියට සහයෝගය දීලා, අවශ්‍ය කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.

මට කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.54]

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැවැන්ත ආර්ථික සහ විදේශ විනිමය අර්බුදයකට මුහුණදෙමින් සිටින අවස්ථාවකයි අද අපි ඉන්නේ. අද උදෑසන අපි දැක්කා ගරු මුදල් අමාත්‍යතුමා මේ රට වර්තමානයේ මුහුණ දෙමින් සිටින අර්බුදය පිළිබඳව ඉතා හොඳ පැහැදිලි කිරීමක් කරනවා. නමුත්, මේ පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරුන් කරන කථා දිහා බැලුවාම ගරු මුදල් අමාත්‍යතුමා පැහැදිලි කළ මේ අර්බුදය හරි තැනින් අල්ලාගෙන නැහැ කියලා මා විශ්වාස කරනවා. ඇත්තටම මේ අර්බුදය මොකක්ද? අද ජනතාව පාරට බැහැලා ඩීසල් ටික ඉල්ලනවා, පෙට්‍රල් ටික ඉල්ලනවා, ගෑස් ටික ඉල්ලනවා, පෝලිම් නැති කරන්න කියා ඉල්ලනවා. සෞඛ්‍ය ඇමතිතුමා ඩොලර් හොයාගෙන ඖෂධ ගන්න විශාල කාර්යභාරයක් සිදු කරනවා. ඇත්තටම මේ අර්බුදය පටන් ගත්තේ විදේශ විනිමය අර්බුදයකින්.

පසුගිය කාලයේ මේ විදේශ විනිමය අර්බුදය නිසා ඇති වුණු බලශක්ති අර්බුදය නිසා ජනතාවට පාරට බහින්න සිදු වුණා; පෝලිම් ඇති වුණා; ඩීසල් නැති වුණා; ගෑස් නැති වුණා. ඒ කාරණා මත එළියට බැහැපු ස්වාධීන ජනතාව දේශපාලන විසඳුම් ඉල්ලුවේ නැහැ. පාරට බැහැලා, නගරවල බෝඩ් අල්ලාගෙන හිටපු ඒ ස්වාධීන ජනතාව මුල් කාලයේදී කවුරුවත් මෙහෙය වූවේ නැහැ. ඔවුන් ඉල්ලුවේ ගෑස් ටික, ඩීසල් ටික දෙන්න කියායි. නමුත් අද ඒක අස්සට දේශපාලනක් රිංගා තිබෙනවා. පීඩනයට පත් වෙලා හිටපු ජනතාවට මුවා වෙලා, තමන්ගේ පටු දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගන්න අද විවිධ පාර්ශ්ව උත්සාහ කරනවා. අද අපි මේ පාර්ලිමේන්තුවේදී මොකද කරන්නේ? අද කියනවා, විශ්වාස භංග යෝජනා ගෙනෙන්න, දෝෂාභියෝග ගෙනෙන්න කියලා. නියෝජ්‍ය කථානායකවරයෙකු පත් කරන්න හෙට ඡන්දයක් පවත්වනවා. හෙට නියෝජ්‍ය කථානායකවරයෙකු පත් කළාට පසුව අපට ඩොලර් ලැබෙනවාද? අගමැතිතුමා හෙට ධුරයෙන් අස් වුණොත් අපට ඩොලර් ලැබෙනවාද? ජනාධිපතිතුමා ඉවත් වෙලා ගියොත් අපට ඩොලර් ලැබෙනවාද? අපට තිබෙන්නේ විදේශ විනිමය අර්බුදයක්. ඒ නිසා අපි මේ ප්‍රශ්නය හරි තැනින් අල්ලා ගන්න ඕනෑ. හරි තැනින් මේ ප්‍රශ්නය අල්ලාගෙන නිසි විසඳුම් ලබා දෙන්න ඕනෑ.

සර්ව පාක්ෂික ආණ්ඩු ගැන කථා කරනවා. "කරුණාකරලා මේ වැඩේ කරන්න එපා. උන්ඩියල් හරහා මුදල් එවන්න එපා. හවාලා හරහා මුදල් එවන්න එපා. රාජ්‍ය බැංකු පද්ධතිය හරහා මුදල් එවන්න" කියලා සියලු පක්ෂ එකතු වෙලා මාධ්‍ය හමුවක් පවත්වලා විදේශ ශ්‍රමිකයන්ට කියන්න පුළුවන් වුණාද? සර්ව පාක්ෂික ආණ්ඩු හදලා දැන් මොකක්ද කරන්න යන්නේ? අඩු ගානේ මාධ්‍ය හමුවකට එකට වාඩි වෙන්න බැරි පක්ෂ ඔක්කොම එකතු වෙලා මේ රටේ ප්‍රශ්න විසඳයිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ ප්‍රශ්න හරි තැනින් අල්ලා ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. අපි දේශපාලන ප්‍රශ්න පසුව විසඳා ගනිමු. අපි, අපේ ආණ්ඩු පසුව හදා ගනිමු. අපේ ජනතාවට අවශ්‍ය ඩීසල් ටික ලබාදීලා, ඒ අයගේ මූලික අවශ්‍යතා ටික සපුරාදීලා රටේ උද්ඝෝෂණය නවත්වා ගන්න අපි ඔක්කොම එකතු වෙලා වැඩ කරමු කියලා මම මතක් කරනවා.

විශේෂයෙන්ම අපේ රටට ලැබෙන විදේශ විනිමයවලින් වැඩි ප්‍රතිශතයක් අපි මේ වෙනකොට පාවිච්චි කරන්නේ විදුලිබල අවශ්‍යතාව සඳහායි. අපි ඩීසල් ගෙනෙනවා, දැවි තෙල් ගෙනෙනවා, ඒවා පාවිච්චි කරලා විදුලි බලය ලබා දෙනවා මිසක් විදේශ විනිමයවලින් වැඩි ප්‍රතිශතයක් අපේ රටේ අනික් දේවලට යොමු කරන්නේ නැහැ. ඒ නිසා මම ගරු විදුලිබල අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපි වහාම විකල්ප බලශක්තිය සඳහා යොමු විය යුතුයි කියා. වසර ගණනාවක් තිස්සේ ප්‍රමාද කරලා තිබෙන ජල විදුලි බලාගාර, සුළං විදුලි බලාගාර, සූර්ය බලාගාර, උදම් රළ බලාගාර -මේ සියල්ල- වහාම අපි සක්‍රිය කළ යුතුයි. මේ සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වැඩසටහන් වහාම අපි ක්‍රියාත්මක කළ යුතුයි. අපි මේ දේශපාලන

අර්බුද පසුව විසඳා ගනිමු. අපි මේ මොහොතේ කළ යුතු අවශ්‍යම කටයුතු වහාම ක්‍රියාත්මක කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මාතෘ භූමිය සියලු සම්පත්වලින් සපිරි භූමියක්. අපේ රටේ භූමියෙන් සෑම වර්ග අඩියකටම පැය 24න්, පැය 12ක්ම ඉර එළිය ලැබෙනවා. මේ සෑම වර්ග අඩියකින්ම අපට ඩොලර් වියදම් නොකර ප්‍රයෝජන ගන්න පුළුවන්. මේ සෑම වර්ග අඩියකටම හිරු එළිය වැටෙන නිසා අපට ඩොලර් හොයන්න පුළුවන්. මේ රට හරහා හමා යන හැම සුළං ධාරාවකින්ම අපට ඩොලර් හොයන්න පුළුවන්. මධ්‍යම කඳුකරයේ ඉහළ සිට පහළට ගලා එන හැම වතුර ලීටරයකින්ම නැවත නැවතත් විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් වාගේම ඒ හරහා විශාල විදුලි ප්‍රමාණයක් ඉතුරු කර ගන්න පුළුවන්. මේ සියලු සම්පත් ටික එකතු කරලා විදුලිය නිෂ්පාදනය කළොත් මට කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා වාගේ වර්ෂයකට රුපියල් බිලියන පහක මුදලක් අපට ඉතුරු කරන්න පුළුවන්. 1977ට කලින් මේ රටේ කඳුකරයේ කුඩා හා ක්ෂුද්‍ර ජල විදුලි බලාගාර 1,000කට අධික ප්‍රමාණයක් තිබුණා. 1977දී හඳුන්වා දුන් විවෘත ආර්ථිකයත් එක්ක තේ වතු තුළ තිබුණු කුඩා හා මධ්‍ය පරිමාණ සියලු බලාගාර එකින් එක වැහිලා ගියා. මීට දශකයකට පමණ කලින් තමයි ආපසු කුඩා ජල විදුලි බලාගාර හැදීම ආරම්භ කළේ.

විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය ගැන කථා කරද්දී අපි කියන්න ඕනෑ, මේ පුනර්ජනනීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට එරෙහිව වාගේම පුනර්ජනනීය බලාගාර ඉදි කිරීම නවත්වා දමන්න සැලසුම් සහගත ක්‍රියාවලියක් සිදු වන බව. අන්න එතැනදී අපට ලොකු වගකීමක් පැවරී තිබෙනවා. බලශක්ති ක්ෂේත්‍රයට සම්බන්ධ ඉංජිනේරුවරයෙකු වශයෙන් මම සූදානම්, අපේ දැනුම හා වෘත්තීයමය හැකියාව ලබා දීලා මේ කටයුතු සඳහා මැදිහත් වෙන්න වාගේම, මේ තුළ තිබෙන මාෆියාව පරාජය කරන්න. විශේෂයෙන්ම වෘත්තිකයන් වන අපට ජනතාව විශාල ඡන්ද ප්‍රමාණයක් ලබා දීලා පාර්ලිමේන්තුවට එව්වේ වෘත්තීය මුහුණුවරකින් මේ ප්‍රශ්නවලට මැදිහත් වෙලා, මෙම ප්‍රශ්න විසඳන්න කටයුතු කරයි කියන බලාපොරොත්තුවෙන්. අද වෘත්තිකයන් දහස් ගණනක් ලංකා විදුලිබල මණ්ඩලයේත්, ඒ හා සමාන ප්‍රමාණයක් බලශක්ති අමාත්‍යාංශයේත් තනතුරුවල නිරත වෙමින් පඩි ගන්නවා. නමුත් ඔවුන් මොකද කරන්නේ? ඔවුන් ආණ්ඩුවෙන් ආණ්ඩුවට මේ ප්‍රශ්නය ඉදිරියට අරගෙන යන්න ඉඩ දීලා, ඔවුන්ගේ වෘත්තීය නිපුණතාව මේ සඳහා යොමු කරන්නේ නැතිව රජයෙන් රුපියල් මිලියන ගණන්, රුපියල් බිලියන ගණන් පඩි අරගෙන සද්ද නොකර ඉන්නවා. එහෙම කරන්න බැහැ. ඔවුන්ට ලොකු වගකීමක් තිබෙනවා. ඔවුන් ඒ පඩි ගන්නේ, ඔවුන් ඒ රැකියාවේ යෙදෙන්නේ මේ බලශක්ති අර්බුදය විසඳන්නයි. ඒ නිසා අපි ඔවුන් එක්ක එකතු වෙලා මේ බලශක්ති අර්බුදය විසඳන්න අවශ්‍ය කටයුතු කරමු කියා මා මේ ගරු සභාවට යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වරාය හා නාවික ඇමතිතුමා එදා ප්‍රකාශයක් කළා. එතුමා කිව්වා, දැනට ලංකාවට එන විදේශ නැව් සමාගම් රුපියල්වලින් ගෙවන්නේ, එතුමා ඩොලර්වලින් ගන්න පියවර ගත්තා කියලා. දෙයියනේ! මෙච්චර කල් ගෙව්වේ රුපියල්වලින්ද? වරායේ නැගෙනහිර ජැටිය හදන්න කථා කරද්දී, බටහිර ජැටිය හදන්න කථා කරද්දී, හම්බන්තොට වරාය හදන්න කථා කරද්දී අපි සතුටු වුණා. අපි හිතුවා, ඒවායින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපේ රටට එනවා කියලා. අන්තිමට ඇමතිතුමා නියෝගයක් දෙනවා, දැන් වහාම ඩොලර්වලින් ගෙවන්න කියලා. වසර 74ක් තිස්සේ නාවුක ක්ෂේත්‍රය තුළ අපට ගෙව්වේ රුපියල්වලින්ද? මේවා සහගහන අපරාධ නොවෙයිද? ඖෂධ ගන්න සෞඛ්‍ය ඇමතිතුමා ඩොලර් හොයන්න රට වටේ දුවනවා; ලෝකය වටේ යනවා; මුදල් ඇමතිතුමා යනවා. හිටපු මුදල් ඇමතිතුමා ඉන්දියාවට ගිහිල්ලා විශාල සහනයක් අරගෙන ආවා. වර්තමාන මුදල් ඇමතිතුමා IMF එකට යනවා; ලෝකයේ හැම තැනටම යනවා. ජනාධිපතිතුමාගේ වචනයෙන්ම කියනවා නම්, හිඟන්නෙක් වාගේ හැම රටටම කථා කරලා ඩොලර් හොයනවා. අපේ රටට එන නැව් ටික අපට ගෙවන්නේ රුපියල්වලින්ලු! මොකක්ද මේ විහිළුව? ඒ නිසා කරුණාකර මේ ගැන හොයන්න. කවුද මේවාට වගකිව යුත්තේ කියලා හොයන්න. මේ වාගේ තව දේවල් ඇති. අපට ආරංචි වුණා, තේ වෙන්දේසියත් යන්නේ රුපියල්වලින් කියලා. මේ වාගේ දේවල් නිවැරදි කරන්න පුළුවන්. අපි ඒවා නිවැරදි කරමු කියලා මම යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව අද විශාල පීඩනයකට පත් වෙලා ඉන්නවා. ඩොලරයේ අගය ඉහළ යෑමත් එක්ක ජනතාව අද විශාල පීඩනයකට මුහුණ දෙමින් ඉන්නවා. ගරු මුදල් ඇමතිතුමා කියන විධියට ඩොලරයේ අගය කෘත්‍රිමව ඉහළ ගිහින් තිබෙන්නේ. අපි හැකි ඉක්මනට මේ අගය යළි රුපියල් 300ට වඩා අඩු සීමාවකට ගත්තේ නැත්නම්, ජනතාවට ඒක දරාගන්න බැරුව යනවා. එහෙම වුණොත් මේ චක්‍රය බිඳ වැටෙනවා. ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව බිඳ වැටෙනවා. ඒ නිසා අපි හැකි ඉක්මනට අවශ්‍ය පියවර ගත යුතුයි, වහාම ඩොලරයේ අගය රුපියල් 300ට වඩා පහළට ගන්න. අපට එහෙම කරගන්න බැරි වුණොත් මම දන්නේ නැහැ, මේ ආර්ථිකය කොච්චර දුරට ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයිද කියලා. අඩුම වශයෙන් රජයේ හා පෞද්ගලික අංශයේ අයට සියයට 60ක, 64කවත් පඩි වැඩි කිරීමක් කළ යුතු බව මා යෝජනා කරනවා. මම හිතන විධියට දැනටත් අපට වැටුප් ගෙවා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා, රජයේ ආදායමත් එක්ක. නමුත් අපට ඩොලරයේ අගය පහළට ගන්න බැරි වුණොත් මෙම චක්‍රය බිඳ වැටෙනවා. මෙම චක්‍රය බිඳ වැටුණොත්, මම හිතන විධියට මේ රට ගොඩ අරගෙන මෙතැනින් එහාට යන්න බැරි තැනට අරාජික තත්ත්වයට පත් වෙනවා.

අපි දන්නවා, රජයේ සේවකයෝ ඔවුන්ට ලැබෙන වැටුපෙන් වැඩට යන්න එන්න ඩීසල් පෙට්‍රල් ටික ගහගත්තාට පස්සේ ඔවුන්ගේ එදිනෙදා වියදම්වලට -ආහාර ටික මිලදී ගැනීමට පවා- ඉතුරු මුදල ප්‍රමාණවත් නොමැති බව. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපි ඔක්කෝම එකතු වෙලා, සියලු පක්ෂවල සියලුදෙනා එකතු වෙලා කටයුතු කරමු කියලා. අපට සර්ව පාක්ෂික ආණ්ඩු හදන්න ඕනෑ නැහැ. මේක අර්බුද අවස්ථාවක්. ඒ නිසා අපි ඔක්කෝම එකතු වෙමු. අපි එකතු වෙලා මේ ප්‍රශ්න ටික විසඳා ගෙන, ඊට පසුව අපි දේශපාලනය කරමු. එදාට කවුද හොඳටම කළේ කියලා හොයා ගෙන, ජනතාව ඔවුන්ට ඡන්දය දීලා බලය ලබා දේවි. ඒ නිසා මේ අවස්ථාවේ බලය පසුපස යන්න එපා කියා මා ඉල්ලා සිටිනවා.

මේක හොඳ අවස්ථාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ ස්වාධීන ජනතාව පාරට බැස්සා. අද ඒකට දේශපාලනික මුහුණුවරක් ඇවිත් තිබෙනවා. ස්වාධීන ජනතාව පාරට බැහැලා සාධාරණය වෙනුවෙන්, මේ රටේ දේවල් හරියට කරන්න කියා ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒකට පසුකාලීනව එකතු වුණු දේශපාලන බළල් අත් නැත්නම්, ඒක හොඳ ප්‍රවණතාවක්. දැන් පක්ෂ-විපක්ෂ මන්ත්‍රීවරු 225ම උපරිමයෙන් බැණුම් අහනවා. ජනතාව කියන්නේ මේවා නිවැරදි දේ කරන්න කියලායි. දේශපාලනිකව අපට ගන්න අපහසු තීරණ නමුත්, ජනතාවාදී රටක් වෙනුවෙන් දීර්ඝ කාලීනව මේ රටේ ජනතාව ශක්තිමත් වෙන අපහසු තීරණ ගැනීමට හොඳම අවස්ථාවක් අපට ලබා දීලා තිබෙනවා. මම හිතන විධියට මේ වාගේ අවස්ථා හැම දාම අපට ලැබෙන්නේ නැහැ. දේශපාලනිකව ගැනීමට අපහසු නමුත්, රට වෙනුවෙන් ගත යුතු නිවැරදි තීරණ ගැනීමට මෙය හොඳම අවස්ථාවක් කියා මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ செல்வராசா கஜேந்திரன் அவர்கள்.

[பி.ப. 3.05]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

மதிப்புக்குரிய தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ நிதி அமைச்சர் அவர்களால் சர்வதேச நாணய நிதியத்துடன் மேற்கொள்ளப்பட்ட உரையாடல்கள் தொடர்பான அவரின் கூற்று சபையில் முன்வைக்கப்பட்டது. அதற்குப் பிற்பாடு அந்தக் கூற்றுத் தொடர்பாக எதிர்த் தரப்பிலிருந்தும் ஆளும் தரப்பிலிருந்தும் பலர் பல்வேறுபட்ட கருத்துக்களை முன்வைத்திருக்கிறார்கள். இன்று இந்த நாடு வரலாற்றில் என்றுமில்லாத அளவுக்கு மிக மோசமான ஒரு பொருளாதார நெருக்கடியைச் சந்தித்திருக் கின்றது. மொத்த உள்நாட்டு உற்பத்தி வீழ்ச்சியடைந் திருக்கின்றது. அதேநேரம், அந்நியச் செலாவணிக் கையிருப்புத் தீர்ந்துபோயிருக்கின்றது. இந்த இரண்டு காரணங்களினாலும் இன்று மக்கள் சொல்லமுடியாத துன்பங்களையும் துயரங் களையும் அனுபவிக்கின்ற ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. அதற்குக் காரணம், தற்போதிருக்கின்ற ஆட்சியாளர்கள் முறைகேடான விதமாகக் கோடானுகோடி பணத்தைக் கொள்ளையடித்து, இந்த நாட்டைக் குட்டிச்சுவராக்கி யிருப்பதாகும். இதனை இன்று வீதியிலிருந்து போராடுகின்ற மக்கள் வெளிப்படையாகக் குற்றஞ்சாட்டிக் கூறிவருகிறார்கள். அதேநேரத்திலே, எதிர்க்கட்சியினரும் அந்த விடயங்களைக் கூறிக்கொண்டிருக்கின்றார்கள். ஆனாலும்கூடச் சுதந்திரத் துக்குப் பின்னரான 74 வருட அனுபவங்களை அடிப்படை யாகக்கொண்டு இந்தப் பிரச்சினைக்கான அடிப்படைக் காரணங்களை நிரந்தரமாகத் தீர்த்துவைப்பதற்கு அரசாங்கத் திடமோ அல்லது எதிர்த்தரப்பிடமோ ஏதாவது அணுகு முறைகள் இருக்கின்றதா? அது தொடர்பான பார்வை உண்டா? என்றால், "இல்லை" என்றுதான் சொல்ல வேண்டும்.

எங்களைப் பொறுத்தவரையிலே இந்த 74 ஆண்டுகளில், குறிப்பாக கடந்த 40 ஆண்டுகளாக இந்த நாட்டின் ஆட்சியைக் கைப்பற்றியவர்கள், தமிழர்களுடைய உரிமைகளை மறுப் பதற்காக, தமிழர்களை அழித்தொழித்து இந்தத் தீவைச் சிங்கள, பௌத்த தீவாக மாற்றுவதற்காகத் தங்களைத் தேசபக்தர் களாகக் காட்டிக்கொண்டு, "தமிழர்கள் இந்த நாட்டைப் பிரித்துவிடப் போகிறார்கள்" என்று சொல்லிச் சிங்கள மக்களை ஏமாற்றி ஆட்சிபீடத்தில் ஏறி, அந்த ஆட்சிபீடத்தில் இருந்துகொண்டு தங்களுடைய பொருளாதாரத்தை வளப் படுத்திக்கொள்ளுகின்ற, நாட்டைக் கொள்ளையடிக்கின்ற செயற்பாடுகளைத்தான் மேற்கொண்டு வந்திருக்கின்றார்கள். இந்தக் காலப்பகுதி முழுவதிலுமே வடக்கு, கிழக்கினுடைய பொருளாதாரம் திட்டமிட்ட ரீதியிலே முற்றாக அழிக்கப் பட்டிருக்கின்றது.

அதேநேரத்தில், தென்பகுதியிலே உங்களுடைய தேசத்தி னுடைய பொருளாதாரத்தை, மாறி மாறி ஆட்சிக்கு வந்த ஆட்சியாளர்கள் கொள்ளையடித்துக் கொள்ளையடித்து நாட்டைக் குட்டிச்சுவராக்கிக்கொண்டே வந்திருக்கின்றார்கள். குறிப்பாக, 2009 மே மாதத்தில் ஓர் இன அழிப்பைச் செய்து, தமிழ் மக்கள் மீதான அந்த இன அழிப்பு யுத்தத்தை ஒரு மாபெரும் போர் வெற்றியாக நீங்கள் கொண்டாடிய பிற்பாடான இந்த 13 வருடங்களில்கூட வடக்கு, கிழக்கி னுடைய பொருளாதாரம் இரண்டு அரசாங்கங்களினாலும் - அது ராஜபக்ஷ அரசாங்கமாக இருக்கலாம் அல்லது அதற்குப் பின்னர் வந்த நல்லாட்சி அரசாங்கமாக இருக்கலாம் - திட்டமிட்டு அழிக்கப்பட்டிருக்கின்றது. இலங்கையினுடைய மூன்றிலிரண்டு பங்கு கடல் பிரதேசம் வடக்கு, கிழக்கில் இருந்தபோதும்கூட, அந்தக் கடற் பிரதேசத்திலே தொழில் புரியும் தமிழர்களைப் பொருளாதார ரீதியாக முன்னேற விடாமல் அழிக்கின்ற செயற்பாடுகள் இந்த இரண்டு அரசாங்கங்களினாலும் திட்டமிட்ட ரீதியிலே மேற் கொள்ளப்பட்டு வந்திருக்கின்றன. அதேபோன்று, கிட்டத்தட்ட இருபது இலட்சம் தமிழர்கள் புலம்பெயர் தேசங்களிலே வாழ்கின்றபோதும்கூட அவர்களுடைய பொருளாதாரத்தை இங்கே கொண்டுவந்து இந்தத் தேசத்தை முன்னேற்று வதற்கான, வடக்கு, கிழக்கை முன்னேற்றுவதற்கான முயற்சிகள் தொடர்ச்சியாகத் தடுக்கப்பட்டு வந்திருக்கின்றன.

அந்தக் காலப்பகுதியிலே பாதுகாப்புச் செலவினங் களுக்கான ஒதுக்கீடு என்பது கிட்டத்தட்ட 15 வீதமாக உங்களால் மேற்கொள்ளப்பட்டு வந்திருப்பது மாத்திரமல்ல, அதனுடைய ¾ பங்கு வடக்கு, கிழக்கிலே தமிழர்கள் மீதான ஒடுக்குமுறைகளைத் தொடர்வதற்காகத்தான் பயன்படுத்தப் பட்டிருக்கின்றது. இவ்வாறான செயற்பாடுகள் காரணமாக இந்த நாட்டினுடைய வளர்ச்சியிலே பெரும் பங்களிப்புச் செய்யக்கூடிய வடக்கு, கிழக்குத் தமிழர் தேசம் அவ்வாறு பங்களிப்புச் செய்ய முடியாமற்போனது மட்டுமல்லாமல், அவர்களுடைய பொருளாதாரம் திட்டமிட்ட ரீதியிலே அழிக்கப்பட்டிருக்கின்றது. இந்தப் பிரச்சினையைக் கையாள் வதற்குக் கௌரவ நிதியமைச்சர் அவர்களினால் முன்வைக்கப் பட்டிருக்கின்ற யோசனைகள் ஒருபோதும் கைகொடுக்கப் போவதில்லை. ஏனென்றால், அவர் நீதியமைச்சராக இருந்த கடந்த ஒன்றரை வருட காலப்பகுதியிலே அவர் முன்மொழிந்திருந்த அரசியலமைப்புக்கான 20ஆவது திருத்தச் சட்டம், இந்தக் கொள்ளையர்களுக்கு அளவுக்கதிகமான அதிகாரங்களை வழங்கியிருக்கின்றதே தவிர, ஒருபொழுதும் நாட்டிலே இன நல்லிணக்கத்தை ஏற்படுத்துவதற்கோ அல்லது இந்த நாட்டை முன்னேற்றுவதற்கோ வழிவகுத்திருக்க வில்லை.

அதேபோன்று, இன்று அரசியலமைப்புக்கான 19ஆவது திருத்தச் சட்டம் மீண்டும் கொண்டுவரப்பட வேண்டும் என்று சொல்லப்படுகின்றது. அந்த 19ஆவது திருத்தச் சட்டம் நடைமுறையில் இருந்தபொழுதும், இந்த நாட்டினுடைய கோடானுகோடி பணம் கொள்ளையடிக்கப்பட்டிருக்கின்றது. அவ்வாறு கொள்ளையடித்தவர்களுக்கு எதிராக இந்தப் பாராளுமன்றத்திலே கொண்டுவரப்படவிருந்த நம்பிக்கை யில்லாத் தீர்மானங்களிலிருந்துகூட அவர்கள் பாதுகாக்கப் பட்டிருக்கின்றார்கள். உங்களுடைய இத்தகைய அணுகு முறைகள் மற்றும் செயற்பாடுகள் ஒருபொழுதும் இந்த நாட்டை முன்னேற்றப் பாதையில் கொண்டுசெல்வதற்கு உதவியிருக்க வில்லை; இப்பொழுது நீங்கள் எடுக்கின்ற தீர்மானங்களும் உதவப்போவதில்லை. ஆகவே, எங்களைப் பொறுத்த வரையிலே நாங்கள் உங்களுக்குத் தெளிவாகச் சொல்ல விரும்புகின்ற ஒரு விடயம் என்னவென்றால், முதலில் நீங்கள் இந்த இனவாத மனநிலையிலிருந்து விடுபட வேண்டும் என்பதைத்தான். அதாவது, இன்று எதிர்க்கட்சியினர் ஆளுங்கட்சிக்கு எதிராகச் சொல்லுகின்ற கருத்துக்கள் மக்கள் மத்தியிலே கவர்ச்சிகரமானதாகத்தான் இருக்கின்றது. ஆளுங்கட்சியினர் குடும்பமாகச் சேர்ந்து நாட்டை அழித்திருக் கின்றார்கள்; இன்ன இன்ன இடங்களிலே பணத்தைக் கொள்ளையடித்து அதனைச் சேமித்தும் முதலீடு செய்தும் வைத்திருக்கின்றார்கள் என்று சொல்லுகின்றபொழுது,

அவையெல்லாம் நாட்டிலே போராடுகின்ற மக்களுக்கு மிகவும் உற்சாகம் அளிக்கின்ற செய்திகளாகத்தான் இருக்கின்றன.

ஆனால், இந்த மாதிரியான செயற்பாடு இந்த அரசாங் கத்தில் மட்டும் நடைபெறவில்லை; கடந்த காலங்களிலும் நடைபெற்றிருக்கின்றது. நல்லாட்சி அரசாங்கத்தின்போது இடம்பெற்ற மத்திய வங்கி ஊழல் தொடர்பாக அப்போதைய எதிர்க்கட்சியினர் பேசுகின்றபொழுது, அவர்கள் மிகப் பெரியதொரு விடயத்தை அம்பலப்படுத்திவிட்டதாகவும் அவர்கள் ஆட்சிக்கு வந்தால் ஊழல் மோசடிகள் இல்லாமல் பரிசுத்தமாக இந்த நாட்டை ஆட்சி செய்வார்கள் என்றும் இந்த மக்கள் நம்பவைக்கப்பட்டார்கள். ஆனால், நடந்தது என்ன? அவர்கள் ஆட்சிக்கு வந்து, முன்னிருந்தவர்களைவிடப் பல மடங்கிலான கோடிகளைக் கொள்ளையடிக்கின்ற செயற்பாடு களைத்தான் முன்னெடுத்துக்கொண்டு வருகின்றார்கள். இவர்களுடைய இந்தக் களவுகளையும் இத்தகைய செயற்பாடு களையும் மறைப்பதற்கு, ஒருபுறத்திலே "சர்வதேச சமூகம் தேசிய வீரர்களைத் தூக்குமேடைக்குக் கொண்டுசெல்லப் போகின்றது" என்று சொல்வதும், மறுபுறத்தில், "தமிழர்கள் நாட்டைப் பிடித்துத் தனிநாடு ஆக்கப்போகின்றார்கள், அதனால் சிங்களவர்களுக்கு நாடு இல்லாமற்போகப் போகின்றது" என்று பொய்களைச் சொல்வதும்தான் இவர்களுடைய முதலீடாக இருந்துவந்திருக்கின்றது. ஆகவே, இந்தப் போக்கை நீங்கள் மாற்றிக்கொள்ளவேண்டும்.

இன்று இந்த விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றிய எதிர்க்கட்சியினுடைய சில முக்கியஸ்தர்கள்கூட donor conference நடாத்தப்படவேண்டும் என்பதைப் பற்றி இங்கே கதைத்திருக்கின்றார்கள். ஆனால், இந்த நாட்டிலிருந்து உங்களுடைய இனவாதச் செயற்பாடுகள் காரணமாக வெளியேற்றப்பட்டு வெளிநாடுகளிலே புலம்பெயர்ந் திருக்கின்ற கிட்டத்தட்ட 20 இலட்சம் வரையான தமிழர்களில் பலர் கோடிகளுக்குச் சொந்தக்காரர்களாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அவர்கள் இந்த நாட்டுக்குள் தங்களுடைய நிதிகளைக் கொண்டுவருவார்களாக இருந்தால், இந்த நாட்டைத் தற்போது ஏற்பட்டிருக்கும் நெருக்கடியிலிருந்து மீட்டெடுக்கமுடியும். ஆனால், அந்தப் புலம்பெயர்ந்த மக்களுடைய அந்த உதவியை - அந்தப் பணத்தை இந்த நாட்டுக்குள் கொண்டுவருவது தொடர்பான சிந்தனைகள் எதுவுமே உங்களிடம் கிடையாது. ஏனென்று சொன்னால், , புலம்பெயர் தமிழர்களுடைய பணத்தை எமது நாட்டுக்குக் கொண்டுவந்தால், தமிழர்களுடைய பொருளாதாரப் பலம் தமிழர்களுக்குத் தெரிந்துவிடும், சிங்கள மக்களுக்கும் தெரிந்துவிடும். அதனால், தமிழர்கள் தங்களுடைய அரசியல் விடுதலை என்ற நிலைப்பாட்டிலே உறுதியாக நிற்பார்கள் என்பது உங்களுக்கு நன்றாகத் தெரியும். அந்த விடயத்தைத் தொட்டுக்கூடப் பார்க்கக்கூடாது என்பதிலே கவனமாக இருக்கின்றீர்கள்.

எங்களுடைய கோரிக்கைகளை நிறைவேற்றுங்கள்! இந்த நாட்டினுடைய ஒற்றையாட்சி அரசியல் அமைப்பை நீங்கள் மாற்றுங்கள்! பௌத்த இனவாதச் சிந்தனையைக் குழிதோண்டிப் புதையுங்கள்! இந்த நாட்டிலே தமிழர்களுடைய தேசத்தை நீங்கள் அங்கீகரியுங்கள்! தமிழ்த் தேசத்தை அங்கீகரித்து புதிய ஓர் அரசியலமைப்பைக் கொண்டு வாருங்களென்றுதான் நாங்கள் உங்களிடம் கேட்கின்றோம், 19ஆவது திருத்தத்தை மீளக்கொண்டுவருதல் என்ற பெயரிலே நீங்கள் கொண்டுவரப்போகின்ற 21ஆவது திருத்தச் சட்டம் ஒருபொழுதும் உங்களை இந்த நெருக்கடியிலிருந்து காப்பாற்றப்போவதில்லை. மாறாக, இன்னுமொரு தரப்பு ஆட்சியைக் கைப்பற்றுவதற்கு மட்டும்தான் அது வழிவகுக்கும். அவ்வாறு ஆட்சிக்கு வருகின்ற தரப்பினரும் அந்தக் கொள்கை களையும் கொள்ளைகளையும் தொடர்ந்து செய்துகொண்டு தான் இருக்கப்போகின்றனர். இந்த நாடு உருப்பட வேண்டுமாக இருந்தால் உங்களுடைய 74 ஆண்டுகாலப் பாதையை நீங்கள் மாற்றிக்கொள்ளுங்கள்! வடக்கு, கிழக்கிலே இராணுவக் கட்டமைப்புக்களை வைத்துக்கொண்டு தமிழர் களைத் தொடர்ந்தும் அடிமையாக்கி அவர்களைப் பொருளாதார ரீதியாக முன்னேறவிடாமல் ஒடுக்குகின்ற செயற்பாடுகளை உடனடியாக நிறுத்துங்கள்! எங்களுடைய தேசத்தை அங்கீகரித்து, இந்த ஒற்றையாட்சி அரசியல் அமைப்பை ஒழித்து, ஒரு சமஷ்டி அரசியல் அமைப்பை உங்களால் கொண்டுவர முடியுமாக இருந்தால், புலம்பெயர்ந்து வெளிநாடுகளில் வாழுகின்ற இலட்சக்கணக்கான தமிழர் களுடைய கோடானுகோடி பணம் இந்த நாட்டுக்குள் வரும். அதாவது, வட, கிழக்கு தேசத்தினுடைய முன்னேற்றத்திற்காக அப்பணம் வருகின்றபொழுது, ஒட்டுமொத்தமான நாடும் முன்னேறும்.

நீங்கள் பல்லாயிரம் கோடிகளைச் செலவழித்து எங்களுடைய இனத்தின்மீது யுத்த அழிவுகளை மேற்கொண்ட பொழுது அந்த இனவழிப்பில் இருந்து எங்களுடைய இனத்தைத் தற்காத்துக்கொள்ளுகின்ற அந்தப் போராட் டத்திற்கு எங்களுடைய தேசியத் தலைவர் பிரபாகரன் தலைமையிலான புலிகள் இயக்கம் கிட்டத்தட்ட நீங்கள் பயன்படுத்தியதைவிடவும் முப்பதில் ஒரு பங்குக்குக் குறைவான பணத்தைப் புலம்பெயர் மக்களிடம் இருந்து பெற்றுப் பயன்படுத்தியிருந்தது. ஆனால், நீங்கள் அதைவிட 30 மடங்கிற்கும் அதிகமான நிதியை எங்களுடைய இனத்தை அழிப்பதற்காகப் பயன்படுத்தியிருக்கின்றீர்கள். இனத்தைக் காப்பதற்கு அந்தப் போராட்டத்திற்கு நிதி வழங்கியதுபோன்று இன்று புலம்பெயர் தமிழர்கள் இந்த நாட்டினுடைய முன்னேற்றத்திற்கும் நிதி வழங்கத் தயாராக இருக்கின்றார்கள். ஆனால், எங்களுடைய தேசம் அங்கீகரிக்கப்பட வேண்டும்.

இன்று இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற இந்தப் பொருளாதார நெருக்கடிக்காகத் தமிழக முதல்வர் மு.க. ஸ்டாலின் அவர்கள் இந்த நாட்டு மக்களுக்கு உதவ முன்வந் திருப்பதை நாங்கள் வரவேற்கின்றோம்; மகிழ்ச்சியடை கின்றோம். ஆனால், இச்சந்தர்ப்பத்தில் நான் அவரிடம் விநயமாக ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன். நீங்கள் உணவுக்காக வழங்குகின்ற உதவிகளை ஒரு குறிப்பிட்ட அளவிலே மட்டுந்தான் உங்களால் வழங்க முடியும். அந்தவகையில், நாங்கள் உங்களிடம் மீனைக் கேட்கவில்லை, மீன் பிடிப்பதற்கான உபகரணங்களை எங்களுடைய கைகளிலே கொடுங்கள் என்று கேட்கின்றோம். அதாவது, எமது நாடு நிரந்தரமாக இந்த நெருக்கடியிலிருந்து மீண்டெழ நீங்கள் ஓர் உதவி செய்யவேண்டும். இந்திய ஒன்றிய அரசுக்கு அழுத்தங்கொடுத்து, இலங்கையிலே ஒற்றையாட்சி முறைமையை ஒழித்து, தமிழ்த் தேசத்தை அங்கீகரிக்கக்கூடிய சமஷ்டித் தீர்வைக் கொண்டுவருவதற்கு நீங்கள் பெரு மனதோடு நடவடிக்கை எடுக்கவேண்டும் என்று கேட்டு, வாய்ப்பளித்தமைக்கு நன்றிகூறி, விடைபெறுகின்றேன்.

[අ.භා.3.15]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයක ඉඳලා අපේ සමාජයේ සාකච්ඡා වුණු කාරණාවක් පිළිබඳව අද මුදල් ඇමතිතුමා බොහොම විවෘත ප්‍රකාශයක් කළා. මුදල් ඇමතිවරයෙකු හැටියට එතුමාට මේ ප්‍රකාශය කරන්න සිද්ධ වුණේ, අපේ ආර්ථිකය මේ

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

තරම් පල්ලම් බැහැලා තිබෙන තත්ත්වය තවදුරටත් නොකියා ඉන්න බැරි වුණාමයි කියලා මට හිතෙනවා.

පසුගිය මැතිවරණයෙන් පොදුජන පෙරමුණ බලයට පත් කළේ අපේ ලංකාවේ ලොකු වෙනසක් බලාපොරොත්තුවෙන්. වෙනසක් බලාපොරොත්තුවෙන් ලංකාවේ ආණ්ඩු දෙකක් පත් වුණා. එකක් තමයි 2015 පත් වුණු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආණ්ඩුව. ඊට පස්සේ පත් වුණේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මේ ආණ්ඩුව. හැබැයි මේ ආණ්ඩු දෙකම මහජනයා බලාපොරොත්තු වුණු වෙනස ඉටු කරන්න අපොහොසත් වුණු බව නම් සත්‍යයක්. රටේ ජනතාව බලාපොරොත්තු වුණු වෙනස යන්නෙන් අදහස් කරන්නේ හැම අංශයකම පරිවර්තනීය වෙනසක්. ඒ එක තැනක නොවෙයි, මුළු රටේම. රාජ්‍ය අංශය, දේශපාලන අංශය, සමාජ අංශය, පෞද්ගලික අංශය යන හැම අංශයකම විශාල වෙනසක් ජනතාව බලාපොරොත්තු වුණා. මම හිතන්නේ නැහැ, මේ රජය ඒ වෙනස හරියට තේරුම් ගත්තා කියලා. තේරුම් නොගත්තා විතරක් නොවෙයි, මේ වාර්තාව කියන හැටියට එතුමන්ලා ගත්ත ආර්ථික උපාය මාර්ගත් එහෙම පිටින්ම වැරදි උපාය මාර්ග බවට පත් වුණා.

මෙහිදී රජයට විතරක් දොස් කියන්න මගේ කැමැත්තක් නැහැ. මොකද, රජය එහෙම වුණත් ඒ පිටු පස්සේ හිටපු සමහර නිලධාරින් ගැනත් මට කියන්න පුළුවන්. ඒ අය දශක ගණනාවක් අපේ ආර්ථිකයේ ගමන් මඟ පිළිබඳව ඒ ඒ රජයන්ට බොරු කිව්වා. ඒ ඒ රජයන් මුළාවේ හෙළුවා. මොකද, ඒ රජයන්වල හිටපු කිසිම මුදල් ඇමතිවරයෙක්, ආර්ථිකමය තොරතුරු හරියාකාරව දන්නා අය නොවෙයි. ඒ නිසා ඒ අයට කිව්වාම ඒ අය ඒවා පිළිගෙන සමහර තීන්දු ගත්තා.

හොඳම උදාහරණය තමයි මේ බදු ප්‍රතිපත්තිය. මේ බදු ප්‍රතිපත්තිය කවුරුවත් කරන්න කියපු එකක් නොවෙයි. ඒ බදු පනත යටතේ කෙනෙකුගේ ආදායම නිරූපනය වෙන්නේ තමන් ලබන වැටුප සහ තමන් ලබන වෙනත් ආදායම් ප්‍රභවයන්ගෙන් බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩු ගණනේ කෙනෙක් පිටරටක නිවාඩුවකට ගියා නම්, ඒකට වියදම් කරපු මුදල් පවා ආදායම හැටියට ගණන් ගෙන තිබුණා. මේක ඉතා හොඳ නිර්වචනයක්. සමහර පෞද්ගලික අංශයේ ආයතන නූලෙන් රිංගලා යන්න නොයෙකුත් දේවල් කළා. මම දන්නවා සමහර වෙලාවට බල්ලන්ට කෑම දෙන එකටත් මිලියන ගණනක් දාලා බදු දැලෙන් රිංගලා ගිය බව. ඒක වෙනස් කරන්න තමයි ඒ බදු ප්‍රතිපත්තිය ගෙනාවේ. ඒ බදු ප්‍රතිපත්තිය කවුරු ගෙනාවත්, ඒ ආණ්ඩුව කරපු ඉතා හොඳ වැඩක්. ඒ වාගේම, ලක්ෂ 6ට වැඩි ආදායමක් ලබන හැම පුද්ගලයෙක්ම බද්දට යටත් වුණා. ඒ වාගේම, උපයන විට ගෙවීමේ ක්‍රමයක් යටතේ නිශ්චිත ක්‍රමයකින් පස්සේ ඒගොල්ලන් බදු ගෙවන්න ඕනෑ. ඒ නිසා ලංකාවේ බදු ආදායම වැඩි වුණා. ඩිව් ගුණසේකර හිටපු ඇමතිතුමා මෙතැන ඉඳගෙන හැම අය වැයකදීම කිව්වා, ලංකාවේ බදු ආදායම පසුපසට යෑම නො කළ යුතු කාර්යයක් හැටියට සලකා බදු ප්‍රමාණය වැඩි කරන්න කියලා.

ඒ නිසා මේක පක්ෂ දෙකක ප්‍රශ්නයක් නොවෙයි. මේක අපේ රටේ ආර්ථික කළමනාකරණය පිළිබඳ ප්‍රශ්නයක්. රජය අසමත් වුණා, ඒ ආර්ථික කළමනාකරණය නිවැරදි දිසාවට ගෙනියන්න. අපි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත්තොත්, 2012 ඉඳලා සංස්ථාව හැම දාම ඛනිජ තෙල් සැපයුම කළේ ගෙන්වන මුදලට අඩුවෙන්.

ඒ වාගේම විදුලිබල මණ්ඩලයට, පෞද්ගලික විදුලිබල ආයතනවලට, රජයේ ආයතනවලට ණය ගෙවීමේ පදනම මත ඉන්ධන ලබා දුන්නා. ඒක නිසා අද ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලංකාවේ ප්‍රධාන බැංකු දෙකට ආසන්න වශයෙන් හෝ දළ වශයෙන් ඩොලර් බිලියන හරතක් ගෙවන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සංචිතවල එක ඩොලරයක්වත් නැහැ. ඒක නිසා මේ බැංකු ක්‍රමය විතරක් නොවෙයි, මුළු ආර්ථිකයම බරපතළ පසුබෑමකට ලක් වෙලා තිබෙනවා.

මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, Galle Face අරගළය කරන අයට. මොකද, ඔවුන් තමයි මේ සැබෑ තත්ත්වය කරළියට ගෙනාවේ. එතකොට තමයි ආණ්ඩුවට තේරුණේ එහෙම ප්‍රශ්නයක් තිබෙනවා කියලා. අඩු ගණනේ අපි පාර්ලිමේන්තුවේ ස්වාධීන වුණේ ඇයි කියලා අහන්න තරම්වත් මේ රජය කාරුණික වුණේ නැහැ. අපි දැන් අහන්නේ එක කාරණයයි. ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරන්නේ නැතිව හුදු වාර්තාවක් ඉදිරිපත් කිරීමේ ඵලය කුමක්ද? මේක හරියට මරණ සහතිකයක් ඉදිරිපත් කෙරුවා වාගේයි. මේ වාර්තාව ඉදිරිපත් කරලා කියන්නේ, "අපට වියදම වැඩියි, ණය ගෙවන්න බැහැ. විදේශ මුදල් සත පහක්වත් නැහැ. මෙවැනි තත්ත්වයක් තිබෙන්නේ. ජූනි මාසයෙන් පස්සේ අපට තෙල් ටිකවත් ගෙන්වා ගන්න සල්ලි නැති වෙයි" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රකාශය මතම මේ විවාදය පවත්වනවාට වඩා මම කැමැතියි, එතැනින් ඉස්සරහට යන්න. අපි දැන් මොකක්ද කරන්න ඕනෑ? අපි කොහොමද විදේශ මුදල් ගෙන්වා ගන්නේ? අපි කොහොමද මේ රටේ අභ්‍යන්තර ප්‍රතිසංස්කරණයක් කරන්නේ? "ප්‍රතිසංස්කරණය" කියපු ගමන්ම සමහර වෘත්තීය සමිති කිපෙනවා. ලංකා බැංකු සංගමයත් මුදල් ඇමතිතුමාගේ ප්‍රකාශයට විරුද්ධව ප්‍රකාශයක් කර තිබෙනවා මා දැක්කා. දැන් මේ කවුරුත් කල්පනා කරනවාද අපේ රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කරන්නේ කොහොමද කියලා? ප්‍රතිසංස්කරණය කරන මොඩල රාශියක් තිබෙනවා. වැඩ කරන පන්තිය එකතු කරගන්න මොඩල තිබෙනවා. වැඩ කරන පන්තිය අත්හැරලා කටයුතු කරන මොඩල තිබෙනවා.

මම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ වාර්තාවත් එක්කම අප පිළිබඳ දේශීය හා විදේශීය තත්ත්වය වෙනස් කර ගන්න පුළුවන් විධියේ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළකුත් ආණ්ඩුව විධියට ඉදිරිපත් කරන්න කියලා. නැත්නම් මේක සාර්ථක වාර්තාවක් නොවෙයි, අර්ධ වාර්තාවක්. මේ වාර්තාව සාර්ථක වාර්තාවක් බවට පත්වෙන්න නම්, ඒ වැඩ පිළිවෙළ මේ වාර්තාවට එකතු වෙන්න ඕනෑ. මොකද, අද වන කොට ආණ්ඩුව කෙරෙහි මුළු ලෝකයේම විශාල විවේචනයක් තිබෙනවා.

අපි මොනවා කථා කෙරුවත්, එදා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඕනෑය කියපු කණ්ඩායම් අද ලෝකයේ විවිධ රටවලටත් ගිහිල්ලා එතුමා එපා කියනවා. ඒ කියන්නේ, මොකක් හෝ ප්‍රශ්නයක් තිබෙනවා කියන එකනේ. ඒ ප්‍රශ්නය address කරන්න නම් විනිවිදභාවයෙන් යුත් නව ප්‍රතිපත්තියක් නිර්මාණය කළ යුතුයි. අපට වැඩි වෙලාවක් නැහැ. අපි හැම දාම මේ සභාවට එනවා; කථා කරනවා. මම තවම විශ්වාස කරන්නේ නැහැ, මේ තිබෙන බැරෑරුම් තත්ත්වය රජයේ බොහෝ දෙනෙක් තේරුම් අරගෙන ඉන්නවා කියලා. විශේෂයෙන් ඉදිරි පෙළ ඉන්න අය තේරුම් අරගෙන ඉන්නවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. නායකකාරකාදීන් තේරුම් අරගෙන ඉන්නවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. තවමත් ඒ ගොල්ලන් කල්පනා කරන්නේ කාලයක් ගියාම මේ තත්ත්වය නැවතිලා සමහන් වෙයි කියලා.

සමහරු උත්සාහ කරනවා, මේක 1971-72 සිදුවීම්වලට සමාන කරන්න. මම ඒක පිළිගන්නේ නැහැ. සමහරු කල්පනා කරනවා, මේක 1988-89 සිදුවීම්වලට ළඟු කරන්න. මම ඒ විධියට කල්පනා

කරන්නේත් නැහැ. මේ රටේ අද තිබෙන්නේ සමාජ වෙනසක් පිළිබඳව හඬ ගාන දැවැන්ත ජන අරගළයක්. ඒ අරගළයට විසඳුම් දෙන්න මේ පාර්ලිමේන්තුවට බැරි නම්, මේ පාර්ලිමේන්තුවේ අපි කාටවත් සුජාතභාවයක් නැහැ, මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙන්නවත්, කථා කරන්නවත්. ඒකයි සමාජය කියන්නේ. මේක අපි තේරුම් ගන්න ඕනෑ. ඒක තේරුම් නොගෙන හිටපු නිසා ආර්ථික අර්බුදය, සමාජ අර්බුදයක් බවට පත් වුණා. ඒක දැන් දේශපාලන අර්බුදයක් බවටත් පත් වෙලා තිබෙනවා. එක්වරම තුන් ආකාරයක ප්‍රශ්න ගණනාවක් ඇති වුණු ආණ්ඩුවක්, පාර්ලිමේන්තුවක් තමයි මේ තිබෙන්නේ. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, මේ අර්බුදය විසඳන මඟ කරුණාකර අපට කියන ලෙස. මෙන්න මේ විධියටයි අපි ඩොලර් ගෙන්වන්නේ, මේ විධියටයි කටයුතු කරන්නේ කියලා අපට කියන්න.

අපි දන්නවා, IMF එක සමඟ කථා කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ කියලා. IMF එක කාරණා හතරක්, පහක් යෝජනා කර තිබෙනවා. ඒවා කරන්න කියලා තිබෙනවා. ආණ්ඩුව අද වෙනකල් ඒ ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. මේ අර්බුදයේ කොටසක් මුදල් ඇමතිතුමාට භාර දීලා තිබෙනවා. තව කොටසක් මහ බැංකු අධිපතිට භාර දීලා තිබෙනවා.

නමුත් එහෙම නොවෙයි. මේක මුළු රජයේම කොටසක්; අපේත් කොටසක්. අපිත් ලෑස්තියි සමහර විසඳුම් ඉදිරිපත් කරන්න. හැබැයි, රජය ඒවා ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපෙන් අහනවාට වඩා රජය ඉස්සෙල්ලාම කරන්න ඕනෑ වන්නේ, IMF එක ගෙනැල්ලා තිබෙන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ මෙන්න මේ දිශාවට, මෙන්න මේ කාලයේ, මෙන්න මේ දවසේ කරනවා කියන එක ප්‍රකාශ කරන එකයි. ඒ සමහර ඒවා අමිහිරියි, සමහර ඒවා වැරැදියි. ඒක ඇත්ත. නමුත් මේ වෙලාවේ ඒ අමිහිරි දේවල් අපි කැවේ නැත්නම් අපේ රටට අනාගතයේ "ශ්‍රී ලංකාව" කියන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, ඒ තරමටම මේ රට පල්ලෙහාට බහිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වුණත් ගිහිල්ලා බලන්න රාත්‍රී 12.00 - 1.00 වන තෙක් හැම කෙනෙකුම ඉන්ධන පෝලිමක ඉන්නවා. මම ඊයේත් බලාගෙන ආවා. ඒ මිනිස්සුන්ගේ කාලය ගැන කල්පනා කරලා බලන්න. රාත්‍රී-දහවල්, අව්ව-වැස්ස, පින්න කිසි දෙයක් බලන්නේ නැතුව ජනතාව පෝලිම්වල ඉන්නවා. හැබැයි, තවමත් මේ ප්‍රශ්නය පිළිබඳව අපට නිසියාකාර අවබෝධයක් නැහැ. ඉන්ධන අවශ්‍ය වෙන්නේ මොන අංශවලටද? කොහොමද ඒ අංශවලට ඉදිරියේදී ඉන්ධන දෙන්නේ? ඒ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන්නේ කොහොමද? අපනයන ක්ෂේත්‍රයේ කටයුතු කරගෙන යන්නේ කොහොමද? ආණ්ඩුව මේවා ගැන වගේ වගක් නැතිව ඉන්න එක ගැන මට හරිම කනගාටුයි.

මමත් පොදුජන පෙරමුණු ආණ්ඩුවල එහෙම නැත්නම් අපි හැමදාම කියනවා වාගේ පොදු ජනයා විසින් ගෙනෙන ආණ්ඩුවල අවුරුදු ගණනාවක් හිටපු කෙනෙක්. නමුත්, ඉස්සර ආණ්ඩු මෙහෙම හැසිරුණේ නැහැ. අද ඔබ හැසිරෙන්නේ අද බාලයෝ වාගෙයි. අඩුම ගණනේ ඔබට ඔබ ඉදිරියේ තිබෙන තර්ජනයවත් තේරෙන්නේ නැහැ. කරුණාකර, අනෙක් අයට කථා කරන්න ඉස්සෙල්ලා ඔබ proactive වෙන්න. එතකොට ඒ අය ඔබට කථා කරාවි. ඔබ ඉදිරිපත් වෙලා මේ වෙනස්කම නොකළොත්, මෙහි ඌන පූරණය නොකළොත්, දෙවැනි කොටසක් ඉදිරිපත් නොකළොත් මේ ආණ්ඩුව විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවත් කිසිම සුජාතභාවයක් නැති තැනක් බවට පත්වන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Rohana Bandara.

[අ.භා.3.27]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වර්තමාන මුදල් ඇමතිතුමා පසුගිය දිනවල කළ අධ්‍යයනයේදී හඳුනා ගත් කාරණා, IMF එකත් එක්ක සාකච්ඡා කරනකොට එතුමාට මුහුණ දෙන්න වුණු සිදුවීම් ටික අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එතුමා අදත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා රාජපක්ෂවරු වෙනුවෙන් කරන්නේ එතුමාගේ සුපුරුදු රාජකාරිය කියලායි මා විශ්වාස කරන්නේ. මගේ මතකය අනුව, 2015න් පසු රාජපක්ෂවරු නිතරම විශ්වාස කළ දෙගොල්ලක් සිටියා. රාජපක්ෂවරු ඉහ උඩින් තියා ගෙන විශ්වාස කළ එක් පාර්ශ්වයක් තමයි අදෘශ්‍යමාන බලවේග. අනෙක් පාර්ශ්වය තමයි අලි සබ්රි ඇමතිතුමා. පසුගිය කාලයේ රාජපක්ෂවරුන්ට තිබුණු නඩු සියල්ලේදී ඒ අය වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටියේ අලි සබ්රි මැතිතුමා. ඒ වෙනුවෙන් එතුමාට ලැබුණු දායාදය, ත්‍යාගය තමයි ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය හිමි වීම. ඊටපසුව එතුමාට කැබිනට් ඇමති ධුරයක් ලැබුණා. අද උදෑසනත් එතුමා මේ ගරු සභාවේ නැඟිටලා කළේ මොකක්ද? අපි දැක තිබෙනවා, උසාවිවලදී වරදකරුවකුගේ නම කැඳෙව්වාම ඔහුගේ පෙරකදෝරු මහත්මයා නැඟී සිට කියනවා, "ගරු ස්වාමීනි, වරද පිළිගන්නවා. පෙර වැරැදි කිසිවක් නැහැ. කුමන හෝ දඬුවමකට යටත්ව සාධාරණය ඉෂ්ට කර දෙන්න" කියලා. අන්න, ඒ වාගේ කටයුත්තක් තමයි අද අපේ අලි සබ්රි මැතිතුමාත් කළේ. එතුමා කියනවා, "බදු සහන දීපු එක වැරැදියි කියා අපි පිළිගන්නවා, මේ රටේ රාජ්‍ය ආදායමට වසරකට බිලියන 600කට වැඩිය අහිමි කරපු එක වැරැදියි, පොහොර සම්බන්ධව ගත්තා වූ තීන්දුව වැරැදියි, බදු අඩු කරපු එක වැරැදියි." කියලා. මෙවැනි බොහෝ දේවල් කියලා වැරැද්දට සමාව ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දඬුවමකට යටත්ව එහෙම නැත්නම් ප්‍රජා සේවයකට යටත්ව කුමන හෝ දඬුවමක් නියම කර පසුව නිදහස් කරන්න පුළුවන් වැරදි තිබෙනවා. හැබැයි, රාජපක්ෂවරු මේ ගෙන තිබෙන තීන්දු තීරණවලට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනාම වග කිව යුතුයි කියලා එළියේ ජනතාව කියනවා. අපි වාගේම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන බොහෝ දෙනෙක් කියනවා, "අපි ඔක්කෝම එකතුවෙලා, සාමූහිකව මේ ප්‍රශ්නයට විසඳුම් සොයමු" කියලා. හැබැයි, ඔය ඉන්න ඔක්කෝම අය පසුගිය කාලයේ අත එසවූයේ කවුරු විසින් ගෙනා තීන්දුවලටද? කෝටිපතියන්ට බදු සහන දෙන්න හදනකොට ඒක අනුමත කරපු, හෘදය සාක්ෂියට අනුව ඒකට එකඟ වෙච්ච පිරිසක් ඔය පැත්තේ ඉන්නවාද? නැහැ. ඉහළම පුටුවෙන් ආපු තීන්දු, එක පවුලකින් ගත්ත තීන්දු ගෙනැල්ලා මේ රටේ පාර්ලිමේන්තුවට ඔබ්බුවාම, තමන්ගේ හෘදය සාක්ෂිය පසෙකින් තියලා, තමන්ගේ මන්ත්‍රී ධුරය ආරක්ෂා කර ගන්න, තමන්ගේ ඇමති ධුරය ආරක්ෂා කර ගන්න කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් ඒවාට අත උස්සලා කරපු වැරැදි ටික තේ අද මේ තිබෙන්නේ. ඒ ප්‍රශ්න ටික අද ඔඩු දුවලා නැවත හරවා ගන්න බැරි තැනකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද ජීවිතයක් පවා අහිමි වෙලා තිබෙනවා. දැන් කියනවා "අපි ඔක්කෝම එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳා ගනිමු" කියලා. පාර්ලිමේන්තුවේදී අපි ඔක්කෝටම එකතු වෙන්න පුළුවන්. හැබැයි, මේ රටේ ශ්‍රම බලකාය අද කොහේද ඉන්නේ? ඉන්නේ පාරවල්වල, පෝලිම්වල. අදට දවස් 28ක් වෙනවා, ඔවුන් ගෝල් ෆේස් එකේ තිබෙන "ගෝඨා ගෝ ගමේ" නතර වෙලා. ඒ වාගේම තව පිරිසක් "මයිනා ගෝ ගමේ" නතර වෙලා ඉන්නවා.

තව පිරිසක් එක එක නගරවල ඒවායේ ශාඛා නිර්මාණය කරලා "homes" හදාගෙන ඉන්නවා. මේ රටේ ශ්‍රම බලකාය තැන්

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

තැන්වල නතර වෙලා සිටිද්දී -ඒ අය නැතිව- කොහොමද අපි මේ රටේ ආර්ථික ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න විසඳන්නේ? තවත් සමහරු ඉන්නවා, පෙට්‍රල් ෂෙඩ් ගණනේ පෝලිම්වල. තව සමහරු ඉන්නවා, ගෑස් පෝලිම්වල. මෙහෙම තියාගෙන ද අපි මේ පාර්ලිමේන්තුව තුළ කථා කරලා මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්නේ?

මේ අර්බුදය පළමුවෙනි වතාවට පුපුරා පිටාර ගලන්න පටන් ගත්තේ මිරිහානේ තිබෙන ජනාධිපතිතුමාගේ නිවස ඉදිරිපිටදී. අපි ඒක දැක්කා. එදා එතැනින් පටන් ගත් අර්බුදයේදී අපට ඇහුණු දේවල් තිබෙනවා. අපි ඉස්සෙල්ලා ඒවාට ඇහුම් කන් දෙන්න ඕනෑ. ජනතාව එතැන වට කරගෙන මොකක්ද කිව්වේ? ජනාධිපතිතුමාගේ මන්දිරය වට කරගෙන ජනතාව කිව්වේ "Gota, Go" කියලායි. ඒ වාගේම අපට තව කථාවක් කියනවා ඇහෙනවා, "පිස්සෙක්, පිස්සෙක්, පිස්සෙක්" කියලා. මේවාට අපි ඇහුම් කන් දෙන්න ඕනෑ. එළියට යන්න කියලා ජනතාව කියන්නේ කාටද? එළියට යන්නේ නැතිව, ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැතිව අපි මෙතැන උඩ පැනගෙන මොන විකල්ප ක්‍රියාත්මක කරන්න හැදුවත් මේ ඔළු ගෙඩි 225 අතරින්ම අපි කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ? විපක්ෂයට තිබෙන මන්ත්‍රී ධුර සංඛ්‍යාව ඔබතුමන්ලා දන්නවා. හෙට විශ්වාස භංගය ගෙනාවාම මොකක්ද වෙන්නේ? ජනතාව මේ අය දඬු කඳේ ගහලා, එහෙම නැත්නම් නිවාස අඩස්සියේ තියාගෙන ඉන්න හින්දා සමහරුන් හෘදය සාක්ෂියට විරුද්ධව, තමන්ගේ පක්ෂයේ ප්‍රතිපත්තියට විරුද්ධව විශ්වාස භංගයට පක්ෂව අත ඔසවයි. ඒ, ජනතාව ඔවුන් නිවාස අඩස්සියේ තියාගෙන ඉන්න හින්දායි; ජනතා අධිකරණයට යන්න භය හින්දායි. හැබැයි, හෘදය සාක්ෂියට එකඟව ජනතාවගේ පැත්තෙන් ඔබතුමන්ලා කවුරුවත් මෙතැනදී විශ්වාස භංගයට සහයෝගය දෙයි කියලා මම හිතන්නේ නැහැ.

අපේ මන්ත්‍රීවරුන් හතළිස් ගණන සහ විපක්ෂයට සහයෝගය දෙන තවත් සුළු පිරිසක් එක්ක හැට ගණනක් එකතු වෙලා ආණ්ඩුවක් හදන්න පුළුවන්ද? යම්කිසි අර්බුද තිබෙන ආණ්ඩුවක් අරගෙන ඒක ක්‍රමානුකූලව ගොඩ නඟාගෙන එනකොට කරගෙන යන්න ඉඩ දෙයිද? අපි දන්නවා නේ, යුද්ධයකදී උපක්‍රමශීලිව යුද්ධ හමුදාවත් පසු බසින බව. ඒ පසු බෑම තමයි මේ තියෙන්නේ. රජා ආරක්ෂා කරලා රජාගේ වටේ සිටි සෙන්පතියෝ ටික පොඩ්ඩක් පසු බැස තිබෙනවා. තවම ජනාධිපතිතුමා ඒ විධියටම වැජඹෙනවා. මේ සෙන්පතියෝ ටික, එහෙම නැත්නම් ආරක්ෂකයෝ ටික, ඇමති සහෝදරයෝ ටික පසු බැහැලා ඇමතිකම් ටික පරිත්‍යාග කරලා සිටියාට තවම රජා ඉන්නවා, පුටුවේ. රජා පුටුවේ තියාගෙන සෙන්පතියෝ ටික පසුබැස්සාට යුද්ධය අවසන් වන්නේ නැහැ. යුද්ධය ජයග්‍රහණය කරන්න නම්, අපි රජා පරාජය කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඝාතනය කරන්න ඕනෑ. අලි සබ්රි මැතිතුමා උසාවිය හමුවේ කියනවා වාගේ දඬුවමකට යටත්ව මොකක් හරි ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ. මේකටත් දෙන දඬුවමක් තියෙන්න ඕනෑ. ජනාධිපතිතුමා කළා වූ වැරැදි ටික දැන් ජනාධිපතිතුමාම පිළිගත්තා.

අද මේ රටේ මේ සියලු අර්බුද නිර්මාණය වන්න ප්‍රධාන වශයෙන් හේතු වුණේ මේ රටේ කෘෂි කර්මාන්තය විනාශ කිරීමයි. අද යල කන්නයේ වගාව ආරම්භ කර තිබෙනවා. මේ මාසයේ පළමුවැනි දා ඉඳලා අපේ ප්‍රදේශවලට වතුර නිකුත් කර තිබෙනවා. ඒ වතුර නිකුත් කිරීමේ ඉඳලාම ප්‍රශ්න. දැන් වෙනදා ලබා දුන් ජල මුර ප්‍රමාණය ලබා දෙන්නේ නැහැ, වෙනදා ජලය ලබා දුන් දින ගණන ලබා දෙන්නේ නැහැ. වෙනදා වගා කරන්න දුන් අක්කර ගණනින් සියයට 75යි දැන් වගා කරන්න දෙන්නේ. ඒකෙනුත් වී වගා කරන්න දෙන්නේ තවත් සුළු ප්‍රමාණයක්. මෙවැනි ප්‍රශ්න තවත් නිර්මාණය කරලා "මම මේ වැරැද්ද කළා" කියා පිළිගෙන ඉන්නවා. කසිප්පු ටිකක් විකුණලා, එහෙම නැත්නම් මෝටර් සයිකල් එකක හෙල්මට් එකක් නැතිව ගිහිල්ලා, ලයිසන්, ඉන්ෂුවරන්ස් නැතිව ගිහිල්ලා, ඉරක් කපලා වාගේ වරදක් නම් අපට තිබුණා සුළු දඬුවමක් දෙන්න. හැබැයි, මේක මුළු රටත්, ජාතියත් විනාශ කරන්න ගත්ත තීන්දුවක්. මේ රටත්, ජාතියත් පිටුපසට ගෙනිහින් රටත්, ජාතියත් විනාශ කරලා-

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is the point of Order?

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවේදී මට ඇහුණා, මේ ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් රජා ඝාතනය කරන්න ඕනෑ කියනවා. ඒක ඉල්ලා අස් කර ගන්න කියලා එතුමාට කියන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා "රජා" කියන එක වරද්ද ගන්න ඇති. මම කිව්වේ ජනාධිපතිතුමා ඝාතනය කරන්න ඕනෑ කියලා නොවෙයි. *[බාධා කිරීමක්]* යුද්ධයක් ගැන- *[බාධා කිරීමක්]* ඔබතුමා උදාහරණය පටලවා ගෙන. *[බාධා කිරීමක්]*

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔබතුමා වාඩි වෙන්න. එහි point of Order එකක් නැහැ. මම ඒකට උත්තර දෙන්නම්. රජා කිව්වේ උදාහරණයකට පමණයි. අපට සත්තු ඝාතනය කරලා පාප කර්මවලට මුහුණ දෙන්න ඕනෑ නැහැ. මේ රටේ මිනිස්සු ඒ පාප කර්මවලට යන්නේ නැහැ.

මෙය යුද්ධයක් නම්, යුද්ධය අවසන් වන ක්‍රමය ගැනයි මම කිව්වේ. ප්‍රභාකරන් මැරුවාම තමයි එල්ටීටීඊ යුද්ධය අවසන් වුණේ. රෝහණ විජේවීර ඝාතනය කළාම තමයි ඒ යුද්ධය අවසන් වුණේ. ඒ නිසා මේක යුද්ධයක් නම්, මේකට නායකත්වය දීපු කෙනා වැරැදිකරුවා නම් ඔහු යම්කිසි බරපතළ දඬුවමකට යටත් වෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි මෙය අවසන් කරන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතිව මේ 225දෙනා අතරේ අර පැත්තටයි, මේ පැත්තටයි, අනෙක් පැත්තටයි කරක් ගහන මේ සෙල්ලම කරන්න බැහැ. රටේ ජනතාව කියන්නේ මෙන්න මේ දේ තමයි. මෙය සුළු පටු වරදක් නම් මේ රජතුමා -මේ වැරැද්ද කරපු කෙනා- සුළු දඬුවමකට යටත් කරන්න, එහෙම නැත්නම් දවස් කිහිපයක සිර දඬුවමකට යටත් කරන්න අපට පුළුවන්.

හැබැයි, මෙහිදී රටක් ජාතියක් කොච්චර ආපස්සට ගෙනිහිල්ලාද? අද සෑම ජාතියකම ජනතාව පීඩාවෙන් ඉන්නවා. පිරිසක් කුසගින්නේ ඉන්නවා. තවත් කොටසක් විවිධ මානසික ප්‍රශ්නවලට මැදි වෙලා ඉන්නවා. ඒ වාගේම ජීවිතයකුත් අහිමි වෙලා තිබෙනවා. මිනී මැරුමක් සම්බන්ධයෙන් අපට කියන්න පුළුවන්ද, "ඔව් ස්වාමිනි, මගේ අතින් සුළු වැරැදීමක් වුණා. මගේ අත පසුවීමකින් ඒ ඝාතනය සිද්ධ වුණේ. ඒ නිසා මට අනුකම්පා කරලා ආයෙත් සැරයක් මට වැඩ කරගෙන යන්න දෙන්න, මට සුපුරුදු විධියට එළියේ ඉන්න ඉඩ දෙන්න" කියලා? එහෙම කිව්වොත් අවසර දෙයි ද උසාවිය? එහෙම දේවල් වෙන්නේ නැහැ. අද මේ රට එක්ක, ආර්ථිකය එක්ක සෙල්ලම් කරලා, සුදු කෙළලා. මේ විනාශ කරපු ආර්ථිකය ගොඩ නගන්න නම් ජනතාව කියන විසඳුමට යන්න ඕනෑ. ඒ සඳහා ඉස්සෙල්ලාම මේ රටේ සමස්ත ජනතාවගේ විශ්වාසය ගොඩ නගලා ඉන්න. ආර්ථිකය විනාශ කළා කියලා දැන් පිළිගෙන තිබෙනවා. ඒකට දඬුවමක් තිබෙන්න ඕනෑ. එතුමා පුටුවේ ඉඳගෙන ජනතාවට කිව්වොත්, "මගේ අතින් වැරැද්දක් වුණා" කියලා ජනතාව එය පිළිගනීවිද? ඒ වැරැද්දට තවම පිළියමක් කරලා නැහැ. ගොවියාට වන්දි දෙනවා කිව්වා. ඒවා දුන්නේ නැහැ. මේ කන්නයේ පොහොර ටික දෙනවා කිව්වා. නමුත් තවම ඒවා දීලා නැහැ. පසුගිය කාලයේ ඒ වාගේ ලොකුවට පම්පෝරි ගැහුවා. මේ රටට පොහොර ගේන්න සල්ලි නැහැ. හැබැයි, තාර ගේන්න ඕනෑ තරම් සල්ලි තිබුණා. තාර ගෙනැල්ලා මේ රටේ ව්‍යාපෘතිවලට දුන්නා. අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු අනෙකුත් දිස්ත්‍රික්කවල අපේ ලියාපදිංචි ඉදි කිරීම්කරුවන් අද ප්‍රශ්නයකට මුහුණ පා සිටිනවා. ඉදිකිරීම්කරුවන්ගේ සංගමය අද බරපතළ ප්‍රශ්නයකට මැදි වෙලා. ඉදිකිරීම්කරුවන් පසුගිය සිංහල අලුත් අවුරුද්දට වැඩ නතර කළා. ඔවුන්ගේ සේවකයන්ට පඩි නඩි ටික ගෙවා ගන්න බැරි වුණා. ඒ අවශ්‍ය payments කරලා නැහැ. ඔවුන් දවස් ගණන් බලාගෙන ඉන්නවා. ඔවුන්ගේ බැංකු OD නැගලා. එක ක්ෂේත්‍රයක් කියලා නැහැ, මේ රටේ සමස්ත ආර්ථිකයට දායකත්වය දීපු හැමෝම අද වැටිලා. කෘෂි කර්මාන්තය ගත්තත් එහෙමයි. පහළ සිට ඉහළම පන්තියට යනකල් -මේ අය සමඟ එකතු වෙලා ජාවාරම් කරපු අය ඇරෙන්න - සියලුදෙනා අද අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ඒ අයට සහනයක් දෙන්නේ නැතිව කොහොමද අපි විසඳුම් සොයන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධායක ජනාධිපති ධුරය ඇති කරන කොට ඒ වෙලාවේ පාර්ලිමේන්තුවේ හිටපු ගරු එන්.එම්. පෙරේරා මැතිතුමා අහලා තිබෙනවා, මේ ජනාධිපති ධුරය බැරි වෙලාවත් පිස්සෙකුගේ අතට පත් වුණොත් අපි මොකක්ද කරන්නේ කියලා. අද අපි රටක් විධියට මේ තත්ත්වයට මුහුණ දෙනවා. මම මෙහි ඇත්ත දන්නේ නැහැ. හැබැයි, රටේ ජනතාවගේ උද්ඝෝෂණවලට ඇහුම් කන් දුන්නාම ඇසෙන ප්‍රධාන සටන් පාඨ අතරේ මේ වචනය නිතර නිතර කියැවෙනවා. එහෙම නම්, ඒක වෙනස් කරන්නේ නැතිව අපි මොන දේට ගියත් වැඩක් නැහැ. ඒ නිසා අපි ඇහුම් කන් දෙමු, රටේ ජනතාවට. මේ රටේ ව්‍යවස්ථාවෙන් එන ප්‍රශ්න ඇති, අර්බුද ඇති. හැබැයි, රටට ජාතියට ආදරයක් තිබෙනවා නම්, මේ රටේ ජනාධිපතිතුමාට මා කියන්නේ මෙකයි. හැටනව ලක්ෂයක් ජනතාව ඡන්දය දීලා මේ රටේ උත්තරීතර නායකයා විධියට එතුමා කැමැත්තෙන්ම පත් කර ගත්තා. ඒ ජනතාවටත්, මේ රටටත් ආදරයක් තිබෙනවා නම්, එතුමා පුටුවෙන් ඉල්ලා අස් වෙලා පැත්තකට වුණොත් අපට පුළුවන් මේ රටේ සමස්ත ජනතාවත් එක්ක එකතු වෙලා මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුව තුළින් විසඳා ගන්න. ආණ්ඩුවට එරෙහි විශ්වාස භංගය නම් දිනයි. එය දිනලා ඊළඟට අපි කොතැනටද එන්නේ? නැවතත් ගැටලු ඇති වෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට තිබෙන පළමුවෙනි විසඳුම මොකක්ද? තිබෙන මොනවා හෝ ගැටලු විසඳාගෙන ජනතාවගේ කැමැත්තෙන් ජනාධිපතිවරයෙකු නැවත පත් කරගෙන හෝ ජනතා විශ්වාසය ඇති කරගෙන අපේ රටේ ශ්‍රම බලකායත් එක්ක සමස්ත රට විධියට මේ ප්‍රශ්නයට මුහුණ දෙමු. රටේ සියලුදෙනා මෙතැනට ඒකරාශි කර ගන්න බැහැ. ප්‍රධාන වැරැදිකරුවා පුටුවේ තියාගෙන, චූදිතයා පුටුවේ තියාගෙන මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න අපට බැහැ. ඒ නිසා මම බොහොම ගෞරවයෙන් ජනාධිපතිතුමාගෙන් ඉල්ලනවා, ඔබතුමා මේ රටට ආදරය කරනවා නම්, ඔබතුමා මේ රටේ ප්‍රධානියා විධියට පත් කර ගත්ත ජනතාවට ආදරය කරනවා නම්, ස්වකැමැත්තෙන් මේ රටේ ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස් වෙලා සමස්ත ජනතාවත් එක්ක එකතු වෙලා මේ පාර්ලිමේන්තුවට මේ ප්‍රශ්නය විසඳන්න ජාත්‍යන්තරයත් එක්ක අත් වැල් බැඳ ගෙන යෑමේ අවස්ථාව උදා කර දෙන්න කියලා. ඒ ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Anuradha Jayaratne. Before he starts his speech, will an Hon. Member propose the Hon. (Mrs.) Kokila Gunawardene to the Chair.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, I propose that the Hon. (Mrs.) Kokila Gunawardene do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. (MRS.) KOKILA GUNAWARDENE *took the Chair.*

[අ.භා.3.39]

**ගරු අනුරාධ ජයරත්න මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යවරයා හැටියට කටයුතු කරන ගරු අලි සබ්රි මැතිතුමාට අපි පළමුවෙන් ස්තුතිවන්ත වෙනවා, රටේ වර්තමාන තත්ත්වය ගැන, අද වන විට අප මොන විධියටද ක්‍රියා කරන්න ඕනෑ කියන එක ගැන දේශපාලන පක්ෂ භේදයකින් තොරව අප සියලුදෙනාට දැන ගන්න අවශ්‍ය කරුණු කාරණා ඉදිරිපත් කිරීම පිළිබඳව. හැබැයි, ඒ ඉදිරිපත් කිරීම මන්ත්‍රීවරුන් මොන විධියට භාර ගත්තා ද කියන එක ප්‍රශ්නයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. සමහර උදවිය කථා කරන විධියට මේක ගෝඨාභය ජනාධිපතිතුමාගේ අර්බුදයක්. තව කෙනෙක් කථා කරන විධියට මේක මුදල් අමාත්‍යාංශයේ කෙනෙකුගේ හෝ වෙනත් කවුරුන් හෝ කෙනෙකුගේ ප්‍රශ්නයක්. හැබැයි අවුරුදු ගණනාවක් තිස්සේ වාර්ෂිකව ඉදිරිපත් කළ අය වැයට අත උස්සපු, පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වන අප මේ ඇත්ත ප්‍රශ්නය කොයි තරම් දුරට අවබෝධ කරගෙනද තිබෙන්නේ?

[ගරු අනුරාධ ජයරත්න මහතා]

අපේ ගරු මුදල් ඇමතිතුමා කියපු විධියට අපි පළමුවෙන්ම 1954දී ඩොලර් මිලියන 6කින් ණය ගැනීම් ආරම්භ කරලා අද වන විට ඩොලර් බිලියන 54ක් දක්වා වන ණය මුදල් ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අපි විවිධ අවස්ථාවල කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම විවිධ කණ්ඩායම් ගත් තීන්දු තීරණවල ප්‍රතිඵල අද අපට භුක්ති විඳින්න වෙනකොට, අපි මේ ගෙනෙන තර්ක විතර්ක මේ රටේ තිබෙන ප්‍රශ්නයට, අර්බුදයට කොයි තරම් දුරට විසඳුම් දෙනවාද කියන එක පිළිබඳව බොහෝ පිරිස් දැනගෙන ඉන්නවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එක පැත්තකින් රජයේ කළමනාකාරණ කටයුතුවලදී සිදු වූ අඩු පාඩු, ප්‍රශ්න වැරදි තිබෙනවා. ජනාධිපතිතුමා, අගමැතිතුමා, අමාත්‍යවරු ඇතුළු අපේ ආණ්ඩුව ඒවා නිර්දෝෂයි කියන්න කොතැනකදීවත් උත්සාහ කරන්නේ නැහැ. හැබැයි, මේ ඇති වුණු ප්‍රශ්නය, මේ ඇති වුණු උග්‍ර අර්බුදය කුමක් නිසාද ඇති වුණේ කියලා අපි හරියාකාරව තේරුම් ගන්න ඕනෑ.

2021 වර්ෂය වෙනකොට රුපියල් බිලියන 1,462ක ආදායමක් ලබලා -දළ වශයෙන් රුපියල් බිලියන 1,500ක ආදායමක් ලබලා- වියදම රුපියල් බිලියන 3,522ක් වෙන රජයක පැවැත්ම - රටේ පැවැත්ම - මොකක්ද කියන එක පිළිබඳව අපි හරියට අවබෝධ කර ගන්න ඕනෑ. අපි රුපියල් බිලියන 1,500ක ආදායමක් ලබනවා. ඒ වාගේම අපි රුපියල් බිලියන 3,500ක් වියදම් කරනවා. මේ පිළිබඳව සමහර කණ්ඩායම් විවිධ අවස්ථාවල කියන්න පටන් ගත්තේ මොනවාද? ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කථා කළේ මොකක්ද? බලය බෙදීම - devolution of power - පිළිබඳව තමයි එතුමා කථා කළේ. එතුමා දිගින් දිගටම විග්‍රහ කළේ වෙන මොනවත් නොවෙයි, පසුගිය අවුරුදු 15ක, 20ක කාලය පුරාවටම යුද්ධය වෙනුවෙන් වියදම් කළ මුදලත් එක්ක රටට සිදු වුණු අහේනිය පිළිබඳව තමයි එතුමා කථා කළේ. ජනතා විමුක්ති පෙරමුණේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මොනවාද කථා කළේ? "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිට තමයි මේකට විසඳුමක් තිබෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිට විසඳුමක් හොයලා ඒක ව්‍යවස්ථාවට එකතු කර ගන්න කටයුතු කරන්න ඕනෑ" කියන ප්‍රකාශය තමයි එතුමාගෙන් පිටවුණේ.

අද අපේ රටේ මිනිසුන්ට ගෑස් ටික නැහැ, තව පිරිසකට තෙල් ටික නැහැ, තව පිරිසක් එදාවේල හම්බ කර ගන්න බැරිව බරපතළ අර්බුදයක ඉන්නවා. මේක තමයි ඇත්ත තත්ත්වය. හැබැයි, ඒ සඳහා අවශ්‍ය විසඳුම්වලටද "ව්‍යවස්ථාමය වෙනස" කියන්නේ? සජබයේ සජිත් ප්‍රේමදාස මැතිතුමා විසිඑක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කියනවා අපි දැක්කා. ඒ වාගේම, තව පැත්තකින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන එක ගැන කථා කරන්න පටන් ගත්තා. මේ වාගේ සාධනීය කාරණා ඕනෑ තරම් තිබෙන්නට පුළුවන්. හැබැයි, මේ මොහොත වන විට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හෝ විසිඑක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම හෝ, එහෙමත් නැත්නම් ඔය කියන විධියට බලය බෙදා හැරීම හෝ නොවෙයි අපේ තර්කය හෝ විතර්කය විය යුතුව තිබෙන්නේ. රටක් හැටියට අපි මුහුණ දී තිබෙන මේ අර්බුදයෙන් ගොඩ එන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳවයි අපි තර්ක කළ යුත්තේ.

මේ සඳහා අපේ අසල්වැසි රට වන ඉන්දියාවෙන් අපට හොඳ උදාහරණයක් ගත හැකිව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1991 වර්ෂය වෙනකොට දින 15කට විතරයි ඉන්දියාව සතුව විදේශ සංචිත ඉතුරුව තිබුණේ. 1988, 1989, 1990 වන විට අගමැතිවරු තුන්දෙනෙක් යටතේ හදපු ආණ්ඩු තුනක් ඉන්දියාවේ තිබුණා. අවසානයේ, 1991 වර්ෂය වෙනකොට දින 15ක් සඳහා පමණයි රට තුළ විදේශ සංචිත ඉතිරිව තිබුණේ. හැබැයි, අවසානයේ මොකක්ද වුණේ? අවසානයේ අගමැතිවරයා, මුදල් අමාත්‍යවරයා ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා, 2004 වර්ෂය වන විට බිලියන 100ක විදේශ සංචිත ප්‍රමාණයක් සහ අද වන විට බිලියන 600කට එහා ගිය විදේශ සංචිත ප්‍රමාණයක් එකතු කර ගන්න ඔවුන්ට පුළුවන්කම ලැබුණා. රටක් හැටියට මේ ප්‍රශ්නය අපි හරි විධියට කළමනාකරණය කර ගත්තොත් මේ අර්බුදයෙන් එළියට එන්න අපටත් පුළුවන්කම තිබෙනවා. හැබැයි, කොතෙක් දුරට නිවැරදිව කළමනාකරණය කරනවාද කියන එක පිළිබඳව තමයි අද අපට ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙන්නේ. මෙහිදී විපක්ෂයේ දේශපාලන පක්ෂවලට අපි මොන තරම් ආරාධනා කළත්, එකතුවෙලා, එක මතවාදයකට ඇවිල්ලා ලෝකයට පණිවුඩයක් දෙන්න මේ පාර්ලිමේන්තුවේ අපි 225දෙනාට පුළුවන්කම ලැබී නැහැ. ඒක තමයි ඇත්ත. අපි එක තැනකට ඇවිල්ලා, "මේ රටේ ජනතාව දුක් විඳිනවා, ඔවුන් මේකෙන් ගලවා ගැනීම සඳහා අපි රටක් හැටියට අවශ්‍ය වැඩ පිළිවෙළ හදමු" කියලා ලෝකයට එක ප්‍රකාශයක් කරන්න මේ 225දෙනාටම පුළුවන්කමක් ලැබී නැහැ. මොකද, ඊට වැඩිය අපට අපේ දේශපාලන පක්ෂය ලොකුවෙලා තිබෙනවා; ඊට වැඩිය අපේ ගමේ දේශපාලනය ලොකුවෙලා තිබෙනවා; ඊට වැඩිය අපේ බෙදිල්ල ලොකුවෙලා තිබෙනවා.

මේ සියලු කාරණාවලට උත්තර සොයන්න යනකොට අපේ රට තවත් වෙනිසියුලාවක්, තවත් ලෙබනනයක් වෙන එක නතර කරන්න පුළුවන්කමක් නැහැ. මේක තමයි ඇත්ත. හැබැයි, ලෝකයේ අනෙක් රටවල් ගත්තාම, 2010 වෙනකොට ජැමෙයිකාවේ ණය අනුපාතය සියයට 124යි. අද වනකොට අපේ ණය අනුපාතය සියයට 118යි, සියයට 119යි. හැබැයි, බැඳුම්කර නිකුතුවකට ගිහිල්ලා, අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් කරලා මාස 10කට පස්සේ නැවත බැඳුම්කර නිකුතුවකට යනකොට අධි ඉල්ලුමකට යනවා. සමහර රටවල් එවැනි වෙනස්කම්වලට ගිහිල්ලා තිබෙනවා. එවැනි වෙනස්කම්වලට ගිහිල්ලා අවශ්‍ය ඉලක්ක සම්පූර්ණ කර ගන්න සමහර රටවල්වලට පුළුවන්කම ලැබී තිබෙනවා.

හැබැයි, අවාසනාවකට අද තව කෙනෙකුට අවශ්‍ය කරලා තිබෙන්නේ හැකි ඉක්මනින් මැතිවරණයකට යන්නයි. ඔවුන් කථා කරනකොට අපට ඒ බව තේරෙනවා. අද වන විට අපේ රටට අවශ්‍ය කඩදාසි ටිකවත් ගන්න පුළුවන් වාතාවරණයක් නැහැ. ඒක තමයි ඇත්ත. අද මේ රජයට තවදුරටත් අනවශ්‍ය වියදම් කරන්න පුළුවන් විධියට මේ රටේ ආර්ථිකය ගොඩනැඟිලා නැහැ. හැබැයි, ඒ කිසිදු දෙයක් තේරුම් ගන්නේ නැතිව තවත් මැතිවරණයකට ගිහිල්ලා හරි කමක් නැහැ, ඒ මැතිවරණය තුළින් බලය ලබා ගැනීමට පුළුවන්කම ලැබෙනවා නම් ඒක ජයග්‍රහණයක් හැටියට ඒ අය දකිනවා. රටක ඉන්ධන නැති වෙනකොට, ගෑස් නැති වෙනකොට, විදුලිය නැති වෙනකොට ඒ එන ආවේගයත් එක්ක කවුරු හරි උද්ඝෝෂණ කරනවා නම්, ඒ පිළිබඳව වැරදි විධියට දකින එක නොවෙයි අපේ ඉලක්කය බවට පත් විය යුතුව තිබෙන්නේ. හැබැයි, ඒ උද්ඝෝෂණවල යම් යම් සුබවාදී කාරණා තිබෙනවා. ඒ උද්ඝෝෂණ නිසා යම් යම් සුබවාදී තීන්දු තීරණ ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මහ බැංකු අධිපතිවරයා විධියට ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා වැනි අය පත් වෙන්න, මුදල් අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්වරයා පත් වෙන්න, අද එවැනි කණ්ඩායමක් මේ රට නැවත පාලනය කරන තත්ත්වයකට අරගන්න පුළුවන්වීමත් එක්තරා විධියක ජයග්‍රහණයක්. හැබැයි මතක තියා ගන්න, ජනවාරි මාසයේ අපේ රටට 82,000ක පමණ සංචාරකයන් ප්‍රමාණයක් පැමිණ තිබෙන බව. පෙබරවාරි මාසයේ අපේ රටට 89,000ක පමණ සංචාරකයන් ප්‍රමාණයක් පැමිණ තිබෙනවා. මාර්තු මාසයේ අපේ රටට

106,000ක පමණ සංචාරකයන් ප්‍රමාණයක් පැමිණ තිබෙනවා. නමුත්, අප්‍රේල් මාසය තුළ අපේ රටට පැමිණ තිබෙන්නේ සංචාරකයන් 62,980යි. අපි අරගල කරලා, උද්ඝෝෂණ කරලා අවසානයේදී ලබන ප්‍රතිඵලය මේක නම්, අප එයින් ලබන ජයග්‍රහණය මොකක්ද? මේ කරන අරගළය හරහා අවසානයේදී සිදු වන්නේ මේ රටට ඩොලර් එකතු කරපු ක්‍රම ඇහිරෙන එක නම්, මේ වෙලාවේදී අපි කළ යුතුව තිබෙන්නේ මෙවැනි දේවල් නොවෙයි. ඒ නිසා අපි විශේෂයෙන්ම වර්තමාන අර්බුදය, ප්‍රශ්නය මොකක්ද කියන එක පිළිබඳව හරියට තේරුම් ගන්න අවශ්‍යයි.

සමහර විට ජනාධිපතිතුමා ගත්ත තීන්දු තීරණ පිළිබඳව විවේචන කරනවා. රටක බදු ආදායම -income tax - සියයට 14ක තබාගත යුතු එක, සියයට 8කට එනකොට සමහර කණ්ඩායම් විවිධ චෝදනා, අදහස් ඉදිරිපත් කළා. හැබැයි, ව්‍යවසායකයකුට අතේ මුදල් නැත්නම්, ඔහුට කළමනාකරණයක් සහිතව නැවත ආයෝජනය කරන්න මුදල් නැත්නම්, ඒ ව්‍යවසායකයාට අවශ්‍ය තීන්දු තීරණ අරගෙන ඉදිරියට යන්න පුළුවන්කමක් නැහැ. මේ ආදායම taxes වේවා, සියලු අය කිරීම් වේවා පහළ වැටෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. ව්‍යවසායකයන් අතේ මුදල් ප්‍රමාණයක් ඉතිරි වුණොත් විතරයි තවත් අලුත් ආයෝජනවලට ඔවුන් පෙළඹෙන්නේ. ඒ නිසා ඔවුන්ට නැවත අලුත් ආයෝජන කරන්න, නැවත අලුත් වැඩ පිළිවෙළකට යන්න අවස්ථාව එදා ලබා දුන්නා. අනෙක් පැත්තෙන් බිලියන 8කට වැඩි ණය ප්‍රමාණයක් 2020 -2021 වර්ෂවල අපි ගෙව්වා. සමහර විට කෙනෙකුට හිතෙන්න පුළුවන්, ගත්ත ණය තිබියදී නැවත ණය අරගෙන පරණ ණය ටික ගෙවනකොට රටේ ආර්ථිකය ලස්සනට දුවනවා කියලා. හැබැයි, ඒ කාලයේ ඉඳලා කරගෙන ආපු මේ වැඩ පිළිවෙළ නිසා තමයි අපට දරා දෙන්න බැරි තත්ත්වයකට අද රට පත්වෙලා තිබෙන්නේ.

හැබැයි මතක තියාගන්න, ජනාධිපතිවරයා මේ වෙනුවෙන් තීන්දු තීරණ ගත්තේ කොහොමද කියලා. තවත් රටට ණය අරගෙන අනවශ්‍ය බරක් මේ රටට එකතු කරන්නේ නැහැයි කියන තීන්දුව එතුමා ගත්තා. සමහර විට අපට තිබෙන ඩොලර් ප්‍රමාණය මදි වෙනවා. සමහර විට අපේ තිබෙන සංචිත ප්‍රමාණය අඩු වෙනවා. වෙන දා වාගේ ණය අරගෙන සංචිත විධියට තබාගෙන, ඒ සංචිත ටික නැවත වාරයක් වියදම් කරන යුගය අවසන් කළා. හැබැයි, එතැනදී රටේ ආර්ථිකය නිවැරදි තැනකට පෙළ ගස්වන්න යනකොට, එක පැත්තකින් අපටම අවාසිදායක තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. එක පැත්තකින් ව්‍යවසායකයා අතේ මුදල් ටික ඉතිරි කරනවා. අනෙක් පැත්තෙන් රටට අනවශ්‍ය ණය ලබා ගන්නේ ගන්නේ නැතිව ඒ ටික නතර කරනවා. හැබැයි, කොරෝනා වසංගතය නිසා මේ රට වහලා තිබ්බව කාලසීමාවේ රජයක් විධියට අපට වෙනම අර්බුද ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ නිසා රජය හැටියට අපි ගත්ත ඒ තීන්දු තීරණවල යම් යම් ප්‍රශ්න, ගැටලු ඇති. හැබැයි, අපි මේ සියලු දේවල් විසඳාගෙන මේ රට නිවැරදිව ඉදිරියට ගෙනියන්න ඕනෑය කියන එක අපි විශ්වාස කරනවා. ඒ සඳහා වෙනස් වෙන්නේ කවුද? අපි අමාත්‍යවරු හැටියට ජනාධිපතිතුමාට කිව්වා, ඕනෑම කැපකිරීමක් කරලා මේවා නිවැරදි තැනට පෙළගස්වන්න පුළුවන් නම් අපි මේ වෙලාවේදී කළ යුතුව තිබෙන්නේ එයයි කියලා. හැබැයි, ප්‍රශ්නය, අර්බුදය, ගැටලුව හමුවේ අතහැර දාලා යනවා නම්, කවුරු හරි කෙනෙක් මේ රට භාර ගන්න ඉදිරිපත් වෙන්න ඕනෑ. අද සජබය මේ රට භාර ගන්න සූදානම් නැහැ. අද සියලු පක්ෂ එකට එකතුවෙලා මේ රට භාර අරගෙන කරගෙන යන්න සූදානමක් නැහැ. එම නිසා අපි මේ සියල්ල අතහැර දාලා, මේ රට තවත් විනාශ කරලා, මේ රට වෙනිසියුලාවක්, ලෙබනනයක් බවට පත් කරන්න මොනම විධියකින්වත් සූදානම් නැහැ.

මෙහිදී අපට කළ හැකි වැඩ කටයුතු බොහෝමයක් තිබෙනවා. අද අපේ රටින් විදේශ විනිමය ගලාගෙන යන ක්‍රම බොහොමයක් තිබෙනවා. ඒ විදේශ විනිමය ගලා යන ක්‍රම ටික අහුරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි හදන්න ඕනෑ. පසුගිය කාලයේ digitalization වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණා. මේ ආයතන digitalize කිරීම තුළින් අඩුම තරමින් අපේ රටට කඩදාසි ආනයනය කරන්න වියදම් කරන විදේශ විනිමය ප්‍රමාණයෙන් සියයට 75ක්වත් රට තුළ රඳවා ගන්න පුළුවන් නම්, ඒකත් එක්තරා විධියක ජයග්‍රහණයක් බවට පත් වෙනවා.

අනෙක් පැත්තෙන් අපේ සංචාරක ක්ෂේත්‍රය ගනිමු. විදේශිකයෙක් පාස්පෝර්ට් එකක් ගන්නකොට, වීසා එක renew කරනකොට ඒ සඳහා අය කරන මුදල රුපියල්වලින් නැතිව ඩොලර්වලින් අය කර ගන්න පුළුවන් නම් හොඳයි. මේක අද අපි කළ යුතු වැඩ පිළිවෙළක්. අපි දැක්කා, වරාය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමා නැව්වලින් අය කරන ගාස්තු ඩොලර්වලින් අය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තිබෙන බව. අවුරුදු ගණනාවක් තිස්සේ අපේ සංචිත පිළිබඳව, අපට තිබෙන ඩොලර් පිළිබඳව කොපමණ තර්ක විතර්ක ඉදිරිපත් කළත් අපට ඩොලර් අය කර ගන්න පුළුවන් තැන් ටික අපි හරියට කළමනාකරණය කරලා නැහැ. නිල් පාටද, රතු පාටද, කොළ පාටද කියන එක අදාළ නැහැ, ඒ සියලුදෙනා යම් යම් කාලවල මේ රට පාලනය කළා. හැබැයි, අවශ්‍ය දේ ගලපාගන්න අපට පුළුවන්කම ලැබුණේ නැහැ. ඒ නිසා දැන් හෝ නිවැරදි විය යුතු තැන් ටික නිවැරදි කරලා අපි මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයනවා නම්, ඒක තමයි අපේ ඉලක්කය බවට පත්විය යුතුව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මම මේ කාරණාවත් සිහිපත් කරනවා. අපි අද කථා කරන්නේ විදේශ සංචිත පිළිබඳවයි. එදා 2019දී ගෝඨාභය ජනාධිපතිතුමා බලයට පත් වෙනකොට කථා කළේ රටේ ජාතික ආරක්ෂාව පිළිබඳවයි; මේ රටේ පාතාලය පිළිබඳවයි; මේ රටේ මත් උවදුර පිළිබඳවයි. හැබැයි, මේ කාරණයත් මතක තබා ගන්න. ලබන දෙසැම්බර් මාසය වෙනකොට අපි හැමෝටම කථා කරන්න වෙන්නේ රටේ ආහාර අර්බුදය පිළිබඳවයි. එතකොට අපට කථා කරන්න වෙන්නේ වගාව පිළිබඳවයි. කොතරම් ආහාර ප්‍රමාණයක්, වී අස්වැන්නක් මේ රටේ ගබඩා කර තිබෙනවාද යන්න පිළිබඳවයි. අපි එදාට -දෙසැම්බර් මාසය හෝ ඊළඟ අවුරුද්ද වෙනකොට- ඒ ගැන තර්ක විතර්ක කරන්න බලාගෙන ඉන්නේ නැතිව, ඒකට අවශ්‍ය විසඳුම් ටික දැන් ඉඳලාම මේ පාර්ලිමේන්තුව තුළ කණ්ඩායමක් හැටියට එකතු වෙලා සූදානම් කරන්න පුළුවන් නම්, මාස හයකින් හෝ අටකින් එන ඒ අර්බුදයට මුහුණ දෙන්නට අපට පුළුවන්කම ලැබෙනවා. මේ භාරදූර අවස්ථාවේ ඒ වග කීම භාර අරගෙන මේ රට පෙළගස්වන්නට එකතු වෙලා කටයුතු කිරීම පිළිබඳව ගරු මුදල් ඇමතිතුමාට, මහ බැංකු අධිපතිතුමාට, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දොළහක කාලයක් තිබෙනවා.

[අ.භා.3.51]

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඉතාම වැදගත් කාරණාවක් පාර්ලිමේන්තුවේ විවාදයට ගන්නා මොහොතේ ප්‍රථමයෙන්ම ගරු අලි සබ්රි නව මුදල් ඇමතිතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න ඕනෑ. මේ රටේ ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදය පිළිබඳව අද ඉතාම පැහැදිලිව,

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

විනිවිදභාවයෙන් යුතුව සමස්ත රටටත්, අපේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් දැනගන්නට පුළුවන්කම ලැබුණා. පසුගිය කාලයේ අවස්ථා ගණනාවකදී අපි මේ අර්බුදය පිළිබඳව ඇහුවාම කිව්වේ, "මාසයෙන් අවසන් වෙනවා, මාස දෙකෙන් අවසන් වෙනවා, මාස තුනෙන් අවසන් වෙනවා" කියලායි. අපි ඒ මත බලාපොරොත්තු තබාගෙන සිටියා. හැබැයි, මේ ආර්ථික අර්බුදය තවත් ප්‍රපාතයට ඇද වැටුණා මිසක් විසඳුමක් ලැබුණේ නැහැ. අද ගරු අලි සබ්රි ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට මේ අර්බුදය පිළිබඳව ඉතාම වැදගත් විධියට, ඉතාම ඕනෑකමින් කරුණු පැහැදිලි කළා.

අපි දන්නවා, අද උදේ ඉඳලා මේ පාර්ලිමේන්තුවේ කථා කළේ මේ ආර්ථික අර්බුදයත් එක්ක රට තුළ පැන නැඟී තිබෙන ඊළඟ අර්බුද පිළිබඳව බව. ආර්ථික අර්බුදයක් එන ඕනෑම රටක ඊළඟට එන අර්බුදය තමයි සමාජයීය අර්බුදය. අපි දැක්කා, ඉන්ධන අර්බුදය, විදුලිය අර්බුදය සහ ගෑස් අර්බුදය. මේ අර්බුද නිසා ජනතාව අරගළ කරන්නට පටන්ගෙන තිබෙනවා. අද රටේ දැවැන්ත අරගළයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම ජනතාව තවමත් පෝලිම්වල ඉන්නවා. ආණ්ඩුව හැටියට අපි ඒවා පිළිගෙන තිබෙනවා. ඊළඟ කාරණාව තමයි, මේ ආර්ථික අර්බුදය නිසා බඩු මිල දැවැන්ත විධියට ඉහළ ගිහින් තිබෙන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උදාහරණයක් විධියට ගත්තොත් මීට පෙර වාහනයට රුපියල් 9,000ක තෙල් ගහගෙන අනුරාධපුරයේ සිට පාර්ලිමේන්තු ආපු මම දැන් රුපියල් 19,000ක තෙල් ගහන්න ඕනෑ. මේක උහුලාගන්නට පුළුවන් තත්ත්වයක නොවෙයි අද මේ රටේ සමස්ත ජනතාව සිටින්නේ. ඒ නිසා ජනතාවගේ පැත්තෙන් ගත්තාම ජනතාව පාරට බහින එක සාධාරණයි. අර Galle Face එකේ සිටින තරුණයන් ඇත්තටම රටට ආදරය කරන තරුණයන්. ඔවුන් Galle Face එකේ සිටීම සාධාරණයි කියලා අපට කියන්න පුළුවන්. හැබැයි, දේශපාලන වුවමනාවට ඒ තුළ සිටින කණ්ඩායමකුත් සිටිනවා. මෙවැනි දැවැන්ත අර්බුදයක් තිබෙන මොහොතක රට අරාජික කරන්න, බොර දියේ මාළු බාගන්න සිටින කණ්ඩායමකුත් Galle Face එකේ සිටිනවා. අපි ඒ අය ගැන නොවෙයි කථා කරන්නේ. මේ රටේ අලුත්ම generation එකේ තරුණයන් හැටියට Galle Face එකට වෙලා මේ රට පිළිබඳව කථා කරන එක ගැන ඒ තරුණයන්ට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් මේ ප්‍රශ්නය නිසාම මම ඇතුළු මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 10 දෙනෙක් හෘද සාක්ෂියට එකඟව වැඩ කරන්න කල්පනා කළා. අපි පසුගිය 19වෙනි දා අපේ අතිගරු ජනාධිපතිතුමාටත්, පසුගිය 21වෙනි දා අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් අපේ යෝජනා ලිඛිතව භාර දුන්නා.

මම පාර්ලිමේන්තුවේ දී විශේෂයෙන්ම මේ ගැන කියන්න ඕනෑ. සමගි ජන බලවේගය අද විශ්වාසභංග යෝජනාවක් පිළිබඳ කථා කරනවා. අපිත් එකඟයි සමගි ජන බලවේගයට උදව් කරන්න. අපි එතුමන්ලාගෙන් අහනවා, ඊට පසු වැඩ පිළිවෙළ මොකක්ද කියලා. පිස්සෝ වාගේ විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ආණ්ඩුව වට්ටලා, ඊට පස්සේ ආණ්ඩුව භාර ගන්නවා ද? ආණ්ඩුව භාර ගන්නවා නම් ආණ්ඩුව භාර ගන්නවා කියන්න. එතකොට අපට පුළුවන් මොකක්ද අපි කරන්නේ කියන්න. විශ්වාසභංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙන ආණ්ඩුව වට්ටලා, ආණ්ඩුව භාර ගන්නේ නැත්නම් විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්නේ මොකටද? අපි සමගි ජන බලවේගයේ නායකයාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. අපි ලිඛිතවත් ඉල්ලුවා. අපි ලිඛිත ඉල්ලීමක් කරලා ඉල්ලුවා, "ඔබතුමන්ලා සාකච්ඡාවකට එන්න. ඔබතුමන්ලා මේ රටේ ජනතාවට ඇත්තටම ආදරෙයි නම් ඔබතුමන්ලා එන්න. ඇවිල්ලා සර්ව පාක්ෂික ආණ්ඩුවකට එකඟතාව පළ කරන්න" කියලා. අපි අනුර කුමාර දිසානායක මහත්මයාගෙන් ලිඛිතව ඉල්ලීමක් කළා; සාකච්ඡා කළා. අපි කිව්වා, "මේ රට වැටිලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න හවුල් වෙන්න" කියලා. අපි හැම කෙනෙක්ම දන්නවා මේ මොහොත වෙනකොට රට වැටිලා තිබෙන තත්ත්වය අනුව අපට මැතිවරණයකට යන්න පුළුවන්කමක් නැහැ කියන එක. මැතිවරණයක් සඳහා අඩුම තරමින් රුපියල් කෝටි 1,200ක්වත් වියදම් කරන්න ඕනෑ. ඇල්පෙනෙත්තක් ගන්න මහා භාණ්ඩාගාරයේ ඩොලර් එකක් නැති අපි, මැතිවරණයකට යන්නේ කොහොමද? ඒ නිසා තමයි මේ රටේ ත්‍රෛනිකායික මහා නායක හාමුදුරුවරු කියන්නේ, මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වහන්සේ කියන්නේ, නීතිඥ සංගමය කියන්නේ, වෛද්‍යවරුන් කියන්නේ සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදන්න, ඒකාබද්ධ ආණ්ඩුවක් හදන්න කියලා. ඒ මතයේ තමයි අපි ඉන්නේ. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 10දෙනා හිටියේ ඒ මතයේ. පාර්ලිමේන්තුවේ ඉන්න තවත් මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් ඉන්නේ ඒ මතයේ. ඒ නිසා පිස්සෝ වාගේ විශ්වාස භංග යෝජනා ගෙනාවාට අපි ඒවාට අත උස්සන්න සූදානම් නැහැ කියන එක විශේෂයෙන් කියන්න ඕනෑ. අද රටට කෑ ගහලා කියනවා, මිලියන 220ක් පමණ ජනතාවගේ නියෝජිතයන් වන පාර්ලිමේන්තුවේ ඉන්න ඔක්කෝම විශ්වාස භංගයට අත උස්සන්න ලු. අපි අත උස්සන්න ලෑස්තියි. හැබැයි, පෙන්වන්න ඕනෑ මොකක්ද ඊ ළඟ වැඩ පිළිවෙළ කියන එක. ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ආණ්ඩුව පරාජයට පත් කළොත්, එතුමන්ලා ආණ්ඩුව භාර ගන්නවා ද? ආණ්ඩුව භාර අරගෙන ආණ්ඩුව ඉස්සරහට ගෙනියනවා ද? ඒ ගෙනියන ආණ්ඩුවේ වැඩ පිළිවෙළ කොහොමද කියලා අපට කියන්න. එතකොට අපි අත උස්සනවා. එහෙම නැතිව පිස්සෝ වාගේ විශ්වාස භංග යෝජනා ගෙනාවාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ලෑස්ති නැහැ ඒවාට අත උස්සන්න. හැබැයි, අපි ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා ඇත්තටම මේ රටට ආදරේ නම්, - සමගි ජන බලවේගය වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්, එහෙම නැත්නම් වෙනත් පක්ෂයක් වෙන්න පුළුවන්- අද මේ රට ඉල්ලන සර්ව පාක්ෂික ආණ්ඩුව හදන්න එන්න. එතැන තමයි අපි හිටගෙන ඉන්නේ. එතැන අතිගරු ජනාධිපතිතුමාත් හිටගෙන ඉන්නවා. අපි ඔක්කෝම එකතු වෙලා මේ රටට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා ක්‍රියාත්මක කරමු කියන ආරාධනාව, ඉල්ලීම අපි නැවත නැවතත් කරනවා. එහෙම නැතිව ආවාට ගියාට විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා, ඒ විශ්වාස භංග යෝජනාවෙන් ආණ්ඩුව පරාජයට පත් කරලා මේ රට තව දුරටත් රට අරාජික කරන්නට බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අලි සබ්රි ඇමතිතුමා IMF එකට ගියා. එතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා අපි ඉස්සරහට කරන්නේ මොකක්ද, රටක් හැටියට ඊළඟ ආර්ථික වැඩ පිළිවෙළ සකස් කරන්නේ කොහොමද, මේ අර්බුදයට මුහුණ දෙන්නේ කොහොමද කියලා සාකච්ඡා කළා. ඒ සඳහා දෙන්න පුළුවන් සහයෝගය අපි හැම කෙනෙකුම දිය යුතුව තිබෙනවා. මොකද, මම පුරවැසියකු හැටියට කල්පනා කරනවා, - පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට නොවෙයි- මේ රටේ අපේ දරුවන්ට අනන්‍යතාවක් තිබිය යුතුයි. අනාගතයේ දී අපේ දරුවෝ කොහේටද යන්නේ කියන කාරණාව අපි සිතිය යුතුයි. අපි පුරවැසියන් හැටියට සිතනවා නම්, අපට වග කීමක් හා යුතුකමක් තිබෙනවා. අපේ රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඔබත් අනුරාධපුරයේ, මමත් අනුරාධපුරයේ. අපටත් වේදනායි අපේ ගොවියෝ පිළිබඳව. අපි ඔවුන් ගැන කථා කරපු අවස්ථා අනන්තයි, අප්‍රමාණයි. කණ්ඩායම් රැස්වීමේදී අපි ප්‍රධාන වශයෙන් ප්‍රබල ඉල්ලීම් කළා. නමුත්, ඒවාට අපට උත්තර ලැබුණේ නැහැ.

හැබැයි, අපි උඩ බලාගෙන කෙළ ගැහුවේ නැහැ, මාධ්‍යයට ඇවිල්ලා එක එක දේවල් කිව්වේ නැහැ. රටේ ජනාධිපතිවරයා, රටේ රාජ්‍ය නායකයා ගත්ත තීන්දුවට අපි එකඟතාව පල කරලා, අපි යම් යම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා ඒ වැඩ පිළිවෙළ සාර්ථක කරන්න.

හැබැයි, අපි නැවතත් කියනවා. අදත් කියනවා. මේ වෙනකොට අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 35,000කට වැඩිය වගා කරලා තිබෙනවා. මම මේ ගැන ගිය සතියේ කණ්ඩායම් රැස්වීමේදීත් ජනාධිපතිතුමාට කිව්වා. දැන් පොහොර ඕනෑ. මොන විධියකින් හෝ අපට පොහොර ටික දෙන්න කියන ඉල්ලීම අපි ප්‍රබල ලෙස එදා ඉදිරිපත් කළා. අද කෘෂිකර්ම ඇමති වශයෙන් ජානක වක්කුඹුර මැතිතුමා පත් වෙලා ඉන්නවා. අපි බලාපොරොත්තු තියාගෙන ඉන්නවා, එතුමා මොන විධියෙන් හෝ රසායනික පොහොර ටිකක් ලබා දෙයි කියලා. එහෙම නොදුන්නොත් අපට නැවතත් වෙන්නේ පසුගිය මාස් කන්නයේ වෙච්ච දේමයි. එතකොට අපි බලාපොරොත්තු වෙන ඉලක්කයට අපට යන්න ලැබෙන්නේ නැහැ. මේවා තමයි අපි කරපු වැරැදි. හැබැයි, අපි ඒ වැරැද්ද පිළිගෙන තිබෙන බව මේ වෙලාවේ පිළිගන්න ඕනෑ. අපි විශේෂයෙන්ම විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, වැරැද්ද පිළිගැනීමත් බොහොම සානුකම්පිත කාරණාවක් හැටියට සලකන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ජනතා අරගළය අපි නිරන්තරයෙන් කථා කළ යුතු කාරණාවක්. මේ ජනතා අරගළය පිළිබඳව අපි නිරන්තරයෙන් සිතිය යුතුයි. ආණ්ඩුවක් හැටියට අපට මේ දෙස අස් කන් පියාගෙන ඉන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පුළුවන් තරම් ඉක්මනින් මේ ජනතාවගේ අරගළය අවසන් කළ යුතුව තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවෙනුත් ඉල්ලීමක් කරනවා. අපි ඉල්ලන සර්ව පාක්ෂික, ඒකාබද්ධ ආණ්ඩුවට අනෙක් පක්ෂ 11ත් එකඟතාව පළ කරලා තිබෙනවා. අපි ජනාධිපතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් මේ ඉල්ලීම කරනවා. මේ ආණ්ඩුවේ වගකීම තමයි සමගි ජන බලවේගයත් එක්ක සාකච්ඡා කිරීම. මේ ආණ්ඩුවේ වගකීම තමයි ජනතා විමුක්ති පෙරමුණත් එක්ක සාකච්ඡා කිරීම සහ අනෙක් පක්ෂ එක්ක සාකච්ඡා කිරීම. අපි හැමෝම කියන කාරණාව තමයි ආණ්ඩුවත් මේ වෙලාවේ නම්‍යශීලි විය යුතුයි කියන කාරණාව. එහෙම නම්‍යශීලි වෙලා අපි ඉල්ලන, මහා සංඝරත්නය ඉල්ලන, අපි හැමෝම කථා කරන සර්ව පාක්ෂික ඒකාබද්ධ ආණ්ඩුව නිර්මාණය කිරීමට ආණ්ඩුවේත් වගකීමක් තිබෙනවා. ආණ්ඩුවත් ඒ පිළිබඳ කටයුතු කළ යුතුයි කියන ඉල්ලීම කරනවා.

විශේෂයෙන් අද අපේ මුදල් අමාත්‍යතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. අද ඉතාම හොඳ මහ බැංකු අධිපතිවරයෙක් පත් කරලා තිබෙනවා. මුදල් අමාත්‍යාංශයට ලේකම්වරයෙක් පත් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ තිබෙන සත්‍ය තත්ත්වයත් එක්ක මේ අර්බුද මොන විධියකින් හෝ සමනය කරගෙන යන්න අපට පුළුවන් වෙයි කියලා. ඒ නිසා අපේ යෝජනාවලියට සියලුදෙනා කන් දීලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.02]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද අපේ රටේ ආර්ථික තත්ත්වය ගැන කථා කරනකොට ඉස්සෙල්ලාම කියන්න අවශ්‍යයි, අලි සබ්රි අමාත්‍යවරයා වර්තමාන තත්ත්වය ඇත්ත ඇති සැටියෙන් කියැවීම පිළිබඳ අපි සතුටු වෙන බව. නමුත් ඇත්ත ඇති සැටියෙන් කියැවීම ප්‍රමාණවත් නැහැ. ඒ මොකද, මේවාට කවුද වග කියන්නේ? අද ඇති වෙලා තිබෙන අර්බුදයෙන් මේ රටේ මිලියන 22ක ජනතාව දුක් විඳිනවා. ඒකට වගකියන්නේ කවුද? මේ තත්ත්වය ඇති වුණේ මුදල් ඇමතිවරයා හැටියට කටයුතු කළ බැසිල් රාජපක්ෂ මැතිතුමා නිසාද, ඊට කලින් කටයුතු කළ මහින්ද රාජපක්ෂ මැතිතුමා නිසාද, අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය මුදල් අමාත්‍යවරයා හැටියට ගත්ත තීන්දු තීරණ නිසාද, මහා භාණ්ඩාගාරයේ අධිපතිවරයා හැටියට ගත්ත තීන්දු තීරණ නිසාද, ජනාධිපතිවරයා පොහොර පිළිබඳ ගත්ත තීරණ නිසා ඇති වූ ප්‍රශ්න ගණනාව නිසාද? මේ අර්බුදය ඇති වුණේ ඒවා නිසාද? මෙන්න මේ ගැන පාර්ලිමේන්තුව හැටියට කරුණු කියන්න අපට වගකීමක් තිබෙනවා. මම කථානායකතුමාට යෝජනා කරනවා, මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා ඒ වැරැදිකරුවන්ටත් දඬුවම් ලබා දිය යුතුයි කියලා. එහෙම නැතිව, "ඔව්, අපි වැරැද්දක් කළා. ඒ ගැන අපි කනගාටු වෙනවා" කියලා කිව්වාට ඒක මේ ප්‍රශ්නයට විසඳුම නොවෙයි.

අපි වරද හඳුනාගත යුතුයි. වරද හඳුනා ගැනීම පිළිබඳව සතුටුයි. මොකද, මීට කලින් වරදක්වෙලා තිබෙනවා, ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කියලා ප්‍රකාශ කළේ නැහැ. හැම වෙලාවේම කිව්වේ, අපට ඕනෑ තරම් ඩොලර් තිබෙනවා, ඉන්ධන බවුසර් ඇවිල්ලා ආපහු හැරිලා යනවා කියලා. එවැනි මහා අද්භූත කථා තමයි කිව්වේ. ඒ නිසා තමයි මේ පාර්ලිමේන්තුවෙන් පිටත ඉන්න ජනතාව අද මේ පාර්ලිමේන්තුව දිහා වෛරයෙන් බලන්නේ. ප්‍රශ්නය හඳුනා නොගත් නිසා, ප්‍රශ්නය පිළිබඳව අවධානයක් යොමු කළේ නැහැ. හරි, දැන් අපි ඒ ප්‍රශ්නය හඳුනාගෙන තිබෙනවා.

ඒ ප්‍රශ්නය අද දේශපාලන අර්බුදයක් බවට පත්වෙලා තිබෙනවා. අද දේශපාලන අර්බුදයයි, ආර්ථික අර්බුදයයි කියන අර්බුද දෙකක් මේ රටට විසඳන්න තිබෙනවා. ආර්ථිකය අර්බුදය විසඳා ගැනීමට, දේශපාලන අර්බුදය විසඳා ගත යුතුමයි. දේශපාලන අර්බුදය විසඳා නොගත්තොත් IMF එක හෝ කවුරුවත් අපට සහයෝගය දෙන්නේ නැහැ. මේ දේශපාලන අර්බුදය විසඳා ගැනීමට නම් මුළු රටම කියන්නේ මොකක්ද? රටම කියන්නේ, "Gota, go home!", "Rajapaksas, go home!" කියලා. ඒ කියන්නේ, මේ ආණ්ඩුවට ගෙදර යන්න, ජනාධිපතිවරයාට ගෙදර යන්න කියන එක. මේ ජනාධිපතිවරයාට, මේ ආණ්ඩුවට ගෙදර යන්න කියලා මේ රටේ හැම පුරවැසියෙක්ම වාගේ දැන් එළියට බැහැලා කියනවා. මේ රටේ ඉන්න පුරවැසියෝ පමණක් නොවෙයි. ලෝකයේ හැම රටකම ඉන්න අපේ ශ්‍රී ලාංකිකයෝ අද එළියට බැහැලා කියනවා, මේ ආණ්ඩුවට, මේ ජනාධිපතිවරයාට ගෙදර යන්න කියලා. හැබැයි, එලෙස චෝදනා කළත්, මේ වාගේ විරෝධතා කළත්, මේ පාලකයෝ ටික ඇස් පෙනෙන්නේ නැතුවා වාගේ, කන් ඇහෙන්නේ නැතුවා වාගේ ඉන්නවා. අන්න ඒ නිසා තමයි දැන් වෛරය තවත් වැඩිවෙලා තිබෙන්නේ. අද අපට පාර්ලිමේන්තුවට වාහනයකින් එන්න බැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපට ජනතාවගේ අදහස් කියන්න එන්න විධියක් නැතිවෙලා තිබෙනවා. මොකද, අද ජනතාව අපේ පාර්ලිමේන්තුව වට කරලා. ජනතාව මේ පාර්ලිමේන්තුව වට කරන්න හේතුව තමයි, මේ රටේ ජනතාවට

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

පාර්ලිමේන්තුව කෙරෙහි විශ්වාසය නැති වීම. විශේෂයෙන්ම මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය නැතිවෙලා තිබෙනවා. මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය නැති වීම තමයි අද තිබෙන ලොකුම ගැටලුව. අපි ඒක ව්‍යවස්ථානුකූලව විසඳාගත යුතුයි.

මම ඉතා සතුටු වන වාගේම, ඉතා කනගාටු වන සිදු වීමක් අද වුණා. අද පොලීසිය දේශපාලනීකරණය කරලා අර අහිංසක විරෝධතාකරුවන් අත්අඩංගුවට ගන්න යනවා. ඒ ගැන මම ඉතා කනගාටු වනවා. එයට විරුද්ධව අපේ සමගි ජන බලවේගය නීතිඥ සහාය ලබා දෙන්න කටයුතු කරනවා. නීතිඥ සංගමය - Bar Association එක - ඒ විරෝධතාකරුවන් වෙනුවෙන් ඉදිරිපත් වීම ගැන මම සතුටු වනවා. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබිය යුතුයි. ඒ වාගේම අපි ඒ විරෝධතාකරුවන්ටත් කියනවා, සාමකාමීව විරෝධතා පවත්වන්න කටයුතු කරන්න කියලා. අපි ඒ විරෝධතාකරුවන් වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ විරෝධතාකරුවන්ගේ, ඒ අරගළය කරන සියලුදෙනාගේ අදහස් තමයි සමගි ජන බලවේගය මේ පාර්ලිමේන්තුව තුළදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

තමුන්නාන්සේලා අපට කියනවා අන්තර්වාර පාලනයකට එන්න කියලා. හැබැයි මුළු රටම කියන්නේ ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස් වෙන්න කියලා නම්, අප පුළුවන්ද ඒ මතයට විරුද්ධව ඇවිල්ලා මැති ඇමතිකම් ගන්න? ඒ නිසා අපි එලෙස කටයුතු කරන්නේ නැහැ. අපි මේ වගකීම ගන්නවා. එයට අපි සූදානම්. අපට හොඳ නායකයෙක් ඉන්නවා. අපට හොඳ කණ්ඩායමක් ඉන්නවා. අපි ඒ වගකීම ගන්න සූදානම්. හැබැයි, ඒ සඳහා ගෝඨාභය රාජපක්ෂ ඉල්ලා අස් වෙන්න ඕනෑ; මහින්ද රාජපක්ෂ ඉල්ලා අස් වෙන්න ඕනෑ; මේ ආණ්ඩුව ඉල්ලා අස් වෙන්න ඕනෑ. එහෙම කළොත් අපි වගකීම ගන්නවා. එතුමන්ලා ඉල්ලා අස් වෙන්නේ නැති නිසා තමයි අපි ඊයේ ගරු කථානායකතුමාට විශ්වාස භංග යෝජනා දෙකක් භාර දුන්නේ. ඒවා භාර දුන්නේ ජනාධිපතිවරයාට විරුද්ධව සහ අග්‍රාමාත්‍යවරයා ඇතුළු ආණ්ඩුවට විරුද්ධව. රටේ දේශපාලන ස්ථාවරත්වය ඇති කරන්න අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා හැකි ඉක්මනින් -පුළුවන් නම් හෙටම- ඒ විශ්වාස භංග යෝජනාව සහ දෝෂාභියෝගය විවාදයට ගන්න අවස්ථාව ලබා දෙන්න කියලා. මා දන්නා තරමට ඒ සඳහා දින පහක කාලයක් ඕනෑ. ඒ දින පහක කාලය ලබා ගන්න කටයුතු කරන්න. ලබන සතිය පාර්ලිමේන්තුව රැස්වෙන සතියක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා ලබන සතිය පාර්ලිමේන්තුව පැවැත්වෙන සතියක් කරන්න. මොකද, මුළු රටම බලාගෙන ඉන්නවා මේ පාර්ලිමේන්තුවෙන් විසඳුමක් ලැබෙන තෙක්. අය වැයේදී සෙනසුරාදා දින ද ඇතුළුව මාසයක් එක දිගට පාර්ලිමේන්තුව රැස් වනවා. නමුත් මේක අය වැයට වඩා අත්‍යවශ්‍ය කාරණාවක්.

මා කියන්නේ නැහැ, අය වැය අත්‍යවශ්‍ය නැහැයි කියලා. ඒ වාගේම අත්‍යවශ්‍යයි, දැනට තිබෙන මේ අර්බුදය විසඳා ගන්න එක. එහෙම නම්, ලබන සතියේ පාර්ලිමේන්තුවට නිවාඩු දෙන්න ඕනෑ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඒ කැප කිරීම කරන්න සූදානම්. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා කියනවා නම්, මේ රටේ ජනතාව කියනවා නම්, ඒ සඳහා වියදමක් යනවා කියලා, අර කැන්ටින් එක වසා දමන්න. කැන්ටින් එක ඕනෑ නැහැ. කෑම නැතුව වුණත් අපි මේ ප්‍රශ්නය විසඳා ගන්න කටයුතු කරන්න ඕනෑ. කැන්ටින් එකේ දවල් කෑම, තේ යනාදී මොනවත් ඕනෑ නැහැ. ඒ කැප කිරීම අපි කරන්නම්. හැබැයි, ලබන සඳුදා සිට සිකුරාදා දක්වා හෝ පාර්ලිමේන්තුව පවත්වා මේ ප්‍රශ්නය විසඳන්න. මේ ප්‍රශ්නය තවදුරටත් මඟ හරින්න එපා. මේ ප්‍රශ්නය තවත් සතියකට කල් දමන්න එපා. මේ ප්‍රශ්නය තවත් සතියකට කල් දැම්මොත්, අපේ ප්‍රජාතන්ත්‍රවාදය රැක දෙන මේ උත්තරීතර පාර්ලිමේන්තුව පිළිබඳ විශ්වාසය මේ රටේ ජනතාවට නැතුව යනවා. මේ රටේ ජනතාවගේ ආවේගයත් එක්ක, මේ අර්බුදය විශාල ගැටලුවක් වුණොත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සදාකාලිකව නැති වෙනවා. ඒ නිසා කථානායකතුමාට මේ සම්බන්ධයෙන් විශේෂ වග කීමක් තිබෙනවා. ලබන සඳුදා, අඟහරුවාදා ඇතුළුව මුළු සතියේම පාර්ලිමේන්තු රැස්වීම් පවත්වමු. ලබන සතියේ පාර්ලිමේන්තු රැස්වීම් පවත්වා මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්න. කොච්චර අරගළ කළත්, කොච්චර විරෝධතා කළත් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ ව්‍යවස්ථානුකූලවයි. මේ ප්‍රශ්නය ව්‍යවස්ථානුකූලව විසඳන්න නම්, පාර්ලිමේන්තුව තුළින් විසඳුමක් ගෙනෙන්න ඕනෑ. ඒ ගැන අපි බලමු. අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනකොට, ඒ විශ්වාස භංග යෝජනාව භාර දීලා තිබෙනකොට, කථානායකතුමාගේ හා මේ ආණ්ඩුවේ වග කීමක් තමයි ඊට ප්‍රමුඛත්වය ලබා දෙන එක. ඊට ප්‍රමුඛත්වය ලබා දීලා, මේ පාර්ලිමේන්තුව තුළ මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් තිබෙනවාද, නැද්ද කියන එක ගැන දැන ගන්න කටයුතු කළ යුතුයි. සමගි ජන බලවේගය, දෙමළ ජාතික සන්ධානය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විශාල පාර්ලිමේන්තු කණ්ඩායමක් මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය ලබා දෙන්න, මේ ආණ්ඩුවට විරුද්ධව තමන්ගේ ඡන්දය පාවිච්චි කරන්න සූදානම්වෙලා ඉන්නවා. මේ රාජපක්ෂ ආණ්ඩුව රකින්න මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ කවුද, රාජපක්ෂ ආණ්ඩුව රැකලා ගෙදර එනවාද, ගමට එනවාද කියලා මුළු රටම බලාගෙන ඉන්නවා. අද ඇමතිවරුන්ට විශාල ගැටලුවක් තිබෙනවා. ගමට යන්න, මඟුල් ගෙදරකට යන්න, මළ ගෙදරකට යන්න බැරි තත්ත්වයකට එතුමන්ලා පත්වෙලා තිබෙනවා. ඒ නිසා මේ කටයුත්ත තවදුරටත් කල් අරින්න බැහැ.

අද අලි සබ්රි අමාත්‍යවරයා කිව්වා, ඇමෙරිකානු ඩොලර් මිලියන 50කට වඩා අඩු සංචිත ප්‍රමාණයක් තමයි තිබෙන්නේ කියලා. අද ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක සංචිත ප්‍රමාණයක් තිබීමට හේතු වුණේ කවුද? තමුන්නාන්සේලා දන්නවා, මේ තුළින් අහිංසකම, දුප්පත්ම අපේ සහෝදර සහෝදරයන්ට, දෙමවුපියන්ට තමයි ප්‍රශ්න ඇති වෙන්නේ කියලා. දැන් ඖෂධ නැහැ. සෞඛ්‍ය අමාත්‍යවරයා කියනවා, ප්‍රමාණවත් ලෙස ඖෂධ ලබා ගන්න තව මාස තුනක් විතර යනවා කියලා. එතකොට ඒ මාස තුන තුළ මිය යන අයට කවුද වග කියන්නේ? අපේ දෙමවුපියන් වෙන්න පුළුවන්, අපේ දූ දරුවන් වෙන්න පුළුවන්, මේ අයට බෙහෙත් ටික නැතුව මේ මාස තුන තුළ මිය ගියොත් කවුද වග කියන්නේ? මේ රාජපක්ෂ ආණ්ඩුවද වග කියන්නේ? ඒ නිසා කරුණාකරලා, අවශ්‍ය කටයුතු කරන්න තවදුරටත් කල් මරන්න එපා. මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ගෙන, ලබන සතිය පුරාම හෝ පාර්ලිමේන්තු රැස්වීම් පවත්වා, මේ ප්‍රශ්නයේ අවසානයක් දකින්න මුළු රටම බලාගෙන ඉන්නවා. ඒ වෙනුවෙන් කටයුතු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, අසංක නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා.4.12]

**ගරු අසංක නවරත්න මහතා**
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වූ එකඟතා ගිවිසුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන

ලද අමාත්‍යාංශ නිවේදනය පිළිබඳව පැවැත්වෙන විවාදයට එක් වෙමින් අද අපට කථා කරන්න සිද්ධවෙලා තිබෙන්නේ, ලංකා ඉතිහාසයේ දැවැන්තම මූල්‍ය අර්බුදයකට අප ලක්වෙලා ඉන්න මොහොතක. විශේෂයෙන්ම ඉතිහාසයේ ඇති නොවූ දැඩි ආර්ථික අර්බුදයකින්, දැඩි පීඩනයකින් ජනතාව ජීවත්වන මොහොතක තමයි, අපි පාර්ලිමේන්තුවේ මේ විවාදයට එකතුවෙලා තිබෙන්නේ.

අපි දන්නවා, 2021 අවුරුද්දේ අපේ රටේ වාර්ෂික ආදායම රුපියල් බිලියන 1,464යි -රුපියල් බිලියන 1,500කට ආසන්න ප්‍රමාණයක්- කියලා. හැබැයි, රාජ්‍ය වියදම රුපියල් බිලියන 3,500 ඉක්මවා ගිහින් තිබෙනවා.

එතකොට අපට ආදායම වාගේ දෙකහමාරක වියදමක් දරමින් තමයි කටයුතු කරන්න වෙලා තිබෙන්නේ. රාජ්‍ය ආදායම වාගේ දෙගුණයක් -බිලියන 2,800ක්- විතර රාජ්‍ය සේවයේ වැටුප් ගෙවන්න, සහනාධාර ගෙවන්න, සමෘද්ධි මුද්දර ඇතුළු අනෙකුත් සහනාධාර කටයුතු වෙනුවෙන් වියදම් කරනවා. පඩි නඩි ගෙවන්න මේ ආණ්ඩුවේ ආදායමින් සියයට පනස්අටක් වාගේ විශාල වියදමක් දරනවා. රටේ ආර්ථිකය බොහොම නරක තැනක තිබෙන මොහොතක තමයි මේ අර්බුදය උත්සන්න වෙලා තිබෙන්නේ. අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න මහජන නියෝජිතයන් විධියට, වග කිව යුතු ජනතා නායකයන් විධියට දීර්ඝ කාලයක් තිස්සේ අපි පාර්ලිමේන්තුවේ දෙපැත්තට බෙදිලා විවාද කර ගන්නවා විතරයි. ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් මීට වඩා සංවේදී වෙලා, ජනතාවට අවශ්‍ය සහන ටික ලබා දෙන්න, මේ අර්බුදයෙන් රට ගොඩ ගන්න අපි අපේ දායකත්වය දුන්නාද කියන කාරණාව හෘදය සාක්ෂියට අනුව කල්පනා කරන්න ඕනෑ යුගයක තමයි අපි ඉන්නේ.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විධියට "පොහොට්ටුව" ලකුණෙන් අපි තරග කරලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපි පසු ගිය කාලය පුරාම විවිධ උත්සාහ ගත්තා, පසුගිය කාලයේ ආණ්ඩුව ගත්ත වැරදි තීන්දු තීරණ නිවැරදි කරන්න. නමුත් අවසානයේ ඒක පුපුරා ගිහිල්ලා, මන්ත්‍රීවරු හතළිහකට ආසන්න සංඛ්‍යාවක් දැන් විපක්ෂයේ ස්වාධීනව කටයුතු කරනවා. අපි මේ අර්බුදය මීට කලින් දැක්කා. මහ බැංකුවේ අපට හිතවත් සමහර නිලධාරීන් මීට පෙර අවුරුද්දකට විතර කලින් මේ අර්බුදය මේ තරම් විශාල මට්ටමකට එනවා කියලා අපට දැනුම් දුන්නා. ඒ අනුව පක්ෂ නායකයන් කැබිනට් මණ්ඩලය තුළදීත්, ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීම තුළදීත් විවිධ අවස්ථාවලදී "මේ යන පාර හරි නැහැ, මේක නිවැරදි කර ගන්න ඕනෑ." කියන අදහස ඉදිරිපත් කළා. නමුත් සමහර වෙලාවට අපේ අදහසට කන් දුන්නේ නැහැ. "අපට ඩොලර් ප්‍රශ්නයක් නැහැ. අපට ආර්ථිකයේ අමාරුකමක් නැහැ. මේක විසඳා ගන්න පුළුවන්." කියන පණිවුඩය තමයි හුඟක් වෙලාවට ලැබුණේ.

නමුත් අද මහජනතාව විශාල පීඩාවකට මුහුණ දීලා ඉන්නවා. ඒ නිසා ඔවුන් පාරට බැහැලා ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, ආණ්ඩුවට, ඒ වාගේම පාර්ලිමේන්තුවේ දෙසිය විසිපස්දෙනාටම ගෙදර යන්න කියන සටන් පාඨය ඉදිරියට අරගෙන ඇවිල්ලා, විශාල අරගළයක් කරනවා. ස්වාධීන වුණු අපේ කණ්ඩායම දේශපාලන පක්ෂ එකොළහක් විධියට විපක්ෂයේ කටයුතු කරමින්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේත් කණ්ඩායමක් සම්බන්ධ කරගෙන, පසු ගිය සති දෙක-තුනක කාලය තුළ යෝජනාවලියක් හැදුවා, මේ ප්‍රශ්නයෙන් ගොඩ යන්න නම් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂ එකට වැඩ කරන්න ඕනෑ, මේ ප්‍රශ්නයට කඩිනම් විසඳුම් ගන්න ඕනෑ කියන කාරණාව පිළිබඳව එකට වාඩි වෙලා සාකච්ඡා කරන්න ඕනෑ කියලා. ඒ අනුව අපි සර්ව පාක්ෂික අන්තර් කාලීන ආණ්ඩුවක් යෝජනා කළා. ඒ යෝජනාවලිය ජනාධිපතිතුමා පිළිගත්තා. පිළිගෙන, මේ කටයුත්ත සාකච්ඡා කරලා ඉස්සරහට ගෙන යන්න කියන වගකීම අපට පැවරුවා. ඒ අනුව අපි සමඟි ජන බලවේගයත් එක්ක සාකච්ඡා කළා; ජනතා විමුක්ති පෙරමුණත් එක්ක සාකච්ඡා කළා; විපක්ෂයේ අනෙකුත් දේශපාලන පක්ෂ එක්ක අවස්ථා ගණනාවක් සාකච්ඡා කළා. නමුත් අපට පෙනෙන්න තිබෙන්නේ, මේ ප්‍රශ්නය විසඳන්න ඔවුන්ට වුවමනාවක් නැති බවයි. ඇතැම් පක්ෂ නායකයන්ට ඒ පිළිබඳ වුවමනාවක් නැහැ. ඊළඟ මැතිවරණයකදී එතුමන්ලාට දැන් තිබෙන මන්ත්‍රී ආසන සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් ලබා ගන්න පුළුවන්කම තිබෙද්දී අපි මොකටද මේ අර්බුදය විසඳන්න දායක වෙන්නේ, අපි මොකටද මිනිසුන්ට මේ වෙලාවේ සහන දීලා අපට ලබා ගන්න තිබෙන මන්ත්‍රී ආසන සංඛ්‍යාව අඩු කර ගන්නේ කියලා හිතලා, දේශපාලන බල අරගළයක යෙදෙනවා මිසක්, රටේ මහජනතාවගේ ප්‍රශ්න ගැන සංවේදී වෙලා, ඔවුන්ට කඩිනමින් විසඳුම් ලබා දීමට ඉදිරිපත් වන්නේ නැහැ; ඒ වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ.

නැවත වතාවක් අපි ඉල්ලා සිටින්නේ, පසු ගිය සති දෙකේ අපි සාකච්ඡා කළා. සමඟි ජන බලවේගයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මෙතැන ඉන්නවා. ඔබතුමන්ලා හෘදය සාක්ෂියට එකඟවද, මැතිවරණයකට යන්න සූදානමින් ආණ්ඩුවට විරුද්ධව මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ? මේ වෙලාවේ මිනිස්සු ඉල්ලන්නේ මැතිවරණයක් නොවෙයි, ඉන්ධන ප්‍රශ්නයට විසඳුමක්; මිල වැඩි වුණු ආහාර ද්‍රව්‍යවලට සහන මිලක්; ගෑස් ප්‍රශ්නයට විසඳුමක්.

මේ මූලික අවශ්‍යතා ටික සපුරලා මේ රට දේශපාලන වශයෙන් ස්ථාවර කර දෙන්න, ආර්ථික වශයෙන් රට ගොඩ නඟන්න කියන ඉල්ලීමයි මිනිස්සු කරන්නේ. ඒ නිසා ජනාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ සියලු දේශපාලන පක්ෂ එකතු වෙලා වහාම සර්ව පාක්ෂික, ජාතික එකඟතා ආණ්ඩුවක් හදන්න කටයුතු කළ යුතු වනවා. ඒකට දැන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත් එකඟ වෙලා තිබෙනවා. මේ මොහොතේ මේ ජාතික වග කීමට එකතු වෙන්න කියලා විපක්ෂයේ අනෙක් ප්‍රධාන පක්ෂවලිනුත් අපි ඉල්ලීමක් කරනවා. මේ වගකීම අපෙන් මඟ හැරුණොත් දේශපාලනය කරන්න අනාගතයේ අපට රටක් ඉතුරු වෙන එකක් නැහැ. රට ප්‍රචණ්ඩත්වය කරා යනවා; රට ගිනි බත් වෙනවා. පාරට බැහැලා ඉන්න මිනිස්සු ගෙදර යවලා, ඒ මිනිස්සුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහා අපි සියලුදෙනා එකට කැප වෙන්න ඕනෑ මොහොතක් මේ තිබෙන්නේ. ඒ වෙනුවෙන් අපි සියලුදෙනා පෙළ ගැහෙමු. අපි පාර්ලිමේන්තුවේ දෙපැත්තට වෙලා ඉතිහාසයේ වුණේ මෙහෙමයි, මෙහෙමයි කියමින් වාද විවාද කළ යුතු යුගයක් නොවෙයි මේ තිබෙන්නේ. අපි අලුතින් හිතන්න ඕනෑ යුගයකයි මේ ඉන්නේ. ඒ වෙනුවෙන් අපි සියලුදෙනා එකට එකතු වෙමු කියා ආරාධනා කරනවා. ඒ ආරාධනාව පිළිගැනීමට සමගි ජන බලවේගයේ හුඟක් ගම් මට්ටමින් ආපු, ඒ බිමට වග කියන මන්ත්‍රීවරු සැදී පැහැදී සිටිනවා. නමුත්, නායකත්වයට තවමත් මේ පිළිබඳ හරිහැටි වැටහීමක් නැහැ. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණත්, සමගි ජන බලවේගයත් නැවත වතාවක් මේ පිළිබඳව හිතන්නය කියන ඉල්ලීම කරමින්, ඒ වැඩ පිළිවෙළ ශක්තිමත්ව ඉදිරියට ගෙන ගිහිල්ලා ඉතා කඩිනමින් ජනතාවගේ ප්‍රශ්න විසඳීමට අපි මැදිහත් වෙමුයි කියන කාරණාව සඳහන් කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.12]

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ ප්‍රකාශය සම්බන්ධයෙන් වන විවාදයට එකතු වන්න කාලය ලබාදීම පිළිබඳව ප්‍රථමයෙන්ම මා ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අපේ රට දිහා බලනකොට අප මේ වන විට සිටින්නේ තීරණාත්මක මොහොතක. විශේෂයෙන් රටක් විධියට, රජයක් විධියට, ජනතාව විධියට අපි සියලුදෙනාම මේ පවතින ආර්ථික තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා සටන් කරමින් සිටින මොහොතක අප සිටින බව සිහිපත් කළ යුතුයි. මේ වනකොට ආර්ථිකයේ තිබෙන සැබෑ තත්ත්වය පිළිබඳවත්, මේ තත්ත්වයෙන් මිදී ඉදිරියට යෑම සඳහා අප ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳවත් ගරු මුදල් අමාත්‍යතුමා අද මේ ගරු සභාව දැනුවත් කළා.

දීර්ඝ කාලයක් පුරා අපේ රටේ ආර්ථිකයට බද්ධ වෙච්ච කරුණු කාරණා ගණනාවක් මේ ආර්ථික අර්බුදයට හේතු වුණු බව අපි දන්නවා. මෑත කාලයේ ඇති වූ කොරෝනා අර්බුදය වේවා, ලෝකයේ ඇති වූ අනෙකුත් තත්ත්ව වේවා, ඒ සියල්ල එකට ගොනු වීමෙන් පසුවයි මේ අර්බුදය මේ ආකාරයේ බොහොම නරක තැනකට පැමිණියේ කියන එක විශේෂයෙන් අපි දන්නා කාරණයක්. ඒ නිසා මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම අපි කළ යුතු දේ තමයි, මේ අර්බුදය ගැන එකිනෙකාට චෝදනා කිරීමෙන් බැහැර වෙලා මේ අර්බුදයෙන් රටත්, ජනතාවත් මුදා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම. මම විශ්වාස කරනවා, මේ වනකොට මුදල් අමාත්‍යතුමාත්, මහ බැංකු අධිපතිතුමා ඇතුළු පිරිසත් ඒ ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳ දැනුවත් කරනවා කියලා. ඒ වාගේම ඉදිරියේදීත් ආර්ථිකය සම්බන්ධ යම් අසීරු ක්‍රියාමාර්ග ගන්න අපට සිදු වෙනවා නම්, ඒ තීන්දු- තීරණ පිළිබඳවත් රටේ ජනතාව දැනුවත් කරමින් කටයුතු කිරීම වැදගත් වෙනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පැවැති සාකච්ඡා ධනාත්මක බව ගරු මුදල් අමාත්‍යතුමා මේ ගරු සභාවේදී සඳහන් කළා. නමුත්, මේ වනකොට අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි, මේ සාකච්ඡාවල ප්‍රතිඵල ලැබෙන්න යන මාස කිහිපය තුළ අපි රටේ ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරමින් ආර්ථිකය කළමනාකරණය කර ගන්නේ කොයි ආකාරයෙන්ද කියන එක. ඉදිරි මාස කිහිපය තුළ අපි ආර්ථිකය කළමනාකරණය කර ගන්නේ කුමන ආකාරයෙන්ද කියන ප්‍රශ්නය තමයි මේ වනකොට අපට තිබෙන ප්‍රධානතම අභියෝගය. අපි දන්නවා ඉන්දියාවෙන් ඉන්ධන සඳහා ලැබී තිබෙන Credit Line එක ගැන. ඖෂධ, ගෑස් ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා යන වියදම කළමනාකරණය කළ යුතු වනවා වාගේම, ලෝක බැංකුවෙන් හා අනෙකුත් ආයතනවලින් සහ රටවලින් අපට උදව් විධියට ලබා දෙන මුදල් නියමාකාරයෙන් කළමනාකරණය කරගෙන ඉදිරි මාස කිහිපයේදී ඉතා කල්පනාකාරීව කටයුතු කිරීමත් වැදගත් වනවාය කියන කාරණය විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම බිලියන 51කට ආසන්න අපේ විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සඳහාත් අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

ඉදිරියේදී රටේ ආර්ථිකය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී, දීර්ඝ කාලීනව ඇති වන බලපෑම් පිළිබඳවත්, රටක් වශයෙන් අපට දැරිය හැකි, කළමනාකරණය කර ගත හැකි ප්‍රමාණය පිළිබඳවත්, හදිසි තත්ත්වයකදී ඒ අවශ්‍ය කටයුතු කළමනාකරණය කර ගන්නා ආකාරය පිළිබඳවත් නිවැරදි නිගමනවලට ඇවිල්ලා ඒ තීන්දු තීරණ ගැනීම සිදු කළ යුතුයි කියන කාරණය විශේෂයෙන් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම Return on Investment, එහෙම නැත්නම් යම් දෙයක් වෙනුවෙන් අපි කරන ආයෝජනවලින් එක් එක් ක්ෂේත්‍රයට ප්‍රයෝජන ලැබෙන්නේ කොයි ආකාරයෙන්ද කියන කාරණය පිළිබඳවත් අපි කල්පනාකාරී විය යුතුයි. සෑම ක්ෂේත්‍රයක් වෙනුවෙන්ම අපි යම් ආයෝජනයක් සිදු කළ යුතුයි. එය ප්‍රවාහන ක්ෂේත්‍රය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, අධ්‍යාපන ක්ෂේත්‍රය වෙන්න පුළුවන්. මේ සෑම ක්ෂේත්‍රයක් වෙනුවෙන්ම අපි කරන ආයෝජන නැත්නම් මුදල් වියදම් කිරීම තුළින් මොන විධියේ ප්‍රතිඵලද රටේ ජනතාවට, සමස්ත ජාතියට ලැබෙන්නේ කියන කාරණා ගැන විශේෂයෙන්ම ඉදිරි කාල සීමාවේදී අපි සැලකිලිමත් විය යුතුයි කියා මම විශ්වාස කරනවා. ඒ ගැන අපි අනාගතවාදී දැක්මක් ඇතිව කටයුතු කිරීම වැදගත් වනවා.

ඒ වාගේම රටේ ආදායම් සහ වියදම් අතර පරතරය ඉතා විශාල බව අප දන්නා කාරණයක්. අද අපට ලබා දී තිබෙන මේ වාර්තාවේත් සඳහන් වන කාරණය තමයි, "The Government's total expenditure was 2.4 times higher than the revenue of the Government" කියන එක. ඒ නිසා මා විශ්වාස කරනවා, අපේ වියදම් අපි ලබන ආදායමට වඩා ඉතා අධික බව. ඒ නිසා අපට ආදායම් සහ වියදම් අතර පරතරය කළමනාකරණය කර ගැනීම වෙනුවෙන් තීන්දු තීරණ ගැනීමට සිදු වන බව සිහිපත් කළ යුතුයි.

එමෙන්ම, අපේ රටට භාණ්ඩ ආනයනය කිරීමට විශාල මුදලක් වැය වන බව අපි දන්නා කාරණයක්. මම විශ්වාස කරනවා, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනයත් මේ ආර්ථික අර්බුදය මේ තැනට ඒම සඳහා දීර්ඝ කාලීනව බලපෑ බව. ඒ නිසා අපි ඉදිරි කාල සීමාවේදී මේ තත්ත්වය පාලනය කරගෙන -කළමනාකරණය කරගෙන- දීර්ඝ කාලීනව ක්‍රමවත් සැලසුමක් ඇතිව කටයුතු කිරීම වැදගත් කියා මා විශ්වාස කරනවා.

විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් එක්ක ඇතැම් දේශීය නිෂ්පාදකයන්ට එම ආර්ථික ක්‍රමය එක්ක ගැටෙන්න හැකියාවක් තිබුණේ නැහැ කියා මා විශ්වාස කරනවා. ඒ නිසා රට තුළ නිෂ්පාදනය කළ හැකි දේ පවා නිෂ්පාදනය නොකර ඉතා පහසුවෙන් පිට රටින් ගෙනෙන තැනට අපේ රටේ ආර්ථිකය පත් වුණා. මේ කාරණාත් ආර්ථික අර්බුදය මේ තරම් උත්සන්න වීමට බලපෑවා කියා මා විශ්වාස කරනවා. ඒ නිසා ආනයනය සඳහා යන වියදම පාලනය කරන අතරතුර, අපනයන වර්ධනය කිරීම සඳහා යොදා ගත හැකි සාර්ථක ක්‍රම වෙත කඩිනමින් යොමු වීම මේ අර්බුදයෙන් ගොඩ එන එක් ප්‍රධානතම මාර්ගයක් බව අපි සිහිපත් කළ යුතුයි.

සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම වැඩි කිරීම සඳහා අපි උපරිමයෙන් කටයුතු කළ යුතුයි. එමෙන්ම, විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ නීත්‍යානුකූල ක්‍රම හරහා මව් රටට එවන ලෙස ඒ අයගෙන් ඉල්ලීම් කරනවා වාගේම, ඒ සඳහා දිරිමත් කිරීම අපි අඛණ්ඩව සිදු කළ යුතුයි. අපනයන වෙළෙඳ පොළ පුළුල් කිරීම සඳහාද උපරිමයෙන් කටයුතු කළ යුතුයි කියා මා විශ්වාස කරනවා.

අද උදෑසන කාලයේ සඳහන් වුණා, සංචාරකයන් පැමිණීමේ අඩුවක් පසුගිය මාස කීපය තුළ සිදු වී තිබෙන බව. අපි සියලු දෙනාගේම වග කීමක් තමයි සංචාරකයන් අපේ රටට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම. මේ අසීරු අවස්ථාවේ රටක් විධියට ආර්ථිකමය වශයෙන් අපට ඉදිරියට එන්න තිබෙන ප්‍රධානතම මාර්ගයක් තමයි සංචාරක කර්මාන්තය කියන්නේ. ඒ නිසා

සංචාරක කර්මාන්තයට බාධා වන ආකාරයට කටයුතු නොකර, එම කර්මාන්තය වර්ධනය කිරීම සඳහා මේ කාල සීමාවේ කටයුතු කළ යුතුයි.

මේ අවස්ථාවේ පවතින ආර්ථික අර්බුදය නිසා රටත්, ජනතාවත් විශාල පීඩාවකට පත්වෙලා ඉන්න බව අපි සියලුදෙනා දන්නවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යෑමේ සිට සහ රට අභ්‍යන්තරයේ තිබෙන ආර්ථිකය ගැන අපි ගන්නා තීන්දු තීරණ වාගේම ඉදිරියේදී ගත යුතු තීන්දු තීරණ පිළිබඳවත් රටේ ජනතාව ඉතා නිවැරැදිව දැනුවත් කරලා, එයින් ඇති වන තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමත් මේ අවස්ථාවේ ඉතා වැදගත් වනවා කියා මා විශ්වාස කරනවා. ආර්ථිකමය වශයෙන් ජනතාවට ඇති වන අපහසුතාවලදී උපරිම සංවේදීව කටයුතු කිරීමත්, ඒ සඳහා වැදගත් ආකාරයට තීන්දු තීරණ ගැනීමත් සිදු කළ යුතු බව මේ අවස්ථාවේදී සිහිපත් කළ යුතුයි.

අපි ඊයේ දැක්කා, සමාජයේ උදවු අවැසි මිනිසුන් පිරිසක් වෙනුවෙන් යම් තීන්දු තීරණ ටිකක් ගෙන තිබෙන ආකාරය. ඒ ගැනත් සංවේදීව, සියලු ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් මේ අවස්ථාවේ කටයුතු කළ යුතු බව මා විශේෂයෙන්ම සඳහන් කරනවා. මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා අපි සියලුදෙනාම ජනතාව දැනුවත් කරමින් රටක් වශයෙන් කටයුතු කළ යුතුයි කියන පණිවුඩය මා මේ අවස්ථාවේ දිය යුතුයි.

ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව ජනතාවට නිවැරැදි කරුණු නිවැරැදිව සන්නිවේදනය කරමින් ගරු මුදල් අමාත්‍යතුමා පැහැදිලි කළා වාගේම, මේ තත්ත්වය ගැන ඉදිරියේදීත් කරුණු ඉදිරිපත් කරමින් පාර්ලිමේන්තුවත්, ජනතාවත් තොරතුරුවලින් යාවත්කාලීන කරමින් කටයුතු කරන්න එතුමාට හැකියාව ලැබෙයි කියා මා විශ්වාස කරනවා. මොකද, මේ අර්බුදයෙන් ගොඩ ඒම සඳහා මේ අර්බුදය පිළිබඳව රටත්, ජනතාවත් නිවැරැදිව දැනුවත් කිරීම කියන කාරණයත් විශේෂයෙන්ම වැදගත් නිසා.

මේ අර්බුදයත් එක්ක ප්‍රධාන වශයෙන්ම සාකච්ඡාවට ලක් වුණු කාරණාවක් තමයි ඉන්ධන හිඟය. ඉන්ධන සම්බන්ධයෙන් දීර්ඝ කාලීන සැලැස්මක් අපේ රටට අවශ්‍යයි. අපට ඒ ගැනත් සිතන්නට සුදුසු කාලය පැමිණ තිබෙනවා කියා මා විශ්වාස කරනවා.

ඒ වාගේම විදුලිබලය සම්බන්ධයෙන් ද අපට දීර්ඝ කාලීන සැලසුමක් අවශ්‍යයි. විශේෂයෙන්ම වර්ෂයක් පාසා වර්ධනය වන විදුලිය ඉල්ලුමට නිවැරැදි ආකාරයට අනාගතයේදී මුහුණ දීම සඳහා පුනර්ජනනීය බලශක්තියෙන් -සූර්ය බලයෙන්, සුළං බලයෙන්- කොයි තරම් මෙගාවොට් ප්‍රමාණයක් විදුලිබල පද්ධතියට එකතු කරන්නට අපට හැකියාව තිබෙනවාද, වියදම් අධික ප්‍රභවයන්ගෙන් වාගේම ලෝකයේ ක්ෂය වෙමින් යන ප්‍රභවයන්ගෙන් කොයි තරම් ධාරිතාවක් අපේ විදුලිබල පද්ධතියට ලබා ගන්නවාද, අප ඉදිරි කාල සීමාවේදී ජල විදුලිය කළමනාකරණය කරන්නේ කොයි ආකාරයෙන්ද කියන දේවල් ගැනත් දීර්ඝ කාලීනව සිතන්නට අවශ්‍යයි කියා මම විශ්වාස කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගෑස්, කිරි පිටි ඇතුළු අපේ විදේශ විනිමය වැය වන අනෙකුත් අංශ සම්බන්ධවත්, ජනතාවගේ මූලිකම අවශ්‍යතා සපුරාලීම සඳහාත් දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් පිළිබඳ සිතීමටත් අපි මෙය අවස්ථාවක් කරගත යුතුයි. ඒ නිසා මා විශ්වාස කරන හැටියට අප මේ අර්බුදයේ යථාර්ථය තේරුම් අරගෙන මෙවැනි තත්ත්වයක් ඇති නොවන්නට සහ විශේෂයෙන්ම අප අතීතයේ යම් වැරැදි තීන්දු තීරණ අරගෙන තිබෙනවා නම්, අප ඒවායේ අඩු පාඩු දකිනවා නම්, ඒවාත් නිවැරැදි කරගෙන අනාගතයේදී ඒ වැරැදි සිදු නොවන ආකාරයට කටයුතු කිරීම පිණිස අද ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදය පාඩමක් කරගෙන පෙරට යෑම තමයි අප සිදු කළ යුතු කාර්යය. මේ අවස්ථාවේදී මා ඒ කාරණය විශේෂයෙන් අවධාරණය කරනවා. වර්තමානයේ තිබෙන මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ප්‍රථමයෙන්ම කටයුතු කර, ඉන් අනතුරුව අප දීර්ඝ කාලීනව ආර්ථිකය කළමනාකරණය කරන ක්‍රම පිළිබඳව පුළුල් දැක්මක් ඇතිව කටයුතු කිරීම වැදගත් කියන පණිවුඩයත් විශේෂයෙන්ම සඳහන් කරමින්, අද මුදල් අමාත්‍යතුමා ඇතුළු පිරිස මේ අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග වෙනුවෙන් අප සියලුදෙනාගේ සහාය එතුමා ඇතුළු ඒ සියලුදෙනාට ලබා දෙමු කියන කාරණයත් මේ අවස්ථාවේ සඳහන් කරනවා. මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිය පළ කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.4.31]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තුවේ අදට දින නවයක් තිස්සේ අපි මේ ප්‍රශ්නවලට විසඳුම් හෙව්වා. දින නවයක් කියන්න හේතුව මේකයි ; අපි පාර්ලිමේන්තු රැස්වීම් දින අටක් තිස්සේ මේ ප්‍රශ්නවලට විසඳුම් හෙව්වා, නවවැනි දිනයත් දැන් අවසන් වී ගෙනයි යන්නේ. නමුත්, එළියේ ඉන්ධන පෝලිමේ සිටින මනුස්සයාට විසඳුමක් දෙන්න අපට තවම බැරි වුණා. ඒ වාගේම එළියේ ගෑස් පෝලිමේ සිටින මනුස්සයා, කිරි පිටි පෝලිමේ සිටින මනුස්සයා ඇතුළු කිසිදු කෙනෙකුට අද දවසේ විසඳුමක් දෙන්න අපට බැරි වුණා.

වර්තමාන මුදල් ඇමතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට - IMF- ගිය එක සම්බන්ධව අද අදහස් ඉදිරිපත් කරනවා මම දැක්කා. මට පෙර කථා කළ මැති ඇමතිවරු මුදල් ඇමතිතුමාට ස්තුති කළා. මුදල් ඇමතිතුමාට ස්තුති කළේ ඇයි කියලා අපි කල්පනා කර බලමු. මා ඉස්සෙල්ලා කිව්වා වාගේ මේ රටේ ප්‍රශ්න ඇති වෙද්දී මීට වසරකට කලින් අපි ඒවා ගැන මේ උත්තරීතර සභාවට පැහැදිලි කර දුන්නා. විශේෂයෙන්ම පොහොර කප්පාදුව කරද්දී අපි කිව්වා, ඒක කරන්න එපා කියලා. ඒ වාගේම, IMF එකට යන්න කියලා අපේ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා දිගින් දිගටම කිව්වා. හැබැයි, එහෙම කියන කොට, ආණ්ඩුව පැත්තේ හිටපු අය අප හැල්ලුවට ලක් කළා. අදත් අපි අපේ අදහස් ඉදිරිපත් කරන කොට, ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරුන්ට තවම පෙනෙන්නේ අපි බොර දියේ මාළු අල්ලන්න හදනවා කියලායි. බොර දියේ මාළු අල්ලන්න අපට කිසිම අවශ්‍යතාවක් නැහැ.

[ගරු කිංස් නෙල්සන් මහතා]

විශේෂයෙන්ම කියන්න ඕනෑ, අද රටේ ඩොලර් නැති අර්බුදය ගැන. ඩොලර් නැවත අපේ රටට ගෙනෙන්න රජය සතු වැඩ පිළිවෙළ මොකක්ද? ඒකට තවම කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ සඳහා වැඩ පිළිවෙළක් නැතිව මේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න විධියක් අපට නැහැ. අද අපි බලන්න ඕනෑ ඒ ගැනයි. අද ඉන්ධන පෝලිමේ සිටින මනුස්සයාගේ කාලය මොන තරම් නාස්ති වෙනවාද? සිංහල-දමිළ අවුරුද්ද දවසේත් මිනිස්සු පෝලිමේ සිටියේ. ඊයේ මුස්ලිම් ජාතිකයන්ගේ අවුරුද්ද තිබුණා. මම දැක්කා, ඒ අයත් පෝලිම්වල හිටියා. ඒ අය ගෑස් පෝලිමේ ඉන්නවා මම දැක්කා. හැබැයි, තවම ඒ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න බැරි වෙලා තිබෙනවා.

එහෙම නම් මොනවාද මේ ප්‍රශ්නවලට දෙන්න පුළුවන් විසඳුම්? මේවාට දෙන්න පුළුවන් විසඳුම් තිබෙනවා. මේවාට විසඳුම් දෙන්න මේවා ගැන සාකච්ඡා කරන්න එන්න කියලා කථා කළාම එන්නේත් නැත්නම්, අප කියන දේවල් අහන්නේත් නැත්නම් විපක්ෂයක් විධියට අපට මොකක්ද කරන්න කියන්නේ? අපි ඊයේ විශ්වාස භංග යෝජනා දෙකක් භාර දුන්නා. මීට පෙර කථා කරපු අසංක නවරත්න මන්ත්‍රීතුමා කිව්වා, "අපි විශ්වාස භංග යෝජනාවලට සහයෝගය දෙන්නේ නැහැ. අපට මැතිවරණයකට යන්න ඕනෑ නැහැ" කියලා. අපටත් මැතිවරණයකට යන්න ඕනෑ නැහැ. අපට ඕනෑ මේ රටේ තිබෙන ප්‍රශ්න විසඳන්නයි. ආණ්ඩුවේ විශ්වාසය නැති නිසා තමයි ඔබතුමන්ලා අද විපක්ෂයට ඇවිල්ලා ඉඳගෙන ඉන්නේ. එහෙම නම් මොකක්ද ඔබතුමන්ලා මේ ප්‍රශ්නයට දෙන විකල්ප විසඳුම? ඔබතුමන්ලා අපට ඇඟිල්ල දිගු කරලා වැඩක් නැහැ. එදා අපි දිගින් දිගටම මේ සිදු වෙන දේවල් ගැන කිව්වා; මේ ප්‍රශ්න ගැන කථා කළා. අපි අවුරුද්දකට කලින් මේ ප්‍රශ්න කිව්වා.

අද මේ රටේ සමස්ත ගොවියා අන්ත අසරණභාවයට පත් වෙලා සිටිනවා. මට මතකයි, පාර්ලිමේන්තුවේ අය වැය විවාදයේදී කෘෂිකර්ම විෂය සම්බන්ධව කථා කරන කොට මේ පොහොර කප්පාදුව කරන්න එපා කියලා මා දිගින් දිගටම කෘෂිකර්ම ඇමතිතුමාට කියපු බව. හැබැයි එතුමා ඒක ඇහුවේ නැහැ. ඒ නිසා පොළොන්නරුවේ විතරක් නොවෙයි, මේ රටට බත සපයන සමස්ත ගොවි ජනතාවගේ මහ කන්නයේ අස්වැන්න සියයට 40කින් අඩු වුණා. දැන් යල කන්නයේ වැඩ පටන් අරගෙන තිබෙනවා. තවමත් ගොවියෝ පොහොර සොයනවා. නමුත්, දෙන්න පොහොර නැහැ. එහෙම නම් මේ යල කන්නයේ අපට නිසි අස්වැන්නක් නොලැබුණොත්, තව මාස තුනහතරක් යනකොට මේ රට විශාල ආහාර හිඟයකට යනවා. එහෙම නම් මොනවාද මේවාට දෙන්න පුළුවන් විසඳුම්? මට මතකයි, මම කියවපු සඟරාවක මෙවැනි තත්ත්වයක් ගැන සඳහන්ව තිබුණු බව. මැලේසියාවේ මේ වාගේ තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ රට ගත්ත තීන්දුව මොකක්ද? ඒ රටේ, "Malaysia My Second Home" කියලා වැඩසටහනක් ගෙනාවා. ඒ රටේ අවුරුදු ගණනකට ඩොලර් ප්‍රමාණයක් තැන්පත් කළ අයට දුන්නා වීසා එකක්. ඒ මුදල් ටික ඒ රටේ තිබෙනතාක් ඒ මුදල් තැන්පත් කරපු පුද්ගලයාට ඕනෑ වෙලාවක ඒ රටට යන්න - එන්න පුළුවන්, ඒ රටේ ජීවත් වෙන්න පුළුවන්. ඒ මුදල් ටික ගත්තාට පස්සේ ඒ පහසුකම නැති වෙලා යනවා. එහෙම නම් අපිත් ඒ වාගේ කටයුතු ආරම්භ කරන්න ඕනෑ.

අනෙක් කාරණය මේකයි. අපේ රටේ අය මේ වනකොට විදේශගත වෙලා ඉන්නවා. ඒ ගොල්ලන්ට ලංකාවේ කිසිම ව්‍යාපාරයක් නැති වෙන්න පුළුවන්. හැබැයි ඒ ගොල්ලන් කැමැතියි, මේ රටට ඇවිල්ලා නිවාඩුව ගත කරන්න ඒ ගොල්ලන්ගේම කියලා ගෙයක් ගන්න. එහෙම ගෙයක් ගන්න බැංකුවකට ගියාම ඒ පහසුකම ඒ ගොල්ලන්ට ලබා දෙනවාද? එහෙම ලබා දෙන්නේ නැහැ. ඒ ගොල්ලන් කැමැතියි, ඒ ඉඩමේ වටිනාකමින් භාගයක් ඩොලර්වලින් ගෙවලා ඉතිරි භාගය සඳහා බැංකුවෙන් පහසුකමක් ලබා ගන්න. හැබැයි ඒ ගොල්ලන් බැංකුවට ගියාම කියනවා, "ඔබට ලංකාවේ කිසිම ව්‍යාපාරයක් නැති නිසා අපේ ඒ පහසුකම ඔබට දෙන්න බැහැ" කියලා. ඒ පහසුකම් ලබා දීමට කටයුතු කරන්න ඕනෑ. ඒ ගොල්ලන් කැමැතියි, ඒ වාරිකය ඩොලර්වලින් ගෙවන්න. ඒ ගොල්ලන් ගන්න ගෙදර හෝ ඉඩම plane එකේ දාගෙන වෙන රටකට ගෙන යනවාද? නැහැ. ඒ අදාළ පහසුකම දෙන්න එම නිවසේ හෝ ඉඩමේ ඔප්පුව බැංකුවේ තියා ගන්නවා. එහෙම නම් අපිත් ඒ පහසුකම් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

හිටපු මුදල් ඇමති බැසිල් රාජපක්ෂ මැතිතුමා පසුගිය අය වැය කථාවේදී කිව්වා, "වරායේ තිබෙනවා වාහන 700ක්. ඒ වාහන 700ම ගෙනාපු ලංකාවේ ඒ වාහන හිමිකරුවන්ට ඒවා ලබා දෙනවා" කියලා. හැබැයි තවමත් ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ යෝජනා තමයි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාහන 700ක අයිතිකාරයෝ මේ වනකොට LCs විවෘත කරපු ඒ අදාළ රටවල් එක්ක කථා කරලා ඉල්ලා තිබෙනවා, මේ සල්ලි ගෙවන්න වසර දෙකක කාලයක් දෙන්න කියලා. ඒ රටවල් ඒ ගොල්ලන් එක්ක ඒකට එකඟ වෙලා තිබෙනවා. එහෙම නම් ඒ අවස්ථාව ඒ ගොල්ලන්ට උදා කර දෙන්න. දැන් බොහොම ලස්සනට උජාරුවට වචන කිව්වාට මේවා ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා තමයි අද මේ රටට මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

අපේ රට තුළ අද ඩොලර් තිබෙනවා. හැබැයි ඒවා එළියට ගන්න මේ රජයට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. දැන් වාහන ගෙන්වන එක සම්පූර්ණයෙන් නවත්වලා තිබෙනවා. එහෙම නම් ඒ ඩොලර් ටික එළියට ගන්න මොකක්ද කරන්න ඕනෑ? රුපියල්වලින් නැතුව ඩොලර් තියෙන අයගේ ඩොලර්වලින් ගෙවලා වාහන ගෙන්වන්න පුළුවන්. වාහනය ලංකාවට ආවාට පස්සේ අපේ වරාය තීරුබදු අය කරනවා නම්, ඩොලර්වලින් අය කරගන්න. එහෙම නැතිව වාහන ගෙන්වන එක නවත්වලා හරි යනවාද? එහෙම නම් මේ හැංගිලා තිබෙන ඩොලර් ටික එළියට ගන්නේ කොහොමද? ඒ සඳහා මෙන්න මේ වාගේ දේවල් ක්‍රියාත්මක කරන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනා ක්‍රියාත්මක කරන්න ඕනෑ. අප මේ ගෙනෙන යෝජනා හැම වෙලාවේම හෑල්ලුවට ලක් කරන්න එපා. මේවා චෝදනා නොවෙයි. අපටත් මේ රට ඕනෑ. දැන් ඇතැම් අය කියනවා "දැන් නැව ගිලෙනවා" කියලා. හැබැයි අමතක කරන්න එපා, "ලංකාව" නමැති නැව තමයි මේ ගිලෙන්නේ කියන එක. මේ නැව ගිලෙන කොට අපිත් ගිලෙනවා, මේ පාර්ලිමේන්තුවත් ගිලෙනවා.

අද තරුණ තරුණියන් එළියේ උද්ඝෝෂණ කරවා. ඇයි උද්ඝෝෂණ කරන්නේ? ඒ අය උද්ඝෝෂණ කරන්නේ මේ රට අද වැටිලා තිබෙන තත්ත්වයෙන් බේරා ගන්නයි. ඒ ගොල්ලන් ඉවසුවා, ඉවසුවා, ඉවසුවා! තව ඉවසන්න හැකියාවක් නැහැ. ඒ නිසා තමයි ඒ ගොල්ලන් මේ මන්ත්‍රීවරුන් 225ටම ගෙදර ඉල්ලන්නේ.

මන්ත්‍රීවරුන් 225දෙනාටම ගෙදර ඉල්ලුවත් අපි සද්භාවයෙන් යම් දෙයක් කියනවා නම් අපට ගෙදර ඉල්ලලා හරි යනවාද? නැහැ. ඒක නිසා මම විශේෂයෙන් මේ සභාවට කියන්නේ, කරුණාකරලා පෝලිම්වල සිටින මිනිස්සු ගැන හිතන්න කියන එකයි. සමහර වෙලාවට පාලක පක්ෂයේ සිටින අයට මේවා තේරෙන්නේ නැති වෙන්න පුළුවන්. හැබැයි, මේ ප්‍රශ්න ගැන ඔබතුමන්ලාට හිතන්න වෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගෝල්ෆේස් පිට්ටනියේ දින 27ක් උද්ඝෝෂණය කරන අයගෙන් පිරිසක් ඊයේ මල්වතු පාර්ශ්වයේ නායක ස්වාමීන් වහන්සේලා බැහැ දකින්න ගියා. එම කණ්ඩායමේ පිරිසක් තමයි ගරු කථානායකතුමාට ලිපියක් භාර දෙන්න මේ පාර්ලිමේන්තු සංකීර්ණය ළඟට ඇවිල්ලා තිබෙන්නේ.

එම ලිපියේ පිටපතක් මගේ ළඟ තිබෙනවා. ඒ ලිපිය භාර දෙන්න ආපු තරුණයන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ ගොල්ලන් මෙතැනට ආවේ කෑ කෝ ගහලා මේවා විනාශ කරන්න නොවෙයි. අපේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථානායකතුමාට ලිපියක් භාර දෙන්නයි ඒ ගොල්ලන් ආවේ. ඇයි? දින 27ක් ඒ ගොල්ලන් එළියේ අරගළ කරනවා. ඒකට විසඳුමක් ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔවුන් දින 27ක් එතැන හිටියත්, අපි කිසි කෙනෙකුට විසඳුමක් දෙන්න බැරි වුණු නිසා ඒ ගොල්ලන් අපේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථානායකතුමාට ලිපියක් භාර දෙන්නයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ ලිපිය භාර දෙන්න තමයි ඇවිල්ලා තිබුණේ. හැබැයි, අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? ඒ ගොල්ලන් අල්ලලා හිරේ දාලා තිබෙනවා. ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන්න.

පසුගිය මහ කන්නයේ වගා හානි වුණු ඒ අහිංසක ගොවීන්ට වන්දි ලබා දෙනවා කිව්වා. නමුත් තවම තඹ දොයිතුවක් ඒ කිසි කෙනෙකුට ලබා දීලා නැහැ. එහෙම නම් මේ රටේ බත සපයන ගොවියා, මේ රටේ ජාතික ආර්ථිකයට සම්බන්ධ වෙලා ආර්ථිකය ශක්තිමත් කරන ගොවියා නඟාසිටුවන්නේ කොහොමද? ඒ ගොල්ලන්ට වුණු පොරොන්දු මේ වෙන කොට ඉෂ්ට කරලා නැහැ. ඒ වාගේම දැන් යල කන්නය ආරම්භ වෙලා තිබෙනවා. ගොවියා කවදාද කිව්වේ, ජලය එපා කියලා. ගොවියා වැඩ කරන්නේ ජලයත් එක්ක. හැබැයි, ගොවියා කියනවා, ජලය ඕනෑ නැහැ කියලා. ඇයි, ජලය එපා කියන්නේ? කුඹුරේ වැඩ පටන් ගන්න වල්නාශක අවශ්‍ය වෙනවා. අද කිසිම තැනක පොහොර ගන්න නැහැ. යූරියා පොහොර මිටියක් දැන් රුපියල් 45,000යි. ගොවියා රුපියල් 45,000ට යූරියා පොහොර මිටියක් අරගෙන ගොවිතැන් කරන්නේ කොහොමද? මේ රටේ වීවලට මොන තරම් මිලක් ලැබුණත් ගොවියා ජීවත් වෙන්නේ කොහොමද? පොහොර නොමැතිකම නිසා මේ රටේ සමස්ත ගොවියාගේ අස්වැන්න සියයට 40කින් අඩු වුණා. ගොවියා තවමත් බලාගෙන ඉන්නවා ඒ පාඩුවට වන්දි ලබා දෙන කල්. තඹ දොයිතුවක වන්දියක් මේ වෙන කල් ලබා දීලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගොවි ජනපදයක් නියෝජනය කරන මන්ත්‍රී කෙනෙකු විධියට මම ඉතාම ඕනෑකමින් කියනවා, ඒ අසරණ ගොවියාට දෙනවාය කියපු වන්දි ටික ලබා දෙන්න කටයුතු කරන්න කියලා. සමෘද්ධිලාභීන්ට ලබා දෙන දීමනා වැඩි කරලා තිබෙනවා. ඒක ගැටලුවක් නැහැ. හැබැයි, ගොවියා කියන්නේ කිසිම කෙනෙකුට කරදරයක් නැති බොහොම ස්වාධීනව ජීවත් වෙන පිරිසක්. ගොවියාගේ වගා හානි වුණේ, අස්වැන්න අඩු වුණේ ඒ අයගේ ඕනෑකමකට නොවෙයි. රජය ගත්තු වැරදි තීන්දු තීරණ නිසා තමයි ගොවියාගේ අස්වැන්න අඩු වුණේ. ඒක නිසා ගොවියාට දෙනවාය කියපු වන්දි ටික වහාම ලබා දෙන්න කටයුතු කරන්නය කියන ගෞරවනීය ඉල්ලීම කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් තිබෙනවා.

[අ.භා.4.42]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ ගරු සභාවේ කථා කරපු මන්ත්‍රීවරුන් ඩොලර් හිඟයක් ගැන කිව්වා. අපේ විදේශ ණය ඩොලර් බිලියන 51ක් වෙනවා. අවුරුදු පතා ඒ වෙනුවෙන් අපට බිලියන හයක් ගෙවන්න සිදුවෙලා තිබෙනවා. ඩොලර් හිඟයක් තිබෙන කොට, තිබෙන ඩොලර් ප්‍රමාණය රඳවා ගැනීමට නම් අප ණය බේරා ගැනීමේ ක්‍රමයකට යා යුතුයි. ඒකට ඉංග්‍රීසියෙන් කියනවා "moratorium" එකක් කියලා. ඒ කියන්නේ, ණය දුන්නු අය එක්ක කථා කරලා, ඒ ණය ගෙවන්න අමතර අවුරුදු පහක විතර කාලයක් ලබා ගන්න එක. ඒ ක්‍රමය විවිධ රටවල් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

මම දන්නවා, උරුගුවායි කියන රටේත් ඒක ක්‍රියාත්මක කර තිබෙන බව. අපිත් ඒ ආකාරයට කටයුතු කළොත්, අපටත් පුළුවන් වෙයි මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්න. ඒ වාගේම අපේ විදේශ විනිමය සංචිත ඉතා දරුණු විධියට බැහැලා තිබෙනවා. ඒ නිසා මේ රටෙන් ඩොලර් පිටතට යෑම වැළැක්වීමට අපි තදින් ක්‍රියා කළ යුතුයි. ඩොලර් අවශ්‍ය වන අත්‍යවශ්‍ය දේවල්වලට පමණක් ඉඩ දීලා කටයුතු කළ යුතුයි.

ඒත් එක්කම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප රටේ සියයට 60ක පමණ ජන කොටසක් දරිද්‍රතා රේඛාවට යටත් ආදායම්ලාභීන් කියලා සමීක්ෂණවලින් පෙන්වා දීලා තිබෙනවා. ඒ අයට ආහාර හිඟයක් තිබෙනවා. මම දන්නවා, සමහර පවුල්වල ළමයින්ට විතරක් කන්න දීලා වැඩිහිටි අය සුළු දෙයකින් ආහාර වේලා පිරිමසා ගන්නා බව. ඒ වාගේ තත්ත්වයකදී ආණ්ඩුවේ ලොකුම වගකීම තමයි බඩ ගින්න නැති කිරීම. ඒ නිසා අනෙක් දේවල්වලට වියදම් කරන මුදල් අඩු කරගෙන, highways වැනි යටිතල පහසුකම් දියුණු කිරීම්වලට යන මුදල් අඩු කරගෙන, මේ ප්‍රශ්නයට මුහුණ දෙන දුප්පත් පවුල්වලට ආණ්ඩුව ගණනේ සතිපතා වියළි ආහාර මල්ලක් ලබා දෙන වැඩ පිළිවෙළක් දියත් කළ යුතුයි. ඒක අත්‍යවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දැන් ගෑස් ප්‍රශ්නයකටත් මුහුණ දෙනවා. මම විද්‍යා හා තාක්ෂණ ඇමති වෙලා සිටි කාලයේ ජීව වායුව නිෂ්පාදනය කිරීම සඳහා නර්ඩ් ආයතනයත් එක්ක සම්බන්ධ වෙලා ව්‍යාපෘතියක් ආරම්භ කළා. අප රට තුළම තිබෙන අපද්‍රව්‍ය පාවිච්චි කරමින් ජීව වායුව නිෂ්පාදනය කරගෙන ඒ තුළින් බලශක්ති ප්‍රශ්නය තරමක් දුරට අඩු කරගන්න අපට පුළුවන්කම තිබෙනවා. නමුත් කියන්න කනගාටුයි, ඒක දිගටම පවත්වා ගෙන යන්න ඉන්පසුව කිසිම උනන්දුවක් දක්වා නැහැ. මම තදින් ඉල්ලීමක් කරනවා, ඒ වැඩ පිළිවෙළ නැවත ආරම්භ කරලා ක්‍රියාත්මක කරගෙන යන්න කියලා. ඒ තුළින් ජීව වායුව නිෂ්පාදනය කරගෙන රට පුරාම ගෙවල්වල ආහාර පිසීමට අවශ්‍ය බලශක්තිය සපයා ගන්න අපට පුළුවන්කම තිබෙනවා. මේ අමාරු කාලයේ ඒ වාගේ ක්‍රම අපි භාවිත කළ යුතුයි.

ඊළඟට, රටේ පවතින සෞඛ්‍ය තත්ත්වය ගැනත් වෛද්‍යවරයකු හැටියට මා කනගාටු වෙනවා. එක පැත්තකින් ඖෂධ හිඟයක් තිබෙනවා. ඒක පදනම් කරගෙන දැන් ශල්‍යකර්ම කිරීමත් සීමා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මොන මුදල් අපහසුතා තිබුණත් ජීවිත බේරා ගැනීමේ අවශ්‍යතාවට මුල් තැන දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

අවසන් වශයෙන් මම පොහොර ප්‍රශ්නය ගැනත් යමක් කියන්න ඕනෑ. පිට රටින් ගේන රසායනික පොහොර භාවිත කිරීමට අපේ ගොවියෝ පුරුදු වෙලා තිබෙනවා. අපේ රටේ තිබෙන පැළෑටිත් ඒවාට හැඩ ගැසී තිබෙනවා. නමුත් ලෝකය වටේම කාබනික පොහොරවලට වැඩෙන වෙනත් බීජ වර්ග තිබෙනවා. පොහොර ප්‍රශ්නය දිගටම තිබෙනවා නම්, අපි කාබනික පොහොරවලට වැවෙන බීජ වර්ග ගෙනැවිත් අපේ රටේ වවන්න ඕනෑ. කාබනික පොහොරවලට වැඩෙන අපේ පාරම්පරික බීජ වර්ගත් තිබෙනවා. ඒවා වගා කිරීමෙන් අපට පුළුවන් වෙයි, පොහොර ප්‍රශ්නයටත් විසඳුමක් ලබා ගන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.51]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
**(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)**
(The Hon. Weerasumana Weerasinghe)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපි මෑත කාලයේ, මේ පාර්ලිමේන්තුව තුළ මේ අර්බුද ගැන කථා සාප්පුව විවෘත කරලා දැන් දෙවෙනි මාසයටත් පිය නඟා තිබෙනවා. අප්‍රේල් මාසයේ පාර්ලිමේන්තු සති දෙකත්, අද දින ඇතුළුව මැයි මාසයේ මුල් සතියත් පාවිච්චි කරන්නේ මේ අර්බුදය ගැන කථා කරන්නයි. හැබැයි, මේ අර්බුදය ගැන අපි කොතෙක් කථා කළා වුණත්, ප්‍රායෝගිකව ඒකට ලබා දෙන්නා වූ විසඳුම් හරියට ඉබ්බාගෙයි හාවාගෙයි රේස් එක වාගේ වැඩක්. ඒක නිසා අද එළියේ තිබෙන අර්බුදයට විසඳුම් මේ පාර්ලිමේන්තුව තුළින් ලබා ගන්න පුළුවන් කියන විශ්වාසයේ ඉන්න මිනිසුන්ගේ, එහෙම නැත්නම් මේ ප්‍රශ්නයට, මේ අර්බුදයට මේ 225 තුළින් විසඳුම් හොයා ගන්න ඕනෑය කියා හිතන මිනිසුන්ගේ විශ්වාසය දවසින් දවස කැඩී යන වෙලාවක තමයි නැවතත් මේ ආර්ථික අර්බුදය ගැන, IMF එක සමඟ වූ එකඟතා ගිවිසුම් ගැන විවාදය පවත්වන්නේ.

හැබැයි, මම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. මොකද, 1974න් පස්සේ පළමුවෙනි වතාවට මුදල් ඇමතිවරයකු පාර්ලිමේන්තුවේදී ඇත්ත කිව්වේ අද. 1974දී අවසාන අය වැය ප්‍රකාශය ඉදිරිපත් කරමින් ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මැතිතුමාට එදා පැවැති ආර්ථික තත්ත්වය ගැන කියන්න සිද්ධ වුණා. හැබැයි 1975දී එතුමාට සිද්ධ වුණා, ආණ්ඩුවෙන් එළියට යන්න. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ප්‍රසන්න රණතුංග මැතිතුමනි, ඒ කාරණාව ඔබතුමාත් දන්නවා. 1975න් පස්සේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමාගේ ඉඳලා හැම මුදල් ඇමතිවරයකුම කටයුතු කළේ පාර්ලිමේන්තුවටත්, රටටත් අසත්‍ය ප්‍රකාශ කරමින්. මුදල් ඇමතිවරයාගේ කාර්යභාරය බවට පත් වුණේ ආණ්ඩුව රැකීමයි. රාජ්‍යය රකින්න, එහෙම නැත්නම් ශ්‍රී ලංකාව රකින්න මුදල් ඇමතිවරු කටයුතු කරපු ප්‍රමාණය බොහොම අඩුයි. එම නිසා 1974න් පස්සේ පාර්ලිමේන්තුවට ඇත්ත කියපු අලි සබ්රි ඇමතිතුමාට මගේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා. අද අලි සබ්රි ඇමතිතුමා කළේ අපි කරන්න හිටපු කථාව. මේ අර්බුදයේ දිග පළල, මේ අර්බුදයට විසඳුම්, එතුමා අවසානයේ ඉදිරිපත් කරපු දේශපාලන ස්ථාවරත්වය සඳහා වන යෝජනාවලිය අපේ පැත්තෙන් ඉදිරිපත් කරන්න ඕනෑ දේවල්. ඒ අනුව, හරි නම් අලි සබ්රි ඇමතිතුමා හිටගන්න ඕනෑ අපේ ස්වාධීන මන්ත්‍රී කණ්ඩායමේ. ඒ කෙසේ වෙතත්, එතුමා ඉදිරිපත් කළ කාරණා ගැන මම එකින් එක නැවතත් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

අපි 1954 වර්ෂයේ ඉඳලා ණය ගත්තා. අද ඇමෙරිකානු ඩොලර් බිලියන 51ක් අපි ණය වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් අපේ රටේ රාජ්‍ය ආදායම සියයට 24-25 ඉඳලා අද වනකොට සියයට 8 දක්වා අඩු වෙලා තිබෙනවා. මේ තුළ ඇති වූ ඛේදනීය තත්ත්වය අපේ ඇස් පනාපිට පේනවා. ඩීසල් පෝලිම, තෙල් පෝලිම, ගෑස් පෝලිම, විදුලි කප්පාදුව වැනි මේ තිබෙන අර්බුද සියල්ලක්ම මේ හැම දේකින්ම ඇතිවන ඵලයයි. ඒවා මතුපිට පෙනෙන්න තිබෙන දේවල්. හැබැයි, අපි මෙතෙක් මේවාට සම්බන්ධ හේතු ගැන හරියට කථා නොකිරීමේ ප්‍රතිඵලය තමයි අද බුක්ති විඳින්නේ. අපි ඵලය ගැන කථා කරනවා, හේතුව ගැන කථා කරන්නේ නැහැ.

මේ ආර්ථික අර්බුදයට ප්‍රධාන හේතුව මොකක්ද? මගේ කියැවීම, අපේ කියැවීම, අපේ දේශපාලන ධාරාවේ කියැවීම මොකක්ද? මේ තමයි අපි ක්‍රියාත්මක කරන වැරදි ආර්ථික මූලෝපායයන්. 1977න් පස්සේ ඇති කළ විවෘත ආර්ථිකයේ ප්‍රතිඵල තමයි අද මේ නව ලිබරල් ආර්ථිකයේ උච්චම අර්බුදයට ගොනු වෙලා තිබෙන්නේ. අද ඒ ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් බවට පත් වෙලා.

මේ වෙලාවේ මුදල් අමාත්‍යතුමා ගරු සභාවේ නැහැ. දැන් කැබිනට් ඇමතිවරයෙකුට මේ සභාවේ ඉන්නේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා විතරයි, අනික් ඇමතිවරු කවුරුවත් නැහැ. එතුමන්ලා අමාත්‍යාංශවලට ගිහිල්ලා ප්‍රශ්නවලට උත්තර හොයනවාද දන්නේ නැහැ. නමුත්, මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න තිබෙන ව්‍යවස්ථාදායකයේ අද තත්ත්වය මේකයි. අද දේශපාලන අර්බුදය උච්ච වෙලා. නාමික ඇමති මණ්ඩලයක් ඉන්නවා. ඒ ඇමතිවරු අද හුදකලා වෙලා ඉන්නවා. ඒ ඇමතිවරුන්ට සමාජය තුළ, මහ ජනතාව තුළ පිළිගැනීමක් තිබෙනවාද? අවාසනාවකට, මේ රටේ රාජ්‍ය සේවයත් පිළිගන්නේ නැති තත්ත්වයට අද රට පත් වෙමින් තිබෙනවා. ඒ අනුව දේශපාලන අර්බුදය උච්ච ස්ථානයට ගිහිල්ලා තිබෙන බව පෙනෙනවා. ඒකේ ඊළඟ ප්‍රතිඵලය දැන් ඇස් පනාපිට පෙනෙන්න තිබෙනවා. ඒ තමයි ඇති වී තිබෙන සමාජ අර්බුදය. සමාජ අර්බුදය හරහා මේ රට තවත් අරාජිකත්වයට ගමන් කරන්න ඉඩ නොදී කටයුතු කිරීම තමයි අපේ කාර්යභාරය විය යුත්තේ.

දැන් අපි මේ කථා කරන විවෘත ආර්ථිකයට අවුරුදු 44ක් වෙනවා. හැබැයි තවත් කණ්ඩායමක් කියනවා, නිදහසින් පසු අවුරුදු 74ක ගමන් මගේ ප්‍රතිඵලය තමයි මේ ඇතිවී තිබෙන්නේ කියලා. එහෙම කියන උන්නැහේලා පසුගිය හැම ආණ්ඩුවක්ම හදන්න කටයුතු කළා. ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම මේ ගැන කියන්නේ අවුරුදු 74ක සාපයක් කියලා. ඒ මතය එළියේ උස්සාගෙන යන ඔවුන්ගේ අනුගාමිකයන් කියන්නේ, මේක අවුරුදු 74ක සාපයක් කියලා. හැබැයි, ඒ අවුරුදු 74න් අවුරුදු 30ක, 40ක විනාශවලට ඔවුනුත් දායක වුණා. නිදහසින් පසු මේ අවුරුදු 74 සාපයක් නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1948ට ඉස්සෙල්ලා මේ රට හොඳද? ලන්දේසි, ඉංග්‍රීසි, පෘතුගීසි මේ රට හූරාගෙන කාපු එක හොඳද? චෝල, පාණ්ඩ්‍යයන් මේ රට හූරාගෙන කාපු එක හොඳද? ඒ කාලයේ රට හොඳට තිබිලා 1948න් පසුව විනාශ වුණාද? නැහැ. ඒ නිසා මේක වැරදි ආර්ථික කියැවීමක්. 1948න් පසුව වෙච්ච විනාශය මෙහි එක් කාරණාවක් පමණයි කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. අද මේ අර්බුදය කොච්චර උච්ච ස්ථානයට ගිහිල්ලා තිබෙනවාද කිව්වොත්, මෙච්චර කාලයක් අපි ආර්ථික විද්‍යාව තුළ, සමාජය තුළ කථා

කළේ අවිධිමත් ආර්ථිකයේ යෙදෙන සියයට 70ක පමණ මිනිස්සු තමයි මේ ප්‍රශ්නවලින් පීඩාවට පත් වුණේ කියන එකයි. එදිනෙදා කුලී වැඩ කරන, දෛනික ආදායම් ලබන මිනිසුන් තමයි මේ ප්‍රශ්නවලින් වැඩියෙන්ම පීඩාවට ලක් වෙන්නේ කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් මමත් ඇතුළුව අපේ රටේ පුරවැසියන්ගෙන් සියයට 95කට වැඩි කොටසක් අද මේ ආර්ථික අර්බුදයේ කොටස්කාරයන් බවට පත් වෙලා, පීඩාවට පත් වෙනවා. අද අවිධිමත් ආර්ථිකයේ ඉන්න අය වාගේම ලක්ෂ 16ක් වූ රාජ්‍ය සේවකයන් පීඩාවට පත් වෙලා සිටිනවා. සියයට 5ක්, 6ක් ඉන්න විධායක ශ්‍රේණියේ ඉහළම කිහිපදෙනා හැරෙන්නට සමස්ත රාජ්‍ය සේවකයාම දැවැන්ත ඛේදනීය තත්ත්වයකට ඇද වැටී තිබෙනවා. අද එදිනෙදා ආර්ථිකයේ ඉන්න මිනිසුන්ටත් වඩා පහළ මට්ටමකින් තමයි ඔවුන්ගේ ආර්ථිකය කළමනාකරණය කර ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඔවුන්ට මාසිකව ලැබෙන වැටුප මේ ආර්ථිකය තුළ ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවයේ යෙදෙන මිනිස්සු දැවැන්ත පීඩාවකට පත් වෙලා සිටිනවා. පෞද්ගලික අංශයේ සේවකයාට targets cover කරන්න - ඉලක්ක සඳහා යන්න - පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. සීමිත පිරිසකට පමණයි ඒ හැකියාව තිබෙන්නේ. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමස්ත පුරවැසියන්ගෙන් සියයට 95ක් මේ තත්ත්වය තුළ පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා එළියේ තිබෙන විරෝධය, උද්ඝෝෂණ සියයට 100ක් සාධාරණයි. ඒ උද්ඝෝෂණවල ප්‍රතිඵලය මේ සමාජය ඛේදනීය තත්ත්වයට තල්ලු කරන එකක් නොකරන්න මේ ව්‍යවස්ථාදායකයේ සිටින 225දෙනාටම වගකීමක් තිබෙනවා කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මේ අර්බුදය තුළ ළඟ ළඟම එන ඊළඟ ඛේදනීය තත්ත්වය කුමක්ද? ඒ තමයි, විරැකියාව. අද මුදල් ඇමතිතුමා කිව්වා, අපේ රටේ සංචාරක ක්ෂේත්‍රයේ කඩා වැටීම ගැන. සංචාරකයන් එන ප්‍රමාණය සියයට 50කින් දැන් කඩාගෙන වැටිලා. අපේ රටේ මිලියන 3ක් ජනතාව සංචාරක ක්ෂේත්‍රයේ ඍජු හා වක්‍ර රැකියාවල යෙදෙනවා. මේ රටේ ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදය සහ බලශක්ති අර්බුදය තුළ සංචාරක ක්ෂේත්‍රය කඩා ගෙන වැටෙනවා. ඒ වාගේම මේක ලෝකයේම සංචාරක ව්‍යාපාරය කඩා වැටෙන වෙලාවක්. යුරෝපා රටවල් පවා මේ ආර්ථික අර්බුදයට ගොදුරු වෙලා තිබෙන නිසා අද ඔවුන්ගේ සංචාර ගමනාන්ත කෙටි කරලා තිබෙනවා. වෙනත් රටවල සංචාරය කළ යුරෝපා රටවල මිනිස්සු අද යුරෝපය තුළ සංචාරය කරන්න යොමු වෙලා තිබෙනවා. ඒ අනුව සංචාරක ව්‍යාපාරය බරපතළ ලෙස කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. මේ හේතුවෙන් ලංකාවේ මිලියන 3ක් මිනිසුන්ගේ රැකියා අද අනතුරේ වැටිලා තිබෙනවා.

අනික් පැත්තෙන්, සංචාරක ව්‍යාපාරය වාගේම කර්මාන්ත ක්ෂේත්‍රයත් මේ ආර්ථික අර්බුදය, අමු ද්‍රව්‍යවල හිඟය සහ මිල ඉහළ යෑම නිසා ඛේදනීය තත්ත්වයකට තල්ලු වෙමින් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
කිව යුතු කාරණා ගණනාවක් තිබුණත්, ලැබී ඇති කාලය ඉතාම සීමිත වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණා නිසාම විරැකියාව පිළිබඳ වැඩි මැදිහත් වීමක් විය යුතුයි. අනික් පැත්තෙන්, ආහාර අර්බුදයක් ඇති වෙමින් රට දැවැන්ත අර්බුදයකට තල්ලු වෙමින් තිබෙනවා. හැබැයි, අපි දැන් IMF ගිහිල්ලා තිබෙනවා; IMF එකට යන්න පාර කැපුවා. ප්‍රශ්නය බිත්තියට හේත්තු වෙනතුරු තියාගෙන හිටියා, මුදල් ඇමතිවරයා, මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුවේ හිටපු අධිපති යන සියලුදෙනා. අපි බිත්තියට හේත්තු වෙනතුරු තබා ගැනීමේ ප්‍රතිඵලය වශයෙන් අද IMF ගිහිල්ලා තිබෙනවා. හැබැයි, IMF යෑම විතරක් නොවෙයි මේකට පිළිතුර. මම වර්තමාන මුදල් ඇමතිවරයාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, IMF එකේ ලණු එහෙමපිටින් ගිලින්න ලැහැස්ති වෙන්න එපා කියලා. එහෙම වුණොත්, ඊළඟ දශකයේ ඊළඟ පරම්පරාවට මේ අර්බුදයට ඛේදනීය තත්ත්වයකින් තමයි උත්තර දෙන්න වෙන්නේ.

එහෙම වුණොත් විරැකියාව නැති කිරීම කියන කාරණාව, සුබසාධනය කියන කාරණාව, ඒ සියල්ල කප්පාදු වෙන්න ඉඩ තිබෙනවා. ඒ වාගේම මහ බැංකුව ප්‍රතිසංවිධානය කරනකොට IMF එක හැමදාම දෙන ලණුවක් වන මූල්‍ය පනතට අත තියන්න එපා. IMF එක ඇතුළු ඒ බටහිර කණ්ඩායමට හැම දාම ලොකු ඕනෑකමක් තිබුණා - බන්දුල ගුණවර්ධන මැතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමා සාක්ෂි දරනවා.- මේ රට ඔසවාගෙන ආපු ආර්ථික කුළුණු තුන වන රාජ්‍ය බැංකු තුන ප්‍රතිව්‍යුහගත කරලා, පෞද්ගලික අංශයට දීලා කොටස් වෙළෙඳ පොළට ඉදිරිපත් කරන්න. IMF එකේ ඒ ඉලක්කයට අත තියන්න එපා කියන කාරණාව ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා. ඒක නිසා මේ කාරණාවලට ස්ථිර විසඳුම් කිහිපයක් ඕනෑ. එහි පළමුවැනි දේ තමයි, ස්ථාවර ආණ්ඩුවක ඇති අවශ්‍යතාව. එම ස්ථාවර ආණ්ඩුව හැදෙන්න ඕනෑ. අද මුදල් ඇමතිතුමා කිව්වා වාගේ, සජිත් ප්‍රේමදාස මහත්මයා සහ අනුර කුමාර දිසානායක මහත්මයා හැර අනෙක් සියලුදෙනාමත් කියන්නේ මේ රට තුළ සර්ව පාක්ෂික අන්තර්කාලීන ආණ්ඩුවක් හදන්න කියන එකයි. අද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, ජනාධිපතිතුමා ඇතුළු සියලුදෙනාත්, මේ රටේ වෘත්තීය ක්ෂේත්‍රය, මහානායක හාමුදුරුවරු, කාදිනල්තුමා වාගේ හැමදෙනාමත් කියනවා, මේ 225දෙනාම ඒ වෙනුවෙන් හිටගන්න ඕනෑ කියලා. ඒක තමයි පළමුවැනි කාරණාව.

අනෙක් පැත්තෙන්, ආර්ථික ප්‍රතිසංස්කරණයක් වෙන්න ඕනෑ, බදු ප්‍රතිපත්තිය වෙනස් කරන්න ඕනෑ. අද මහ බැංකුව අලුත් විධියට හිතන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒක තවත් ශක්තිමත් වෙන්න ඕනෑ. මේ රටේ ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, Ministry of Economic Policies and Plan Implementation එක අහෝසි කරලා තිබෙන්නේ. ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මහ බැංකුවත් එක්ක එකට හිටගෙන තවත් දශකයකට ගැළපෙන ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා මැදිහත් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි අපේ විදේශ ප්‍රතිපත්තිය ගැනත් හිතන්න ඕනෑ. බටහිරට ගැතිවෙලා, ඇමෙරිකාවට ගැතිවෙලා, යුරෝපයට ගැතිවෙලා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මට තව තත්පර 30ක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

පසුගිය කාලයේ යුරෝපයට ගැතිවෙලා ගෙන ගිය විදේශ ප්‍රතිපත්තියේ ඛේදනීය තත්ත්වයක් තමයි අද තිබෙන්නේ. අපට

[ගරු වීරසුමන වීරසිංහ මහතා]

උදව් කරපු රටවල් සියල්ලම අද තරහයි. චීනය අද අපිත් එක්ක නැහැ, ජපානය අද අපිත් එක්ක නැහැ, රුසියාව අද අපිත් එක්ක නැහැ, මැදපෙරදිග රටවල් -අරාබි රටවල්- අද අපිත් එක්ක නැහැ. ඇමෙරිකාව තරහා වෙයි කියලා, ඉන්දියාව තරහා වෙයි කියලා අපි ඔවුන් එක්ක තිබුණු ගනුදෙනු අද දුරස් කරලා. ඉන්දියාව තරහා වෙයි කියලා අපි රුසියාවත් එක්ක ගනුදෙනු කරන්නේ නැහැ. නමුත්, ඉන්දියාව රුසියාවත් එක්ක අපූරුවට ගනුදෙනු කරනවා. ඒක නිසා අපේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි ප්‍රතිපත්තියක් තුළ අලුත් දිශානතියකට ගමන් කරවන්න කියා අපි ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මුදල් ඇමතිතුමා අද අධිකරණ ඇමතිතුමා හැටියටත් සිටින නිසා මම කියනවා, සාපරාධී මූල්‍ය අපරාධ නීතියක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා මේ ඛේදනීය තත්ත්වයට රට තල්ලු කරපු හිටපු මුදල් ඇමතිවරු, හිටපු මහ බැංකු අධිපතිවරු, මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරු හැමදෙනාටම දඬුවම් දෙන්න කියලා. ඒ කාරණාවත් සිහිපත් කරමින්, අපි 225දෙනාම එකතුවෙලා මේ අර්බුදයෙන් රට ගොඩගනිමු කියන ආරාධනාවත් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Thavaraja Kalai Arasan. You have ten minutes.

[பி.ப. 5.01]

**ගරු තවරාජා කලෛයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டின் தற்போதைய பொருளாதார நிலைமை மற்றும் சர்வதேச நாணய நிதியத்துடன் எட்டப்பட்ட இணக்கப்பாடுகள் சம்பந்தமாக கௌரவ நிதியமைச்சர் அவர்களால் முன்வைக்கப் பட்ட கூற்று தொடர்பில் இந்த உயரிய சபையிலே விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கிறது. இதில் கலந்துகொண்டு சில கருத்துக்களைச் சொல்வதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்கள் வருமானத்தை விஞ்சிய செலவினம் பற்றியும் ஒற்றுமை பற்றியும் மிகவும் விரிவாகக் குறிப்பிட்டார். இந்த நாட்டை நிர்வகிக்கின்ற தலைவர், அமைச்சர்கள் மற்றும் நிர்வாகத்துடன் சம்பந்தப்பட்ட நிபுணத்துவம் வாய்ந்த அதிகாரிகள் ஆகியோர் ஒழுங்கான திட்டமிடலைச் செய்யவில்லை என்பதை அவர் எடுத்துக் கூறினார். இன்றைய மோசமான நிலைமைக்கு முக்கிய காரணமாக இருப்பது, இந்த நாட்டை ஆண்ட ஆட்சியாளர்கள் பின்பற்றிய முறையற்ற கொள்கையே ஆகும். குறிப்பாக, 2019ஆம் ஆண்டு ராஜபக்ஷ குடும்பம் ஆட்சியைப் பொறுப்பேற்கும்போது, அந்நியச் செலாவணிக் கையிருப்பு 7.6 பில்லியன் டொலராக இருந்தது. ஆனால், தற்பொழுது 0.05 பில்லியன் டொலருக்கும் குறைவான தொகையே கையிருப்பில் இருப்பதாக நிதியமைச்சர் அவர்கள் கூறினார். உண்மையிலே இது முறையற்ற ஒரு போக்கையே காட்டி நிற்கின்றது. இலங்கையராக இருக்கின்ற நாங்கள் வெட்கித் தலைகுனியக் கூடிய அளவுக்கு இந்த நாட்டில் செயற்பாடுகள் நடந்து கொண்டிருக்கின்றன. இவற்றை மன வேதனையான விடயங் களாகவே நாங்கள் பார்க்கின்றோம்.

அண்மைய நாடான இந்தியாவின் தமிழ் நாட்டை ஆண்டுகொண்டிருக்கின்ற மாண்புமிகு முதலமைச்சர் மு.க. ஸ்டாலின் அவர்கள் ஓர் அறிக்கையை வெளியிட்டிருக் கின்றார். நீரினால் சூழப்பட்டிருக்கின்ற, இயற்கை அழகைக்கொண்ட இலங்கைத் தீவு இப்பொழுது பொருளாதார ரீதியான பின்னடைவுகளைச் சந்தித்து, கண்ணீரிலே மூழ்கிக்கொண்டிருக்கிறது என்ற கருத்தை அவர் கூறி, இந்த இலங்கைத் தீவுக்கு உதவிசெய்ய முன்வந்திருக்கிறார். உண்மையிலே எங்களுடைய இலங்கை நாட்டு மக்களுக்காக பெருமனதோடு, மனிதநேயத்தோடு உதவிசெய்ய முன்வந்த மையையிட்டு நாங்கள் அவருக்கு விசேட நன்றிகளைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம். இந்நாட்டின் நிலைமை இவ்வாறு மோசமான நிலைக்கு ஏன் போயி ருக்கிறது? என்பது பற்றி இலங்கையர்களாகிய நாம் ஒவ்வொருவரும் சிந்திக்க வேண்டியவர்களாக இருக் கின்றோம். சிறந்த முகாமைத்துவம் இன்மை, ஊழல் நிறைந்த ஆட்சி, செல்வந்தர்கள் நன்மை பெறக்கூடிய வகையில் 15 சதவீதமாக இருந்த 'வற்' வரியை 8 சதவீதமாகக் குறைத்தல் என்பன இந்த நாட்டின் பொருளாதாரம் மிக மோசமாகப் பின்நோக்கிச் செல்வதற்குக் காரணங்களாக இருந்திருக் கின்றன. இவற்றை தற்போதைய ஆட்சியாளர்கள் அல்லது அமைச்சர்கள் சிந்தித்துப் பார்க்கிறார்களா? என்ற வினாவும் எங்கள் மனதில் எழுந்துகொண்டிருக்கிறது. தங்களுடைய தவறுகளை நாட்டின் தலைவர் அவர்களும் அமைச்சர்களும் இப்பொழுது ஏற்றுக்கொண்டிருக்கிறார்கள்.

இங்கு விவசாயம் சம்பந்தமாகப் பேசப்பட்டபோது, நாங்கள் ஒவ்வொன்றாகச் சுட்டிக்காட்டினோம். அதுமாத்திர மன்றி, விவசாயத்திலே கைவைக்காதீர்கள்; தோல்வியைத் தழுவுவீர்கள்! என்ற விடயத்தை நாங்கள் அடிக்கடி கூறி வந்தோம். ஆனால், இன்று விவசாயம் மிக மோசமாகப் பாதிக்கப்பட்டு, உள்நாட்டிலே உற்பத்திகள் இல்லாத சூழல் உருவாக்கப்பட்டிருக்கிறது. கௌரவ உறுப்பினர்கள் பலர் இது சம்பந்தமாக இங்கு விரிவாகப் பேசினார்கள். அந்த வகையில், நானும் விவசாயிகள் சார்பாக சில கருத்துக்களை முன்வைக் கலாம் என்று நினைக்கின்றேன்.

சிறந்த பொருளாதாரக் கொள்கை இல்லாமையால்தான் இந்த நாடு பின்னோக்கிச் சென்றுகொண்டிருக்கின்றது என்பதை முதலிலே இந்த நாட்டின் தலைவர் ஏற்றுக்கொள்ள வேண்டும். அதேபோன்று, அமைச்சர்களும் அவர்கள் சார்ந்த கட்சியினரும் ஏற்றுக்கொள்ள வேண்டும். முதலில் நீங்கள் விவசாயத்திலே கைவைத்தீர்கள். இரண்டாவதாக, செல்வந் தர்கள் நன்மை பெறக்கூடிய வகையில் 'வற்' வீதத்தைக் குறைத்தீர்கள். அவை பிழையான காரியங்கள் என்று இப்பொழுது நாட்டின் தலைவர் சொல்கிறார். இதன்மூலம் மக்கள் பிழையான ஒரு தலைவரைத் தெரிவு செய்திருக் கிறார்கள் என்பதை அவர் மறைமுகமாக ஏற்றுக்கொள்கிறார். ஆகவே, அவர் பதவி விலக வேண்டும்.

மேல் மாகாணம் உட்பட நாட்டின் நாலா பக்கமும் இன்று போராட்டங்களும் பேரணிகளும் நடந்துகொண்டிருக்கின்றன. இவை எதற்காக நடந்துகொண்டிருக்கின்றன என்பதை இந்த உயரிய சபையில் இருக்கின்ற ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினரும் சிந்திக்க வேண்டும். நாட்டிலே பஞ்சம் ஏற்பட்டு, பொருட்களின் விலைகள் வானத்தைத் தொடுமளவுக்கு உயர்ந்துகொண்டிருக்கிற இந்த வேளையிலே, மக்கள் வாழ முடியாமல் வீதிக்கு இறங்கியிருக்கிறார்கள். இதைப் பற்றி யார் சிந்திக்கிறார்கள்? இப்பொழுது நிதி அமைச்சைப் பொறுப்பேற்றிருக்கின்ற அமைச்சர் அவர்கள் இதற்கான தீர்வை முன்வைத்திருக்கிறாரா என்றால், அதுவும் கேள்விக்

குரிய ஒரு விடயமே. நீங்கள் அமைச்சையும் அரசியலையும் முன்னிறுத்தி உங்களுடைய செயற்பாடுகளை முன்னெடுக் காமல், நாட்டு மக்கள் நன்மை பெறக்கூடிய வகையில் செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும்.

விவசாயத்தை எடுத்துக்கொண்டால், இன்று உள்ளூர் உற்பத்தி மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கிறது. நீங்கள் உர மானியத்தை நிறுத்தினீர்கள்; தொழிலதிபர்களை மேம்படுத் தினீர்கள். பதுக்கல்களில் ஈடுபடுகின்ற போடிமார், முதலாளிமார் மற்றும் உர இறக்குமதியாளர்கள் ஓர் அந்தர் யூரியா பசளையை 43,000 - 45,000 ரூபாவுக்கு விற்பனை செய்துகொண்டிருக்கிறார்கள். இதனால், பாதிக்கப்படுபவர்கள் யார்? வளம் பெறுபவர்கள் யார்? என்பதையும் நீங்கள் சிந்திக்க வேண்டும். உண்மையில் முதலாளிமாரே இதனால் வளம் பெறுகிறார்கள். உற்பத்தியில் தன்னிறைவற்ற நிலைமையை அடைந்து, மிகவும் மோசமாகப் பாதிக்கப்படக்கூடிய சூழலிலே இந்த நாடு இருந்துகொண்டிருக்கிறது. எனவே, சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் உடனடியாக இதில் தலையிட்டு விவசாயிகளுக்கு நிர்ணய விலையில் உரத்தை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ள வேண்டும். அதுமாத்திரமல்ல, 2,500 ரூபாவுக்கு விற்கப்பட்ட களைநாசினி இன்று 25,000 ரூபாவுக்கு விற்கப்படுகின்றது. நீங்கள் இவை பற்றிச் சிந்திக்க வேண்டும். இந்த அடிப்படையில் நாடு மோசமான நிலைக்குச் சென்றுகொண்டிருக்கின்றது. குறிப்பாக, இந்த நாட்டை ஆண்டுகொண்டிருக்கின்ற அரச தலைவர் இந்த நாட்டின்மீது அக்கறைகொண்டு, மக்களின் அன்றாடப் பிரச்சினைகளுக்குத் தீர்வுகளைக் காணக்கூடிய வகையிலே உடனடியாகச் செயற்பட வேண்டும்.

இன்று எங்களுடைய உள்ளூர் உற்பத்தி பாதிக்கப்பட்ட நிலையில், வெளிநாடுகளிலிருந்து அரிசி மற்றும் ஏனைய உணவுப் பொருட்களை இறக்குமதி செய்யக்கூடிய நிலைக்கு நாங்கள் தள்ளப்பட்டிருக்கிறோம். இது எந்தளவுக்கு நியாய பூர்வமான விடயம் என்பதை நீங்கள் சிந்திக்க வேண்டும். மக்களின் எதிர்காலம் நாட்டின் வளர்ச்சியிலே தங்கியுள்ளது என்பதை இந்த நாட்டை ஆண்டுகொண்டிருக்கின்ற அரச தலைவர் மறந்துவிட்டு, வேறொரு திசையில் சென்று கொண்டிருக்கிறார். எனவே, நாட்டின் தலைவர் மக்களின் கோரிக்கைகளுக்குச் செவிசாய்த்து, நல்லதொரு தீர்மானத்தை எடுக்க வேண்டும். இல்லாவிட்டால், எதிர்காலத்தில் இந்த நாடு மோசமான ஒரு சூழலைச் சந்திக்கும் என்பதில் எவ்விதமான சந்தேகமும் இல்லை.

குறிப்பாக, இந்த நாடு சுதந்திரம் அடையும்போது, பொருளாதாரத்தில் ஆசியாவிலே மூன்றாவது நிலையில் இருந்தது. ஆனால், இப்பொழுது இறுதி நிலையில் இருக்கிறது. இலங்கையானது பொருளாதாரத்தில் மிகவும் பின்தங்கிய ஒரு நாடாக மாறியிருக்கின்றது. இதற்குக் காரணம், சீரிய பொருளா தாரக் கொள்கை இல்லாமையே ஆகும். கொழும்பு பல்கலைக் கழகத்தின் பொருளியல்துறைப் பேராசிரியர் சிறிமல் அபேரத்ன அவர்கள் தனது கட்டுரையிலே இலங்கையின் பொருளாதாரம் சம்பந்தமாகக் குறிப்பிடும்போது அதனைக் குறிப்பிட் டிருக்கிறார். இயற்கை வளம் நிறைந்த இந்த நாடு இன்று பொருளாதார ரீதியாகப் பின்னடைந்து இருப்பதற்கு இந்த நாட்டை ஆண்ட அரச தலைவர்கள் இனவாத, மதவாத அடிப் படையில் செயற்பட்டமையும் ஒரு காரணமாக இருக்கின்றது. அவர்கள் நீண்ட காலமாக இனப் பிரச்சினையை மையப் படுத்திச் செயற்பட்டு வந்தமையால் இந்த நாடு பொருளாதார ரீதியாகப் பின்னடைவை அடைந்திருக்கின்றது.

இந்த நாட்டிலிருந்து வெளியேற்றப்பட்ட இலட்சக் கணக்கான மக்கள் இன்று புலம்பெயர் தேசத்திலே வாழ்ந்து கொண்டிருக்கிறார்கள். இந்த நாட்டிலே சமாதானம் ஏற்படுத் தப்பட்டு, சமத்துவம் பேணப்படுகின்றபொழுது, தமிழர் களுடைய நீண்ட காலப் பிரச்சினைக்கு அரசியல் ரீதியாக ஒரு நிரந்தரத் தீர்வு கிடைக்கப்பெறுகின்றபொழுது நிச்சயமாக அவர்கள் வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே முதலீடுகளைச் செய்து, இந்த நாட்டின் பொருளாதாரத்தை உயர்த்துவார்கள். இந்த நாட்டில் யுத்தம் ஏற்பட்டபொழுது, குறிப்பாக, 1983, 1990ஆம் ஆண்டுகளிலே மிகவும் மோசமாகப் பாதிக்கப் பட்டவர்கள் யார் என்றால், பொருளாதாரத்திலே உயர்வான நிலையிலிருந்த, நகர்ப்புறத்திலே வாழ்ந்த தமிழர்களே ஆகும். அவர்கள் திட்டமிட்டு அழிக்கப்பட்டதோடு, அவர்களின் பொருளாதாரமும் அழிக்கப்பட்டது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු තවරාජා කලෙයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
அதன் காரணமாக அவர்களால் இந்த நாட்டில் உயிர்வாழ முடியாமல், வெளிநாடுகளுக்குப் போய் வாழவேண்டிய சூழல் உருவாகியது. இந்த நாடு பொருளாதார ரீதியில் முன்னேற் றத்தைக் காண வேண்டுமானால், இவ்வாறான விடயங்கள் தவிர்க்கப்பட வேண்டும். அந்த வகையில், தமிழர்கள் ஏற்றுக் கொள்ளக்கூடிய அரசியல் தீர்வை அவர்களுக்கு வழங்கி, இந்த நாட்டிலே நிலையான சமாதானத்தை ஏற்படுத்த வேண்டும் என்ற கருத்தைக் கூறி, நிறைவுசெய்கின்றேன். நன்றி. வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.12]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ රටේ ඇති වී තිබෙන ආර්ථික අර්බුදය, අපේ ජනතාව මුහුණ දීලා තිබෙන මේ කනගාටුදායක තත්ත්වය පිළිබඳව අපේ රටේ මිලියන 22ක් වූ ජනතාවගෙන් පළමුවෙන්ම මම මේ අවස්ථාවේදී සමාව ඉල්ලා සිටිනවා.

මේ රට තුළ ඇතිවෙලා තිබෙන ආර්ථික අර්බුදය පිළිබඳව මුදල් අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා පසුගිය සතියේ එක්තරා රූපවාහිනී වැඩසටහනකදී පැය දෙකහමාරක් කරපු කථාව සහ එතුමා IMF එකට ගිහින් ආපසු ලංකාවට ඇවිල්ලා කරපු කථාව මම දැක්කා. ඇත්තටම මම පැය දෙකහමාරක් තිස්සේ ඒ කථාව අහගෙන සිටියා.

අපි වාගේ නවක මන්ත්‍රීවරුන්ට එතුමාගේ ඒ කථාවෙන් යම් ජීවයක් ලැබුණා. අපේ රටේ ඇතිවී තිබෙන අර්බුදය පිළිබඳව මෙච්චර කාලයක් ජනතාවට ඇත්ත කිව්වේ නැති බවයි මගේ හැඟීම. ජනතාවට අපි ඇත්ත කිව්වා නම්, ජනතාවගෙන් මේ වාගේ ප්‍රතිප්‍රහාරයක් අපට නොඑන්න ඉඩ තිබුණා. මේ කාරණාවලදී

[ගරු ගුණතිලක රාජපක්ෂ මහතා]

ඇත්තටම මුදල් අමාත්‍යාංශයේ සහ මහ බැංකුවේ හිටපු සමහර නිලධාරින් ජනාධිපතිතුමා නොමඟ යවලා තිබෙන බව මට හොඳාකාරවම පෙනෙනවා.

එකක් තමයි පොහොර ප්‍රශ්නය. මේක ජනාධිපතිතුමා ක්‍රියාත්මක කරපු රටට වැඩදායී, ඉතාම හොඳ ව්‍යාපෘතියක්. නමුත්, රටේ ජනතාවට හිරිහැරයක් නොවන ආකාරයට මේ ව්‍යාපෘතිය ඒ නිලධාරින් ක්‍රියාත්මක කළේ නැති බව තමයි මට පෙනෙන්නේ. මේක හොඳ වැඩක් වුණත්, එය ක්‍රියාත්මක කරන්නට සැලැස්මක් තිබිය යුතුයි. අපේ ආණ්ඩුවට අවුරුදු 5ක කාලයක් තිබෙනවා. මේ අවුරුදු 5ක කාලය තුළ අපට පුළුවන් අවුරුද්දකට සියයට 20ක් වාගේ ප්‍රමාණයකින් අපේ රටේ රසායනික පොහොර භාවිතය අඩු කරන්න. ඊළඟ අවුරුද්දේ තවත් සියයට 20කින් රසායනික පොහොර භාවිතය අඩු කරනවා. මේ ආකාරයට අපට අවුරුදු 5ක් ඇතුළත ඒ රසායනික පොහොර භාවිතය ක්‍රම ක්‍රමයෙන් නවත්වන්න අවශ්‍ය සැලසුම් සකස් කරන්න තිබුණා. එසේ නොකර එක පාරටම ගෙඩිය පිටින් රසායනික පොහොර භාවිතය නවත්වපුවාම ඒ වාසිය ගත්තේ කවුද? ඒ වාසිය ගත්තේ මේ රටේ ජනතාව නොවෙයි, නිදාගෙන හිටපු විපක්ෂය. සජබය, JVP ඇතුළු මේ අය මේකෙන් ඇහැරුණා. ඇහැරිලා ඒ අය මේ සෙල්ලම පටන් ගත්තා. ඒ නිසා මේකට වග කියන්න ඕනෑ, මේවාට උඩගෙඩි දුන්නු ගොඩක් අය ඒ පිළිබඳව දැන් කථා කරන්නේවත් නැහැ. කාබනික පොහොර ගේන්න ඕනෑ කියලා කෑ මොර ගහපු අපේ සමහර නායකයෝ දැන් ඒ ගැන කථා කරන්නේවත් නැතිව, හිමින් සීරුවේ ජනාධිපතිතුමා අමාරුවේ දැම්මා. ඒක තමයි ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, මහ බැංකුවේ හිටපු ඒ නිලධාරින් අද ඒ තැන්වල නැහැ. මම දන්නා විධියට රට පිළිගත් හොඳ ලේකම්වරු, සභාපතිවරු අද ඒ තැන්වලට පත්වෙලා ඉන්නවා. ඒ නිසා අපට දැන් බලාපොරොත්තුවක් තියාගන්න පුළුවන්, ක්‍රම ක්‍රමයෙන් මේ රටේ ඇතිවෙලා තිබෙන උද්ධමනය, ආර්ථික අර්බුදය අඩු කරමින්, ටිකෙන් ටික අපේ රට ඉස්සරහට ගෙනියන්න පුළුවන් කියලා. මේක මීට කලින් කරන්න තිබුණා. අපේ අලි සබ්රි මුදල් ඇමතිතුමා කථා කළා වාගේ මේ දේවල් මාස 3කට, 4කට කලින් ජනතාව අතරට දුන්නා නම්, අද මේ වාගේ ප්‍රතිවිපාක අපට නොලැබෙන්න තිබුණා. කෙසේ වෙතත්, එතුමා අදත් පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව හොඳ කථාවක් කළා. අපි ඒක අහගෙන හිටියා. මේ කථාව විපක්ෂයේ අයට වුණත් අහක දාන්න බැහැ. ඒ තරම් සාරගර්භ විධියට එතුමා මේ ප්‍රශ්නය, මේ කථාව ගරු සභාවට ඉදිරිපත් කළා. එතුමා මේ බදු ප්‍රශ්නය ගැන කිව්වා. බදු අඩු කරන්න කියලා මේ රටේ මොන මනුස්සයාද ඉල්ලුවේ? ඒක අපි කරගත්තු මහා මෝඩ වැඩක් කියලායි මම නම් හිතන්නේ. බදු අඩු කරන්න කියලා කවුරුවත් ඉල්ලුවේ නැහැ. බදු අඩු කරපු අය සමහර විට හිතන්න ඇති මේ බදු අඩු කිරීමෙන් ජනතාවට සෙතක් වෙයි කියලා. නමුත් ඒ සෙත, ඒ සහනය බදු හිමියන්ගෙන් රටට ලැබුණේ නැහැ. ඒ නිසා රටට එන්න තිබුණු බිලියන 5ක මහා ධනස්කන්ධයක් රටට අහිමි වුණා. නුවර පැත්තේ මගේ යහළුවෙක් ඉන්නවා. ඔහු හොඳ ව්‍යාපාරිකයෙක්.

ඔහු මට කිව්වා, කාර්තු තුනෙන් එක් කාර්තුවකට ලක්ෂ 17ක්, 18ක් බදු ගෙවනවා කියලා. අවුරුද්දකට ලක්ෂ 60ක් ගෙවනවා. ඔහු බදු ගෙවන්නත් කැමැත්තෙන් සිටි පුද්ගලයෙක්; බදු ගෙවමින් සිටියේ. නමුත්, අර බදු සහන ක්‍රමය නිසා ඔහුට ඒ බදු ගෙවන්න අවශ්‍ය වුණේ නැහැ. ඔහුට බදු සහනය ලැබුණා. ඒ මගේ යහළුවා ඇතුළු මේ රටට බදු ගෙවමින් සිටි කී දාහක් නම් ඒ බදු සහනය හේතුවෙන් බදු නොගෙවා සිටින්න ඇද්ද? ඒ බදු ආදායම රටට අහිමි වුණා. මේක තමයි ඇත්ත. තිත්ත වුණත් අපි ඒක කියන්න ඕනෑ. ඒ වාගේම, අපේ අපනයන ආදායමත් ශීඝ්‍රයෙන් පහළ බැස්සා.

ඊළඟට, අපේ සංචාරක ව්‍යාපාරය ගත්තොත්, මේ අවුරුද්දේ මුල් මාස දෙක ඇතුළත ලක්ෂයකට එහා සංචාරකයෝ මේ රටට ආවා. මේ රටේ පවතින අරගළ හේතුවෙන් මේ වෙනකොට සංචාරකයන්ගේ පැමිණීම 10,000කට පමණ සීමා වෙලා තිබෙනවා. ඒ නිසා රටට එමින් පැවැති ඩොලර් ආදායම නතර වුණා. ඒ වාගේම, මේ රටින් පිටවන ඩොලර් ප්‍රමාණය පිළිබඳව තව තවත් හොයලා බලන්න ඕනෑ. දවසකට flights කීයක් යනවාද, සුමානයකට flights කීයක් යනවාද කියා හරියාකාරව Airport එකෙන් check කර ගත්තොත්, ඒ තුළින් මේ රටේ තිබෙන ඩොලර් කොපමණ පිටට යනවාද කියලා සොයා ගත්තොත්, අපට මේ රටේ විශාල මුදලක් ඉතිරි කර ගන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

මුදල් ඇමතිතුමාගේ කථාව අනුව ඉතා බැරෑරුම් තත්ත්වයක සිටින අපට ඉදිරියේදී බිලියන 51ක් ණය වශයෙන් ගෙවන්න තිබෙනවා. කොහොමද මේ ණය ගෙවන්නේ? මේ ණය ගෙවන්න නම් අපි සියලුදෙනාම රට වෙනුවෙන් ඒක රාශි විය යුතුයි. විපක්ෂයේ අයත් බලයට තිබෙන කෑදරකම අතහැරලා අපේ මේ පාලන කාලය තුළ එකට එක්කහු වුණොත්, අපට මේ රට ගොඩගන්න බැරිකමක් නැහැ.

එදා අපට නිලධාරින් කිව්වා, IMF එකට යන්න එපා කියලා. නමුත්, අපි මීට පෙර එකොළොස් වතාවක් IMF එකට ගිහිල්ලා මේ රටට ආධාර ලබාගෙන තිබෙනවා. නමුත් සමහර නිලධාරින් මෙවර IMF එකට යන්න දුන්නේ නැහැ. ඒකත් එක්තරා ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් කියලා මට හිතෙනවා. මේවා ජනතාව දන්නේ නැහැ. 2009 වන කොටත් මේ රටේ යුද්ධය තිබුණා. ඒ වෙලාවේත් මේ අර්බුදය ඇවිල්ලා තිබෙනවා, අපි දන්නේත් නැහැ. එවකට හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනතාවට නොදැනෙන්න යුද්ධයත් තිබෙන අතරේ ඒ අර්බුදය අයින් කර ගත්තා; රට ඉස්සරහට අරගෙන ගියා; රටේ සංවර්ධන වැඩත් කළා; ණයත් ගෙව්වා. ඒ විධියට තමයි කරගෙන ගියේ.

අපේ රජය කරපු අනික් කාර්යය තමයි ණය ගෙවපු එක. මට මතක හැටියට බිලියන 5ක් වෙන්න ඇති. අපි ඒ ණය ගෙව්වා. ගත්ත ණය ගෙවන්න ඕනෑ. ඒක හොඳ වැඩක්. ඒ වාගේම 2020න් පසු ණය ගත්තේ නැහැ. ඒකත් හොඳ දෙයක්. නමුත්, අර ඩොලර් ටික අපි ණය විධියට ගෙවන්නේ නැතිව හිටියා නම්, මේ අර්බුදය අපට නොඑන්න තිබුණා කියලා මා හිතනවා. රට සමෘද්ධිමත් වෙලා රට යථා තත්ත්වයට පත් වුණාම අපට ඒක ගෙවන්න පුළුවන්කම තිබුණා. ඒ නිසා මේ වෙලාවේ IMF එකට යන එක වරදක් කියලා මම හිතන්නේ නැහැ. IMF එකේ කොන්දේසි පිළිබඳ සමහර අය බිල්ලෙක් මවනවා. නමුත්, ඒ කියන තරම් බිල්ලෙක් එතැන නැහැ. ඒ ගොල්ලන් කියා තිබෙන එක කාරණයක් තමයි වියදම් අඩු කරගෙන ආදායම් වැඩි කර ගන්න කියන එක. මේක අපට කරන්න බැරි දෙයක් නොවෙයි. කරන්න පුළුවන්. අනෙක් කාරණය තමයි බදු අය කර ගත හැකි අයගෙන් අය කරගෙන බදු ආදායම වැඩි කර ගැනීම. අපට මේක කරන්න බැරිද? ඒකත් කරන්න පුළුවන්. ඊළඟට, ගෙවිය යුතු ණය ප්‍රතිව්‍යුහගත කරගෙන ණය බර සැහැල්ලු කිරීම. මේකත් කරන්න පුළුවන් දෙයක්.

ඒ වාගේම, විදේශ රටවලට යන්න කැමැති අතිරික්ත රාජ්‍ය සේවක පිරිසක් ඉන්නවා. ඒ අයට විදේශ රැකියා අවස්ථා ලබා දුන්නොත් ඒකෙන් රටටත් ආදායමක් ලැබෙනවා. ඒකෙන් අපේ රටට ඩොලර් ප්‍රමාණයක් ලැබෙනවා.

මේ රටේ පාඩු ලබන ආයතන කීයක් තිබෙනවාද? අපේ ගරු ජානක වක්කුඹුර ඇමතිතුමා කෘෂිකර්ම අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ලංකා සීනි සමාගම -පැල්වත්ත ඒකකය ඇතුළු- ලාභ ලබන ආයතනයක් බවට පත් කළා. මේවා කරන්න අපට බැරිකමක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ඒ නිසා අපට කරන්න බැරි දෙයක් නැහැ. මෙන්න මේ අතරේ තමයි නැවතත් ජේවීපී භූතයා එන්නේ. ඒ ගොල්ලන් ඉල්ලන්නේ ලේ. දැන් ආපහු ලේ ඉල්ලා ගෙන එනවා. ඒ ගොල්ලන්ට ඕනෑ අවුරුදු 15කට විතර සැරයක් මේ රට ලේ විලක් කරන්නයි. ඒක 1971දී කළා. එදා අපේ තරුණ-තරුණියෝ 60,000ක් ජීවිත පූජා කළා. ඒක 1988-1989 කාලයේත් කළා. එදා අපේ කොල්ලෝ, කෙල්ලෝ තිස් හතළිස්දාහක් මැරුවා. දැන් ආයෙත් ඒ සෙල්ලම ඒ අය පටන් අරගෙන තිබෙන බව අපට පෙනෙනවා. ඒ අයට ඕනෑ ලේ; බිලි ගන්න. ඒ අයට පළමු බිල්ල ගන්න පුළුවන් වුණේ රඹුක්කනදී. ඒ විධියට තවත් ජීවිත බිලි ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ලේ මාපිලුන් වාගෙයි කටයුතු කරන්නේ. ඉස්සර වාගේ නොවෙයි, දැන් කටයුතු කරන්නේ. එක දවසට රටවල් 27ක, උද්ඝෝෂණ 27ක් කළා. ඒ උද්ඝෝෂණවලට සහභාගි වුණු අයගේ පිටි පස්සෙන් හිටියේ කවුද කියලා අපි දන්නවා. රට රටවල ඒ උද්ඝෝෂණවලට ගිය අය එක ඩොලරයක් මව් රටට එව්වාද? නැහැ. මව් රටට ආදරයක් තිබෙනවා නම් එහෙම කරන්න තිබුණා. මා දන්නා විධියට ඒ අයත් ඩොලර් එවා තිබෙන්නේ කළු කඩ හරහා.

ජේවීපී එකේ මන්ත්‍රීවරයකු පරණ තැටියම වාදනය කරමින් කථාවක් කරනවා මා දැක්කා. ඒ පරණ කථා ටික ආපසු දාලා තිබෙනවා. එක් එක් සිද්ධිවලට සම්බන්ධ සජබයේ අය 52ක් ඉන්නවා ලු. එතුමාත් හිටියා නේ, ඒ කාලයේ දූෂණ විරෝධී කමිටුවේ. එතුමා ඒකේ හිටියා නේ? ඒ ගොල්ලන්ට ඒ දූෂණ අල්ලන්න තිබුණා නේ. පොදුජන පෙරමුණේත් 25ක් හිටියා ලු. ඒ අයත් අල්ලන්න තිබුණානේ. කෝ, ඇල්ලුවාද? 2015 සිට 2019 දක්වා අවුරුදු 4 තුළ බලයේ හිටියේ අපි ද? ඒ කාලයේ වැරදිකරුවන් එක්කෙනෙක්වත් ඇල්ලුවේ නැහැ. අද මෙතැන පුරසාරම් දොඩවනවා. තවත් මේ රට මිනී කනත්තක්, ලේ විලක් කරන්න අර අදින බවක් අපට පෙනෙනවා. එහෙම නම් ජනතාවට අපි කියනවා ඒ අයගෙන් පරිස්සම් වෙන්න කියලා. 2000න් පස්සේ ඉපදුණු අපේ අහිංසක තරුණ-තරුණියන් තමයි මේ අරගළයට මැදි වෙලා ඉන්නේ. ඒ අයට අපි කියනවා මේ දේවල්වලට රැවටෙන්න එපා කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමරකීර්ති අතුකෝරළ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.26]

**ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**
(மாண்புமிகு அமரகீர்த்தி அதுகோரல)
(The Hon. Amarakeerthi Athukorala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට මගේ ගෞරවය පිරිනමනවා. අපේ රටේ ජනතාව ඉතා බරපතළ, ඛේදනීය තත්ත්වයකට මුහුණ පා තිබෙන අවස්ථාවක, ගරු මුදල් අමාත්‍යතුමා අද මේ උත්තරීතර සභාව හමුවේ සත්‍ය තත්ත්වය පැහැදිලි කළා. අතිගරු ජනාධිපතිතුමා මේ රට භාරගෙන, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලය අරගෙන තවම අවුරුදු දෙකහමාරකට වඩා ගත වුණේ නැහැ. මේ රට භාරගෙන මාසයක් ඇතුළත වාගේ අපට දැවැන්ත කොවිඩ් වසංගතයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ නිසා වසර දෙකක කාලයක් අපේ රටේ ඉදිරි ගමන සම්පූර්ණයෙන්ම ආපස්සට හැරවුණා. විශේෂයෙන් ඒ කාලයේ රාජ්‍ය අංශය වහලා තියන්න සිද්ධ වුණා. රටේ ආදායම නැති වුණා. සංචාරකයන්ගෙන් එන්න තිබුණු ආදායම සම්පූර්ණයෙන් රටට අහිමි වුණා. ඒ වාගේම අපේ විදේශ ශ්‍රමිකයන්ගෙන් ලංකාවට එන්න තිබුණු ඩොලර් ටික ආවේත් නැහැ. ඒ සියල්ල නැති වෙලා තිබියදීත් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය ප්‍රමුඛත්වය දුන්නේ අපේ ජනතාවගේ ජීවිත ටික ආරක්ෂා කර ගැනීමේ යුද්ධය ජය ගන්නයි. අපේ රජයට ඉතාම සාර්ථකව කොවිඩ් වසංගතයට මුහුණ දෙන්න පුළුවන් වුණා. නමුත් අපි බලාපොරොත්තු වුණේ නැහැ, ජනතාවට මේ වාගේ විපතක් සිද්ධ වෙයි කියලා.

විශේෂයෙන් අද අරගළවල ඉන්න දරුවෝ එදා -1988-89- භීෂණ කාලය ගැන දන්නේ නැහැ. එදා ජනතා විමුක්ති පෙරමුණ තරුණ-තරුණියන්ට උත්තර දුන්නේ උණ්ඩයෙන්. ඒ විධියට තරුණ-තරුණියන් මරා දැමූ යුගයක් තිබුණු බව අද මේ අලුත් පරම්පරාව දන්නේ නැහැ.

මේ රට සංවර්ධනය කිරීම සඳහා මහින්ද රාජපක්ෂ යුගයේ ඩොලර් බිලියන 16ක් ණයට ගත්තා. ඉන් ඩොලර් බිලියන 8.5ක් සංචිත ලෙස භාණ්ඩාගාරයේ ඉතිරි කරලායි එතුමා එදා රජය භාර දුන්නේ. ඒ කාලයේ අපේ ගම්මානවලට විදුලිය දුන්නා; මාර්ග ටික කාපට් කර දුන්නා; වරායවල් හැදුවා; ධීවර වරායවල් ගොන්නක් හැදුවා; ගුවන් තොටුපොළවල් හැදුවා; highways හැදුවා; Port City එක හැදුවා.

නමුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ණය අරගෙන මොකක්ද කළේ කියලා අපේ ජනතාවගෙන් අපි අහනවා. ඒ අය හම්බන්තොට වරාය විකුණලා කරපු දෙයක් නැහැ. හම්බන්තොට වරාය විකුණලා ගත්ත සල්ලිවලට වෙච්ච දෙයක් නැහැ. එතුමන්ලා ඒ මොකුත් නොකරපු පොඩි ළමයින් වාගේ අද සිටියත් ජනතාව දන්නවා මේ රටේ යම්කිසි සංවර්ධනයක් කළා නම්, රට ඉදිරියට ගෙනිච්චා නම් ඒ මහින්ද රාජපක්ෂ කාලයේදී මිස එක්සත් ජාතික පක්ෂ කාලයේදී නොවන බව.

විශේෂයෙන් කෘෂිකාර්මික ප්‍රදේශයක් වන පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයෙකු වන මම දන්නවා අපේ ගොවි ජනතාවට බරපතළ ප්‍රශ්නයක් තිබුණු බව. ඒ තමයි ගොවි ජනතාවට කෘෂි කර්මාන්තය සඳහා රසායනික පොහොර නොමැතිකම. අතිගරු ජනාධිපතිතුමා ඒක පිළිගත්තා. එතුමා අඩියක් ආපස්සට අරගෙන විශේෂ ප්‍රකාශයක් කළා, "මට යම්කිසි වැරැදීමක් සිදු වුණා" කියලා. ජනාධිපතිතුමා ඒ වරද පිළිගැනීම, නායකයෙකු එවැන්නක් කළ පළමු අවස්ථාව හැටියට තමයි අපි දැක්කේ.

[ගරු අමරකීර්ති අතුකෝරළ මහතා]

අද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිංස් නෙල්සන් මැතිතුමා කථා කළා. එතුමන්ලා තමයි ඒ ගොවි ජනතාව කුලප්පු කරලා, පාරට බස්සලා කොළඹට පා ගමන් එවන්නේ. නව කෘෂිකර්ම අමාත්‍ය අපේ ජානක වක්කුඹුර මැතිතුමාත්, සිරිපාල ගමලත් රාජ්‍ය අමාත්‍යතුමාත්, මමත් පසුගිය දා උද්සෝෂණවල නිරත වෙච්ච සියලු ගොවි සංවිධානවල ගොවි නායකයන් -පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ වැව, මින්නේරිය වැව, කවුඩුල්ල වැව කියන වැව් ආශ්‍රිත ගොවි නායකයන්- කැඳවා කෘෂිකර්ම අමාත්‍යාංශයේ පැය තුනක සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ අය අපට ඉතාම සාධනීය ප්‍රතිචාරයක් දැක්වූවා. කෘෂිකර්ම අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මැතිතුමා අපට අනිවාර්ය පොරොන්දුවක් දීලා තිබෙනවා, මැයි මාසයේ 20වන දා වනකොට යූරියා පොහොර අපේ ගොවි ජනතාවට ලබා දෙන බවට සහ වගා හානි සඳහා වන වන්දිවලින් කොටසක් හෝ කඩිනමින් - ලබන සති දෙක ඇතුළත- ඒ සියලු ගොවි ජනතාවට ලබා දෙන බවට. පොළොන්නරුව දිස්ත්‍රික්කය ප්‍රමුඛ සමස්ත ගොවි ජනතාව වෙනුවෙන් ලබා දුන් ඒ පණිවුඩය පිළිබඳව ජානක වක්කුඹුර ගරු අමාත්‍යතුමාට අපේ ස්තුතිය පළ කරනවා. අපි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු ගොවි ජනතාවගෙන් ඉල්ලනවා, ජලය නිකුත් කරන්න අවස්ථාව දෙන්න, කුඹුරුවලට බහින්න කියලා. එහි වගකීම රජය විධියට අපි අරගෙන තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා එදා ආණ්ඩු පක්ෂ රැස්වීමේදී අපත් සමඟ කථා කරලා කිව්වේ යූරියා පොහොර ටික, රසායනික පොහොර ටික ගුවනින් හෝ ගෙනැල්ලා කෘෂි කර්මාන්තයේ යෙදෙන ප්‍රදේශවලට ප්‍රමුඛත්වය දෙමින් ඒවා ලබා දෙන්න කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න. කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**
(மாண்புமிகு அமரகீர்த்தி அதுகோரல)
(The Hon. Amarakeerthi Athukorala)

හොඳයි.

බොහොම ස්තුතියි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 මැයි 05 වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2022 மே 05, வியாழக்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 10.00 a.m. on Thursday, 05th May, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.